329 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 329 - இல. 02
Volume 329 - No. 02

2026 අගෝස්තු 19වන බදාදා
2026 ஓகஸ்ட் 19, புதன்கிழமை
Wednesday, 19th August, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 211]

**ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන - 2026** [තීරුව 211]

**ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකගේ වාර්තාව - 2025** [තීරුව 212]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 213]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 215-244]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ජාතික සීමා නිර්ණය කොමිසමට මුස්ලිම් නියෝජනය ඇතුළත් කිරීම [තීරුව 245]
ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික දෙමළ සරණාගතයින්ට ස්වේච්ඡාවෙන් නැවත පැමිණීමට පහසුකම් සැලසීම [තීරුව 248]

**දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 252]

**මුදල් පනත:**
යෝජනා සම්මතය [තීරු 256-371]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 372-378]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 378-386]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம் மற்றும் நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 211]

**தேசிய கணக்காய்வு அலுவலகத்தின் வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம் - 2026** [ப: 211]

**தேசிய கணக்காய்வு அலுவலகத்தின் நிதிக்கூற்றுகள் மற்றும் நிதிக்கூற்றுகள் தொடர்பான சுயாதீன கணக்காய்வாளரின் அறிக்கை - 2025** [ப: 212]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 213]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 215-244]

**தனி அறிவித்தல் மூல வினா:**
தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் முஸ்லிம் பிரதிநிதித்துவத்தை உள்வாங்கல் [ப: 245]
இந்தியாவிலுள்ள இலங்கைத் தமிழ் அகதிகள் சுய விருப்பத்துடன் தாயகம் திரும்புவதற்கு வசதியளித்தல் [ப: 248]

**ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 252]

**நிதிச் சட்டம்:**
தீர்மானம் [ப: 256-371]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 372-378]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 378-386]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Twenty Second Amendment to the Constitution Bill and Judicature (Amendment) Bill: Petitions to the Supreme Court [Col. 211]

ANNUAL WORK PROGRAMME OF NATIONAL AUDIT OFFICE - 2026 [Col. 211]

FINANCIAL STATEMENTS AND INDEPENDENT AUDITOR'S REPORT ON FINANCIAL STATEMENTS OF NATIONAL AUDIT OFFICE - 2025 [Col. 212]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 213]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 215 - 244]

QUESTION BY PRIVATE NOTICE:
Inclusion of Muslim Representation in National Delimitation Commission [Col. 245]
Facilitation of Voluntary Return of Sri Lankan Tamil Refugees in India [Col. 248]

ANTI-CORRUPTION (AMENDMENT) BILL:
Read the First time [Col. 252]

FINANCE ACT:
Resolution [Cols. 256 - 371]

ADJOURNMENT QUESTIONS [Cols. 372 - 378]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 378-386]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අගෝස්තු 19වන බදාදා***
*2026 ஓகஸ்ட் 19, புதன்கிழமை*
*Wednesday, 19th August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம் மற்றும் நீதித்துறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL AND JUDICATURE (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් හා "අධිකරණ සංවිධාන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන - 2026
## தேசிய கணக்காய்வு அலுவலகத்தின் வருடாந்த வேலை நிகழ்ச்சித்திட்டம் - 2026
## ANNUAL WORK PROGRAMME OF NATIONAL AUDIT OFFICE - 2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 35(1) වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2026 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය වැඩසටහන, එකී පනතේ 35(5) වගන්තිය ප්‍රකාරව මම සභාගත කරමි.

## ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකගේ වාර්තාව - 2025
## தேசிய கணக்காய்வு அலுவலகத்தின் நிதிக்கூற்றுகள் மற்றும் நிதிக்கூற்றுகள் தொடர்பான சுயாதீன கணக்காய்வாளரின் அறிக்கை - 2025
## FINANCIAL STATEMENTS AND INDEPENDENT AUDITOR'S REPORT ON FINANCIAL STATEMENTS OF NATIONAL AUDIT OFFICE - 2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 36(1) වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකගේ වාර්තාව, එකී පනතේ 36(3) වගන්තිය ප්‍රකාරව මම සභාගත කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report of the People's Bank for the year 2025; and

(ii) Annual Report of the Bank of Ceylon for the year 2025.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා

[ගරු බිමල් රත්නායක මහතා ]

දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

(i) 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තා;

(ii) 2020, 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා;

(iii) 2024 සහ 2025 වර්ෂ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iv) 2024 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව

වාර්තාව 2

(i) 2022/2023 සහ 2023/2024 වර්ෂ සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තා;

(ii) 2023/2024 වර්ෂය සඳහා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2024 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2024 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බෙලිඅත්ත, තංගල්ල පාර, අංක 68/ඒ/1 යන ලිපිනයෙහි පදිංචි අනිල් නිශාන්ත වික්‍රමආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, උයන්වත්ත, වේරගම්පිට පන්සල පාර, අංක 2/5 යන ලිපිනයෙහි පදිංචි ඩී.එන්.ජේ. දිසානායක මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අඟුණුකොළපැලැස්ස, ආචාරියගම, අංක 137 යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. රංජිත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ජා-ඇල, තුඩැල්ල, මිගෙල් සෙනවිරත්න මාවත, අංක 424/සී/2/ඒ යන ලිපිනයෙහි පදිංචි එම්.යූ. මල්ෂාණි ජයරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කිරිදිවැල, නිට්ටඹුව පාර, කඩපෙළ, ඉස්කෝලවත්ත, අංක 62/106 යන ලිපිනයෙහි පදිංචි ආර්.ඒ. රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -32/2024- (1), ගරු නිතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -139/2024/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -684/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## වනඅලින්ගෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ සිදුවන හානි: වැළැක්වීමේ ක්‍රියාමාර්ග
## மட்டக்களப்பு மாவட்டத்தில் காட்டு யானைகளால் ஏற்படும் சேதங்கள்: தடுப்பதற்கான நடவடிக்கை
## DAMAGES CAUSED BY WILD ELEPHANTS IN BATTICALOA DISTRICT: PREVENTIVE MEASURES

1495/2025

**4. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වනඅලින් විසින් මිනිස් ජීවිත සහ දේපළවලට හානි සිදු කරන බව දන්නේද;

(ii) එම හානි වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) දිස්ත්‍රික්කයේ මේ වන විට ඉදිකර ඇති අලි වැටවල මුළු දුර ප්‍රමාණය කොපමණද;

(iv) මේ වන විට ඉදිකර ඇති අලි වැටවල් කඩා බිඳ දමමින් වනඅලින් ජනාවාස සහ වගා බිම්වලට ඇතුළු වන බව දන්නේද;

(v) එය වැළැක්වීම සඳහා මෙම වර්ෂය තුළ අමතර අලි වැට ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දිස්ත්‍රික්කය තුළ අලුතින් අඩවි වන කාර්යාල 05ක් ස්ථාපිත කිරීමට හැකියාව තිබේද;

(ii) උප අඩවි වන කාර්යාල 14ක් ස්ථාපිත කිරීමට හැකියාව තිබේද;

(iii) ඒ සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் காட்டு யானைகள் மனித உயிர்களுக்கும் உடைமைகளுக்கும் சேதம் விளைவிப்பதை அறிவாரா;

(ii) மேற்படி சேதங்களைத் தடுப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

(iii) மாவட்டத்தில் தற்போது அமைக்கப்பட்டுள்ள யானைத் தடுப்பு வேலியின் மொத்த நீளம் யாது;

(iv) ஏற்கனவே அமைக்கப்பட்டுள்ள யானைத் தடுப்பு வேலிகளை உடைத்துத் தரைமட்டமாக்கி குடியிருப்புகள் மற்றும் பயிர் நிலங்களுக்குள் காட்டு யானைகள் உள்நுழைவதை அறிவாரா;

(v) அதனைத் தடுப்பதற்காக இவ்வருடத்தில் மேலதிக யானைத் தடுப்பு வேலிகளை நிர்மாணிப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மாவட்டத்தில் புதிதாக 5 வட்டார வன அலுவலகங்களைத் தாபிப்பதற்குரிய சாத்தியக்கூறு உள்ளதா;

(ii) 14 உப வட்டார வன அலுவலகங்களைத் தாபிப்பதற்குரிய சாத்தியக்கூறு உள்ளதா;

(iii) அவற்றுக்குத் தேவையான மனித மற்றும் பௌதிக வளங்களை வழங்குவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that wild elephants cause damage to human lives and property in the Batticaloa District;

(ii) the measures that have been taken to prevent the said damages;

(iii) the total length of the elephant fences that have been constructed in the district by now;

(iv) whether he is aware that wild elephants enter human settlements and agricultural lands by breaking down the elephant fences constructed by now; and

(v) whether action will be taken to construct additional elephant fences during this year to prevent it?

(b) Will he also inform this House whether -

(i) it is possible to establish five new Range Forest Offices within the said district;

(ii) it is possible to establish 14 Sub-Range Forest Offices; and

(iii) action will be taken to provide the human and physical resources required for that purpose?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

(අ) (i) ඔව්.

(ii) 1. 2026 වර්ෂයේ මේ දක්වා දිග කිලෝමීටර 216.77ක ප්‍රමාණයකින් යුතු විදුලි වැටවල් මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකර ඇත.

2. එමෙන්ම මෙම දිස්ත්‍රික්කය තුළ 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම යටතේ විදුලි වැට ඉදිකිරීම සඳහා කිලෝමීටර 85.4ක් වෙනුවෙන් ප්‍රතිපාදන නිදහස් කර ඇත.

3. මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද විදුලි වැට නඩත්තුව සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින් 136ක් හා බහුකාර්ය සංවර්ධන සහායකයින් 131ක් මඟින් නඩත්තු කටයුතු සිදු කරගෙන යනු ලබයි.

4. වනඅලි-මිනිස් ගැටුම වැළැක්වීම සඳහා ජාතික විදුලි වැට ස්ථාපිත කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන යටතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ වනඅලින් ජනාවාසවලට හා ගොඩබිම්වලට ඇතුළුවීම වැළැක්වීම සඳහා දැනට පවත්නා විදුලි වැට පද්ධතියට අමතරව පවත්නා විදුලි වැට පද්ධතිය දීර්ඝ කිරීමට සැලසුම් කර ඇත.

5. වනජීවී කලාපවල වනඅලින් විසින් සිදු කරන වගා හානි අවම කිරීමටත්, දෛනිකව වනඅලි පලවා හැරීමේ කටයුතු සඳහාත් අලි වෙඩි මිලදීගෙන බෙදා හැරීමට කටයුතු කරයි.

6. වනඅලි විසින් සිදු කරන ජීවිත හානි, දේපළ හානි සඳහා වන්දි ගෙවීමට කටයුතු කිරීම.

(iii) කිලෝමීටර 216.77කි.

(iv) ඔව්.

ජන ජීවිතයට වනඅලින්ගෙන් සිදු වන බලපෑම අවම කිරීම සඳහා විදුලි වැට සාර්ථක කළමනාකරණ මෙවලමක් වශයෙන් හඳුනා ගෙන තිබුණද, සමහර වනඅලින් විදුලි වැට බිඳ දමා ගම්මානවලට ප්‍රවේශ වීමේ සම්භාවිතාවක් නිරීක්ෂණය වේ. එමෙන්ම විදුලි වැට යනු, වනඅලින්ට මානසික බාධකයක් වන අතර, එය භෞතික බාධකයක් වශයෙන් ක්‍රියාත්මක නොවේ. ඒ හේතුව මත විදුලි වැට බිඳ දැමීම සඳහා හුරු වූ වනඅලින් එම ක්‍රියාව සිදු කර ගම්මානවලට ප්‍රවිෂ්ටවීමේ හැකියාවක් පවතින අතර, එහි අතුරු ප්‍රතිඵල වශයෙන් අනපේක්ෂිත සිදුවීම් වාර්තාවීමට ඉඩ ඇත.

(v) ඔව්.

2026 වර්ෂය සඳහා කිලෝමීටර 85.4ක දිගින් යුත් විදුලි වැට ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ අඩවි වන කාර්යාල 3ක් ස්ථාපිත කර ඇත. ඒ අනුව දැනට ස්ථාපිත කර ඇති කාර්යාල ගණන ප්‍රමාණවත්ය.

(ii) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ බීට්ටු වන කාර්යාල 12ක් ස්ථාපිත කර ඇති අතර, එම කාර්යාල ගණන ප්‍රමාණවත්ය.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் புதிதாக 85.4 கிலோமீற்றர் யானை வேலி அமைப்பதற்கு நிதி ஒதுக்கப்பட்டு இருப்பதாக நீங்கள் கூறினீர்கள். ஆனால், உண்மையிலேயே 96 கிலோமீற்றர் யானை வேலி அமைப்பதற்கு உங்களுடைய அரசாங்கம் நிதி ஒதுக்கியிருக்கிறது. அதற்கு எங்களுடைய நன்றியை தெரிவித்துக் கொள்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, இதற்கான நிதி ஒதுக்கீட்டை உங்களுடைய அமைச்சு மேற்கொண்டாலும், யானை வேலி அமைப்பதற்குத் தேவையான சில பொருட்களை பல்வேறு நாடுகளிலிருந்து இறக்குமதி செய்யவேண்டி இருப்பதால் அப்பொருட்கள் அனைத்தும் இன்னும் கிடைக்கவில்லை. இதனால் அந்த வேலைத்திட்டம் ஆரம்பிக்கப்படாமல் இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த ஆண்டு நீங்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகை தந்தபோது, நாங்கள் உங்களிடம் முன்வைத்த, புதிதாக Sub-Range Forest Offices அமைப்பது சம்பந்தமான கோரிக்கைக்கு நீங்கள் அந்த இடத்திலே இணக்கப்பாடு தெரிவித்திருந்தீர்கள். அதாவது, மாவட்ட மட்டத்தில் நடந்த விசேட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் புதிதாக 5 sub-officesஐ உருவாக்குவதற்கு நீங்கள் இணக்கப்பாடு தெரிவித்திருந்தீர்கள். ஆனால், இன்று நீங்கள் உங்களுடைய பதிலில் அவை போதியளவு இருப்பதாகக் குறிப்பிட்டு இருக்கின்றீர்கள். அதுமாத்திரமல்ல, மட்டக்களப்பு மாவட்டத்தில் Department of Wildlife Conservationக்குத் தேவையான ஆளணியை புதிதாக ஆட்சேர்ப்புச் செய்வதன் மூலம் பெற்றுத் தருவதாகவும், அப்படி இல்லாவிட்டால் casual basisஇல் அல்லது contract basisஇல் எடுக்கக்கூடியவர்களை எடுக்கலாம் என்றும் சொல்லப்பட்டது.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் போரதீவுப்பற்று பிரதேச செயலாளர் பிரிவில் இந்த 96 கிலோமீற்றரில் ஒரு கிலோமீற்றர்கூட உள்வாங்கப் படவில்லை. அதையும் நாங்கள் ஒரு தேவையாக முன்வைத்திருந்தோம். அது என்ன காரணத்துக்காக உள்வாங்கப்படவில்லை என்று தெரியவில்லை. கடந்த வாரம்கூட, ஒரு யானை கிராமத்துக்குள் வந்து பாரிய சேதங்களை ஏற்படுத்திச் சென்றிருந்தது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் சொன்ன விடயங்களைத் தற்பொழுது நடைமுறைக்குக் கொண்டுவருவதில் சிக்கல்கள் இருக்கின்றன. உங்களுக்குப் புதிதாக வாகனங்கள் - single cabs மற்றும் double cabs - கிடைத்திருக்கின்றன. அவற்றில் எத்தனை மட்டக்களப்பு மாவட்டத்துக்கு ஒதுக்கப்பட்டு இருக்கின்றதென கடந்த முறை எங்களுடைய wildlife officer சுரேஷிடம் வினவியபோது, அவர் தெரியாதெனச் சொல்லியிருந்தார். நான் கேட்கின்ற விடயம் வேறு எதுவுமல்ல, மட்டக்களப்பு மாவட்டம் யானை - மனித மோதல் உச்சக்கட்டத்தில் இருக்கின்ற ஒரு மாவட்டம் என்பதை அடிப்படையாகக்கொண்டு நீங்கள் எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் இணங்கிய விடயங்களை எப்போது நடைமுறைக்குக் கொண்டுவருவீர்கள்? என்றுதான்.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කරුණු සම්බන්ධයෙන් අපි සලකා බලන්න සූදානම්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා

විධිමත් ලෙස ඔබතුමාගේ යෝජනාව අපිට ඉදිරිපත් කරනවා නම් ඊට පස්සේ අපට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන පියවර ගන්න පුළුවන්. අපි උත්සාහ කරන්නේත් කෙසේ හෝ මේ වනඅලි-මිනිස් ගැටුම අවම කරන්නයි. ඒ සඳහා ඔබතුමන්ලා ලබා දෙන සහයෝගයට අපි ස්තුතිවන්ත වෙනවා. මම අද ඉදිරිපත් කළේ මේ මොහොතේ පවතින තත්ත්වය පිළිබඳවයි. විධිමත් ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා යෝජනා සම්මතයක් එවනවා නම් අවශ්‍ය විධියට ඒවා වෙනස් කර ගන්න අපට පුළුවන්.

වාහන ලබා දීම සම්බන්ධයෙන් ගත්තොත්, විශේෂයෙන්ම single cabs ලබා දීම පිළිබඳව අපි කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කරන්න ඉන්නේ, මේ ප්‍රමාණවලින් මේ, මේ දිස්ත්‍රික්කවලට ලබා දෙන්න කියලා. මම ඔබතුමාට ඒ විස්තර ටික ලැබෙන්න සලස්වන්නම්. අපි දිස්ත්‍රික්ක හැටියටම නොවෙයි, කලාප හැටියට තමයි ඒවා වෙන් කරලා තිබෙන්නේ. ඒ කලාපයට අපි වෙන් කරන වාහන ප්‍රමාණය දිස්ත්‍රික්කයට ගැළපෙන විධියට හදා ගන්න පුළුවන්. ඔබතුමා අහලා තිබෙන්නේ මේ යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන එකයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියෙන් ඔබතුමන්ලාගේ යෝජනා ටික අපට විධිමත් ලෙස ආවොත් අපට ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු අමාත්‍යතුමනි, මම දෙමළ භාෂාවෙන් අතුරු ප්‍රශ්නය අහපු නිසා interpretationවල මොනවා හරි අඩුපාඩුවක් වුණාද දන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, මේවා ඔබතුමා මඩකලපුවට පැමිණි අවස්ථාවේදී පැවති විශේෂ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ යෝජනා. කැබිනට් අමාත්‍යවරයා වශයෙන් ඔබතුමාට ඒ රැස්වීමේදී ඉදිරිපත් කරපු යෝජනා වාගේම ඔබතුමා ඒ රැස්වීමේදී එකඟ වෙච්ච යෝජනා ටික ක්‍රියාත්මක කිරීම ගැන තමයි මම ඇහුවේ. ඊට පස්සේ අලුතින් ගත්ත තීන්දු තීරණ ගැන නොවෙයි මම ඇහුවේ. ඒකට කමක් නැහැ.

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

நீங்கள் விரும்பினால் இதற்குப் பதில் அளிக்கலாம் அல்லது பதில் அளிக்காமலும் விடலாம். உங்களுடைய subjectக்குள் வருவதனால்தான் நான் இந்த வினாவைக் கேட்கின்றேன். உங்களுடைய தேசிய மக்கள் சக்தியின் மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கந்தசாமி பிரபுவும் நானும் இணைந்து இந்த வினாவை இந்தச் சபையில் முன்வைப்பதாக இணங்கியிருந்தோம். ஆனால், இன்று அவரால் வரமுடியாமல் போய்விட்டதென நினைக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பில் உன்னிச்சை என்ற பிரதேசம் பாரிய நிலப்பரப்பைக் கொண்ட ஒரு பிரதேசம் என்பது உங்களுக்குத் தெரியும். அந்தப் பிரதேசத்தில் வவுணதீவு - மண்முனை மேற்கு பிரதேச சபையால் புதிய proposal ஒன்று முன்வைக்கப்பட்டது. அது ஓர் அரசாங்கத் திணைக்களம். அந்த proposalக்குத் தேவையான காணியை விடுவிப்பதில் Department of Forest Conservationஉம் Wildlife Conservation Departmentஉம் இழுபறியாக இருக்கின்றன. நீங்கள் இந்த விடயத்தைச் சாதகமாகப் பரிசீலனை செய்து, சிறிய நிலப்பரப்பைக் கொண்ட அந்தக் காணியை விடுவித்துத் தந்தால், வவுணதீவு - மண்முனை மேற்கு பிரதேச சபையால் முன்னெடுக்க இருக்கின்ற அபிவிருத்தித் திட்டங்களுக்கு உதவியாக இருக்கும். அதை நீங்கள் செய்துதர வேண்டுமென்ற கோரிக்கையை முன்வைக்கின்றேன். அந்தக் காணியை விடுவிப்பதாக இருந்தால், அதற்கு என்ன ஆவணங்கள் உங்களுக்குத் தேவையென நான் கேட்கின்றேன். கௌரவ சபாநாயகர் அவர்களே, இந்த வினா பிரதான வினாவுடன் நேரடியாகத் தொடர்புபடாததால், கௌரவ அமைச்சர் அவர்கள் விரும்பினால் மட்டும் பதில் வழங்கலாம். நன்றி.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, මමත් සම්බන්ධ වෙච්ච මඩකලපුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඔබතුමා කියූ විධියට ඒ යෝජනා ටික පිළිබඳව සාකච්ඡා වුණා. ඒ යෝජනා ටික විධිමත්ව ලැබුණා නම් අපිට ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඒ ටික යවලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

මම ඒ ගැන සොයා බලන්නම්.

ගරු මන්ත්‍රීතුමා අහපු දෙවැනි කාරණය සම්බන්ධයෙන් මේ මොහොතේදී මට නිශ්චිත දෙයක් කියන්න බැහැ. නමුත් අපි ඒ ගැනත් සොයා බලා ඔබතුමාට දැනුම් දීමක් කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

## මරගල කඳු වැටිය: පාරිසරික ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

'மரகல' மலைத்தொடர்: சுற்றாடல் பாதுகாப்பு வலயமாகப் பிரகடனப்படுத்தல்

MARAGALA MOUNTAIN RANGE: DECLARATION AS ENVIRONMENTAL PROTECTION AREA

2055/2026

5. **ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි 'මරගල' කඳු වැටිය පාරිසරික ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේද;

(ii) එසේ නම්, එහි භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම පාරිසරික ආරක්ෂණ කලාපයට අදාළ මායිම් සලකුණු කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර තිබේද;

(iv) එම කඳු වැටියේ රක්ෂිත සීමාව තුළ නීති විරෝධී ලෙස පදිංචිවීම් හෝ අනවසර වගා බිම් පවත්වාගෙන යෑම පිළිබඳව වාර්තා වී තිබේද;

(v) එසේ නම්, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සහ රක්ෂිතය ආරක්ෂා කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මරගල කඳු වැටිය ආශ්‍රිත ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද දිනය කවරේද;

[ගරු නිතිඥ සරත් කුමාර මහතා]

(ii) එලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කර තිබේද;

(iii) එසේ නම්, නිරවුල් කරන ලද භූමි ප්‍රදේශය තුළ පෞද්ගලික ඉඩම් වශයෙන් නිරවුල් කර ඇති ඉඩම් තිබේද;

(iv) පාරිසරික ආරක්ෂණ කලාපය ලෙස ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් නිරවුල් කරන ලද පෞද්ගලික ඉඩම් භාවිතයට බාධා ඇති වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தில் அமைந்துள்ள 'மரகல' மலைத்தொடர், சுற்றாடல் பாதுகாப்பு வலயமாகப் பிரகடனப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதன் நிலப்பரப்பு யாது என்பதையும்;

(iii) மேற்படி சுற்றாடல் பாதுகாப்பு வலயத்துக்குரிய எல்லைகளை குறிக்கும் பணிகள் முழுமையாக நிறைவு செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) மேற்படி மலைத்தொடரின் ஒதுக்கப்பட்ட எல்லைக்குள் சட்டவிரோதமான முறையில் குடியேற்றங்களை அல்லது அனுமதியற்ற பயிர்ச்செய்கை நிலங்களை நடாத்திச் செல்வது குறித்து அறிக்கையிடப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அனுமதியற்ற குடியிருப்பாளர்களை அகற்றுவதற்கும் ஒதுக்கப்பட்ட நிலத்தைப் பாதுகாப்பதற்கும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'மரகல' மலைத்தொடரைச் சார்ந்த பிரதேசம் சுற்றாடல் பாதுகாப்பு வலயமொன்றாகப் பிரகடனப்படுத்தப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அவ்வாறு பிரகடனப்படுத்தப்படுவதற்கு முன்னர், காணி உரித்து நிர்ணயத் திணைக்களத்தால் அது நிர்ணயம் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வாறு நிர்ணயம் செய்யப்பட்ட நிலப்பரப்புக்குள் தனியார் காணிகளாக நிர்ணயம் செய்யப்பட்ட காணிகள் எவையேனும் உள்ளனவா என்பதையும்;

(iv) சுற்றாடல் பாதுகாப்பு வலயமொன்றாகப் பிரகடனப்படுத்தப்பட்டதன் காரணமாக, நிர்ணயம் செய்யப்பட்ட தனியார் காணிகளைப் பயன்படுத்துவதற்குத் தடைகள் ஏற்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether the Maragala mountain range in the Monaragala District has been declared an Environmental Protection Area;

(ii) if so, the total area of land covered by the aforesaid mountain range;

(iii) whether the demarcation of boundaries of the aforesaid Environmental Protection Area has been finalized;

(iv) whether any instances of unauthorized settlements or unlawful cultivations within the boundaries of the said mountain reserve have been reported; and

(v) if so, the courses of action that will be taken by the Government to remove the unauthorized occupants and safeguard the reserve?

(b) Will he also inform this House -

(i) the date on which the area surrounding the Maragala mountain range was declared an Environmental Protection Area;

(ii) whether the concerned lands have been settled by the Department of Land Title Settlement prior to such declaration;

(iii) if so, whether there are any lands within the settled area that have been settled as private lands; and

(iv) whether the use of the settled private lands has been disrupted owing to the declaration of the area as an Environmental Protection Area?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) හෙක්ටෙයාර 5,460ක් පමණ.

(iii) මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේදී එහි මායිම් ලෙස පවතින භෞතික මායිම් සලකා ඇති බැවින් (මාර්ග පද්ධතිය) මායිම් සලකුණු කිරීමක් සිදු කර නොමැත.

(iv) වාර්තා වී ඇත.

(v) අනවසර වගාකරුවන්ගේ තොරතුරු සහ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත.

එහි කිසියම් විස්තර ප්‍රමාණයක් තිබෙනවා. අනවසර පදිංචිකරුවන් 8දෙනෙකු හඳුනාගෙන තිබෙනවා. භූමි ප්‍රමාණයන් සම්බන්ධයෙනුත් විස්තරයක් තිබෙනවා. ඇමුණුම පහත දැක්වේ.

ඇමුණුම

| කාරණය | අනවසර වගාකරු | භූමි ප්‍රමාණය | වසම | මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ගත් ක්‍රියාමාර්ග | වෙනත් |
|---|---|---|---|---|---|
| අනවසර රාජ අල වගාව (2025 වර්ෂය) | 1. රාසු පෙරියසාමි, අලියාවත්ත, මොනරාගල | අක්කර 01 | අලියාවත්ත ග්‍රා.නි. | 1. වගා කටයුතු නවතා භූමිය නැවත ප්‍රතිස්ථාපනය කිරීමට නියෝග කිරීම | |
| | 2. ඩී. ගෝපාල් ක්‍රිෂ්නන්, අලියාවත්ත, මොනරාගල | අක්කර ½ | අලියාවත්ත ග්‍රා.නි. | 2. ඉඩමේ අයිතිය තහවුරු කර දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත දන්වා ඇත. | |
| අනවසර කෙසෙල්, ගම්මිරිස් සහ පුවක් වගාව (2020 වර්ෂය) | 1. කුප්පන් ධර්මරාජා, කුමාර දොල පාර, මරගල | අක්කර ½ | අලියාවත්ත ග්‍රා.නි. | 1. තවදුරටත් වගා කටයුතු නතර කරන ලෙසත් දින 14 ඇතුලත භූමිය නැවත ප්‍රතිස්ථාපනය කිරීමටත් නියෝග කිරීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම වගාකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත. |
| | 2. කවුන්ඩර් ඉලන්ගේෂ්වර්, මදුරුකැටිය, මොනරාගල | අක්කර 2 | අලියාවත්ත ග්‍රා.නි. | | |
| | 3. කේ. සිංහරාජා, කුමාරදොළ පාර, මරගල | අක්කර ½ | අලියාවත්ත ග්‍රා.නි. | | |
| | 4. එස්. ෂම්මුගරාජා, කුමාරදොල පාර, මරගල | අක්කර 2 | අලියාවත්ත ග්‍රා.නි. | | |
| | 5. මොහාන් රාජ්, මදුරුකැටිය, මොනරාගල | අක්කර 1 ½ | අලියාවත්ත ග්‍රා.නි. | | |
| | 6. කුප්පන් ෂම්මුගරාජා, කුමාරදොල පාර, මරගල | අක්කර ½ | අලියාවත්ත ග්‍රා.නි. | | |

(ආ) (i) මෙම ප්‍රදේශය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව 560/26 දරන 2008.08.01 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

(ii) ජාතික පාරිසරික පනතේ 24 'ඇ' සහ 'ඈ' වගන්ති ප්‍රකාරව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේදී ඉඩම් අයිතිය පිළිබඳ තහවුරු කර ගැනීමක් හෝ ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු නොකරන අතර, ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශයේ භූමියේ කළමනාකරණ කටයුතු පමණක් සිදු කරන අතර, අදාළ ප්‍රදේශයේ පරිසර සංවේදීතාව සලකා නීතිමය රැකවරණයක් ලබා දේ.

(iii) පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු නොකරන බැවින් ඉඩම් නිරවුල් කිරීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

(iv) මරගල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය ගැසට් නිවේදනයේ ii වන උපලේඛනයේ සඳහන් අවසරලත් භාවිතයන් පමණක්, iii වන උපලේඛනයේ සඳහන් කොන්දේසිවලට යටත්ව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන සිදු කිරීමට හැකියාව පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලද ආකාරයට 2008.08.01 දිනැති ගැසට් පත්‍රය මඟින් මරගල කඳුවැටිය පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. එම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති කලාපය තුළම, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් 1975.01.21 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව, නිරවුල් කරන ලද ඉඩම් යම් ප්‍රමාණයකුත් අන්තර්ගතව තිබෙන බවට තමයි අපට තොරතුරු ලැබෙන්නේ. ඒ අනුව එවැනි නිරවුල් කිරීමේ ගැසට් පත්‍රයක් නිකුත් කර ඇත්නම් ඊට පසු ප්‍රකාශයට පත් කරන ලද පරිසර ආරක්ෂණ කලාපය සම්බන්ධයෙන් වන ගැසට් පත්‍රයත්, අර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයත් - ඒ ලේඛන දෙකම - නීත්‍යනුකූලව වලංගු ලේඛන ද යන්න දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, ඒ දෙකම නීත්‍යනුකූල ලේඛන දෙකක්. මේ පරිසර ආරක්ෂණ ප්‍රදේශය තුළ විවිධ අයිතීන් සහිත ඉඩම් තිබෙන්න පුළුවන්. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුවක් පැන නඟින්නේ නැහැ. නමුත් අපි මේ ප්‍රදේශයේ කරන්නේ, පාරිසරික සංවේදී කලාපයක් හැටියට කළමනාකරණය කිරීමක්. ඒ වෙනුවෙන් කමිටුවක් පත්කර තිබෙනවා. ඒ කමිටුවේ සභාපතිවරයා වන්නේ අදාළ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා. ඒ වාගේම ලේකම්වරයා හැටියට කටයුතු කරනවා, මධ්‍යම පරිසර අධිකාරිය විසින් පත් කරන ලද නිලධාරියෙක්. ඒ ප්‍රදේශයට අදාළ කළමනාකරණයක් තමයි කෙරෙන්නේ. ඒ නිසා ඉඩම් අයිතිය පිළිබඳව ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමාගේ පිළිතුර අනුව, නිකුත් කරන ලද ගැසට් පත්‍ර දෙකම නීත්‍යනුකූල, වලංගු ලේඛන. ඒ අනුව මේ වනවිට ඒ ප්‍රදේශය තුළ ඇතිවෙලා තිබෙන ප්‍රායෝගික තත්ත්වය තමයි, ඇල්ලේ කෝන, ගෝනතලාව, ඔබ්බේගොඩ, බෙරලියපොල, කිඹුලාවෙල යන ග්‍රාම නිලධාරි වසම්වල තිබෙන, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කරන ලද ඉඩම් යම් ප්‍රමාණයක් මේ පාරිසරික කලාපය තුළ අන්තර්ගත වීම. ඒ නිසාම ඒ නිරවුල් කරන ලද ඉඩම්ලාභීන්ට තමන්ට අවශ්‍ය ආකාරයට ඒ ඉඩම්වල කටයුතු කිරීම සඳහා නීත්‍යනුකූල බාධාවක් ඇතිවෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මේ පාරිසරික ආරක්ෂණ කලාපය ගැසට් කරන අවස්ථාවේදී එය නිරවුල්, නිවැරදි මිනුමකට යටත්ව සිදු කරලා නැහැ. එහෙම නැත්නම් මේ සම්බන්ධයෙන් මානක වාර්තාවක් නිකුත් කරලා නැහැ. ඒ නිසා පාරිසරික ආරක්ෂණ කලාපය හඳුනා ගැනීම සඳහා ප්‍රකාශයට පත්කරන ලද ගැසට් එකේ සඳහන් මායිම් ප්‍රමාණයන් වඩා නිරවුල් නැති බව තමයි අපේ අදහස. ඒ නිසා මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු කරලා මෙම පාරිසරික කලාපය නැවත හඳුනාගැනීම සඳහා survey එකක් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

ඊට අමතරව, දැනට ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව තමන් විසින්ම දශක ගණනාවක් තිස්සේ සංවර්ධනය කරන ලද ඉඩම් භුක්ති විඳීම සහ හිමිකම්පෑම සම්බන්ධයෙන් දැනට මතුවෙලා තිබෙන තත්ත්වය නිරවුල් කරන්නට අමාත්‍යාංශය මඟින් මේ වන විට යම් පියවරක් ගෙන තිබෙනවාද, එහෙම නැත්නම් පියවරක් ගන්න බලාපොරොත්තු වෙනවාද කියන කාරණය මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, මේ ප්‍රදේශය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් නිසා ඒ ප්‍රදේශයේ ඉඩම් හිමිකරුවන්ගේ ඉඩම් කළමනාකරණය කරගන්න වෙන්නේ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් කළමනාකරණය කරන නීති-රීතිවලට යටත්වයි. ඒ සම්බන්ධව ii වන උපලේඛනයේත්, iii වන උපලේඛනයේත් සඳහන් වෙනවා. ඊට අමතරව, ඒ කළමනාකරණ කමිටුව විසින් අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා. ඒ නිසා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් කළමනාකරණය කරන සීමාව තුළ ඒ අවශ්‍ය කරන

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

වෙනස්කම් ඉඩම් හිමියන්ට කරගන්න පුළුවන්. ඒක තමයි ඒ තත්ත්වයට අදාළ නීතිමය තත්ත්වය. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන ගැටලුව සම්බන්ධයෙන් අපි නැවත සලකා බලන්න සූදානම්. විශේෂයෙන්ම ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් විධිමත් දැනුම්දීමක් කරන්න. අපට ඒ ගැටලු නිරාකරණය කිරීම සඳහා මැදිහත් වෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -2113/2026- (1), ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -2128/2026- (1), ගරු සුජීව දිසානායක මහතා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
ගරු කථානායකතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2139/2026- (1), ගරු දිනේෂ් හේමන්ත මහතා.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -2181/2026- (1), ගරු චමින්ද ලලිත් කුමාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## "අපි වෙනුවෙන් අපි" අරමුදල: විස්තර
‘அபி வெனுவென் அபி’ நிதியம்: விபரம்
"API WENUWEN API" FUND: DETAILS

2188/2026

**10. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "අපි වෙනුවෙන් අපි" අරමුදල පිහිටුවා ඇති පනත සහ එහි ප්‍රධාන කාර්යභාරය කවරේද;

(ii) අරමුදල මඟින් නිවාස ආධාර ලබා දීම සඳහා සුදුසුකම් ලබන සන්නද්ධ සේවා සාමාජිකයන් කවුරුන්ද;

(iii) අරමුදලේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන නිලධාරින් කවුරුන්ද;

(iv) අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අරමුදලේ මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක කළ යුතු බවත් අරමුදල රජයේ විගණනයකට ලක් කළ යුතු බවත් පිළිගන්නේද;

(ii) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) අරමුදල යටතේ ක්‍රියාත්මක වන `පූර්ණ නිවාස' සහ `අර්ධ නිවාස' ව්‍යාපෘති යනු කවරේද;

(ii) නිවසක් මිල දී ගැනීමට හෝ ඉදි කිරීමට ලබා දෙන මූල්‍ය ආධාර ප්‍රමාණය තීරණය කරනු ලබන පදනම කවරේද;

(iii) මේ වන විට ඉදි කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ණය බරින් පීඩාවට පත් රණ විරුවන් සඳහා අරමුදල මඟින් මූල්‍යමය සහන ලබා දීමේ හැකියාවක් තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அபி வெனுவென் அபி’ நிதியம் எச்சட்டத்தின்கீழ் நிறுவப்பட்டது என்பதையும், அதன் பிரதான பணிப்பொறுப்புகள் யாவை என்பதையும்;

(ii) மேற்படி நிதியத்தினூடாக வீடமைப்பு உதவி யைப் பெறத் தகுதியுடைய ஆயுதப்படை அங்கத்தவர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி நிதியத்தின் நிருவாக மற்றும் முகாமைத்துவ நடவடிக்கைகளை மேற் கொள்ளும் உத்தியோகத்தர்கள் யாவர் என்பதையும்;

(iv) மேற்படி நிதியத்தின் பிரதான வருமான மூலங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிதியத்தின் நிதி மற்றும் நிருவாக நடவடிக்கைகள் அரசிறைக் கொள்கைக்கு அமைவாக நடைமுறைப்படுத்தப்பட வேண்டும் என்பதையும், அந்நிதியம் அரசாங்கக் கணக் காய்வுக்கு உட்படுத்தப்பட வேண்டும் என்ப தையும் அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) 2024ஆம் ஆண்டுக்கான நிதிக்கூற்றுகளும் கணக் காய்வாளர் தலைமையதிபதியின் அறிக்கையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கப்பட்டுள்ள னவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி நிதியத்தின்கீழ் நடைமுறைப்படுத்தப் படுகின்ற 'முழுமையான வீடமைப்பு' மற்றும் 'பகுதியளவிலான வீடமைப்பு' கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) வீடொன்றைக் கொள்வனவு செய்வதற்கோ அல்லது நிர்மாணிப்பதற்கோ வழங்கப்படும் நிதியுதவியின் தொகை எவ்வடிப்படையில் தீர்மானிக்கப்படுகின்றது என்பதையும்;

(iii) இதுவரையில் நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) கடன் சுமையால் பாதிக்கப்பட்டுள்ள இராணுவ வீரர்களுக்கு மேற்படி நிதியத்தின் ஊடாக நிதிசார் நிவாரணங்களை வழங்குவதற்கான இயலுமையுள்ளதா என்பதையும்;

(v) இன்றேல், ஏன் என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House the -

(i) Act under which the "Api Wenuwen Api" Fund was established, and the main function of the said Fund;

(ii) members of the armed forces who are eligible to receive housing assistance under the said Fund;

(iii) officers responsible for the administration and management of the said Fund; and

(iv) main sources of income of the said Fund?

(b) Will he also inform this House -

(i) whether he admits that the financial and administrative affairs of the Fund should be carried out in accordance with State fiscal policies, and that the Fund should be subjected to government audit; and

(ii) whether the Financial Statements for the year 2024 of the said Fund and the Auditor-General's Report thereon have been presented to Parliament?

(c) Will he further inform this House -

(i) the 'Full House Grant' and 'Half House Grant' projects implemented under the said Fund;

(ii) the basis on which the amount of financial assistance granted for the purchase or construction of a house is determined;

(iii) the number of houses completed thus far;

(iv) whether there is a possibility to provide financial assistance through the said Fund to war heroes with indebtedness; and

(v) if not, why?

(d) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ "අපි වෙනුවෙන් අපි" අරමුදල සබැඳිව ප්‍රශ්න කිහිපයක්. ගරු ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදල් පනත යටතේ "අපි වෙනුවෙන් අපි" අරමුදල ස්ථාපිත කර ඇත.

සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස ඉදි කිරීම පිණිස මූල්‍යමය සහාය ලබා දීම සඳහා යෝජනා ක්‍රම ඇති කිරීම, නිවාස පහසුකම් ලබා ගැනීම සඳහා ආධාර ලබා දීම, මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සහ එම ණය ගෙවීම සඳහා ආධාර ලබා දීම සඳහා විවිධවිධාන සැලැස්වීම සහ මිය යන අවස්ථාවේදී හෝ සටනේදී හෝ අනාථාකාරයකට ස්ථිරව ආබාධිතයෙකු වන අවස්ථාවකදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම "අපි වෙනුවෙන් අපි" අරමුදලේ ප්‍රධාන අරමුණුවල සඳහන් කාර්යභාරය වේ.

(ii) යුද්ධයේදී මිය ගිය, අතුරුදහන්, ආබාධිත හා සේවයෙහි යෙදී සිටින සන්නද්ධ සේවාවල - ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසියේ - සාමාජිකයන්.

(iii) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදලේ 3(1) වගන්තිය අනුව, "අපි වෙනුවෙන් අපි" අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය කළමනාකරණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලබයි. එම මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ.

පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

a) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු

b) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක්

c) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරි ආයතන පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සභාව විසින් නම් කරනු ලබන වරලත් ගණකාධිකාරී සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයෙක්

d) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සභාව මඟින් නම් කරනු ලබන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ සාමාජිකයෙක්

- නීතිය සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හෝ විශේෂඥ දැනුම ඇති තැනැත්තන් අතුරින් රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්.

(iv)
- පරිත්‍යාග,
- රණජයපුර නිවාස ව්‍යාපෘතියේ වාරික මුදල් ලැබීම,

  (රණජයපුර නිවාස සංකීර්ණය තිබෙනවා, අනුරාධපුරයේ.)
- කෙටි කාලීන හා දිගු කාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජන පොලී.

(ආ) (i) ඔව්.

(ii) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ඇ) (i)
- **"අපි වෙනුවෙන් අපි" පූර්ණ නිවාස ව්‍යාපෘතිය**

  තමාටම කියා නිවසක් නොමැති, ක්‍රියාන්විතයේ රාජකාරියේදී මිය ගිය/ආබාධිත තත්ත්වයට පත්වූ ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් (ආබාධිත ප්‍රතිශතය 65ට වැඩි) රණ විරුවන් හෝ මිය ගිය රණ විරුවන්ගේ ළඟම ඥාතීන් සඳහා රු.2,000,000.00ක මූල්‍යාධාරයක් වැය කර හමුදා වැඩ කණ්ඩායම් යොදවා වර්ග අඩි 900කින් පමණ සමන්විත අංග සම්පූර්ණ නිවාස ඉදි කර ලබා දීම.

- **"අපි වෙනුවෙන් අපි" අර්ධ නිවාස ව්‍යාපෘතිය**

  සේවයේ නියුක්ත හෝ විශ්‍රාමික රණ විරුවන් ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිස් රණ විරුවන්ගේ අඩක් ඉදි කර ඇති නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා රු.1,000,000.00ක උපරිමයකට යටත්ව මූල්‍යාධාරයක් පිරිනමා ඉදිකිරීම් සම්පූර්ණ කර දීම.

(ii) "අපි වෙනුවෙන් අපි" පූර්ණ නිවාස ව්‍යාපෘතිය හා අර්ධ නිවාස ව්‍යාපෘතිය මඟින් ලබා දෙනු ලබන උපරිම නිවාස ආධාර මුදල කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කර ඇත.

ඒ අනුව, ලැබෙන අයදුම්පත් සම්මුඛ පරීක්ෂණයට භාජන කර නිර්ණායක සම්පූර්ණ කරන අයදුම්පත් ප්‍රමුඛතාගත කිරීම ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සුබසාධක අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරනු ලැබේ.

ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සුබසාධක අධ්‍යක්ෂවරුන් වෙතින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන එම අයදුම් පත් ත්‍රිවිධ හමුදා ප්‍රමාණ සමීක්ෂක නිලධාරින් වෙත යොමු කර ලබා දෙනු ලබන නිවාස ආධාර ප්‍රමාණය තීරණය වේ.

තවද, මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස මිල දී ගැනීමක් සඳහා මූල්‍ය ආධාර ලබා දෙනු නොලැබේ.

(iii) 2010 සිට 2026 - මේ වර්ෂය - දක්වා සම්පූර්ණ නිවාස 4,571ක් හදා දීලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර ඇමුණුමෙහි දක්වා තිබෙනවා. එම ඇමුණුම මම සභාගත* *කරනවා.*

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| හමුදාව | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | | 2020 | | 2021 | | 2022/23 | | 2024 | | 2025/2026 | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | පූර්ණ නිවාස | අර්ධ නිවාස | |
| යුද්ධ හමුදාව | 71 | 0 | 92 | 0 | 97 | 0 | 251 | 0 | 214 | 17 | 65 | 62 | 69 | 51 | 33 | 62 | 48 | 240 | 25 | 420 | 33 | 200 | 23 | 178 | 26 | 206 | 19 | 120 | 18 | 78 | 2718 |
| නාවික හමුදාව | 10 | 0 | 7 | 0 | 22 | 0 | 98 | 0 | 72 | 5 | 21 | 9 | 24 | 0 | 13 | 27 | 0 | 100 | _ | 174 | 4 | 60 | 5 | 69 | 7 | 59 | _ | 87 | _ | 123 | 996 |
| ගුවන් හමුදාව | 7 | 0 | 8 | 0 | 14 | 0 | 59 | 0 | 44 | 0 | 14 | 4 | 16 | 0 | 12 | 11 | 2 | 60 | _ | 106 | | 40 | | 53 | _ | 38 | _ | 40 | _ | 19 | 547 |
| පොලිසිය | ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රතිලාභීන් සඳහා මෙම වසරේ ප්‍රතිලාභ ලබා දී නොමැත | | | | | | | | | | | | | | | | | | | | 13 | 90 | 1 | | 1 | 89 | _ | 34 | 2 | 80 | 310 |
| එකතුව | 88 | 0 | 107 | 0 | 133 | 0 | 408 | 0 | 330 | 22 | 100 | 75 | 109 | 51 | 58 | 100 | 50 | 400 | 25 | 700 | 50 | 390 | 29 | 300 | 34 | 392 | 19 | 281 | 20 | 300 | |
| | 88 | | 107 | | 133 | | 408 | | 352 | | 175 | | 160 | | 158 | | 450 | | 725 | | 440 | | 329 | | 426 | | 300 | | 320 | | |

(iv) 2008 අංක 6 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදලේ 4 (ඇ) වගන්තිය අනුව, "සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා සහ එම ණය ගෙවීම සඳහා එම සන්නද්ධ සේවා සාමාජිකයන්ට ආධාර ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීමේ" හැකියාව ඇත. ඒ කියන්නේ පනත අනුවම එහි අරමුණුවලත් ඒ ගැන සඳහන් කර තිබෙනවා.

(v) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "අපි වෙනුවෙන් අපි" අරමුදලට අමතරව රණවිරු සේවා අධිකාරිය, ජාතික ආරක්ෂක අරමුදල සහ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සතුව විවිධ අරමුදල් පවතිනවා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි, මෙන්න මේ ආයතන අතර නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් සිදු කර, ඒ විවිධ අරමුදල් විගණනය කරන්න සහ ඒවායෙන් ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධව නිරීක්ෂණයක් කරන්නට යම් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියලා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය බලයට පැමිණියාට පසු ආරක්ෂක අමාත්‍යාංශය මඟින් මේවා සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ජාතික ආරක්ෂක අරමුදල තිබෙනවා. ඊට අමතරව ත්‍රිවිධ හමුදාවල වෙනම අරමුදල් තිබෙනවා. ඒත් එක්කම, "අපි වෙනුවෙන් අපි" අරමුදල තිබෙනවා. ඒ සියලු අරමුදල්වලින් ගොඩක් දුරට එකම කාර්යය තමයි සිද්ධ වෙන්නේ. අපි ඒවා ගැන විශ්ලේෂණයක් කර තිබෙනවා. ඒ අනුව අපි බලනවා, මේ ඔක්කෝම එකට බද්ධ කරලා මේවායේ තිබෙන කාර්යක්ෂමතාව වැඩිකර ප්‍රතිලාභ වැඩිපුර ලබා දෙන්නට. මම පිළිතුර සපයද්දීත් කියූ පරිදි ජාතික විගණන ආයතනයට මේවා විගණනය කිරීම සඳහා සම්පූර්ණ අවකාශය තිබෙනවා. ඒ අනුව අපි කටයුතු කරලත් තිබෙනවා. විශේෂයෙන්ම මේකේ මධ්‍යම දත්ත පද්ධතියක් නැහැ. ඒ කියන්නේ සියලු දේවල් integrate කරලා හදලා නැහැ. ඒ ගැනත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. මධ්‍යම දත්ත පද්ධතියක් හදලා අර ඔබතුමා ඇහුවා වාගේම ඒ ක්‍රමය කරන්නත් අපි සැලසුම් කරගෙන යනවා. බොහෝදුරට එන වර්ෂය විතර වෙද්දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ ගැන කටයුතු කරන්න හැකි වෙයි කියා බලාපොරොත්තු වෙනවා.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මගේ ප්‍රශ්නයේ (ඇ) (iv) කොටසට පිළිතුරු වශයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ණය බරින් පීඩාවට පත් රණවිරුවන් සඳහා ඒ අරමුදල මඟින් මූල්‍ය සහන ලබා දීමට හැකියාවක් තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ විධියට විවිධ ආයතනවලින් ණය අරගෙන විශාල ණය බරකින් පීඩාවට පත් වෙච්ච රණවිරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ට සහන ලබාදීමේ හැකියාවක් තිබෙන බව ඔබතුමා පැවසුවා. ඒ ණය බරින් මිරිකිලා ඉන්න රණවිරුවන් එයින් නිදහස් කර ගැනීම සඳහා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා දැන ගන්නට කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නය ඉතාම වැදගත්. පසුගිය කාලවකවානු තුළ රණවිරුවන් සෑහෙන ප්‍රමාණයක් අප හමුවෙන්න ආවා. අපිත් ඔවුන් හමු වුණා. දිස්ත්‍රික්කවලට ගියාම මහජන දිනවලදීත් ඔවුන් මේ ප්‍රශ්නය නිතරම අපට ඉදිරිපත් කරනවා. ආර්ථික අර්බුදය ආපු වෙලාවේ බැංකුවලින් ගත්ත ඒ ණය පොලී අනුපාත වෙනස් වුණා. ඉතින් ණය ලබා ගත්තාට පස්සේ ඔවුන්ට එය විශාල ලෙස බලපෑවා. "අපි වෙනුවෙන් අපි" අරමුදලේ අරමුණ එහි ව්‍යවස්ථාවේම සඳහන්ව තිබෙනවා. ඒ නිසා ඒ සහනය කොහොමද දෙන්නේ කියන එක පිළිබඳව අපි ඉදිරි කටයුතු කරගෙන යනවා. මොකද, ඒ ගැන විශ්ලේෂණයක් කරන්න ඕනෑ, කොහොමද ඒ සහන වැඩ පිළිවෙළ කරන්නේ කියලා. මූල්‍ය සහනයක් දෙනකොට ඉතාම හොඳින් සලකා බැලිය යුතු කරුණු රාශියක් තිබෙනවා. "අපි වෙනුවෙන් අපි" අරමුදලේ ව්‍යවස්ථාවක් තිබෙනවා. අපි ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. මොකද, රණවිරුවන් විශාල සංඛ්‍යාවක් මේ නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා, දුෂ්කරතාවලට මුහුණ දීලා තිබෙනවා. මේ රජය ඒ වෙනුවෙන්ම විශේෂ අවධානයක් යොමු කරලා ඒ මූල්‍ය ආයතනවලින් අරගෙන තිබෙන ණයවලින් ඔවුන් මුදා ගන්න මේ අරමුදල භාවිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමාත් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ: ආදායම සහ වියදම

### மத்தளை ராஜபக்ஷ சர்வதேச விமான நிலையம்: வருமானமும் செலவும்

### MATTALA RAJAPAKSA INTERNATIONAL AIRPORT: INCOME AND EXPENDITURE

32/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney at Law)
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ විවෘත කළ දිනය කවරේද;

(ii) එම ගුවන්තොටුපළ විවෘත කළ දින සිට මේ දක්වා වාර්ෂික වියදම සහ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගුවන්තොටුපළේ වාර්ෂික ආදායම ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා ]

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்தள ராஜபக்ஷ சர்வதேச விமான நிலையம் திறக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி விமான நிலையம் திறக்கப்பட்ட திகதியிலிருந்து இது வரையிலான வருடாந்த செலவு மற்றும் வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) விமான நிலையத்தின் வருடாந்த வருமானத்தை அதிகரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House the -

(i) date on which the Mattala Rajapaksa International Airport was opened;

(ii) annual expenditure and income of the said Airport from the date of its opening up to now, separately for each year; and

(iii) steps that will be taken to increase the annual income of the Airport?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2013 මාර්තු මස 18 දින (2013.03.18)

(ii)

| වර්ෂය | වාර්ෂික ආදායම (රු.) | වාර්ෂික මෙහෙයුම් වියදම් (රු.) |
|---|---|---|
| 2013 | 48,010,898.00 | 2,297,114,089.00 |
| 2014 | 136,264,763.00 | 2,426,845,638.00 |
| 2015 | 71,635,413.00 | 2,288,694,851.00 |
| 2016 | 48,724,077.00 | 2,339,033,772.00 |
| 2017 | 77,630,640.00 | 2,314,897,394.00 |
| 2018 | 22,990,359.00 | 2,199,763,516.00 |
| 2019 | 17,060,751.00 | 2,190,942,860.00 |
| 2020 | 42,591,707.00 | 2,151,916,749.00 |
| 2021 | 93,471,586.00 | 2,036,770,615.00 |
| 2022 | 77,998,185.00 | 2,033,000,227.00 |
| 2023 | 289,073,346.00 | 2,412,909,070.00 |
| 2024 | 242,263,934.00 | 3,675,939,234.00 |
| 2025 | 257,540,906.00 | 2,523,381,960.00 |
| 2026 (ජුනි 30 දක්වා) | 144,793,439.00 | 1,189,072,452.00 |

(iii) • ගුවන් සංවර්ධන කටයුතු සඳහා සුදුසු ආයෝජකයින් හඳුනා ගැනීම සඳහා අභිලාෂ කැඳවීම (EOI) අවසන් කර ඇත.

• ආයෝජකයන් 19දෙනෙකු විවිධ ක්ෂේත්‍ර සඳහා අභිලාෂ ප්‍රකාශ කර ඇත.

• එම අභිලාෂ ඇගයීම් කටයුතු දැනට සිදුකරගෙන යමින් පවතී.

• අනතුරුව ව්‍යාපෘති යෝජනා කැඳවීම (REP) සිදු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -139/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මාව පාර්ලිමේන්තුවට ගෙනාවේ ප්‍රමාද වෙලා. නමුත්, මම ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

## 2021 සහ 2022 වර්ෂවල කාබනික පොහොර ආනයනය: විස්තර

2021 மற்றும் 2022ஆம் ஆண்டுகளில் சேதனப் பசளை இறக்குமதி: விபரம்

IMPORT OF ORGANIC FERTILIZER IN 2021 AND 2022: DETAILS

139/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2021 සහ 2022 යන වර්ෂවල ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය කොපමණද;

(ii) එම පොහොර ආනයනය කරන ලද සමාගම්/ ආයතනවල නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) විගණන වාර්තාවලට අනුව, එම පොහොර ආනයනය කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් සිදුවූ පාඩුව කොපමණද;

(v) ඊට වගකිව යුතු පුද්ගලයන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(vi) ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2021 மற்றும் 2022ஆம் ஆண்டுகளில் இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட சேதனப் பசளையின் அளவு யாது;

(ii) மேற்படி பசளையை இறக்குமதி செய்துள்ள கம்பனிகள்/நிறுவனங்களின் பெயர்கள் யாவை;

(iii) அதற்காகச் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு;

(iv) கணக்காய்வு அறிக்கைகளுக்கு அமைவாக மேற்படி பசளை இறக்குமதி தொடர்பான பெறுகை நடைமுறை காரணமாக ஏற்பட்ட நட்டம் எவ்வளவு;

(v) அதற்குப் பொறுப்புக்கூறவேண்டிய ஆட்களின் பெயர்கள் மற்றும் பதவிப் பெயர்கள் யாவை;

(vi) அது தொடர்பாக கணக்காய்வு அறிக்கைமூலம் வழங்கப்பட்டுள்ள விதப்புரைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) quantity of organic fertilizer imported into Sri Lanka in 2021 and 2022;

(ii) names of the companies/institutions that imported the said fertilizer;

(iii) amount spent on it;

(iv) loss identified through the audit reports resulting from the procurement process related to the import of the said fertilizer;

(v) names and the designations of the persons responsible for it; and

(vi) recommendations that have been made in the audit report regarding this matter?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2021 වර්ෂයේදී චීනයේ M/s Qingdao Seawin Biotech Group Co. Ltd. වෙතින් Heppo Sprit නෞකාවෙන් කාබනික පොහොර මෙ.ටො.20,550.000 ආනයනය කර ඇත. මෙම පොහොරවල ප්‍රමිතියේ ඇති වී තිබූ ගැටලු සහගත තත්ත්වය හේතුවෙන් එම පොහොර තොගය ශ්‍රී ලංකාව වෙත භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.

2022 වර්ෂයේදී රජයේ පොහොර සමාගම විසින් කාබනික පොහොර ආනයනය කර නොමැති අතර, පෞද්ගලික පොහොර සමාගමක් වන Muller International (Pvt.) Ltd. විසින් පහත පරිදි කාබනික දියර පොහොර ආනයනය කර ඇත.

1. Sterilized Liquid Organic Soil Conditioner/ Fertilizer (Rapid Growth) - 1000L
2. Sterilized Liquid Organic Micro Nutrient (Micro Fud) - 1000L

(ii) 1. සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම චීනයේ M/s Qingdao Seawin Biotech Group Co. Ltd. වෙතින් කාබනික පොහොර ආනයනය කර ඇත. මෙම පොහොරවල ප්‍රමිතියේ ඇති වී තිබූ ගැටලු සහගත තත්ත්වය හේතුවෙන් එම පොහොර තොගය ශ්‍රී ලංකාව වෙත භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.

2. Muller International (Pvt.) Ltd.

(iii) 1. ඉදිරියේදී නිසි ප්‍රමිතියෙන් යුත් පොහොර ලබා දීමේ කොන්දේසිවලට යටත්ව සමථයක් වශයෙන් එම නැව්ගත ප්‍රමාණයේ වටිනාකමින් 75%ක මුදල වන රු.1,382,720,494ක මුදල මහා භාණ්ඩාගාරය විසින් චීනයේ M/s Qingdao Seawin Biotech Group Co. Ltd. වෙත ගෙවීම් කර ඇත.

2. Sterilized Liquid Organic Soil Conditioner/ Fertilizer (Rapid Growth)

ලීටරයක මිල ඇ.ඩො.13.56x1000L = ඇ.ඩො.13,560

3. Sterilized Liquid Organic Micro Nutrient (Micro Fud)

ලීටරයක මිල ඇ.ඩො.6.90x1000L = ඇ.ඩො.6,900

(iv) කාබනික පොහොර මිලදී ගැනීම - රු.1,382,720,494

(මෙම ගැටලුව දෙරට අතර සුහදශීලීව විසඳීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති බැවින්, නීතිමය පියවර ගෙන නොමැත.)

(v) නිලධාරීන් විසින් කාර්ය සාධන බැඳුම්කර සම්බන්ධයෙන් නිසි කලට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බැවින්, ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු නොකරන බව විගණකාධිපතිතුමා වෙත දැනුම් දීම සිදු කර ඇත.

මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

(vi) එම විගණන වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ මේ සමඟ දක්වා ඇත.

1. කාබනික පොහොර මිලදී ගැනීම - ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

*ඇමුණුම:*

පොහොර සමාගම, කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ආදියෙහි වගකීව යුත්තන් සිය වගකීම පැහැර හැර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

9.5 පොදු නිරීක්ෂණ

(අ) පූර්වයෙන් සඳහන් 9.1 (අ) සිට (එ) දක්වා වූ නිරීක්ෂණයන් අනුව සැපයුම්කරු විසින් ආනයනකරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්, සැපයුම්කරු අතර ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව සැපයුම්කරු කටයුතු කර නොමැති බැවින්, සැපයුම්කරු වෙත ණයවර ලිපිය මත ගෙවීම් කිරීම වළක්වාලන නියෝගයක් නිකුත් කරන ලෙසත් රජයේ පොහොර සමාගම් දෙක විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ 2021 ඔක්තෝම්බර් 22 දින පැවරූ නඩුවේදී ගෙවීම් අත්හිටුවීමට අතුරු නියෝගයක් ලබා දී තිබියදී සැපයුම්කරු ශ්‍රී ලංකා රජයට සිදු කරන ලද බලපෑම හා රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා සැලකිල්ලට ගනිමින් නඩුව සමථයකට පත්කර ගැනීමට සැපයුම්කරු සිදු කරන ලද යෝජනාවට ප්‍රතිචාරීව නඩුව සමථයට පත් කර ගැනීම සඳහා 2021 දෙසැම්බර් 13 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අතර, අංක අමප/21/2161/323/030-IX දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එයට අනුමැතිය ලබා දී

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තිබුණු නමුත් මෙම වාර්තාවේ නිරීක්ෂණයන්ට අනුව නඩු නිමිත්ත සඳහා බලපා ඇති බොහෝ කරුණු සම්බන්ධ වගකීම සැපයුම්කරු වෙත විතැන් කළ හැකිව තිබුණු නමුත් ක්‍රියාවලිය තුළ සැපයුම්කරුගේ කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන් කිසිදු අවධානයකින් තොරව ගනුදෙනුවට සම්බන්ධ නිලධාරින් නඩුව සමථයකින් අවසන් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සහාය වීම පිණිස කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021 අගෝස්තු 23 දිනැති ලිපියක් මඟින් කාබනික පොහොර විශේෂඥයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර තිබුණු අතර, එවැනි කමිටුවක් පත් කිරීමට අදාළ නීතිමය පසුබිමක් සම්බන්ධයෙන් හා එම කමිටුව විසින් මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් සිදු කර ඇති කාර්යයන් හා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි හා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

10. නිර්දේශ

(01) අදාළ සුරක්ෂණයන් කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම හෝ සුරක්ෂණයන්ගේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීම හා අත්තිකාරම් ගෙවීමේදී කිසිදු සුරක්ෂණයකින් තොරව අරමුදල් නිදහස් කිරීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව මෙම ගනුදෙනුවට සම්බන්ධ වගකිව යුත්තන්ට එරෙහිව නඩු පවරා අය කර ගැනීම.

(02) ගිවිසුමේ කොන්දේසි හා 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත අනුව ශ්‍රී ලංකාවට ආනයනය කළ නොහැකි ජීවානුහරණය නොකළ, මර්දනය කිරීමට නිර්දේශිත කෘෂි රසායන වර්ගයක් නොමැති බැක්ටීරියා සහිත පොහොර තොගයක් ලංකාවට නැව්ගත කිරීමට ක්‍රියා කිරීම, 2020/2021 මහ කන්නයේදී වී වගාවට අවශ්‍ය පොහොර ගිවිසුම් ප්‍රකාරව ලබා නොදී පාඩුවක් සිදු කිරීම, නොසැපයූ පොහොර තොගයක් වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9කට සමාන ශ්‍රී ලංකා රු.1,382,720,494ක මුදලක් ලබා ගැනීම හා සමථය ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව නෛතිකව කටයුතු කිරීම.

(03) ශ්‍රී ලංකාවේ නීති රීති ප්‍රකාරව හා ගිවිසුම්වලට අනුකූලව ක්‍රියා නොකළ උක්ත සැපයුම්කාර සමාගම ශ්‍රී ලංකාව තුළ අසාදු ලේඛනගත කිරීමට කටයුතු කිරීම.

(ආ) අදාළ නොවේ.

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ඇති ඉඩම් සහ පුරාවිද්‍යා ස්ථාන: අනුරාධපුර දිස්ත්‍රික්කය
## தொல்பொருள் திணைக்களத்துக்குச் சொந்தமான நிலங்கள் மற்றும் தொல்பொருள் தளங்கள்: அநுராதபுரம் மாவட்டம்
## LAND AND ARCHAEOLOGICAL SITES UNDER DEPARTMENT OF ARCHAEOLOGY: ANURADHAPURA DISTRICT

684/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කය තුළ පිහිටි පුරාවිද්‍යා වැදගත්කමකින් යුත් ස්ථාන කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති පුරාවිද්‍යා සොරකම් සහ විනාශ කිරීම් සම්බන්ධ සිදුවීම් සංඛ්‍යාව කොපමණද;

(iv) දිස්ත්‍රික්කය තුළ සේවයේ යොදවා ඇති දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) දිස්ත්‍රික්කය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(vi) පවතින සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தில் காணப்படும் தொல்பொருள் திணைக்களத்துக்குச் சொந்த மான காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) அந்த மாவட்டத்தில் அமைந்துள்ள தொல் பொருளியல் முக்கியத்துவமிக்க இடங்கள் யாவை என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை அந்த மாவட்டத்தில் அறிக்கையிடப்பட்டுள்ள தொல் பொருள் திருட்டு மற்றும் அழிப்புகள் தொடர்பான சம்பவங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மாவட்டத்துக்குள் சேவையில் ஈடுபடுத்தப் பட்டுள்ள திணைக்கள ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மாவட்டத்துக்கான அங்கீகரிக்கப்பட்ட ஊழியர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) நிலவும் ஊழியர் வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House the -

(i) extent of land belonging to the Department of Archaeology in the Anuradhapura District;

(ii) sites of archaeological importance located within the said district;

(iii) number of incidents related to theft and destruction of antiquities reported from the said district since 2015 to date;

(iv) number of employees of the Department deployed for service within the district;

(v) approved cadre for the said district; and

(vi) measures that will be taken to fill the existing vacancies?

(b) If not, why?

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පිළිතුර දීර්ඝ බැවින්, **ඇමුණුම 01**** මඟින් දක්වා ඇත.

(ii) ස්මාරක ලෙස ගැසට් කර නොමැති පුරාවිද්‍යා ස්ථාන **ඇමුණුම 02(I)**** මඟින් දක්වා ඇත.

ස්මාරක ලෙස ගැසට් කර ඇති පුරාවිද්‍යා ස්ථාන **ඇමුණුම 02 (II)**** මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම 03හි දක්වා ඇත.

*ඇමුණුම 03:*

| | අනුරාධපුර දිස්ත්‍රික්කය | පුරාවස්තු සොරකම | පුරාවස්තු විනාශය | පුරාවස්තු සෙවීම සඳහා අනවසර කැණීම් සිදු කිරීම | පනතට ගැනෙන වෙනත් වැරදි | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2015 | | 02 | 01 | 19 | 01 | 23 |
| 2016 | | 02 | 02 | 32 | 01 | 37 |
| 2017 | | 02 | 08 | 53 | 18 | 81 |
| 2018 | | 01 | 04 | 43 | 23 | 71 |
| 2019 | | 01 | 11 | 65 | 05 | 82 |
| 2020 | | 02 | 05 | 31 | 01 | 39 |
| 2021 | | 00 | 07 | 37 | 04 | 48 |
| 2022 | | 06 | 12 | 18 | 01 | 37 |
| 2023 | | 05 | 26 | 51 | 01 | 83 |
| 2024 | | 11 | 50 | 44 | 02 | 107 |
| 2025 | | 13 | 18 | 24 | 00 | 55 |
| 2026 | | 04 | 11 | 24 | 00 | 39 |
| එකතුව | | 49 | 105 | 441 | 57 | 702 |

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(iv) 331කි.

(v) 502කි.

(vi) මුරකරු පුරප්පාඩු 122ක් සහ පුරාවිද්‍යා සහායක පුරප්පාඩු 36ක් පවතින අතර, එම පුරප්පාඩු පිරවීම සඳහා 2026.07.06 දිනෙන් අවසන් වන පරිදි අයදුම්පත් කැඳවා ඇත. 2026 නොවැම්බර් මස සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

සහකාර අධ්‍යක්ෂ තනතුර සම්පූර්ණ කිරීම සඳහාද 2026.08.03 දිනෙන් අවසන් වන පරිදි අයදුම්පත් කැඳවා ඇත. විභාගය පවත්වා සමත් අයදුම්කරුවන් අතරින් තනතුරු පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට නියමිතය.

පුරප්පාඩු වී ඇති අනෙකුත් තනතුරු සඳහාද බඳවා ගැනීමට කැඳවීම් නිවේදන නිකුත් කරීම, බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම වැනි කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

## වතු පාසල්වල ගුරු හිඟය අවම කිරීම: ක්‍රියාමාර්ග
தோட்டப் பாடசாலைகளில் நிலவும் ஆசிரியர் பற்றாக்குறையைக் குறைத்தல்: நடவடிக்கை
MINIMIZATION OF TEACHER SHORTAGE IN ESTATE SCHOOLS: MEASURES TAKEN

2113/2026

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) V.S. Radhakrishnan)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වතු පාසල්වල ගුරු හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පාසල් සඳහා ගුරු සහායකයින් බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍රයක් නිකුත් කර තිබේද;

(iii) මේ වනවිට අත්හිටුවා ඇති එම බඳවා ගැනීම් නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) වතු පාසල් සඳහා ගුරු සහායකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විකල්ප ක්‍රියාමාර්ග තිබේ නම්, ඒවා කවරේද;

(v) ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමේ සංකල්පය අනුව, නාම පුවරුවට පමණක් සීමාවී ඇති වතු පාසල්, ජාතික අධ්‍යාපන පද්ධතියට අන්තර්ග්‍රහණය කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தோட்டப் பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை நிலவுவதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளுக்கு ஆசிரிய உதவியாளர்களை இணைத்துக்கொள்வதற்கான வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) தற்போது இடைநிறுத்தப்பட்டுள்ள மேற்படி ஆட்சேர்ப்புகளை மீள ஆரம்பிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) தோட்டப் பாடசாலைகளுக்கு ஆசிரிய உதவியாளர்களை ஆட்சேர்ப்புச் செய்தல் தொடர்பில் மாற்று நடவடிக்கைகள் முன்னெடுக்கப்படுமாயின், அவை யாவை என்பதையும்;

(v) தேசிய பாடசாலைகளின் எண்ணிக்கையை அதிகரிக்கும் எண்ணக்கருவின் பிரகாரம், பெயர்ப்பலகைகளுக்கு மாத்திரம் மட்டுப் படுத்தப்பட்டுள்ள தோட்டப் பாடசாலைகள் தேசிய கல்வி முறைமைக்குள் உள்ளீர்க்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that there is a shortage of teachers in estate schools;

(ii) whether a gazette has been issued for the recruitment of teaching assistants for aforesaid schools;

(iii) the steps that will be taken to resume the recruitments that have been suspended so far;

(iv) the alternative measures taken regarding the recruitment of teaching assistants for estate schools, if there is any; and

(v) whether estate schools that exist in name only will be absorbed into the national education system in line with the concept of increasing the number of National Schools?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

දිවයිනේ වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්හි පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරු සහායකයන් බඳවා ගැනීමට අදාළව අංක 2389 හා 2024.06.14 දිනැති ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර, ඊට අනුව 2024.08.12 දින බඳවා ගැනීමේ තරග විභාගය පැවැත්වීමට නියමිතව තිබුණි.

(iii) ඉහත බඳවා ගැනීම සඳහා අභියාචනාධිකරණ නඩු අංක CA (Writ) 519/2024 යටතේ නඩු පැවරීම හේතුවෙන් ගරු අධිකරණය විසින් 2024.08.09 දින අදාළ තරග විභාගය පැවැත්වීමට අතුරු තහනම් නියෝගයක් පනවා ඇත. එබැවින් එම නඩුවේ නියෝග මත මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන්ද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත.

(iv) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරින් හා රජයේ සේවයේ නියුතු නොවන සෙසු උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මේ වන විට අයදුම්පත් කැඳවා විභාග පවත්වා ඇත. ඒ අනුව, එකී ගැසට් නිවේදනය ප්‍රකාරව ගුරු සේවයේ පුරප්පාඩු සඳහා මෙම වර්ෂය තුළ උපාධිධාරින් ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇති අතර, වතු පාසල් පුරප්පාඩු සම්පූර්ණ කිරීමද එමඟින් බලාපොරොත්තු වේ.

එමෙන්ම, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් එම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(ආ) ශ්‍රේණියේ පවතින ගුරු පුරප්පාඩු සඳහා 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළ ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇත. එහිදී ශ්‍රීපාද විද්‍යා පීඨය යටතේ අධ්‍යාපනය හදාරන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් සියලුදෙනා වතු පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා අනුයුක්ත කර බඳවා ගැනීමට නියමිතය.

ඒ අනුව, උක්ත බඳවා ගැනීම් මඟින් හා ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ගුරු තුලනය මඟින් වතු පාසල්හි ගුරු සේවයේ පවතින පුරප්පාඩු 2027 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරමි.

(v) නැත.

ජාතික පාසල් සංඛ්‍යාව 1,000ක් දක්වා ඉහළ නැංවීමේ වැඩසටහනට අදාළව, ජාතික පාසල් ලෙස සංවර්ධනය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරවරුන්ගේ එකඟතාව ලද, එහෙත් ජාතික පාසල් බවට පත් නොකරන ලද පාසල්, අදාළ පළාත් සභා මඟින් තවදුරටත් භෞතික සංවර්ධනය හා පරිපාලන කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

## ගම්පහ, කැබැල්ලගහලන්ද සුසාන භූමියට අයත් ඉඩම් කොටසක් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම: ක්‍රියාමාර්ග

## கம்பஹா, கெபெல்லகஹலந்த பொது மயானத்துக்குச் சொந்தமான காணியின் ஒரு பகுதியை பலவந்தமாகக் கையகப்படுத்தல்: நடவடிக்கை

## FORCIBLE AQUISITION OF PART OF LAND BELONGING TO KEBELLAGAHALANDA CEMETERY, GAMPAHA: MEASURES TAKEN

2181/2026

**9. ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44 බී, කලුඅග්ගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කැබැල්ලගහලන්ද සුසාන භූමියට අයත් ඉඩමෙන් කොටසක් පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති බවත්;

(ii) එම ඉඩම් කොටස නැවත සුසාන භූමියට ලබා ගැනීම සඳහා ප්‍රදේශවාසීන් සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සුසාන භූමිය බලහත්කාරයෙන් භාවිත කරනු ලබන පුද්ගලයන්ගෙන් එසේ භාවිත කරනු ලැබූ කාලසීමාව සඳහා යම් මුදලක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

(ii) රජය සතු ඉඩමක් පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් එම පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா மாவட்டத்தின் திவுலபிட்டிய பிரதேச செயலாளர் பிரிவின் இலக்கம் 44B, களுஅக்கல கிராம அலுவலர் பிரிவில் அமைந்துள்ள கெபெல்லகஹலந்த பொது மயானத்துக்குச் சொந்தமான காணியின் ஒரு பகுதி, தனிநபரொருவரால் பலவந்தமாகக் கையகப் படுத்தப்பட்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி காணியை மீண்டும் பொது மயானத்தின் பயன்பாட்டுக்குப் பெற்றுத் தருவதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்ளு மாறு அப்பிரதேச மக்களும் பிரதேச செயலாளரும் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுக்குக் கோரிக்கை விடுத்துள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பொது மயானத்தைப் பலவந்தமாகப் பயன்படுத்துகின்ற ஆட்களிடமிருந்து அவ்வாறு பயன்படுத்திய காலப்பகுதிக்காக ஏதேனும் கட்டணத்தை அறவிடுவதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதை யும்;

(ii) அரசுக்குச் சொந்தமான காணியொன்றைத் தனி நபரொருவர் பலவந்தமாகக் கையகப் படுத்தியமை தொடர்பில் சம்பந்தப்பட்டவருக்கு எதிராக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) a person has forcibly acquired a part of the land belonging to the Kebellagahalanda Cemetery located at No. 44 B, Kaluaggala Grama Niladhari Division within the Divulapitiya Divisional Secretary's Division in the Gampaha District; and

(ii) the Ministry of Agriculture, Livestock, Land and Irrigation has been informed by the residents and the Divisional Secretary of the area to take necessary action to return the said part of land for the cemetery?

(b) Will he inform this House -

(i) whether action will be taken to recover some amount from the persons who have been forcibly using the land belonging to the said cemetery for the period of such use;

(ii) the measures that will be taken against the persons who have forcibly acquired a State land; and

(iii) the time period required in that regard?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government**)**

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) අනවසර අල්ලා ගැනීමක් සිදු වී ඇති බව වාර්තා වී ඇත.

(ii) අනවසර අල්ලා ගැනීම සම්බන්ධයෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් හා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර අවශ්‍ය සම්බන්ධීකරණය කරමින් හා උපදෙස් ලබා ගනිමින් කටයුතු කරනු ලබයි.

(ආ) (i) 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ පවතින ප්‍රතිපාදන අනුව කටයුතු කරනු ලැබේ.

(ii) රජය සතු ඉඩමක් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින විටෙක, 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ කටයුතු කරනු ලැබේ.

(iii) 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ නිශ්චය කර ඇති කාල සීමාවන් මේ සඳහා අදාළ වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ජාතික සීමා නිර්ණය කොමිසමට මුස්ලිම් නියෝජනය ඇතුළත් කිරීම
### தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் முஸ்லிம் பிரதிநிதித்துவத்தை உள்வாங்கல்
### INCLUSION OF MUSLIM REPRESENTATION IN NATIONAL DELIMITATION COMMISSION

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே! நிலையியற் கட்டளை 27 (2)இன்கீழ், எமது நாட்டில் ஜனநாயகம், நல்லாட்சி மற்றும் சமூக நல்லிணக்கத்தைப் பாதுகாப்பது தொடர்பில் முக்கியத்துவம்வாய்ந்த ஒரு விடயத்தை கௌரவ பிரதம அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

தற்போதைய அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்றதி லிருந்து அனைத்து சமூகங்களையும் சமமாக நடத்தும் நோக்கில் முன்னெடுத்துவரும் ஜனநாயக சீர்திருத்தங்கள் மற்றும் நிருவாக நடவடிக்கைகள் வரவேற்கத்தக்கவை. நாட்டின் பன்முகத்தன்மையை மதித்து, நல்லாட்சியைக் கட்டியெழுப்புவதற்கான அரசாங்கத்தின் அர்ப்பணிப்பை நாங்கள் பாராட்டுகின்றோம். எனினும், அண்மையில் இடம்பெற்ற சில முக்கிய நியமனங்கள் முஸ்லிம் சமூகத்தின் மத்தியில் கவலையையும் நியாயமான கேள்விகளையும் எழுப்பி இருக்கின்றன.

தேசிய எல்லை நிர்ணய ஆணைக்குழு என்பது, நிருவாக எல்லைகளை வரையறுக்கும் ஒரு தொழில்நுட்ப அமைப்பு மட்டுமல்ல, அது தேர்தல் பிரதிநிதித்துவம், அரசியல் நிருவாகம், பிரதேச உள்ளூராட்சி அமைப்புகள், அரசியல் சமநிலை மற்றும் மக்களின் ஜனநாயகப் பங்கேற்புடன் நேரடியாகத் தொடர்புடைய முக்கியமான சுயாதீன நிறுவனமும் ஆகும். குறிப்பாக, சிறுபான்மை மக்கள் செறிந்து வாழும் பகுதிகளில் எல்லை நிர்ணயம் மேற்கொள்ளப்படும் போது, அப்பகுதிகளின் வரலாற்றுப் பின்னணி, மக்கள் தொகைப் பரவல், நிருவாகத் தேவைகள் மற்றும் அரசியல் பிரதிநிதித்துவம் ஆகியவை சமநிலையுடன் கருத்திற் கொள்ளப்பட வேண்டும். இதற்காக ஆணைக்குழுக்களில் நாட்டின் பன்முகத்தன்மையைப் பிரதிபலிக்கும் வகையில் நியாயமான பிரதிநிதித்துவம் இருப்பது முக்கியமான ஓர் அம்சமாகும். எனினும், தற்போதைய தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த பிரதிநிதி ஒருவர் இடம்பெறாமை அச்சமூகத்தினரிடையே கவலையை ஏற்படுத்தி இருக்கின்றது. அதேவேளை, முக்கிய தேசிய நிறுவனங்கள் மற்றும் உயர்மட்ட நியமனங்களில் முஸ்லிம் சமூகத்தின் பிரதிநிதித்துவம் போதுமான அளவில் பிரதிபலிக்க வில்லை என்ற உணர்வும் மக்கள் மத்தியில் உருவாகி இருக்கின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, நாட்டின் பன்முகத் தன்மையை மதித்து, அனைத்து சமூகங்களுக்கும் நியாயமான பிரதிநிதித்துவம் வழங்கப்படுவதே உண்மையான நல்லாட்சிக்கும் தேசிய ஒற்றுமைக்கும் அடிப்படையாகும். எனவே, கௌரவ பிரதம அமைச்சரிடம் பின்வரும் வினாக்களுக்கான விடைகளை எதிர்பார்க்கின்றேன்.

1. தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் முஸ்லிம் பிரதிநிதித்துவம் இடம்பெறாமை தொடர்பில் அரசாங்கத்தின் நிலைப்பாடு என்ன? ஒரு முஸ்லிம் உறுப்பினரை மேலதிகமாக நியமிக்க நடவடிக்கை எடுக்கப்படுமா?

2. எல்லை நிர்ணயத் தீர்மானங்களின்போது முஸ்லிம் சமூகத்தின் நியாயமான கோரிக்கைகள் மற்றும் நிலைப்பாடுகள் உரிய முறையில் பிரதிபலிக்கப் படுவதை உறுதிசெய்ய அரசாங்கம் என்ன நடவடிக்கைகளை மேற்கொள்ளும்?

3. எதிர்காலத்தில் தேசிய ஆணைக்குழுக்களில் மற்றும் உயர்மட்ட நியமனங்களின்போது, நாட்டின் பன்முகத் தன்மையைப் பிரதிபலிக்கும் வகையில், தகுதியை அடிப்படையாகக் கொண்டு அனைத்து சமூகங்களுக்கும் நியாயமான பிரதிநிதித்துவம் கிடைப்பதை உறுதிசெய்ய அரசாங்கம் கொள்கை ரீதியாக நடவடிக்கை எடுக்குமா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ජාතික සීමා නිර්ණය කොමිෂන් සභාව මැතිවරණ හා පරිපාලන ප්‍රදේශ සීමා නිර්ණය කිරීම සඳහා ස්ථාවර, සංවිධානාත්මක සහ විද්‍යාත්මක ක්‍රමවේදයකින් ක්‍රියා කරන ස්වාධීන ආයතනයකි.

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ)(3) ව්‍යවස්ථාව ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමන් විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම සිදු කරනු ලබයි.

   එම සාමාජිකයන් කොමිසමේ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය තාක්ෂණික කරුණු පිළිබඳ ප්‍රාමාණික දැනුමක් සහිත පුද්ගලයන් විය යුතුයි. ඒ අනුව, සීමා නිර්ණය කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීමේදී හුදෙක්ම විශේෂඥ දැනුම සහ අත්දැකීම් පදනම් කරගෙන පත් කිරීම තමයි රජයේ ස්ථාවරය වෙලා තිබෙන්නේ.

2. ජනතාවගේ ඉල්ලීම්වලදී සියලු ජන වර්ගවලට සාධාරණව හා සමානාත්මතාවකින් සැලකීම කොමිෂන් සභාවේ ස්ථාවරයයි.

   මෙම ස්වාධීන කොමිෂන් සභාව විසින් එක් එක් කොට්ඨාසවල සීමා නිර්ණය කිරීමේදී එම කොට්ඨාසයේ භූගෝලීය පිහිටීම මෙන්ම, සමාජ ආර්ථික තොරතුරුද පදනම් කර ගන්නා බැවින්, කිසිදු ජන වර්ගයකට වෙනස්කොට සැලකීමක් නොවන ලෙස කටයුතු කරනු ලැබේ.

3. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව, නියමිත තනතුරුවලට පත් කිරීමට සලකා බලනු ලබන සුදුසුකම් සපුරා ඇති තැනැත්තන් අදාළ තනතුරුවලට පත් කිරීම සිදු කරනු ලැබේ.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, கடந்த காலங்களில் இருந்த எல்லா தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுக்களிலும் ஒரு முஸ்லிம் பிரதிநிதித்துவம் இருந்திருக்கிறது. வட, கிழக்குப் பிரதேசங்களில் முஸ்லிம் சமூகத்தினருக்கு எல்லை நிர்ணயம் சம்பந்தமாக நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. நீங்கள் சொல்வதுபோல், குறித்த துறைசார்ந்த அறிவும் ஆற்றலும் உள்ளவர்கள் - professionals - முஸ்லிம் சமூகத்திலும் இருக்கிறார்கள். அவ்வாறான ஒருவரைத் தேர்ந்தெடுத்து இந்த ஆணைக்குழுவுக்கு நியமித்தால், ஆணைக்குழுவானது சகல சமூகங்களுடைய நியாயமான கோரிக்கைகளையும் ஏற்று செயற்படக்கூடியதாக இருக்கும். அந்த அடிப்படையில்தான் நான் உங்களிடம் இந்த வேண்டுகோளை விடுக்கின்றேன். ஜனநாயகத்தை மதிக்கின்ற, சகல இனங்களும் சமம் என்று கருதுகின்ற அரசாங்கம், இந்த ஆணைக்குழுவில் ஒரு முஸ்லிம் பிரதிநிதித்துவத்தை உள்வாங்காமல் இருப்பது, முஸ்லிம் சமூகத்தினர் மத்தியில் மிகவும் கவலையை ஏற்படுத்தி இருக்கின்றது. ஆகவே, நீங்கள் எதிர்பார்க்கின்ற தகுதியை உடைய முஸ்லிம் ஒருவரை அந்த ஆணைக்குழுவுக்கு நியமிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, සීමා නිර්ණය කොමිෂන් සභාවේදී අපි සලකනු ලැබූ කාරණා තමයි සුදුසුකම්.

යම් ක්‍රමවේදයක් තිබෙනවා; සම්මුඛ පරීක්ෂණයක් තුළින් ලකුණු ලබා දෙන ක්‍රමයක් තිබෙනවා. ඒ ලකුණු අනුව තමයි පත් කිරීම් සිදු කරන්නේ. මේක ඉතාම තාක්ෂණික කාරණාවක්. ඉදිරිපත් වෙලා තිබුණු අයගේ ලකුණු අනුව ඉහළම ලකුණු ලබා ගත් පුද්ගලයන් තුන්දෙනෙක් තමයි පත් කළේ. ගරු කථානායකතුමනි, බහුල අත්දැකීම් සහිත තුන්දෙනෙක් පත් කළේ. අත්දැකීම් සහ තාක්ෂණික දැනුම තුළ සියලු ජනවාර්ගික කණ්ඩායම්වල අවශ්‍යතා, අදහස් හා නිශ්චිත ප්‍රදේශවල තිබෙන සංවේදී කාරණා සලකා බලා තීරණ ගැනීමේ හැකියාව ඔවුන්ට තිබෙනවා කියන විශ්වාසය මත තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ තුන්දෙනා යෝජනා කළේ. ගරු ජනාධිපතිතුමාට recommend කළේ ඒ පදනම මත.

ගරු කථානායකතුමනි, මම නැවත වතාවක් මේ කාරණය කියන්න කැමැතියි. මේ කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තෝරා පත් කරනකොට සලකා බලපු කාරණාව තමයි merit-based බව. මේක merit-based recommendation එකක්. එතැනදී අපි අවස්ථා ගණනාවකදී සියලු ප්‍රදේශ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගික නියෝජනය වාගේ සියලු දේවල් කථා කරනවා, consider කරනවා, හැබැයි, මෙවැනි තාක්ෂණික කොමිෂන් සභාවලදී අපේ මූලික අවශ්‍යතාව සහ මූලික criteria එක වෙන්නේ merit එකයි. අපි ඒක සලකා බලනවා. ඒ අනුව තමයි අපි මේ recommendations කළේ. ඒ, ඉතාම බහුල අත්දැකීම් තිබෙන තුන්දෙනෙක්. එතුමන්ලාට ඒ හැකියාව තිබෙනවා කියලා අපි හිතනවා. ගරු මන්ත්‍රීතුමා මතු කළ සියලු සමාජ, ආර්ථික, ජනවාර්ගි කාරණා සලකා බලා තීරණ ගනීයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## II

## ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික දෙමළ සරණාගතයින්ට ස්වේච්ඡාවෙන් නැවත පැමිණීමට පහසුකම් සැලසීම

இந்தியாவிலுள்ள இலங்கைத் தமிழ் அகதிகள் சுய விருப்பத்துடன் தாயகம் திரும்புவதற்கு வசதியளித்தல்

FACILITATION OF VOLUNTARY RETURN OF SRI LANKAN TAMIL REFUGEES IN INDIA

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. I ask this Question from the Hon. Minister of Public Security and Parliamentary Affairs.

Will he state,

(a) what steps the Government is taking to address the concerns of the Sri Lankan Tamil refugees in India who wish to return to Sri Lanka, particularly regarding security clearance, housing, access to land and property, employment, reparations and rebuilding their lives, especially in light of the arrest in May, 2025 of a 75-year-old Sri Lankan Tamil refugee upon his return through Palaly Airport after living in India for several decades;

(b) what the new procedure approved by the Cabinet is, allowing Sri Lankan citizens who fled to India during the civil war without valid travel documents and registered there as refugees to return through authorized ports without prosecution under immigration law solely for the manner in which they left Sri Lanka, and how would this procedure operate in practice;

Hon. Speaker, I saw that recently the Government has taken a new decision in this regard. So, I would like the Hon. Minister to tell us what it is.

(c) what steps must a refugee take before returning to Sri Lanka, including with regard to the requirements for verification of nationality, travel documents and security clearance;

(d) how many Sri Lankan refugees have returned from India to Sri Lanka in each year from 2009 to date, separately identifying those who returned with UNHCR assistance and those who returned independently;

(e) what the security clearance process under the new procedure is, including -

  (i) which institution or institutions conduct the clearance;

  (ii) what criteria are applied and what information or documents are required;

  (iii) the maximum time frame within which the assessment must be completed;

  (iv) what happens if security clearance is refused;

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(v) whether reasons must be provided for an adverse decision and whether the person has a right to seek a review or appeal; and

(vi) what safeguards exist against arbitrary or indefinite security screening;

(f) what assistance will be provided to returning refugees regarding land, housing, property, reparations, employment and livelihoods; and

(g) whether the Government will establish a One-Stop Return and Reintegration Unit in the North and the East to resolve these matters through a single mechanism, and if not, why?

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தியாவிலிருந்து நாட்டுக்குத் திரும்பும் அகதிகளுக்கு அரசாங்கம் புதிய பொறிமுறை ஒன்றை அறிமுகப்படுத்தப்போவதாக நான் அண்மையில் செய்தி ஒன்றைப் பார்த்தேன். இந்தக் கேள்வியின் பின்னணி என்னவென்றால், 2025ஆம் ஆண்டு இந்தியாவிலிருந்து நாடு திரும்பிய 75 வயதுடைய இலங்கைத் தமிழ் அகதி ஒருவரை பலாலி விமான நிலையத்தில் வைத்து கைதுசெய்தார்கள். அதனைத் தொடர்ந்து, இந்தியாவில் இருந்து மீண்டும் நாட்டுக்கு வரவிருந்த அகதிகள், அச்சம் காரணமாக இங்கு வருவது பற்றி யோசிக்கிறார்கள். அவர்கள் மீண்டும் எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்கு வர வேண்டும் என்பது எங்களது விருப்பம்! வடக்கு, கிழக்கிலுள்ள எங்களுடைய மாவட்டங்களில் சனத்தொகை குறைந்து கொண்டு போகின்றது. இவர்களை மீண்டும் இலங்கைக்கு அழைத்துவந்தால், எங்களுடைய சனத்தொகையின் விகிதா சாரத்தை அதிகரிக்கலாம்; வாக்குகளின் எண்ணிக்கையை அதிகரிக்கலாம்; பாராளுமன்றப் பிரதிநிதித்துவத்தை அதிகரிக்கலாம்.

கௌரவ அமைச்சர் அவர்களே, இவர்கள் இலங்கைக்கு வரும்போது, எத்தனையோ ஆண்டுகளாக இந்தியாவில் சேர்த்த பொருட்களை படகுச் சேவை ஊடாகக் கொண்டுவருவதற்கு ஏற்பாடு செய்துகொடுக்க வேண்டும். அதுமாத்திரமல்ல, அவர்கள் இங்கு மீண்டும் வரும்போது, அவர்களுடைய காணிகள் இராணுவத்தினரிடம் இருந்தால் அவற்றையும் விடுவித்துக் கொடுக்க வேண்டும்; அவர்களுடைய வீடுகள் யுத்தத்தால் அழிக்கப்பட்டு இருந்தால், புதிய வீடுகளைக் கட்டிக் கொடுக்க வேண்டும்; அவர்களுடைய வாழ்வாதாரத்துக்கு உதவி செய்யக்கூடிய திட்டங்களை மேற்கொள்ள வேண்டும். இப்படிப் பல விடயங்கள் இருக்கின்றன. இந்த விடயங்கள் சம்பந்தமாக அரசாங்கத்தின் நிலைப்பாடு என்ன என்பதைத்தான் நான் இந்தக் கேள்வியின் ஊடாக எதிர்பார்க்கின்றேன். நன்றி!

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙන්නම්.

අමාත්‍ය මණ්ඩලය මඟින් ගිය සතියේ මෙම කරුණට අදාළව යම් තීන්දුවක් ගනු ලැබුවා. පැවති යුද වකවානුව තුළ මෙරටින් ඉන්දියාවට සරණගතයින් හැටියට පලා ගිය පිරිස් නැවත රට තුළට පැමිණෙන විට ඇති වෙලා තිබෙන ගැටලුවක් සම්බන්ධයෙන් එතුමා මතු කළා වාගේම මීට පෙරාතුවත් එවැනි ගැටලුවක් මතු වුණා. ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරලා, ඒ කරුණු අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා, අමාත්‍ය මණ්ඩලය ගිය සතියේ ඊට අදාළව තීන්දුවක් දුන්නා. ඒ අනුව පිළිගත් ගුවන් තොටුපළකින් නොවන අවස්ථාවක වුවත් රටින් බැහැරව ගිය අවස්ථාවකදී, නැවත රටට ඒමේදී ඇති වන බාධා ඉවත් කරන්න කැබිනට් මණ්ඩලය තීන්දු කළා. ඒ අනුව කටයුතු කරන්න ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට දැනුම් දීලා තිබෙනවා.

විශේෂයෙන්ම පිළිගත් ගුවන් තොටුපළකින් ගියේ නැති කෙනෙක් රටට එනකොට ආගාමික හා විගාමික පනත අනුව වරදක් හැටියට සලකමින් තමයි, අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙලා තිබුණේ. දැන් අපට ලැබිලා තිබෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, ඒක වරදක් කොට නොසලකමින් රට ඇතුළට එන්න අවශ්‍ය විධිවිධාන සලස්වා තිබෙනවා. මෙහිදී රටට එන්න කැමැත්තෙන් ඉන්න පිරිස අදාළ තානාපති කාර්යාලයට, එහෙම නැත්නම් චෙන්නායි තානාපති කාර්යාලයට දැනුම් දුන්නාට පස්සේ, ඔහු සරණාගතයෙක් හැටියට ගිය ශ්‍රී ලාංකික පුරවැසියෙකු බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව, ඒ සඳහා අනෙක් අවස්ථාවලදී වාගේම රාජ්‍ය බුද්ධි සේවාව මඟින් clearance report එකක් ගන්න අවශ්‍යයි. ඊට පසු ඔහුට මෙරටට පැමිණීමේ හැකියාව තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ මෙම ප්‍රශ්නවලින් විශාල ප්‍රමාණයක්, එහෙම නැත්නම් වැඩි ප්‍රමාණයක් අදාළ වන්නේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට. සරණාගතයින් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ එම අමාත්‍යාංශය. ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග, ඔවුන්ගේ නිවාස සහ ඉඩම් සම්බන්ධ ගැටලු තමයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ සඳහා උත්තර ලබා දීමට මට සති දෙකක කාලයක් දෙන්න. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයෙන් තොරතුරු අරගෙන සම්පූර්ණ උත්තරයක් ඉදිරියේදී ලබා දෙන්න කටයුතු කරනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
process
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දීමේදී පුළුවන් නම් security clearance එකේ process එක පිළිබඳව අපට document එකක් හදලා දුන්නා නම්, ඉන්දියාවේ ඉන්න අයට එය යවන්නත් අපට පුළුවන්. එතකොට ඒගොල්ලන්ට පෙර සූදානමක් වෙන්න පුළුවන්.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, ඒ ආකාරයට කටයුතු කිරීමේ හැකියාව අපට තිබෙනවා. ඒ අනුව, එහෙම කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙම ප්‍රකාශය කරන්න අවස්ථාව ලබා දීම ගැන. අද මේ සභාවේ අධිකරණ ඇමතිතුමා නොමැති නිසා තමයි මම මේ ප්‍රකාශය කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අවස්ථාවේ සිදු වෙච්ච සාකච්ඡා පිළිබඳව පුවත් පත්වල කරුණු වාර්තා කර තිබෙනවා. "අද ඉදිරිපත් කළ යෝජනාවේ බලපෑමේ වගන්තිය නැහැ. යම් පනතක් ඉදිරිපත් කරන විට බලපෑමේ වගන්ති තිබිය යුතුයි. ඒ අඩුපාඩුව හදන්න" කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කරන ලද ප්‍රකාශයක් එම පුවත් පත් වාර්තාවක තිබෙනවා. එහෙම තිබෙන්නේ "ලංකාදීප" පුවත් පතේ. ගරු කථානායකතුමනි, තවත් පුවත් පතක ඒ විධියටම වාර්තා කර තිබෙනවා, "අද ඉදිරිපත් කළ යෝජනාවේ බලපෑමේ වගන්තිය නැහැ. කාටද මේ සංශෝධනය බලපාන්නේ කියලා සඳහන් කර නැහැ. ඒක ඌනතාවක්. ඒක හදන්න" කියලා. අද ඉංග්‍රීසි පුවත් පත්වලත් තිබෙනවා මම දැක්කා, "Opposition found shortcomings in the Twenty Second Amendment" කියලා.

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව රජයේ ස්ථාවරය මේකයි. අද දිනයේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත බැලුවත් අපි දන්නවා, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරද්දී "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියන එක සාමාන්‍යයෙන් පනත් කෙටුම්පතක පළමුවන පිටුවේම සඳහන් කර තිබෙන බව. ඒ, පනත් කෙටුම්පතක් සම්බන්ධව. අද ඉදිරිපත් කර තිබෙනවා, දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත. "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියන එක එහි තිබෙනවා. ඕනෑම පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ඒක එහෙමයි. අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පතෙත් "නීතිය බලපෑමේ ප්‍රකාශය" තිබෙනවා.

ගරු කථානායකතුමනි, නමුත් අප විසි දෙවන සංශෝධනය වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්. එය සාමාන්‍ය පනත් කෙටුම්පතක සංශෝධනයට වඩා වෙනස්. ගරු කථානායකතුමනි, මා ඔබතුමාට ඒ සඳහා උදාහරණයක් පෙන්වන්නම්. මා ළඟ මේ තිබෙන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එය විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් දැන් ඉන්න බොහෝ දෙනෙක් සහයෝගය දුන්නු පනත් කෙටුම්පතක්. ගරු කථානායකතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියන එක නැහැ. ඒක අවශ්‍ය නැහැ. ඊට පසුව තිබෙනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මා ළඟ මේ තිබෙන්නේ, ඒක. ඒකෙත් "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියලා එකක් නැහැ. ඊට පසුව විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා එකක් ඉදිරිපත් කළා, 2022දී. හැබැයි, ඒ වෙලාවේ මන්ත්‍රීවරයෙකුත් පෞද්ගලික සංශෝධනයක් ඉදිරිපත් කර තිබුණු නිසා එය සම්මත වුණාට පසුව ඒක විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බවට පත් වුණා. ඒක විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා තමයි ගැසට් එකේ තිබෙන්නේ. ඒ, මේක නොවෙයි. ගරු කථානායකතුමනි, ඒකෙත් "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියලා එකක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන අවස්ථාවේදී "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියන එක සාමාන්‍ය පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරද්දී මෙන් සඳහන් කරලා නැහැ. එම නිසා මෙතැන කිසිම ආකාරයක අඩුපාඩුවක්, වැරැද්දක් සිදු වෙලා නැහැ. අපි එය පැහැදිලි කළ යුතුයි.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ පනත් කෙටුම්පත් සකස් කරන්නේ ආණ්ඩු පක්ෂයෙන් නොවන බව. ප්‍රතිපත්තිමය තීන්දුව ගත්තාට පසුව මේ පනත් කෙටුම්පත් සකස් කරන්නේ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන්. එහි සිටින්නේ ඉතා විධිමත්ව මේ විෂයය ඉගෙන ගත්, වගකීමකින් වැඩ කරන නිලධාරින්ය කියන එක මම හිතන විධියට අපි කවුරුත් පිළිගන්නවා. ඉන් පසුව එය නීතිපති දෙපාර්තමේන්තුවට යොමු වෙනවා. එතැනත් ඉන්නේ මේ විෂයය පිළිබඳව විශාල අත්දැකීමක් තිබෙන පිරිසක්. එතැනිනුත් අනුමත වෙලා තමයි ඒක කැබිනට් මණ්ඩලයට එන්නේ. කැබිනට් ලේකම් කාර්යාලයේ ඉන්නෙත් ආණ්ඩු පක්ෂයේ කවුරුවත් නොවෙයි, මේ පිළිබඳව හොඳ අවබෝධයක් සහ අත්දැකීමක් තිබෙන නිලධාරින්. එතකොට ආයතන තුනක් පසු කරලා තමයි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට එන්නේ. පාර්ලිමේන්තුව ගත්තාම, ලේකම් මණ්ඩලය ඇතුළු සභානායක කාර්යාලයේ ඉන්නේත් මේ පිළිබඳව විශාල අත්දැකීම් තිබෙන නිලධාරින්. එම නිසා මම කියන්න කැමැතියි, මෙන්න මේ කාරණයත්. අපේ දේශපාලන ප්‍රශ්න වෙනම එකක්. මේ කරන දෙයින් වෙන දේ මේකයි. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට නීති කෙටුම්පතක් හදා ගන්න බැහැ කියන එක තමයි ඔය ඊයේ කියලා තිබෙන්නේ. නීතිපති දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථා සංශෝධනයක් වාගේ බරපතළ දෙයක්වත් හරියට හදා ගන්න බැහැ කියන එක තමයි ඊයේ කියලා තිබෙන්නේ. කැබිනට් ලේකම් කාර්යාලය සහ පාර්ලිමේන්තුවටත් එක්ක යම් අපහාසයක් තමයි ඒ කරලා තිබෙන්නේ. මේකේ කිසිම ආකාරයක ගැටලුවක් නැහැ, මෙහෙම තමයි ව්‍යවස්ථා සංශෝධන දිගටම ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක නිසා, "නීතිය බලපෑමේ ප්‍රකාශය" අවශ්‍ය වෙන්නේ පනත් කෙටුම්පත්වලට. එහෙම නැතුව ව්‍යවස්ථා සංශෝධනවලට නොවෙයි. ගරු කථානායකතුමනි, ඒක කරුණක් වශයෙන් වැරැදියි. බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට ඒ ගැන point එකක් කියන්න අවස්ථාවක් දෙන්න. *[බාධා කිරීමක්]* මේ ගැන විස්තරයක් කරන්න අපට අවස්ථාව දෙන්න. ගරු කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත
ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்
ANTI-CORRUPTION (AMENDMENT) BILL

"2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 සැප්තැම්බර් 08වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Tuesday, 08th September, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
92 (2) ස්ථාවර නියෝගය යටතේ කියන්නේ. අද කියපු කාරණය පිළිබඳව මම කථා කරන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා 92 (2) ස්ථාවර නියෝගය යටතේ තිබෙන point එක කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා ඒ ගැන බලන්න. කියන කාරණයක් සම්බන්ධව,- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ඒ ස්ථාවර නියෝගය මම කියවන්නම්. ඔබතුමාටත් කියවන්න පුළුවන් නේ. ඔබතුමා සෑහෙන කාලයක ඉඳලා නේ, කථානායක ධුරයේ ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, point එකක් නැතුව ඔබතුමාගේ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
92 (2) ස්ථාවර නියෝගයේ තිබෙනවා, "ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද..."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා නිවැරදි point එකක් raise කරන්න. ඔබතුමා point එක කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ පනත් කෙටුම්පත සම්බන්ධව නිවැරදි ක්‍රමවේදය අනුගමනය කර තිබේද යන්න තමයි මේ ප්‍රශ්න කරන්නේ. මට ඒ ගැන කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point එක කියන්න. ඔබතුමාට මම කියන දේ තේරෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point එකට තමයි කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහගන්න, ගරු මන්ත්‍රීතුමනි. Point එක raise කරන්න නැඟිටිද්දී තමයි ඔය 92 (2) ස්ථාවර නියෝගය කියන කාරණය තිබෙන්නේ. ඒ ස්ථාවර නියෝගය යටතේ ඔබතුමාට නැඟිටින්න පුළුවන්. හැබැයි, ඊට පස්සේ ඔබතුමා point එක කියවන්න ඕනෑ. එහෙම කියවන්නේ නැතුව 92 (2) ස්ථාවර නියෝගය කියලා හරියන්නේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මම මේ කියන්නේ. Point එක මම කියෙව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ point එක මෙකයි. ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78වන ව්‍යවස්ථාවේ තිබෙනවා, පනත් කෙටුම්පත් පළ කිරීම සහ පනත් කෙටුම්පත් හා යෝජනා සම්මත කිරීම පිළිබඳව. ඔබතුමා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම කියනවා. 78 (3) අනුව්‍යවස්ථාවේ තිබෙනවා, "පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය" කියලා. "යම් සංශෝධනයක් පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය" කියලා එහි තිබෙනවා. එහෙම වෙනවා නම් ඒක තමයි බලපෑමේ වගන්තිය කියලා කියන්නේ.

මේ පනත් කෙටුම්පත ගෙනාවාම කවදා ඉඳලාද මේ වගන්තිය බලපාන්නේ කියන කාරණය මෙහි අනිවාර්යයෙන් තිබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එහෙම නැතුව සංශෝධනයක් හැටියට මේක ගෙනෙන්න බැහැ. ඒකයි අපි මේ කියන්නේ. එදා අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මතු කළේ මේ කාරණයම තමයි. ගරු කථානායකතුමනි, වෙන ප්‍රශ්නයක් නිසා නොවෙයි අපි මේක කියන්නේ. මේ නීතිය බලපෑමේ ප්‍රකාශය කවදා ඉඳලාද

බලපාන්නේ? පැහැදිලිවම මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් විධියට ගෙනෙනවා නම් ඒක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, නැවත ගැසට් කරන්න ඕනෑ. එහෙම නැතුව මේක කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපිට මේ පාර්ලිමේන්තුවේ මේවා මතු කරන්න අයිතිය තිබෙනවා, සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමා හැම දාම උපදෙස් දෙනවා නේද? මම විපක්ෂ නායකතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, මෙතුමා හැම දාම උපදෙස් දෙනවා, ඒවායින් පරිස්සම් වෙන්න කියලා.

ගරු කථානායකතුමනි, මේක කොයි තරම් වැරදිද බලන්න. අපි ඉතා පැහැදිලිවම මේ කරුණු අධ්‍යයනය කරලා, ඒවා ඉදිරිපත් කළා. මම ඒකයි කිව්වේ. අපි පැත්තකින් තියන්න. මේ හැල්ලු කරන්නේ තමන්ගේ මොකක් හරි විසකුරු දේශපාලන වුවමනාවකට. මේ පහර දෙන්නේ නීතියට. මේ පහර දෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවට, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට, Cabinet office එකට සහ පාර්ලිමේන්තු staff එකට. එතකොට, මෙතුමාද මේ ගැන දන්නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපිටත් පාර්ලිමේන්තුවේ අදහසක් කියන්න බැරිද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අදහසක් කියන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඒ නිසා නේ ගරු කථානායකතුමා ඔබතුමාට අවස්ථාව දුන්නේ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඔබතුමා ඇත්තටම එතුමාට අවස්ථාව දුන්නා. මෙතුමා අඩු ගණනේ ස්ථාවර නියෝග දන්නෙත් නැහැ. ගරු කථානායකතුමනි, මෙතුමා නැඟිට්ටේ 92 (2) ස්ථාවර නියෝගය කියාගෙන. සමහරු හිතනවා නේ, මොකක් හරි ඉලක්කමක් කිව්වාම මෙතැන ගොන්පාට් වෙනවා කියලා. 92 (2) ස්ථාවර නියෝගය කියවන්න පටන් ගත්තාට පස්සේ මට හිතුණේ ඡන්දයක් ගැන කියනවා කියලා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මම කියන්නේ,- *[බාධා කිරීම්]* විශේෂයෙන්ම මම විපක්ෂ නායකතුමාට මේ කාරණය කියන්න කැමැතියි. විපක්ෂ නායකතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ වාගේ ගොඩ පෙරකදෝරුවන්ගෙන් නම් ඔබතුමා උපදෙස් ගන්න එපා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. Hon. Minister, you have 14 minutes.

## මුදල් පනත: යෝජනා සම්මතය
## நிதிச் சட்டம்: தீர்மானம்
## FINANCE ACT: RESOLUTION

[පූ.භා. 10.34]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 19 වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත මතු සඳහන් පරිදි විධාන කිරීම සඳහා මෙම පාර්ලිමේන්තුව විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබිය යුතු ය:-
>
> (අ) 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම; සහ
>
> (ආ) 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය ව්‍යවසායක් වන ශ්‍රම වාසනා අරමුදල 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් ලෙස යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් පත් කිරීම.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. 1971 අංක 38 දරන මුදල් පනත යටතේ ඉදිරිපත් කරන මේ යෝජනා සම්මතය තුළින් ශ්‍රම වාසනා අරමුදල ඈවර කිරීමට යෝජනාවක් කරනවා. එවැනි අරමුදලක් තිබෙනවා නම් එය ඈවර කිරීම සඳහා වූ යෝජනාව ගෙන ආ යුත්තේ මේ මුදල් පනත යටතේයි.

මෙයට පසුබිම් වූ හේතු මේවායි. අපේ ආණ්ඩුකරණය තුළ විශේෂයෙන්ම මූල්‍ය විනය, රාජ්‍ය ආදායම් ඒකාග්‍රතාව, ආදායම් එක්රැස් කර ගැනීම කියන කාරණාවලට වැඩි ප්‍රමුඛතාවක් ලබා දුන්නා. ඒ වාගේම ඒ සඳහා මහ පෙන්වන්න අපට තිබෙනවා, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත. ඒ ක්‍රියාමාර්ග ඇතුළේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක වැඩ කටයුතුවලින් එකක් තමයි, ව්‍යවස්ථාපිත අරමුදල්. විවිධ ව්‍යවස්ථාපිත අරමුදල් ගොඩ නැඟිලා තිබුණා. ඒ ව්‍යවස්ථාපිත අරමුදල්වල ඒ අවස්ථාවේදී අවශ්‍යා වූ කාරණය තවදුරටත් වලංගුද? එය වෙනස් වෙන්න ඕනෑ ද? සමහර අරමුදල් පිහිටුවන කාරණයන් දැන් වෙනත් ඒකක

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

මඟින් සිදු කරනවා. මේ වාගේ පැතිරුණු අරමුදල් විශාල ප්‍රමාණයක් තිබෙන නිසා ඒ පිළිබඳව අධ්‍යයනය කරලා වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා තිබෙනවා. ඒ අනුව ඉදිරිපත් කළ වාර්තාව ඇතුළෙත් අරමුදල් ගණනාවක විවිධ වූ වෙනස්කම් කිරීම්, ඒකාබද්ධ කිරීම්, අහෝසි කිරීම් වැනි කාරණා හඳුනාගෙන තිබෙනවා.

ශ්‍රම වාසනා අරමුදල රාජ්‍ය ව්‍යවසායන් යටතට වැටෙනවා. හැබැයි, ඒ වුණාට එය වෙනමම ව්‍යවසායක කටයුත්තක් කරන්නේ නැහැ. වෙනම අරමුදල් ලැබෙනවා, මේ ලොතරැයිය හරහා. ඒ නිසා රාජ්‍ය ව්‍යවසායන් ඇතුළේ තිබෙන වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කිරීමටත් නිලධාරි කමිටුවක් පත් කළා, අග්‍රාමාත්‍යතුමියගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්. එතැනදීත් හඳුනාගත් ආයතන අතර තිබෙනවා, මේ ශ්‍රම වාසනා අරමුදල. එය තවදුරටත් අපට පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ. ඒ නිසා අහෝසි කිරීමේ ලැයිස්තුවේ මෙය තිබෙනවා. ඒ අනුව කම්කරු අමාත්‍යාංශයෙන් අපි කැබිනට් අනුමැතිය ලබා ගත්තා, මේ අරමුදල අහෝසි කරලා ඒක ඈවර කිරීමට අවසරය ලබා දීමටත්, ඒ වාගේම ඒ ඈවර කටයුතු අවසාන කිරීමට 2026 ඔක්තෝබර් 31 දින සිට කාලය ලබා දෙන්නත්. ඒ අනුව තමයි පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගැනීමට මේ ඉල්ලුම් කරන්නේ.

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත අනුව තමයි පිහිටුවා තිබෙන්නේ. ඒකට යම් සංශෝධනයක් එකතු කරනවා, 2019දී. මේ අරමුදලේ තිබෙන ප්‍රධාන අරමුණුවලින් එකක් තමයි, සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. ඒ වාගේම සේවා නියුක්තිකයන් සේවයේ යෙදී සිටින විට යම් ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව විවිධ හේතු මත වසා දැමීමට ලක් වුණොත් එවැනි අවස්ථාවකදී සේවා නියුක්තිකයන්ට මූල්‍ය ආධාර සැපයීම, හදිසි අවස්ථාවකදී සේවා නියුක්තිකයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට වෛද්‍ය පහසුකම් හෝ වෙනත් පහසුකම් ලබාදීම, සේවා නියුක්තිකයන්ට විරුද්ධව යම් ආකාරයක පරීක්ෂණ සිදු වෙනවා නම්, එහිදී ඔවුන්ට ඒ සඳහා උදව් උපකාර කිරීමට මැදිහත්වීමට මේ අරමුදල් යොදා ගැනීම, ව්‍යසනයක් අවස්ථාවකදී සේවා නියුක්තිකයන්ට ගැටලුවක් පැන නඟිනවා නම් ඒ වෙනුවෙන් මූල්‍යමය ආධාර ලබාදීම කියන කාරණා ඉලක්ක කරගෙන තමයි මේ අරමුදල පිහිටුවා තිබෙන්නේ.

අද වෙනකොට මේ අරමුදලට ප්‍රධාන වශයෙන්ම මුදල් ලැබෙන්නේ ජාතික ලොතරැයි මණ්ඩලයේ "ජය" ලොතරැයිය මඟින් ලැබෙන අරමුදල් මඟින්. ඒ අරමුදල්වලින් මේ කාරණා පවත්වාගෙන යෑමේ හැකියාව තිබෙනවා. හැබැයි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පැත්තෙන් ගත්තාම මම මේ සඳහන් කරපු අරමුණු ටික දැනටමත් කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තු සහ ඒකක විසින් සිද්ධ කරමින් තිබෙනවා. ඒ වාගේම, වෙනමම ඒකකයක් වෙතින් මෙය පරිපාලනමය කටයුතු සඳහා සේවකයන් යොදවා ගැනීමේදී ඒ අනවශ්‍ය පරිපාලන වියදමකුත් අපට අඩු කර ගැනීමට පුළුවන්. එම නිසා මේ අරමුදල ඈවර කිරීමට ගෙන එන ලද යෝජනාව විසින් සේවකයන්ට එහි මූලික අරමුණ වෙනුවෙන් ලබාදී තිබූ කිසිදු වරප්‍රසාදයක් හෝ අරමුණින් ඉටු කරනු ලබන කාර්යයන් කිසිවක් අහෝසි වන්නේ නැහැ. ඒවා දැනටමත් අමාත්‍යාංශය යටතේ පවතින ඒකකවලට පවරා ගැනීමක් සිදු කරන ගමන්ම, මූල්‍ය කළමනාකරණයේ අන්න ඒ වියදම් අවම කර ගැනීමේ ක්‍රියා මාර්ගය තමයි මෙතැනදී සිදු කරනු ලබන්නේ. එමඟින් පෙන්නුම් කරන්නේම රාජ්‍ය මූල්‍ය විනය සඳහා අපේ මැදිහත්වීම වෙනුවෙන් කරන කැප කිරීමයි.

ඒ වාගේම, මේ පිහිටුවා තිබෙන ශ්‍රම වාසනා අරමුදලේ අතීත දත්ත අරන් බැලුවාම අවස්ථා කිහිපයකදී යම් වෙනස් ආකාරයෙන් කටයුතු කර තිබෙන තත්ත්වයක් දකින්න තිබෙනවා. ගරු කථානායකතුමනි, දැන් මෙතැන ස්වාධීන අරමුදලක් තිබෙන නිසා එහි අරමුණ වෙනුවෙන්ම මුදල් වියදම් කරන ගමන්, ඒ අරමුණුවලින් එළියට ගිහිල්ලා වියදම් කරන තත්ත්වයකට යම් ඉඩකඩක් ලැබිලා තිබෙන බවක් අපට නිරීක්ෂණය වෙනවා, මේ මූල්‍ය වියදම් කිරීම් දිහා බැලුවාම. දැන් මා සතුව තිබෙනවා, 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වූ වියදම්. එහිදී කැපී පෙනෙන වියදමක් 2024 වර්ෂයේදී පෙන්නුම් කරනවා. ඒ කියන්නේ, අපේ ආණ්ඩුව පිහිටුවන්න කලින් තමයි මේ වියදම් කිරීම් සිද්ධ කර තිබෙන්නේ. එවකට කම්කරු අමාත්‍යවරයා විධියට වැඩ කටයුතු කළේ මනුෂ නානායක්කාර මහතා. ඉතිහාසයේ කිසිදු අවස්ථාවකදී මේ මූල්‍ය වියදම් අයිතමය තිබී නැහැ. 2024 වර්ෂයේදී ඒ මණ්ඩලයෙන් - ඒ බෝඩ් එකෙන් - රුපියල් මිලියන 6.6ක් අනුමත කරගෙන තිබෙනවා, SVF එක හරහා, "educational aid programme" කියලා පාසල්වල යම් දරුවන් ප්‍රමාණයකගේ අධ්‍යාපනයට උදව් උපකාර කිරීම සඳහා. එතකොට ශ්‍රමිකයින්ගේ ක්‍රියාවලිය ඇතුළේ පාසල් දරුවන්ට උදව් උපකාර කිරීම කියන එක කලින් තිබිච්ච එකක් නොවෙයි. ඒක, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, සමාජ සවිබලගැන්වීම් පිළිබඳ අමාත්‍යාංශයෙන්, විවිධ වැඩ කටයුතුවලින් කරනවා වෙන්න පුළුවන්. හැබැයි, මෙවැනි කාරණයක් ඇතුළත් කරලා මිලියන 6.6ක් වෙන් කරගෙන තිබෙනවා. මතුපිටින් ගත්තාම, පාසල් දරුවන්ට යම් උදව්වක් කරන එක, අධ්‍යාපනයට ආධාරයක් ලබා දෙනවා කියන එක හොඳ දෙයක්. ඒක නරක දෙයක් නොවෙයි. එතකොට හොඳ ක්‍රියාවක් උපයෝගී කරගෙන ඒක ඇතුළේ තම අභිමතාර්ථය පරිදි වියදම් කිරීමක් සිද්ධ වුණාද කියන සැකය තිබෙනවා.

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය පැන නඟින්නේ, මේ අතිරේක කරුණක් හොයා ගන්නේ, මේ මිලියන 6.6ට අමතරව, මිලියන 66ක් special educational programme එකකට විශේෂ වෙන්කිරීමක් විධියට වෙන්කර තිබෙන නිසායි. ඒ මිලියන 66 ඇතුළේ පාසල් බෑග් බෙදා හැරීම වැනි කාරණා තිබෙනවා. අපි කවුරුත් දන්නවා, පාසල් දරුවන්ට පාසල් බෑග් බෙදනවාට කවුරුත් කැමැතියි. එවැනි ව්‍යාපෘති ජනප්‍රිය වන නිසා තමන්ගේ අභිමතාර්ථය පරිදි ප්‍රධාන අරමුණින් බැහැරවත් කටයුතු කර තිබෙනවා. අපේ මූල්‍ය විනය යටතේදී මෙවැනි අභිමතාර්ථය පදනම් කරගත්, දේශපාලන වුවමනා පදනම් කරගත් වියදම් සිද්ධ වෙන්නේ නැහැ කියන එක අපි ප්‍රකාශ කරනවා. මෙවැනි අරමුදල් අහෝසි කිරීම හා මූල්‍ය විනය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමේ ක්‍රියාවලිය අපි සිදු කරනු ලබනවා.

ඒ වාගේම මූල්‍ය විනය ස්ථාවරත්වයේදී ඉතාම වැදගත් වන සාධකයක් තමයි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවේදී ආදායම් එකතු කරගන්නේ කොහොමද, වියදම් කරන්නේ කොහොමද, අය වැය පරතරය අපට පාලනය කරන්න පුළුවන් සීමාවක පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක වැදගත් වනවා. මොකද, අපි මේ ස්ථාවරත්වය අත්පත් කරගෙන, ආර්ථිකය ඉදිරියට ගමන් කරනකොට සමාජය නිරන්තරයෙන් කථා බහක් ඇති කර ගන්නවා, "මේක ගෙනයන්න බැහැ, බිඳ වැටෙනවා, බිඳ වැටෙනවා" කියලා. ආදායම එකතු කර ගන්න බැහැයි කියන කථාව දිගින් දිගටම මතු කළා. හැබැයි, අපි ඒකට උත්තර වචනයෙන් විතරක් නොවෙයි, ක්‍රියාවෙන් ලබා දී තිබෙනවා. 2025 වෙනකොට සියලුම ආදායම් ඉලක්ක ඉක්මවමින් ආදායම් සපුරා ගත්තා. ඒ වාගේම 2026 වසරේ මේ වනකොටත් අපි දිනපතාම ඒ ආදායම් ඉලක්ක නිසි පරිදි, සැලසුම් කරපු ආකාරයටම ඉදිරියට පවත්වාගෙන යනවා. එහි අවසාන ප්‍රතිඵලය වෙන්නේ, මේ ණය තිරසරභාවය ආරක්ෂා කර ගැනීම. මොකද, ආණ්ඩුවක් විධියට අපට ණය ලබා ගැනීමට ඇති හැකියාවේ නෛතික අවශ්‍යතාව සහ අවස්ථාව තිබෙනවා. ඒ වාගේම අපි ඒ ණය ලබා ගත යුත්තේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක වෙන්නයි. හැබැයි, අපි මේ ආණ්ඩුව

ගන්නකොට පරණ ණය ගොඩකට අපට කර ගහන්න සිද්ධ වුණා. ඒ ණයත් තිරසරභාවයට පරිවර්තනය කරමින්, උපාය මාර්ගිකව අපේ අනාගත ණය සැලසුම් කරන්නේ කොහොමද කියන කාරණයත් මේ මූල්‍ය ණය කළමනාකරණය ඇතුළේ තිබෙනවා. එහිදී විශේෂ බරක් අපට පැටවෙනවා, අතීතයේදී ගත් ණයවල ණය පොලී පිළිබඳව. 2023, 2024, 2025 කියන වර්ෂවලට අදාළව දත්ත වශයෙන් ඉදිරිපත් කළොත්, 2023දී රුපියල් බිලියන 2,456ක්, 2024දී රුපියල් බිලියන 2,690ක් සහ 2025දී රුපියල් බිලියන 2,501ක් ණය පොලී වශයෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම, මෙය විශාල ප්‍රමාණයක්. ඒ වාගේම, ආණ්ඩුවේ ආදායම වශයෙන් අපි රුපියල් 100ක් එකතු කරගන්නකොට, සියයට 60, 70ක් පොලී වශයෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් ඒක අපි සියයට 49 දක්වා අඩු කරගෙන ණය තිරසරභාවය අත්පත් කරගෙන තිබෙනවා.

මේ ණය තිරසරභාවයේදී වැදගත් වන දේ තමයි, අපි අනාගතයේදී බිඳ වැටෙන්නේ නැතිව, අපට ගෙවන්න පුළුවන් ආකාරයට ණය ලබාගන්නේ කොහොමද කියන එක. එතැනදී අපට උපක්‍රමශීලි වෙන්න වෙනවා, අපි අඩු පොලියට ණය ලබා ගන්නේ කොහොමද, ව්‍යාපෘති ඉලක්ක කරගෙන ණය ලබා ගන්නේ කොහොමද, තිරසර විධියට ණය ලබා ගන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව. ඒ නිසා අපි ක්‍රමිකව 2030 වෙනකල් සැලසුම් සකස් කර තිබෙනවා, හැකිතාක් දුරට ලංකාවට තාක්ෂණය කැන්දන අත්‍යවශ්‍ය වූ විදේශීය ණය හැර ඉතිරි ණය දේශීය වශයෙන් සම්පාදනය කර ගැනීමටත්, දේශීය වශයෙන් ආණ්ඩුව උපයා ගන්නා ආදායම මඟින් ව්‍යාපෘති සිද්ධ කරන්නත්. එහි ප්‍රතිඵලයක් විධියට තමයි මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමුවැනි කොටස වන කඩවත සිට මීරිගම දක්වා කොටස ඉදිකිරීමේ මූලික වැඩකටයුතුවලදී දේශීය අරමුදල් යොදාගෙන ඒ වැඩකටයුත්ත සිද්ධ කරන්නේ.

ඒත් එක්කම මේ ණයවලදී තව කොටසක් එනවා, අපි ඉදිරියේදී ගෙවන ණය පිළිබඳව. එකක් තමයි, මේ වෙනකොට තිබෙන ණය අපට ගෙවන්න බැහැයි කිව්වාට අපි 2025දීත් ණය ගෙව්වා. 2026දීත් මාස්පතා නිසි පරිදි මේ ණය ගෙවමින් ඉන්නවා. ඒ වාගේම, අපි සැලසුම් සකස් කර තිබෙනවා 2030 වෙනකල් කොහොමද ණය ගෙවන්නේ කියලා. සමස්තයක් වශයෙන් ගත්තාම, බහුපාර්ශ්වීය, ද්විපාර්ශ්වීය සහ විවෘත වෙළෙඳ පොළෙන් ලබාගත් ණය තිබෙනවා. ඊට අමතරව, දේශීය වශයෙන් ලබාගත් බැඳුම්කර තිබෙනවා, ඩොලර් බැඳුම්කර. ඒ දේශීය වශයෙන් ලබාගත් ඩොලර් බැඳුම්කර 2028දී අහෝසි වෙනවා. 2028දී අපට දේශීය වශයෙන් ලබාගත් කිසිදු ඩොලර් බැඳුම්කරයක් ඇති වෙන්නේ නැහැ. අපට තිබෙන්නේ ද්විපාර්ශ්වීය ණය සහ බහුපාර්ශ්වීය ණය සහ ISBs. ඒවායේ ප්‍රමාණයත් ගත්තාම සමස්ත එකතුව 2028දී ඩොලර් බිලියන 2.8යි; 2029දී ඩොලර් බිලියන 3.0යි; 2030දී ඩොලර් බිලියන 3.2යි. මේ සමස්ත තත්ත්වය සහ අනෙකුත් ආර්ථික දත්ත ගත්තාම, මේ ස්ථාවරත්වයෙන් ඉදිරියට එනවා, ගරු කථානායකතුමනි. එසේ ඉදිරියට ඒමේ ප්‍රතිඵල විධියට ජාත්‍යන්තර සංවිධාන, විශේෂයෙන්ම S&P ආයතනය විසින් ලංකාව ඇතුළේ විදේශ මුදල් හුවමාරු කර ගැනීම සහ පරිවර්තනය කිරීමේ දර්ශකය පැත්තෙන් අපි CCC+ කියන තැන ඉඳලා B- කියන තැනට උසස් කර තිබෙනවා; ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහින් තිබෙනවා. International Finance Corporation එකෙනුත් අපට දැනුම් දීලා තිබෙනවා, ණය සම්බන්ධතා පවත්වාගෙන යෑමේ හොඳ ප්‍රගතියක් තිබෙනවා කියලා. ඒ අතරේ විශේෂයෙන් චෝදනා එල්ල කරමින් තිබෙනවා, අපේ සංචිත ප්‍රමාණවත් නැහැ කියලා. විදේශ සංචිත කියන්නේ, ස්වාරක්ෂකයක්. එය පවතින තත්ත්වය අනුව තීරණය වෙනවා; කලින් කලට වෙනස් වෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා අප ලබා ගත යුතු සංචිත 2023දී ඇස්තමේන්තු කරද්දී ඒ දුන්නු ඉලක්ක ඒ ගොල්ලෝ වේගයෙන් අඩු කර ගත්තු හේතුව තමයි, අප අනුගමනය කළ ක්‍රියාමාර්ග. අපි ආර්ථික ක්‍රියාවලියට ඒ සංචිත නිදහස් කළා. උදාහරණයක් වශයෙන් ගත්තාම, 2022දී, 2023දී වාහන ආනයනය සඳහා කිසිදු ඇස්තමේන්තුවක් තිබුණේ නැහැ. අපි වාහන ආනයනය සඳහා සංචිත නිදහස් කළාට පසුව මේ වන කොට LC විවෘත කර තිබෙනවා, ඩොලර් මිලියන 3.5ක් දක්වා. ඩොලර් මිලියන 3.5කට LC විවෘත කරන්නේ නැතුව සිටියා නම්, වාහන ගෙන්වූයේ නැත්නම් තවත් ඩොලර් මිලියන 3.5කින් අපේ සංචිත ප්‍රමාණය වැඩි වෙනවා.

අපි ණය ගෙවා තිබෙනවා, ඩොලර් බිලියන 2.6ක් දක්වා. ඒ අනුව ගත්තාම, අපි ඩොලර් මිලියන 6.6ක සංචිත මේ මොහොතේ පවත්වාගෙන යමින් තිබෙන්නේ ආනයනය සඳහා විශාල සංචිත ප්‍රමාණයක් වැය කරමින් සහ අපට පාලනය කරන්න බැරි අර්බුදයක් වුණු ඉන්ධනවලටත් සංචිත ප්‍රමාණයක් එළියට ගමන් කරමින් තිබියදීයි. විදේශ සංචිත කියලා කියන්නේ, ස්වාරක්ෂකයක් මිසක් ආර්ථිකය මනින එකම මිනුම් දණ්ඩ නොවෙයි. අපි ස්වාරක්ෂකය ගොඩනඟන්නේ, ආර්ථික ක්‍රියාවලියට පණ දෙමින්, එය අඩපණ නොකර ගෙනයි. එම නිසා කිසිදු පදනමකින් තොරව, "සංචිත ප්‍රමාණවත් නැහැ" කියලා කිව්වාට එය නිවැරැදි වෙන්නේ නැහැ.

ස්වාරක්ෂකය - external buffer - කියන්නේ, අප ලබා ගත යුතු ආර්ථික ඉලක්කයක් නොවෙයි. එය ඇස්තමේන්තුවක්. අපි එම ඇස්තමේන්තුව කලින් කලට වෙනස් කරමින් ආර්ථික ක්‍රියාවලියට දායක කර ගන්නවා. අප ලබා ගත යුතු ඉලක්කය වන්නේ, ශුද්ධ සංචිත ප්‍රමාණයයි. මහ බැංකුවේ මූල්‍ය කළමනාකරණය යටතේ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග තුළ එය ඉතාම නිවැරැදිව සහ වේගයෙන් අත්පත් කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ස්ථාවරත්වයත් එක්ක ඉදිරියට යන මේ ගමනේදී ශ්‍රම වාසනා අරමුදල අහෝසි කර ඒ සඳහා අවශ්‍ය කරුණු කාරණා ඉෂ්ට කිරීමටයි අපි අද මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඒ සඳහා පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගැනීම තුළින් තවදුරටත් තහවුරු වන්නේ අපේ ආණ්ඩුව මූල්‍ය විනය යහපත් ආකාරයට ඉදිරියට ගෙන එමින්, මහජන මුදල් ආරක්ෂා කරමින්, මහ ජනතාවට වග වන ආණ්ඩුවක් වන බවයි. ඒ කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Leader of the Opposition. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට සති කිහිපයකට පෙර ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් මම පළමුව ඉල්ලීමක් කළා, විසි දෙවන ආණ්ඩුකම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත්, උපරිමාධිකරණ විනිසුරුවන් පත් නොකිරීමේ තත්ත්වය පිළිබඳවත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න කියලා. පසුව මම තේරුම් ගත්තා, ඇත්ත වශයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම දැනුවත් කිරීම වඩාත් වැදගත් කියලා. අපි ඒ පිළිබඳව ලිපි ගනුදෙනුවක් කළා. මම ඒ පිළිබඳව ගරු කථානායකතුමාව දැනුවත් කළා. මේ මොහොත වන විට ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් අපට පිළිතුරක් ලැබී තිබෙනවා, ඒ ලිපිවල අන්තර්ගතය තුළින් යෝජනා වුණු ආකාරයට හෙට මධ්‍යාහ්න 12.00 සිට පස් වරු 1.30 දක්වා කාලය තුළ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවක් පවත්වා මේ කරුණු කාරණා පිළිබඳව මන්ත්‍රීවරු 225දෙනාම දැනුවත් කිරීමේ කටයුත්ත කරන්න ඒ අය සූදානම් කියලා. මම මේ ඉල්ලීම කළේ ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන්. ඒ කරපු ඉල්ලීම පිළිබඳව මම ගරු කථානායකතුමා දැනුවත් කළා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, මෙය කොටසක් පමණක් නොව මන්ත්‍රීවරුන් 225දෙනාම දැනුවත් කළ යුතු කාරණාවක් කියලා. ඒ නිසා එයට අදාළ සියලු ලිපි ලේඛන සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා.

හෙට දිනයේ මධ්‍යාහ්න 12.00 සිට පස් වරු 1.30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිත කණ්ඩායමක් පාර්ලිමේන්තුවට පැමිණෙනවා. එතුමන්ලා ගරු ජනාධිපතිතුමාත් හමු වුණා. ගරු ජනාධිපතිතුමාටත් අදහස් ඉදිරිපත් කළා. එතුමාත් සමඟ සංවාදයක් ඇති වුණා. ඒ වාගේම ඉතාම සුහදශීලී අදහස් හුවමාරුවකට ශ්‍රී ලංකා නීතිඥ සංගමය හෙට දිනයේ පාර්ලිමේන්තුවට පැමිණෙනවා. එම සාකච්ඡාව පැවැත්වෙන වෙලාව හෙට මධ්‍යාහ්න 12.00ත් පස් වරු 1.30ත් අතර කාලයයි. මම ගරු නියෝජ්‍ය කථානායකතුමා දැනුවත් කරමින් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාව දැනුවත් කරන්න කියලා. මොකද, මගේ කථාව ආරම්භ කරන්න හදන කොටම එතුමා සීට් එකෙන් ගියා. ඒ නිසා මට ඒකට කරන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගරු කථානායකතුමාව දැනුවත් කරලා පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් - භේදයකින් තොරව 225දෙනාම - මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න කටයුතු කරන්න. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන, අධිකරණයට අදාළ තවත් අණපනත් පිළිබඳව සහ උපරිමාධිකරණ - අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ - විනිසුරුවරයන් පත් නොකිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න තමයි ඒ නීතිඥ සංගමයේ කණ්ඩායම පැමිණෙන්නේ. ඒ නිසා මම මේක අවස්ථාවක් කර ගන්නවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාටම පුළුවන් ආකාරයට එයට සහභාගි වෙන්න කියලා ඉල්ලා සිටින්න. ඒ හරහා බොහොම සුහදශීලී සංවාදයකට, අදහස් හුවමාරුවකට ප්‍රවේශ වෙලා අපේ මතය, තම තමන්ගේ මතය ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා මම මගේ කථාව ආරම්භයේදී බොහොම ගෞරවයෙන් මූලාසනයේ සිටින ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ පිළිබඳව මන්ත්‍රීවරුන් 225දෙනාම දැනුවත් කරන්න කටයුතු කරන්න කියලා.

මම මගේ කථාවේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන ප්‍රධාන කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ඒවා ඉදිරිපත් කරන්න පෙර සඳහන් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. උතුරු පළාතේ, වන්නි දිස්ත්‍රික්කයේ ගරු තුරෙරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාවක් පිළිබඳව කරුණු දක්වන්න මමත් බලාපොරොත්තු වෙනවා. පෞද්ගලික පාර්ශ්වයකට සම්බන්ධ අක්කර 54ක ඉඩමක ලුණු ලේවායක් ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියකට රජය යොමු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන් ලුණු ලේවායන් ගණනාවක් තිබුණු දිස්ත්‍රික්කයක් නියෝජනය කරපු මම බුන්දල, පලටුපාන, හම්බන්තොට සහ රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ලුණු ලේවා ව්‍යාපෘතිය හරහා සිදු වූ රැකියා උත්පාදනය නිසා සැලසුණු සෙත, සුබසාධනය, සහනය පිළිබඳව දන්නවා. ඒ නිසාම මම යෝජනාවක් කරන්න කැමැතියි. අක්කර 54ක පෞද්ගලික ඉඩමක් ගන්නවා වෙනුවට සත්‍ය වශයෙන්ම ලුනු ලේවායක් ස්ථාපනය කරන්න පුළුවන් ප්‍රදේශයක් තිබෙනවා. ඒ තමයි මුලතිව් දිස්ත්‍රික්කයේ මාතලන් කියන ප්‍රදේශය. කොක්කුතුඩුවායි ප්‍රදේශයේ තිබෙන අක්කර 54ක් වූ පෞද්ගලික ඉඩම අරගෙන එතැන ලේවායක් ස්ථාපනය කරනවා වෙනුවට මාතලන් බල ප්‍රදේශයේ ඒ ලුණු ලේවාය ස්ථාපිත කිරීම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊළඟට කියන කාරණය ඔබතුමාටත් වැදගත් වෙයි. කල්මුණේ රෝහලේ බරපතළ අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. ඒ කියන්නේ ඉස්ලාම් ආගම අදහන මුස්ලිම් නිලධාරිනියන්ගේ uniform එක පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ uniform එක පිළිබඳ ප්‍රශ්නය නිසා එම නිලධාරිනියන් කල්මුණේ රෝහලෙන් තවත් රෝහලකට මාරු කර යවා තිබෙනවා. අපි දකින විධියට, ඒක සුදුසු දෙයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට තුළ ඒ ඒ ආගම්වලට, ඒ ඒ ජන කොට්ඨාසවලට, ඒ ඒ සංස්කෘතීන්වලට තමන්ගේ ආගමික රටා, ඒ සංස්කෘතික රටා අනුගමනය කිරීමේ නිදහස තිබෙනවා. ඒ නිසා මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කල්මුණේ රෝහලේ උද්ගත වෙලා තිබෙන මේ ගැටලුවට වහාම විසඳුමක් ලබා දෙන්න කියලා. අලුතින් බඳවා ගත්ත attendantsලා නවදෙනෙක් තමයි uniform එක නිසා මාරු කර යවා තිබෙන්නේ. ඔබතුමන්ලා බලයට ආවේ ජාති, ආගම්, කුල-මල, පන්ති, පක්ෂ කියන ඔය කිසිම තරාතිරම් භේදයකින් තොරව කටයුතු කරනවා කියලායි. හැබැයි ඉතින් මුස්ලිම් ජාතික attendantsලා නවදෙනෙකුගේ uniform එක පදනම් කරගෙන මේ මාරුවීම් කරන එක ඔබතුමන්ලා මැතිවරණ වේදිකාවල ඉදිරිපත් කරපු ප්‍රතිපත්තිවලට සහමුලින්ම පටහැනියි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ නිසා විශේෂයෙන්ම මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණාවටත් ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ ප්‍රශ්නය විසඳන්නට වහාම කටයුතු කරන්න කියා. ඒ මාරු කරපු මුස්ලිම් ජාතික attendantsලා නවදෙනා ආපසු එම රෝහලටම අනුයුක්ත කරලා ඒ අයගේ සංස්කෘතියට අනුකූල uniforms ලබා දෙන්න. මොකක්ද, ඒක ගැන තිබෙන ප්‍රශ්නය? ඒ නිසා මම යෝජනා කරනවා, එම කාර්යය ඉෂ්ට සිද්ධ කරන්නය කියලා.

මම මේ අවස්ථාවේදී තවත් කාරණයක් කියන්න කැමැතියි. මම සතුටු වෙනවා, අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමා එතුමාගේ ඇමති පුටුවේ ඉන්න මොහොතක මට මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලැබීම පිළිබඳව. ගරු අමාත්‍යතුමනි, ගොවි ජනතාවගේ ප්‍රශ්නය උග්‍රයි; අති බරපතළයි. ඒ අයගේ ගොවිතැන් කටයුතුවලට දරන පිරිවැයට සාපේක්ෂව අඩුම ගණනේ පුංචි ලාභයක් එක්ක හෝ ඒ අයගේ වී ටික විකුණා ගන්නට අද බැරි වෙලා තිබෙනවා.

ඔබතුමා පොඩ්ඩක් සොයා බලන්න. අද තෙත වී යන්නේ රුපියල් 80ට, 85ට. වියළි ඒවා යන්නේ රුපියල් 90ට, 95ට. යම් තැන්වල රුපියල් 100ට. හැබැයි, ඔබතුමා මේ සභාවේ කරුණු ඉදිරිපත් කරපු ආකාරයට වී කිලෝවක් නිෂ්පාදනය කරන්නට

රුපියල් 137ක් වැය වෙනවා. මේ නිසා බරපතළ තත්ත්වයක් අද නිර්මාණය වෙමින් පවතිනවා. මේ පිළිබඳව වහාම ඔබතුමාගේ අවධානය නැවත නැවතත් යොමු විය යුතුයි කියන එක මම අවධාරණය කරනවා. ගොවියාගේ නිෂ්පාදන පිරිවැයට සරිලන ආකාරයට, අඩුම ගාණේ සාමාන්‍ය ලාභයක් හෝ ලබා ගන්නට පුළුවන් ආකාරයට කටයුතු සලස්වන්න. වී ගොවීන් දුප්පතුන් බවට පත් කරන්නේ නැතුව, දරිද්‍රතාවට, පීඩනයට, අසහනයට ලක් කරන්නේ නැතුව, තෙරපන්නේ නැතුව කටයුතු කරන්න. ඒ අයගේ ජීවිත හකුළන්නේ නැතුව, මිරිකන්නේ නැතුව කරුණාකරලා වී ගොවියාට සාධාරණ මිල ලබා දෙන්නට කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ අසුන ආසන්නයේම ඉන්න ඇමතිතුමන්ලා දන්නවා, ඔබතුමන්ලා කොහොමද එදා වී ගොවියා වෙනුවෙන් කථා කළේ කියලා; ගොවිතැනේ නියැළී සිටින ජනතාව වෙනුවෙන් කථා කළේ කොහොමද කියලා. නමුත් ඒ කථාව අද ගොවි ජන සේවයට, ගොවි ජන සුබසාධනයට, ගොවි ජන ජීවිතය සුඛිත මුදිත කරවීමට සමත් වෙලා නැහැ. මම ගරු ලාල් කාන්ත මැතිතුමාට එක සංඛ්‍යාලේඛනයක් ඉදිරිපත් කරන්නම්. ගරු ලාල් කාන්ත ඇමතිතුමා, ගරු ලාල් කාන්ත ඇමතිතුමා,-

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
අහගෙන ඉන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. බොහොම හොඳයි.

ඔබතුමා දන්නවා, හෙක්ටෙයාරයකට අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණය සතු යූරියා දෙන්නට ඕනෑ කිලෝග්‍රෑම් 225ක්. එතකොට හෙක්ටෙයාරයකට ඔබතුමන්ලා ලබා දෙන්නේ රුපියල් 30,000ක සහනාධාරයක්. එතකොට ගණන් හදලා බලන්න. මම මේ කථා කරන්නේ රජයේ නිර්දේශ පදනම්ව. මේ අවසාන නිල නිර්දේශය 2013 නිර්දේශය. එතකොට, ඒ අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණය ලබා දීම සඳහා හෙක්ටෙයාරයකට යූරියා කිලෝග්‍රෑම් 225ක් ලැබෙන්නට ඕනෑ. හැබැයි, ඔබතුමන්ලා ලබා දෙන රුපියල් 30,000 පොහොර සහනාධාර අරමුදල් කිසිසේත්ම ඒකට ප්‍රමාණවත් නැහැ. මම එතැනින්ම ඔබතුමාට කියන්න හදන්නේ, පැහැදිලිවම මේ පිරිවැය පිළිබඳව ගොවි ජනතාවට ගැටලුවක් තිබෙන බවයි. ඔබතුමා හැම වෙලාවේම කියනවා, හෙක්ටෙයාරයකින් මීට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නට ඕනෑය කියන කාරණය. ඔබතුමා ඒ කාරණාව කියන ගමන් පොඩ්ඩක් ගණන් හදලා බලන්න, යන පිරිවැයත්. බිත්තර වී, පොහොර, කෘෂි රසායන මිල, උපකරණ මිල, වනඅලි මිනිස් ගැටුම තුළ නිර්මාණය වෙන වගා හානිය, ජීවිත හානිය, දේපළ හානිය කියන මේ හැම දෙයක්ම නිසා ඇත්ත වශයෙන්ම ගොවියා මුහුණ දෙනවා බරපතළ දුෂ්කරතාවලට. ඒ නිසා විශේෂයෙන් මම නැවත නැවතත් ඔබතුමාට කියන්න කැමැතියි, මේ රටේ ලක්ෂ 220ක ජනතාවගෙන් සියයට 25ක් කෘෂිකර්මාන්තයේ නියැළිලා සිටිනවා කියන කාරණය. සියයට 26ත්, සියයට 27ත් අතර ප්‍රමාණයක් ශ්‍රම බලකාය හැටියට ඉන්නවා.

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්තය ලබා දෙන දායකත්වය ගණනය කරන එක පිළිබඳවත් බරපතළ ගැටලුවක් තිබෙන බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have exhausted the time allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මාරඹේ මැතිතුමා, ගාමිණී පුෂ්පකුමාර මැතිතුමා, ජීවිකා වීරහේවා මැතිනිය, ප්‍රදීපා සිල්වා මැතිනිය පැහැදිලිවම කියා තිබෙනවා, දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්තයෙන් ලබා දෙන දායකත්වය ගණනය කිරීමේදී බරපතළ දෝෂ තිබෙන බව.

ඒ කියන්නේ, වී නිෂ්පාදනය විතරක් ගණන් ගන්නවා, හැබැයි ඒ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නිර්මාණය වන agrifoodsවලින් දළ දේශීය නිෂ්පාදිතයට තවත් අමතර සියයට 7ක් එකතු කරනවා. නියමානුකූලව බැලුවොත්, කෘෂි කර්මාන්තයෙන් දළ දේශීය නිෂ්පාදිතයට සියයට 15ක දායකත්වයක් ලබා දෙනවා. ඉතින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මේ කරන අඩුපාඩුව, මේ වරද නිවැරැදි කරන්නට කටයුතු කරන්න කියලා මම කියන්න කැමැතියි. තව මාස දෙකක්, තුනක්, හතරක්, පහක් යනකොට මේ තත්ත්වය මැඩ පැවැත්වෙයි, මේ තිබෙන උද්සෝෂණකාරී තත්ත්වය, මේ පීඩනය මැඩ පැවැත්වෙයි, ඒක යටපත් වෙයි කියලා ලාල් කාන්ත මැතිතුමා හිතාගෙන ඉන්නවා ඇති. ඒක වැරැදියි. ලාල් කාන්ත මැතිතුමනි, වී ගොවියාගේ බරපතළ ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න ඔබ කල් මරමින් සිටින හැම මොහොතක්, මොහොතක් පාසාම මේ රටේ වී ගොවියා සහ අනෙකුත් ගොවිතැන් කටයුතුවල නියැළී සිටින ගොවි ජනතාව තදබල ලෙස පීඩනකාරී, අසහනකාරී ජන ජීවිතයකට ඇද දමනවා. නියත වශයෙන්ම ඒ අයගේ ආර්ථිකය හැකිළෙනවා. ජනාධිපතිවරණ, මහ මැතිවරණ, පළාත් පාලන මැතිවරණවලදී කැප කිරීම් කරලා, ඔබගේ වචනය විශ්වාස කරලා, ඔබට දසලක්ෂ ගණනින් ඡන්ද දුන්, බරපතළ දරිද්‍රතාවකින් සිටි ගොවි ජනතාව, ඔබ කුඹුරට බැහැලා ගොයම් කකා වී කිලෝවකට රුපියල් 150ක සහතික මිලක් දෙනවායැයි වූ පොරොන්දුව ඉෂ්ට වේයැයි බලාපොරොත්තුවෙන් හිටපු ගොවි ජනතාව, අවසානයේ අද අන්ත අසරණභාවයට පත්වෙලා තිබෙනවා. ඒ අයට මේ වාගේ හතුරුකම් කරන්නේ නැතුව ගොවි ජනතාව වෙනුවෙන් ඔබට ලබා දිය හැකි උපරිම සහනය, උපරිම ශක්තිය ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මට අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව, ගරු විපක්ෂ නායකතුමා මතු කරපු ප්‍රශ්නයකට උත්තර දෙන්න ඕනෑ. එතුමා ලුණු ලේවායක් පිළිබඳව කථා කළා. විෂය භාර ඇමතිවරයා හැටියට මම ඒ ගැන යමක් කියන්න ඕනෑ. රජය හැටියට අපි වන්නි ප්‍රදේශයේ හෝ වෙනත් කිසිම තැනක පෞද්ගලික ඉඩමක් අරගෙන ලුණු ලේවායක් හදන්න තීරණයක් අරගෙන නැහැ. අලිමංකඩ ලුණු ලේවාය ආසන්නයේ තිබෙන කුරුන්වත්තිවු ලුණු ලේවාය, දියුණු කරන්න පුළුවන් ලුණු ලේවායක්. ඒක industrial salt, එහෙම නැත්නම් chemical salt හැටියට අපනයනය සඳහා ලුණු නිෂ්පාදනය කරන්න පුළුවන් ඉතාම දියුණු ලුණු ලේවායක් බවට පත් කරන්නට රජය දැනට තීරණය කර තිබෙනවා. ඒක රජයේ ඉඩමක්. දැනට තිබෙන එම රජයේ ලුණු ලේවාය තුළ යුද්ධය කාලයේ deep tanks හදලා තිබුණා. ඒ ලුණු ලේවාය තමයි අපි වැඩිදියුණු කරන්න තීරණය කර තිබෙන්නේ. එහෙම නැතුව වන්නි ප්‍රදේශයෙන් හෝ උතුරු පළාතේ කොතැනකින්වත් කිසිම පෞද්ගලික ඉඩමක් අරගෙන නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, we are not going into a debate. He just clarified your matter.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, give me just a few seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a minute.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාව මා වෙත යොමු කළේ ITAK පක්ෂයේ ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. එතුමා නිරන්තරයෙන්ම වන්නි බලප්‍රදේශයේ මූලතිව් කේන්ද්‍ර කරගෙන ලොකු වැඩ කොටසක් කරන මන්ත්‍රීවරයෙක්. කොක්කුතුඩුවායි කියන ප්‍රදේශයේ අක්කර 54ක මෙවැනි ලුණු ලේවායක් ස්ථාපනය කරනවාය කියලා එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම, පුදුමාතලන් බලප්‍රදේශය ඊට වැඩිය යෝග්‍යයි කියන එක එතුමා ප්‍රකාශ කළා. මැරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ තමයි ඒක පිහිටා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මෙහෙම අඩුපාඩුවක් සිදුවෙලා තිබෙනවා නම්, ගරු රවිකරන් මැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ඒක නිවැරදි කරන්න ඔබතුමාට පුළුවන්. ඇත්ත වශයෙන්ම පෞද්ගලික මනුස්සයෙකුගේ ඉඩම් අරගෙන ඒක කරන්න අවශ්‍ය නැහැ. රජයේ ඉඩමක් උපයෝගී කරගෙන ඒක ක්‍රියාත්මක කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, shall we move on to the next speaker?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පැහැදිලිවම උතුරු පළාතේ බරපතළ ඉඩම් ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය කාලය පුරාවටම පෞද්ගලික ඉඩම්, ජනතාව පරිහරණය කරපු ඉඩම්, ජනතාව වගා කටයුතු කරපු ඉඩම්, සමහර අවස්ථාවලදී ජනතාව පදිංචි වුණු ඉඩම් රජයට අත් පත් කරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, you are taking a lot of time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට තව විනාඩියක් දෙන්න. පොඩ්ඩක් ඉන්න, කලබල වෙන්න එපා. උතුර ගැන කථා කරනකොට කලබල වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I do not accept what you said, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විශේෂයෙන්ම ඒ ඉඩම් අත්පත් කර ගත් ජනතාවට යම් සහනයක් ලබා දෙන්නට, ඒ අයගේ ඉඩම් ගැටලුවට විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. Mano Ganesan?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

Sir, I was at that discussion this morning, but -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That is okay. We have had enough of that. Thank you. - *[Interruption.]* It is irrelevant here, Hon. Member, please understand.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම ඒ සාකච්ඡාවේ හිටියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක ඔබතුමන්ලාගේ පෞද්ගලික සාකච්ඡාවක් නේ.

Next, the Hon. Wijesiri Basnayake, you have ten minutes.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි විවාදයට භාජන කරන්නේ 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීමත්, ඒ වාගේම - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, අවස්ථාව දීමට කැමැතිද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Mano Ganesan, he is willing to take that on. Hon. Member, I will give you one minute.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ සාකච්ඡා කරනකොට මාත් හිටියා. ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා ඒ කාරණය ඉදිරිපත් කළා. කරුණාකරලා එතුමා කැඳවලා, ඒක පෞද්ගලික ඉඩමක්ද, ආණ්ඩුවේ ඉඩමක්ද කියලා විසඳා ගන්න. සද්භාවයෙන් මේක කියන්නේ. වෙන මොනවත් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි එහෙම කරන්නේ නැහැ. පෞද්ගලික ව්‍යාපාර, පෞද්ගලික ලුණු ලේවායන් පවත්වාගෙන යනවා නම් ඒක වෙනම එකක්. නමුත් රජය හැටියට අපි විපක්ෂ නායකතුමා කියන ආකාරයට පෞද්ගලික ඉඩමක් අරගෙන ලුණු ලේවායක් කරන්න තීරණය කරලා නැහැ. මම රවිකරන් මන්ත්‍රීතුමා එක්ක කථා කරන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Wijesiri Basnayake, you may continue.

[පූ.භා. 11.09]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි සාකච්ඡාවට භාජන කරන්නේ 2019 අංක 15 දරන පනතින් සංශෝධිත, 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතින් පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීමත්, ඒ වාගේම 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව එය වසා දැමීමේ කාර්යයත් පිළිබඳවයි. අදත් සුපුරුදු පරිදි විපක්ෂ නායකතුමා පෙන්වා දුන්නා එතුමාගේ දේශපාලන දරිද්‍රතාව. අද දවසේ මාතෘකාව පැත්තක තියලා විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම, වී නිෂ්පාදනය වැනි කාරණා පිළිබඳව, - හැම දාම පාරන තුවාලය - තමයි එතුමා කරුණු දැක්වූයේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා ආයතනයක ප්‍රධාන සම්පත් කිහිපයක් තිබෙන බව. ඒ තමයි, භෞතික සම්පත් - physical resources, මූල්‍ය සම්පත් - financial resources - සහ මානව සම්පත් - human resources. විශේෂයෙන්ම මානව සම්පත හරිම වැදගත්. ආයතනයක අනෙකුත් සම්පත්වලින් ඒක සුවිශේෂී වෙනවා. මානව සම්පත හරහා තමයි ආයතනයක අරමුණු ඉෂ්ට කර ගන්නේ. එතැනදී මානව සම්පතේ සුබසාධනය හරිම වැදගත්. ඒ මානව සම්පත හොඳින් රැක බලා ගන්න කම්කරු අමාත්‍යාංශය යටතේ 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල ස්ථාපිත කළා. ඒ අරමුදල ස්ථාපිත අරමුණු ගණනාවක් තිබෙනවා, විශේෂයෙන්ම ඒ සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම, ඔවුන්ට විවිධ අවස්ථාවල අවශ්‍ය මූල්‍ය ආධාර සැපයීම ආදී වශයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අරමුණු, ඒ කාර්යයන් ඉෂ්ට කර ගන්න ඔවුන් මුදල් සොයා ගත්තේ කොහොමද? ඒ සඳහා ආදායම් මාර්ගයක් ලෙස ජාතික ලොතරැයි මණ්ඩලයත් එක්ක එකතු වෙලා මුලදී "ශ්‍රම වාසනා" ලෙසත් පසුව "NLB Jaya" විධියටත් ලොතරැයියක් නිර්මාණය කරලා ඒ හරහා ඒ අරමුදල තර කළා. පසුගිය වසර 5 තුළ ශ්‍රම වාසනා අරමුදලේ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කර බැලුවොත්, 2024 වෙනකොට ඛේදවාචකයක් තිබෙන්නේ. ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය සෘණ 14යි. ඒ විතරක් නොවෙයි. ඒ අරමුදලේ ලොතරැයි ආදායම පසුගිය වසර 5න් අවසන් වසර වෙනකොට සෘණ 9ක වර්ධනයක් තිබෙන්නේ. මේක වෙන්නේ කොහොමද?

2024දී ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාවේ මෙන්න මෙහෙම කියනවා. "එහි අධ්‍යක්ෂ මණ්ඩලය අටදෙනෙකුගෙන් සමන්විතයි. ඉන් හතරදෙනෙකුම අමාත්‍යවරයා විසින් පත් කරනවා. ඒ නිසා තීරණ ගැනීමේදී ඇති වෙන අපහසුතාව ශ්‍රම වාසනා අරමුදල හමුවේ තිබුණු ප්‍රබල තර්ජනයක්" කියලා. ඒ විතරක් නොවෙයි. 2024දී රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව සමාලෝචනයක් කරනවා. ඒ සමාලෝචනයේදී ශ්‍රම වාසනා අරමුදල ඈවර කළ යුතු, නැත්නම් ඉවත් කළ යුතු ආයතනයක් විධියට එම සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරනවා. ඒ නිර්දේශය දීමේදී සැලකිල්ලට ගන්නේ මොනවාද? ඒ ආයතනය පිහිටුවීමේ, ඒ ස්ථාපිත අරමුණුවලින් අපගමනය වෙලා, බැහැර වෙලා, එතැනින් පරිබාහිර කටයුතු ගණනාවක් සිද්ධ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ ආයතනයේ කාර්යක්ෂමතාව ඉතාම දුර්වල මට්ටමක පැවතිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් එවැනි තත්ත්වයක් ඇති වන්නේ කොහොමද? එවැනි දැවැන්ත අරමුදලක් පසුගිය කාලපරිච්ඡේදය

[ගරු විජේසිරි බස්නායක මහතා]

පුරා සෘණ වර්ධන වේගයක් අත්පත් කර ගන්නේ කොහොමද? අපි දැක්කා, ඒ කාලපරිච්ඡේදයේදී මේ අරමුදල මෙහෙයවූයේ එදා හිටපු කම්කරු ඇමති වූ මනුෂ නානායක්කාර මහතා බව. ඔහු මොනවාද කළේ? මෙන්න මේ මානව සම්පතේ සුබසාධනයට වෙන් කරන්න තිබුණු මුදල්වලට මොකද කළේ? ඒ කාලපරිච්ඡේදයේදී පැවතුණු මැතිවරණ ප්‍රචාරක වැඩසටහන්වලදී පුද්ගල ප්‍රතිරූප පුම්බන්න, ප්‍රවර්ධනය කරන්න ඒ මුදල් වෙන් කළා. ඒ විතරක් නොවෙයි. දිස්ත්‍රික්ක 12ක් මුල් කරගෙන කොක්ටේල් සාද පැවැත්වූවා. ඒ වාගේම ඒවා සංවිධානය කරන්න අතිකාල දීමනා, ප්‍රවාහන වියදම්, පරිපාලන වියදම් විශාල වශයෙන් දරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එක කාරණයක් විතරයි.

අපි දැක්කා, පසුගිය වසර 50 පුරාවටම පත් වෙච්ච හැම ආණ්ඩුවක්ම මොකද කළේ කියන එක. මහජනතාවගෙන් බදු අරගෙන, ඒවා අරමුණක් රහිතව, වගකීම් රහිතව වියදම් කළා. ඒ හරහා දැවැන්ත අය වැය හිඟයක් නිර්මාණය වනවා. මේ රටේ පවුල් ලක්ෂ 62ක් විතර ඉන්නවා. අද දවසේත් ඒ පවුල් ලක්ෂ 62න් පවුල් ලක්ෂ 35ක් විතර දිළිඳු මට්ටමේ ඉන්නේ. එහෙම නම්, ඒ රාජ්‍යයන් මොනවාද කළේ? ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් නොවෙයි මේ මුදල් වෙන් කළේ. අපට අවශ්‍ය වන්නේ මොකක්ද? ජාතික ජන බලවේගයට අවශ්‍ය වන්නේ, මෙන්න මේ මූල්‍ය විනය ඇති කිරීමයි. අපි මේ අරමුදල වහලා දැම්මත්, කම්කරු අමාත්‍යාංශය යටතේ 2027දී රුපියල් මිලියන 50ක් වෙන් කරලා අපි මේ කටයුත්ත ඉස්සරහට කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ විපක්ෂ නායකතුමා සඳහන් කළා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස පිළිබඳව. අපි දැක්කා, පසුගිය කාලපරිච්ඡේදය පුරාම මේ විපක්ෂය විනිසුරු විශ්‍රාම වයස දඩමීමා කරගෙන, දැවැන්ත පුරවැසි මතයක් ආණ්ඩුවට එරෙහිව නිර්මාණය කරන්න උත්සාහ කළ ආකාරය. අපි දන්නවා, නිල සංඛ්‍යාලේඛනවලට අනුව ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ නොවිසඳුණු නඩු මිලියනයකට වැඩිය තිබෙන බව. ඒ වාගේම දිසා අධිකරණවල නඩු ලක්ෂ දෙකකට වැඩිය ගොඩගැහිලා තිබෙනවා. මේ නඩු ප්‍රමාදය කියන්නේ, ඒ ගොනු සංඛ්‍යාව විතරක් නොවෙයි. ඒකෙන් ගම්‍ය වන්නේ, එක්කෝ සංවර්ධනය නොකළ ඉඩමක්, එහෙම නැත්නම් නීතිඥ ගාස්තු ගෙවලා බංකොලොත් වන ව්‍යාපාරයක්, එහෙම නැත්නම් අහිමි වන වැඩ දිනයක්, එහෙම නැත්නම් නැවත ලබා ගත නොහැකි දරුවෙකුගේ ළමා කාලයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඒ සියලු විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස පොදුවේ වසර දෙකකින් දීර්ඝ කිරීමට ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ පසුබිම තේරුම් ගන්න ඕනෑ. ඒක රටේ ජනතාවට තේරෙනවා. හැබැයි, දේශපාලන දරිද්‍රතාවෙන් පෙළෙන විපක්ෂයට තමයි මේ පිළිබඳව නොතේරෙන්නේ. අපි දන්නවා, ජාතික ජන බලවේගය වටා දේශපාලන බලය ගොඩනැඟුණේ ඇයි කියලා. අපි පොරොන්දු වුණා, ඒ දූෂණයට එරෙහිවීමට, ඒ වාගේම නීතිය සැමටම සමානව ක්‍රියාත්මක වීමට, ඒ වාගේම පැරණි දේශපාලන වරප්‍රසාද අභියෝගයට ලක් කිරීමට. ඒ කාරණා අපි මේ මොහොතේ ඉතා හොඳට ඉටු කරමින් සිටිනවා.

මේ සුන්බුන් විපක්ෂය තවමත් යල කන්නයේ වී කිලෝවකට රුපියල් 150ක් ඉල්ලමින්, ඒ ගොවීන් ඉස්සරහට දාලා උද්ඝෝෂණ කරගෙන යනවා. අද ඒ උද්ඝෝෂණ හීන්කෙඳිරි බවට පරිවර්තනය වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, නොවැම්බර් මාසයේදී ඇති වෙච්ච "දිට්වා" සුළි කුණාටුව. පැය කිහිපයක් තුළ ගංගා, ඇළ දොළ විතරක් නොවෙයි, විශාල කඳු පවා හොලවා දැම්මා. හැබැයි, "දිට්වා" සුළි කුණාටුවෙන් නොසෙල්වී, ස්ථාවරව පැවති එකම ආණ්ඩුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. අපි දැක්කා, ශ්‍රී ලංකා රජයක් විසින් මෑත ඉතිහාසයේ සිදු කරන ලද ආපදා සහන ලබා දීමේ, ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ විශාලතම මෙහෙයුම කළේ අපේ අනුර දිසානායක ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් බව. අපි දැක්කා, ඒ සුළි කුණාටුව, වර්ෂාව පිළිබඳව මේ ආණ්ඩුව පූර්ව දැනුම්දීමක් නොකිරීමෙන් ජීවිත බේරා ගැනීමට නොහැකි වුණා කියන මතවාදය ජනගත කරන්න මේ සුන්බුන් විපක්ෂය උත්සාහ කළ බව. ඒ වාගේම ආණ්ඩුව පෙරළා දමන්න ඒ කුණාටුව යොදා ගැනීමට හැකි වේ යැයි සුන්බුන් විපක්ෂය දිගටම විශ්වාස කළා. නමුත්, මොකක්ද වුණේ? විපතට පත් වෙච්ච ජනතාව ජාතික ජන බලවේග ආණ්ඩුවත් එක්ක දිගටම හිටියා. ඒත් එක්කම අපි දැක්කා, කැලණියේ නයි නටවපු සමහර නාළිකා ගිහිල්ලා මේ ආණ්ඩුවට එරෙහිව ජන මතයක් හදන්න voice-cuts ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මාධ්‍ය මෙහෙයුම අසාර්ථකයි. ඉතින්, මේ වර්තමාන ආණ්ඩුව වසර දෙකකට ආසන්න කාලයක් තුළ ජාතික ආර්ථිකය ශක්තිමත් කරලා ඉතා හොඳින් මේ කටයුතු කරගෙන යනවා. නමුත්, මේ තිබෙන පරිසරය මොකක්ද? කුමන්ත්‍රණකාරී උපාය මාර්ග ක්‍රියාත්මක වන පරිසරයක් තමයි තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Wijesiri Basnayake, your time is up.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මට පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන්, මා මෙම කරුණත් කියන්න ඕනෑ. සාධනීය ලෙස රටක වැඩ කරගෙන යන ජනතාවාදී පාලනයක් පලවා හැරලා, රටක් බංකොලොත් කරපු, ඒකේ සාරය උරා බීපු පිරිසකට යළිත් මේ රට භාර දෙනවාද කියන කාරණාව මේ රටේ ජනතාව අද ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් සිටිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව යටතේ, ස්ථාවර නියෝග 115හි මෙසේ සඳහන් වනවා:

"කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් අටදෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ සභානායකවරයා විමසා, කථානායකවරයා විසින් කාරක සභාවට යොමු කිරීම පිණිස නියම කරනු ලබන පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සඳහා වෙන් කළ යුතු කාල සීමාව සහ වෙනත් කරුණු සලකා බලා තීරණය කිරීම, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය."

මෙහි අවසාන කොටසේ පැහැදිලිව තිබෙනවා, "පාර්ලිමේන්තුවේ සභානායකවරයා විමසා කථානායකතුමා විසින් කාරක සභාවට යොමු කිරීම පිණිස නියම කරනු ලබන පාර්ලිමේන්තු වැඩකටයුතු" කියලා.

ගරු කථානායකතුමනි, අගෝස්තු 7වැනි දා දහවල් 12ට ගරු කථානායකතුමාගේ සහ පක්ෂ, විපක්ෂ සාමාජිකයින්ගේ නායකත්වයෙන් පැවැත්වුණු Parliamentary Business Committee එකේ Minutesවල 5.3 යටතේ මේ කාරණය ඉතා පැහැදිලිව තිබෙනවා. විපක්ෂයෙන් කිව්වා, හෙට දිනයේදී යම් වෘත්තීය සංවිධානයකින් මන්ත්‍රීවරුන් කැඳවන්න දින දාගෙන තිබෙනවා කියලා. එහෙම දින දාගත්තා කියලා මාධ්‍යවලට කියලා තිබෙනවා. පළමුවැනි කාරණය තමයි, කෙනෙක් මාධ්‍යවලට එහෙම කිව්ව පළියට මන්ත්‍රීවරුන් කැඳවන්න බලයක් නැහැ. පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය පිළිබඳව ලේකම් කාර්ය මණ්ඩලය සහ කථානායකතුමා - සියලුදෙනාම - සිටින විට තීරණය කළා, සියලු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම කළ හැක්කේ සභානායකවරයාගේ ද එකඟතාව සහිතව Parliamentary Business Committee එකේ තිබෙන එකඟතාව මත කියලා. ඒ වාගේම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව සියලු මන්ත්‍රීවරු කැඳවීමට යම් කිසි වෘත්තීය සංවිධානයකටවත්, වෙනත් කාටවත් කිසිසේත්ම අවසරයක් දීලා නැහැ. ඒක ඉතා පැහැදිලි කරුණක්. එහෙම තිබියදී විපක්ෂ නායකවරයා එවැනි කථාවක් කිව්වා. ඊට පස්සේ එක එක ගැතිකම් කරන මාධ්‍යවල ඒ සම්බන්ධව බොරු ලියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන මන්ත්‍රීවරු එකතු කිරීමේ බලයක් එතුමාට නැහැ. එතුමාට එතුමාගේ පක්ෂයේ කිහිප දෙනෙක් එකතු කරගන්න පුළුවන් වෙයි. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ එකඟතාවකින්, සභානායකවරයා විමසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනාම කැඳවන්න කියලා තමයි මෙහි තිබෙන්නේ. එතකොට කිසිම වෘත්තීය සංවිධානයකටවත්, වෙන සංවිධානයකටවත් මන්ත්‍රීවරු කැඳවන්න බලයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් එක ඔබතුමාත් දන්නවා, වෘත්තීය සංවිධාන අතර විවිධ බෙදීම් තිබෙන බව. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ Minutesවල මේ පිළිබඳව ඉතා පැහැදිලිව තිබෙනවා. පොදු එකඟතාවෙන් එක එක වෘත්තීය සංවිධාන ඇවිල්ලා මන්ත්‍රී කණ්ඩායම් දැනුවත් කරන එක කවදාවත් වෙලාත් නැහැ, එහෙම කරන්නත් බැහැ. කවදාවත් එහෙම වෙලා නැහැ. පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සංශෝධන හෝ කුමන දෙයක් හෝ ගැන තමන්ගේ කැමැත්තෙන් මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න පුළුවන්. මන්ත්‍රීවරුන්ට කැමැති දෙයකට යන්නත් පුළුවන්. හැබැයි, ඒක පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් සම්බන්ධ කරගෙන කරන්න විපක්ෂ නායකතුමාට කිසිම බලයක් නැහැ. ඒ නිසා ඇත්තටම එක පැත්තකින් ඒ ප්‍රකාශයේත් අඩුවක් තිබෙනවා. ඊට පස්සේ ඒක misuse කරන වේළෙන මාධ්‍ය ටිකකුත් තිබෙනවා. ඒ නිසා අපි ඒක ප්‍රතික්ෂේප කරනවා. බොරු කියන්නේ නැතුව අපි කවුරුත් මේ සභාවේ යම්කිසි විධිමත් විධියකට හැසිරෙමු කියලා අපි ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ ඒ Minutes මම **table*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mano Ganesan, what is it?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
විපක්ෂ නායකතුමා ඒ ප්‍රකාශය කරනකොට මම මේ සභාවේ හිටියා. එතුමා ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කළා, මන්ත්‍රීවරුන් 225දෙනාට මේ ගැන දැනුම් දෙන්න කියලා. එච්චරයි. එතුමාට බලය තිබෙනවාද, නැද්ද කියන එක වෙන කථාවක්. මාධ්‍යවල මොනවා පළ වනවාද කියලා කියන්න අපි දන්නේත් නැහැ. මාධ්‍යවලට උත්තර දෙන්න යන්න එපා, ගරු සභානායකතුමනි. අපි ඔබතුමාට ගරු කරනවා. මාධ්‍යවලට උත්තර දෙන්න යන්න එපා. මාධ්‍ය ඕනෑ දෙයක් ගැන කථා කරනවා නේ. එහෙම නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමා කිව්ව කාරණය සම්බන්ධව මම නැවත කියන්නම්. ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් ඉල්ලුවා කියන ඉල්ලීම සම්බන්ධව කිව්වොත්, නීතිඥ සංගමයෙන් මෙහෙම එකක් ඉල්ලා තිබෙනවා, ඒකට මෙන්න මේ අහවල් දවසේ, අහවල් වෙලාවේ මන්ත්‍රීවරුන් එකතු කරලා දෙන්න කියලා විපක්ෂ නායකතුමා මීට සති කිහිපයකට කලින් ගරු කථානායකතුමාට ලිපියක් එවලා තිබුණා. ඊට පස්සේ නීතිඥ සංගමය මොකක්ද කළේ? අගෝස්තු 04වැනි දා එතුමන්ලා එවපු පිළිතුරේ print එකක් මම පසුව අරගෙන දෙන්නම්. මේක, public knowledge. ඒගොල්ලන් මොකක්ද කළේ? ඒගොල්ලන් ඒක ප්‍රතික්ෂේප කළා. නීතිඥ සංගමය කියන්නේ දේශපාලන පක්ෂයක අතකොළුවක් නොවෙයි, නීතිඥ සංගමයේ අවබෝධයෙන් තොරව කොහොමද විපක්ෂ නායකතුමා වෙලාවල් දෙන්නේ කියලා ඔවුන් අහලා තිබුණා. ඒක අපි minute කරලා තිබෙනවා, Parliamentary Business Committee එකේදී. හරි ක්‍රමයට නොවෙයි ඒක එවලා තිබෙන්නේ කියන එක පිළිගත්තා. ඒ නිසා නීතිඥ සංගමයම මෙතුමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා, public statement එකකින්.

අනෙක, අපි කවුරුත් දන්නවා, නීතිඥ සංගමයට විවිධ බෙදීම් තිබෙන බව. නීතිඥ සංගමයට එක මතයක් නැහැ. ඒකේ නීතිඥයෝ මේ කාරණය සම්බන්ධව විවිධ ස්ථාවර දරනවා. ඒගොල්ලන් පසුව එක ස්ථාවරයක් දරයි. ප්‍රධාන වශයෙන් ගත්තොත්, පාර්ලිමේන්තුවේ මේවා කරන විධියට - procedure එකට - සහමුලින්ම මේක විරුද්ධයි. ඒක තමයි, පළමුවන කාරණය.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

දෙවන කාරණය මෙයයි. අපි මේ අවස්ථාව දුන්නොත් නීතිඥ කණ්ඩායම් ඔක්කෝටම අවසර දෙන්න වෙයි. එහෙම එකක් නැහැ. එහෙම කරන්න බැහැ නේ. ඒ නිසා ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම කැඳවනවා කියලා කියන්න මට බලයක් නැහැ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
එතුමා එහෙම කිව්වේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමා එහෙම තමයි කියලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mujibur Rahuman - [*Interruption.]* We are not going in for a debate on this, Hon. Mano Ganesan.

Hon. Mujibur Rahuman, you may start your speech.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, we are not going in for a debate on this.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔබතුමා මයික් එක දෙන්න කැමති නැහැ නේ. කැමති නැත්නම් මම මෙහෙම කථා කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, it is not because කැමති නැහැ. We are not going in for a debate on this. He had made himself clear and it is in reply to the Hon. Leader of the Opposition's request.

Hon. Mujibur Rahuman, you may proceed, please.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ කථාව සම්බන්ධයෙන්,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, are you going to speak? - *[Interruption.]* Hon. Mujibur Rahuman, - *[Interruption.]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
සභානායකතුමාට කේන්ති ගියාට මට කරන්න දෙයක් නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට පෞද්ගලිකවත්, පක්ෂයක් ලෙසවත් කිසිම කේන්තියක් නැහැ. ජනාධිපතිතුමා එක්ක කරපු සාකච්ඡාවේදී වෙච්ච දේ දැක්කාට පස්සේ අපට කේන්ති යන්නේ නැහැ, හිනා තමයි යන්නේ. *[බාධා කිරීම්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා එතුමාට මයික් එක දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
This is with regard to the Hon. Leader of the Opposition's request. He is in his seat.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි මේක Parliamentary Business Committee එකේ minute කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙතැන දේශපාලනය අදින්න හදන්න එපා. මෙතැන තිබෙන්නේ procedural error එකක්. මේ තිබෙන්නේ බොරුවක් නොවෙයි. බලන්න, මා ළඟ මේ තිබෙන්නේ විපක්ෂ නායකතුමාගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරලා BASL එකෙන්ම දාපු ලියුම. ඒක public knowledge.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව දුන්නා නම් හරි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාට අවස්ථාව දෙන එක මගේ වගකීමක් නොවෙයි. ඒක නියෝජ්‍ය කථානායකතුමාගේ වැඩක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I have to respond to the Hon. Leader of the House.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, you may. I will give a few minutes to do that.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව ඉදිරිපත් කරපු සියලුම ලිපි ලේඛන මම එකින් එක සභාගත කරන්නම්. 2026 ජූනි 08වැනි දා මම නීතිඥ සංගමයේ සභාපතිතුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා නීතිඥ සංගමය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ කරුණු කාරණා පිළිබඳව දැනුවත් කිරීමක් කරන එක වැදගත් කියන කාරණාව සම්බන්ධයෙන්. ඒක තමයි මේ ලිපිය. 2026.06.08 දින ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති වෙත මම යොමු කරන ලද ලිපිය ඇමුණුම 1 ලෙස මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, this may be discussed at the Committee on Parliamentary Business; this is not an appropriate forum to discuss this.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා යම් අදහසක් ඉදිරිපත් කළා. මටත් අවස්ථාව දෙන්න, ඒකට උත්තර දෙන්න. මම කලින් කිව්ව ලිපිය ඉදිරිපත් කළේ 2026 ජූනි 08වැනි දා. 2026 ජූලි 31වැනි දා මම නැවතත් වරක් ලිපියක් යැව්වා, නීතිඥ සංගමයේ සභාපතිතුමාට. මොකද, මා පෙර ලියපු ලිපියේ අඩුපාඩුවක් දැක්කා. ඒ අඩුපාඩුව නිවැරදි කරගෙන මම එතුමාට ලිපියක් යැව්වා, මේක ගැන විපක්ෂයේ මන්ත්‍රීවරුන් විතරක් නොවෙයි, සමස්ත පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීම වැදගත් කියලා. 2026 ජූලි 31 දිනැති ඇමුණුම 2 දරන එම ලිපිය මම ඉදිරිපත් කරනවා.

ඒ වාගේම, මම එදාම ගරු කථානායකතුමාට ලිපියක් යැව්වා, මම නීතිඥ සංගමයේ සභාපතිතුමාට මෙන්න මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කළා,- *[බාධා කිරීමක්]* මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please, wind up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා සභානායකතුමාට බාධා කළේ නැහැ නේ. No, no. I have to reply.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He replied to what you had said about this.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
And, he requested that this be discussed at the Committee on Parliamentary Business.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම උත්තර දෙන එකෙන් චෝදනාවකට බරපතළ තර්ජනයක් එල්ල වෙනවාට ඔබතුමා මාව නිහඬ කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you one more minute.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මට අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම නීතිඥ සංගමයේ සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු 225දෙනාම දැනුවත් කරන්න කියලා. මම ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාව දැනුවත් කළේ අද - ඊයේ නොවෙයි, 2026.07.31වැනි දා. එහෙම කරලා මම මේ සභාවේ ප්‍රසිද්ධියේ ඒක ප්‍රකාශ කළා. මම ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාව දැනුවත් කරන්න යවපු 2026.07.31 දිනැති ලිපිය ඇමුණුම 3 වශයෙන් මම ඉදිරිපත් කරනවා.

ඊට පස්සේ ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් මට ලිපියක් එව්වා. ඒගොල්ලන් මේක ප්‍රතික්ෂේප කළේ නැහැ. ඒගොල්ලන් කිව්වා, මේක හොඳ අදහසක් කියලා. හැබැයි අපි කියපු දිනය උචිත නැහැ කියන එක තමයි එතුමන්ලා මේ ලිපියෙන් කියන්නේ. එතුමන්ලා කියා තිබෙනවා, මේක හොඳ අදහසක්, මේක කරන්න කැමැතියි, හැබැයි ඒ දිනය සුදුසු නැහැ කියලා. 2026.08.04 දිනැති එම ලිපිය මම ඇමුණුම 4 වශයෙන් ඉදිරිපත් කරනවා.

ඒ වාගේම, මම ලිපියක් මඟින් නීතිඥ සංගමයේ සභාපතිතුමාගෙන් - from the President of the Bar Association - නැවත වරක් ඉල්ලීමක් කළා, හෙට දිනයේ හරි ඇවිල්ලා මේ කරුණු කාරණා පිළිබඳව මන්ත්‍රීවරු 225දෙනාම දැනුවත් කරන්න කියලා. ඒකට ප්‍රතිචාරයක් හැටියට එතුමා උත්තරයක් එව්වා, එතුමා ඒකට සූදානම් කියලා. මොනම අවස්ථාවකදීවත් අපි මේ වැඩ කටයුත්ත කළේ පාර්ලිමේන්තුවට හංගලා නොවෙයි, සියලුදෙනාම දැනුවත් කරලා. ඒ නීතිඥ සංගමය වෘත්තීය සමිතියක් කියලා කිව්වාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෘත්තීය සමිතියක් කියලා කිව්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නීතිඥ සංගමය වෘත්තීය සමිතියක් කියලා කිව්වා. කොහොම හරි ඒගොල්ලන් පෙනී හිටපු වෘත්තීය සමිතිත් අද අනාථයි, කම්කරුවොත් අනාථයි, ඔක්කෝම ඉවරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, we will get on with the Business of the Day, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නීතිඥ සංගමයේ සාමාජිකයෝ එනවා. අපේ මන්ත්‍රීවරු 225දෙනාගෙන් මේ ගැන දැනුවත් වෙන්න කැමති කට්ටිය එන්න, අකැමති කට්ටිය එන්නේ නැතුව ඉන්න. එච්චරයි.

මීට අදාළ 2026.08.06 දිනැති ඇමුණුම 5 දරන ලිපිය සහ 2026.08.18 දිනැති ඇමුණුම 6 දරන ලිපියද මම ඉදිරිපත් කරනවා.

ඉහත සඳහන් කළ සියලු ලිපි මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, let us get on with the Business of the Day. The Hon. Mujibur Rahuman, please.

[පූ.භා. 11.32]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විශේෂයෙන්ම මුදල් පනත යටතේ ගෙන එන යෝජනා සම්මතය පිළිබඳවයි විවාද කරන්නේ. විශේෂයෙන්ම අපි දන්නවා, ඊයේ දිනයේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළ බව. විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රය ගැන, ඒ වාගේම අධිකරණ ක්ෂේත්‍රයට බලපාන විනිසුරුවන්ගේ වයස් සීමාව ඉහළ දැමීම සම්බන්ධව පසුගිය කාලය පුරාවටම මේ රටේ යම් ආකාරයක සංවාදයක් තිබුණා. ඊයේ ඇමතිතුමා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා අපි දැක්කා.

ගරු කථානායකතුමනි, දැන් මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන යම් විවාදයක් තිබෙනවා. ඒ විවාදය මේකයි. මේ රටේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කාලයක් තිස්සේ සංශෝධන එනවා කියන එක අපි දන්නවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවා. ඊළඟට, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට එදා හිටපු ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමායි, අපියි එකට එකතු වෙලා ඒකට පක්ෂව ඡන්දය දුන්නා. ආපසු ගෝඨාභය රාජපක්ෂ මහත්මයා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට ඔබතුමන්ලායි, අපියි එකතු වෙලා ඒකට විරුද්ධව ඡන්දය දුන්නා.

එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති වෙලා ඉන්නකොට විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. එතකොට අපි දෙගොල්ලන් එකතු වෙලා ඒ සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නා. ඔබතුමන්ලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. එතැනදී, මීට පෙර එකට මේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී හිටපු ඔබතුමන්ලා සහ අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය උඩ අදහස් දෙකකට බෙදිලා ඉන්නවා.

මේකට විරුද්ධව අදහස් දක්වා තිබෙන්නේ අපි විතරක් නොවෙයි. ජාතික ජන බලවේගය එහෙම නැත්නම්, තමුන්නාන්සේලාව බලයට ගෙනෙන්න පසුගිය කාලයේ වැඩ කරපු පක්ෂ, දේශපාලන නායකයන්, වෘත්තීයවේදීන්, මාධ්‍යවේදීන් විශාල ප්‍රමාණයක් යම් ආකාරයකට මේ සංශෝධනය ගැන විරුද්ධ අදහස් දක්වලා තිබෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලාව බලයට ගෙනෙන්න මුල ඉඳන්ම වැඩ කරපු උදවිය ඉන්නවා. දැන් ඒ උදවියත්, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අධිකරණ පද්ධතියේ තිබෙන ස්වාධීනත්වයට යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වන නිසා අද මේකට විරුද්ධ වෙලා තිබෙනවා. ආණ්ඩුව බලයට ගෙනෙන්න උදව් කරපු අයත් අද විරුද්ධ වෙලා තිබෙනවා. ඒක අපට පෙනෙනවා, සමාජ මාධ්‍ය තුළ, සාකච්ඡා තුළ ඒ උදවු කරපු අය දක්වන අදහස්වලින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජේ.ආර් ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව දීර්ඝ ඉතිහාසයක් තමුන්නාන්සේලාට තිබෙනවා. තමුන්නාන්සේලා හැම දාම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒකාධිපති ව්‍යවස්ථාවක් හැටියට තමයි හැඳින්වූයේ. මේ ව්‍යවස්ථාව ඉරා දමන්න ඕනෑ කියලා හැම දාම පෙළපාළි ගිය උදවිය, තමුන්නාන්සේලා; ඒ වෙනුවෙන් සටන් කරපු උදවිය; ඒ වෙනුවෙන් පෙනී හිටපු උදවිය; මේ ව්‍යවස්ථාව නිසා රටේ ප්‍රජාතන්ත්‍රවාදය හැකිළුණා කියලා දිගින් දිගටම ජනතාව ඉදිරියේ කරුණු කියපු උදවිය. ඒ නිසා තමයි 2024දී තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශයේ පැහැදිලිවම කිව්වේ, නාමික ජනාධිපතිවරයෙකු, විධායක අගමැතිවරයෙකු පත් කර ගන්නා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවා කියලා. ඒ පොරොන්දුව තමුන්නාන්සේලා එදා ලබා දුන්නා. ඒ පොරොන්දුවට තමයි ජන වරම ලැබුණේ. ඒ කියන්නේ, අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න, තමුන්නාන්සේලා කියන විධියට ජේ.ආර්. ජයවර්ධනගේ ඒකාධිපති ව්‍යවස්ථාව අහෝසි කරන්න, 2024 ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් දුන් පොරොන්දුවට මේ රටේ ජනතාව ජන වරමක් දුන්නා. ඒ ජන වරම දුන්නේ අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න. දැන් තමුන්නාන්සේලාට ඒ ජන වරම තුළ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා. එතකොට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්න, මේ තිබෙන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න තමුන්නාන්සේලාට ඒ තුනෙන් දෙකේ බලය, හයිය පාවිච්චි කරන්න පුළුවන්. දශක තුනකට - අවුරුදු 30කට - වැඩි කාලයක් තිස්සේ තමුන්නාන්සේලා මැතිවරණ වේදිකාවල, වීථි සටන්වල ලබා දුන් පොරොන්දුව ඉෂ්ට කරන්න තමුන්නාන්සේලාට දැන් අවස්ථාවක් ලැබිලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තියාගෙනත් ඒ පොරොන්දුව ඉෂ්ට නොකර ඒක අහිමි කිරීම මම හිතනවා, තමුන්නාන්සේලාට ඡන්දය දුන් ජනතාවගෙත් අවාසනාව, මේ රටේ සියලු ජනතාවගෙත් අවාසනාව කියලා. මොකද, එහෙම බලයක් දීලාත් තමුන්නාන්සේලා ඒක පාවිච්චි කරන්නේ නැහැ. ඒ බලය දුන්නේ පාවිච්චි කරන්න. තමුන්නාන්සේලා ඒක නොකර දැන් ව්‍යවස්ථාවට පැච් දමනවා. දැන් තමුන්නාන්සේලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙනෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එදා රටේ හිටපු පාලකයෝ සංශෝධන ගෙනෙනකොට තමුන්නාන්සේලා ඒ සංශෝධනවලට විරුද්ධ වුණා. විරුද්ධ වෙලා කිව්වා, අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න කියලා, මේ තිබෙන ඒකාධිපති ව්‍යවස්ථාවට සංශෝධන එපා කිව්වා, ඒ වෙනුවෙන් විශාල හඬක් නැඟුවා. නමුත්, අද අපට කියන්න කනගාටුයි, එහෙම කථා කරපු, විපක්ෂයේ ඉඳගෙන ඒ ගැන හඬ නඟපු තමුන්නාන්සේලාට ඇහුම්කන් දීලා අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න ඡන්දය දුන්, තුනෙන් දෙකක බලයක් දුන් ජන මතයට - ජනතාවට- අද වනකොට තමුන්නාන්සේලා පිටුපස හරවලා තිබෙනවා. අද ඒ ගැන කථා කරන්නේ නැහැ. ඒ හින්දා තමයි, තමුන්නාන්සේලාට උදව් කළ හැම කෙනාම, තමුන්නාන්සේලා බලයට ගෙනෙන්න වැඩ කරපු මේ රටේ ඉන්න බුද්ධිමතුන්, නීතිඥවරුන් ඇතුළු වෘත්තියවේදීන් සියලුදෙනාම අද තමුන්නාන්සේලාගේ මතයක් එක්ක එකඟ වෙලා නැහැ. අද ඒගොල්ලන් විරුද්ධ මත ප්‍රකාශ කරන්න පටන් අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ICCPR එක. ඒ කියන්නේ, එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය. 1980දී අපේ රට ඒකට ඇතුළත් වුණා. ICCPR, Article 14, පරිච්ඡේද 1හි පැහැදිලිවම කියා තිබෙන්නේ මොකක්ද? එහි කියා තිබෙනවා, විනිසුරුවන්ගේ පඩි හා දීමනා, සුදුසු ක්‍රියා පටිපාටියට අනුව උසස්වීම්, මාරුවීම් සියල්ලම විධායකයේ හෝ ව්‍යවස්ථාදායකයේ දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ICCPR, Article 14හි එසේ තිබෙනවා. ඒ පනත අපි පිළිඅරගෙන තිබෙනවා. ඒ ජාත්‍යන්තර සම්මුතියට අපි ඇතුළත් වෙලා තිබෙනවා.

අපි දැක්කා, අගෝස්තු මාසයේ 7වැනි දා එක්සත් ජාතීන්ගේ විනිසුරුවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරිය වන මාග්‍රට් සැටර්ත්වේට් මහත්මිය රජයට ලිපියක් එවලා තමන්ගේ අදහස හා විරෝධතාව මේ සම්බන්ධයෙන් මතු කර තිබෙන ආකාරය. ICCPR එක යටතේ තිබෙන, මේ අධිකරණයේ ස්වාධීනත්වය ගැන එතුමියගේ ඒ වාර්තාවේ පැහැදිලිවම කරුණු දක්වා තිබෙනවා. මේ ලිපිය ආවේ අගෝස්තු මාසයේ 7වැනි දා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ලිපිය **සභාගත*** කරනවා.

මේ ලිපිය ආවාට පස්සේ, අධිකරණ ඇමතිතුමා ඊයේ ඇවිල්ලා කිව්වා, එතුමා ඒකට උත්තර ලියන්නේ නැහැ; ඒකට උත්තර ලියන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය කියලා. මම දන්නේ නැහැ, විදේශ කටයුතු අමාත්‍යාංශය මානව හිමිකම් සම්බන්ධව උත්තර ලියන්නේ කොහොමද කියලා. එක්සත් ජාතීන්ගේ විනිශ්චයකාරවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරියගේ මේ ලිපිය අගෝස්තු මාසයේ 7වැනි දා ආවා; නමුත්, මේ වෙනකම් ඇමතිතුමා ඒකට උත්තරයක් ලියලා නැහැ. අද අගෝස්තු 19වැනි දා. අගෝස්තු 7වැනි දා ආපු ලිපියට මේ වෙනකම් උත්තරයක් ලියලා නැහැ.

මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රට පාලනය කරපු කාලයේ එතුමා හැම තිස්සේම කියපු දෙයක් තමයි, මේ රටට විරුද්ධව ගිහිල්ලා කේලාම් කියනවා; බොරු කියනවා කියන එක. එහෙම චෝදනාවක් කළා. දැන් අපට පේනවා, ඊයේ ඇමතිතුමාත් ඒ මන්තරේම ජප කළා. ඇමතිතුමා ඊයේ කියනවා, විපක්ෂය ජාත්‍යන්තරයට බොරු කියා තිබෙනවා; කේලාම් කියා තිබෙනවා; බොරු තොරතුරු ලබා දී තිබෙනවා කියලා. විපක්ෂය බොරු තොරතුරු ලබා දී තිබෙනවා නම්, ඇමතිතුමා ඇත්ත තොරතුරු මේ එවපු ලියුමට යවන උත්තරයේ ලියන්න ඕනෑ. ඇමතිතුමා දැන් ඒ උත්තරය ලියන්නේත් නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පරණ මන්තරේ ජප කරලා අද ඇමතිතුමාත් ඒකම ඇවිල්ලා කියනවා. අපට පේන්න තිබෙන දේ තමයි, ඒ system change එක නම් වෙලා නැහැ කියන එක. ඒ අර මහින්ද රාජපක්ෂගේ system එකම තමයි යන්නේ. එතුමාත් ඒ කාලයේ මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය වෙනකොට ජාත්‍යන්තරයට බොරු කියනවාය කියලා චෝදනා කළා. අද අධිකරණ ඇමතිතුමාත් ඇවිල්ලා පොඩි ළමයෙක් වාගේ ඒ කථාවම කියනවා. අපට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ කථාව කියලා. *[බාධා කිරීමක්]* විදුලි පුටු කථාව වාගේ.

දැන් අපි එකක් මතක් කරන්න ඕනෑ. මේ රටේ ඉන්න ජනතාවට කොළය වහලා ගහන්න පුළුවන්. අපට කොළය වහලා ගහන්න පුළුවන්. නමුත් හොඳට මතක තියාගන්න, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය හෝ ජාත්‍යන්තරය බබාට අන්දන්න බැහැ කියන එක. ඒගොල්ලන්ව බබාට අන්දන්න බැහැ. ඒගොල්ලන්ට කොළේ වහලා ගහන්න බැහැ. ඒක අපි හොඳට මතක තියාගන්න ඕනෑ. මොකද, ඒක ඉතාම බරපතළයි. විශේෂයෙන් දැන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රශ්න කරන, අධිකරණයට බලපාන ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා සම්මත කර ගත්තොත්, අපේ රට ජාත්‍යන්තරයේ කුණු බක්කියට යන රටක් බවට පත් වනවා කියන එකත් මතක තියා ගන්න ඕනෑ. මොකද, දැන් ජාත්‍යන්තරයේ තිබෙන ප්‍රමිතීන්වලට විරුද්ධව, ඒවාට පටහැනිව, ඒවාට එකඟ නොවී, අපේ හිතු මනාපයට අපි මේක කරන්න යනවා නම්, විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධයෙන්, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් වන කාරණයකදී අපි එහෙම කරන්න යනවා නම්, ජාත්‍යන්තර වශයෙන් අපි රටක් හැටියට කුණු බක්කියට යන එක නවත්වන්න හම්බ වෙන්නේ නැහැ. අන්න එතකොට ඇවිල්ලා කියන්න එපා, රටට සතුරුකම් කළා කියලා. එතකොට ඇවිල්ලා කියන්න එපා, රටට විරුද්ධව ගිහිල්ලා බොරු කිව්වා කියලා. ඒක මම මතක් කරන්න කැමැතියි. මොකද, තමුන්නාන්සේලා මේ වාගේ දේවල් ගෙනැල්ලා, ජාත්‍යන්තර ප්‍රමිතීන් එක්ක ගැළපෙන්නේ නැති, මේ අධිකරණය සම්බන්ධව අනුකූල නැති නීති සම්මත කළාට පස්සේ, "කනවෝ, කනවෝ" කියලා අපට නම් කියන්න එන්න එපා. ඒ හින්දා තමයි අපි කලින්ම මේ දැනුම් දීම කරන්නේ.

අධිකරණයේ ස්වාධීනත්වය හා විශේෂයෙන්ම නීතියේ ආධිපත්‍යය කියන එක අද ජාත්‍යන්තර වශයෙන් අපිත් එක්ක ගැටගැහිලා තිබෙන ප්‍රශ්නයක්. පසුගිය කාලය පුරාම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයෙන් චෝදනා රාශියක් එල්ල වෙච්ච රටක් හැටියටයි අපි ඉන්නේ. තවම අපි ඒකට උත්තර බඳින රටක් හැටියටයි ඉන්නේ. තවම අපට ඒකෙන් ගැලවෙන්න බැරි රටක් හැටියටයි ඉන්නේ. පසුගිය කාලයේ හිටපු පාලකයෝ ගත්ත වැරදි තීන්දු උඩ තවම අපි ඒකට උත්තර බඳිනවා. ඒ හින්දා නැවත වතාවක් ජාත්‍යන්තරයත් එක්ක ගැටෙන, ජාත්‍යන්තරයේ තිබෙන ප්‍රමිතීන්වලට පටහැනි, ඒ තිබෙන නීති රීතිවලට අනුකූල නොවන දේවල් ගෙනැල්ලා මේ රටේ සම්මත කරගෙන ජාත්‍යන්තරය ඉදිරියේ නැවත වතාවක් අපේ රට හැල්ලුවට ලක් කරන්න එපා කියා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අධිකරණයේ ස්වාධීනත්වය ගැන තමුන්නාන්සේලා කථා කළා. අධිකරණයේ විනිවිදභාවය ගැනත් තමුන්නාන්සේලා කථා කළා. තමුන්නාන්සේලා තරම් අධිකරණයේ විනිවිදභාවය ගැන කථා කරපු කවුරුවත් මේ රටේ හිටියේ නැහැ. ඒ වාගේම තමුන්නාන්සේලා නීතියේ ආධිපත්‍යය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගැනත් කථා කළා. 2022දී මේ රටේ ඇති වෙච්ච ජනතා නැඟිටීමේ ආස්වාදයත් එක්ක විශාල බලාපොරොත්තු රාශියක් තබාගෙන මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තමුන්නාන්සේලා ඒ බලාපොරොත්තු ඉෂ්ට නොකර අද වෙනත් ගමනක නිරත වී සිටින නිසා අන්න ඒ ජනතාව, ඒ බලවේගය දැන් ක්‍රමක්‍රමයෙන් තමුන්නාන්සේලාගෙන් ඈත් වෙලා යන්න පටන්ගෙන තිබෙනවා. මේ යථාර්ථය පිළිගන්න. තමුන්නාන්සේලා මේ යථාර්ථය පිළිගන්නේ නැතිව, තමුන්නාන්සේලාගේ දේශපාලන ව්‍යාපෘති - projects - ඉෂ්ට කර ගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒකට විරුද්ධවත් මේ රටේ ජනතාව පෙළ ගැහෙනවා කියන එක මතක තබා ගන්න. ඒ පෙළ ගැසීම අප කාටවත් නවත්වන්න බැරි වෙනවා කියන එකත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Anushka Thilakarathne. You have ten minutes.

[පූ.භා. 11.45]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදය වෙනම කාරණයක් සම්බන්ධයෙන් කළ යුතුව තිබුණත් විපක්ෂය දිගින් දිගටම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අසත්‍ය සහ සමාජය නොමඟ යවන විවිධ කාරණා කියන නිසා ඒකට උත්තරයක් දීලා ඉන්න ඕනෑ. දැන් කථා කරපු විපක්ෂයේ ගොඩක් අය, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට මේ රටේ මිනිස්සු ඡන්දය දුන්නේ මොකටද කියන එක ගැන අපට වඩා හොඳින් පැහැදිලි කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවට මිනිස්සු ඡන්දය දෙනකොට මේ රටේ සාමාන්‍ය ජනතාවට අදහසක් තිබුණා, මේ රටේ නීතිය වල්වැදිලා, පොහොසත් කෙනාට, බලය තිබෙන කෙනාට එක නීතියක්, බලය නැති කෙනාට තව නීතියක් කියලා. මේ විධියට අයාලේ යමින් තිබුණු නීති පද්ධතියට - ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අයාලේ ගියේ නීති ක්ෂේත්‍රයේ ඉන්න අයයි කියලා - බලපෑම් කරමින්, ඒකට තර්ජනය කරමින්, ඒකට අත පොවමින් කටයුතු කරපු මහා බලසම්පන්න දේශපාලන අධිකාරියක් තමයි මේ රටේ මිනිස්සු විසින් සමතලා කරලා, කුඩු සම්බල් කරලා බිමට දැම්මේ. නීතිය අකුරට ඉෂ්ට කරන්න තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවට මිනිස්සු බලය දුන්නේ. ඒක හොඳට මතක තබා ගන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනෙකු පත් කරලා ව්‍යවස්ථාපිත බලය - නීති සම්පාදනය කිරීමේ බලය - පාර්ලිමේන්තුවට තුනෙන් දෙකකට එහාට ගිය බලයක් සහිතව මේ රටේ මිනිස්සු ලබා දුන්නේ හොඳ නීතියක් ස්ථාපිත කරන්නයි.

ඒ නිසා මම විපක්ෂයට මතක් කරනවා, මිනිසුන් අපට දීලා තිබෙන්නේ නීති සම්පාදනය කිරීමේ බලයයි, නීතිය නිවැරදි මඟක ගමන් කරවීමට අවශ්‍ය බලයයි කියන එක. අපි විපක්ෂයෙන් අහලා නොවෙයි ඒ කටයුතු කරන්නේ. මේ රටේ සාමාන්‍ය මිනිසුන්ගෙන් අහලා තමයි අපි නීතිය ක්‍රියාත්මක කරන්නේ. සාමාන්‍ය මිනිසුන්ට අවශ්‍ය කරන දේවල් තමයි නීතිය ලෙස අප ක්‍රියාත්මක කරන්නේ කියන එක හොඳට මතක තබා ගන්න කියා මම විපක්ෂයට කියනවා.

ඔය විපක්ෂයෙන් කථා කරන ගොඩක් අයට මතක නැහැ, ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලවල හිටපු අධිකරණ ඇමතිලාට තිබුණු චෝදනා ගැන; ඒ අධිකරණ ඇමතිලා අධිකරණවලට කරපු බලපෑම් පිළිබඳ චෝදනා ගැන. ඒකට වැඩි ඈතකට යන්න ඕනෑ නැහැ. 2015-2017 කාලයේත්, 2022-2024 කාලයේත් මේ රටේ අධිකරණ අමාත්‍ය ධුරය දරපු විජයදාස රාජපක්ෂ මහත්මයාගේ පුතා, "හරක් කටා" නොහොත් නදුන් චින්තක රූඳවුම් භාරයෙන් නිදහස් කිරීමට රුපියල් මිලියන 500ක අල්ලසක් ලබා ගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ වන විට ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂලාගේ සහ ප්‍රබල දේශපාලනඥයන්ගේ පෞද්ගලික නීතිඥවරුන් විධියට කටයුතු කරපු අයත් අධිකරණ ඇමතිවරුන් වෙලා හිටියා. ඒ වෙලාවේ අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරපු නැති, කට ඇරපු නැති විපක්ෂය දැන් මොනවාද මේ නන් දොඩවන්නේ?

විපක්ෂ නායකතුමා කියනවා, සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ක නීතිඥ සංගමයේ රැස්වීමක් අරන් දෙන්න කියලා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය මොකක්ද කියලා දන්නේ නැද්ද, නීතිඥ සංගමයෙන් ඔය ඉල්ලීම් කරන කට්ටිය? මා ඉස්සෙල්ලා මතක් කරපු ව්‍යවස්ථාපිත බලය තමයි පාර්ලිමේන්තුවට ලබා දීලා තිබෙන්නේ. අපි පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුගත වෙන්නට ඕනෑ. අපි පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට ගරු කරන්නට ඕනෑ. විපක්ෂ නායකතුමාද තීරණය කරන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක්ක සාකච්ඡා ලබා දෙන්නේ කාටද, කොයි වෙලාවටද කියලා? හෙට දවසේ තවත් ධීවර සමිතියක් ඇවිල්ලා අපෙන් සාකච්ඡාවක් ඉල්ලයි. අනිද්දා දවසේ තව මොකක් හෝ සමාගමකින් ඇවිල්ලා අපෙන් සාකච්ඡාවක් ඉල්ලයි. එහෙම සාකච්ඡා දෙන්න අපි බැඳිලා නැහැ. ඒකට ව්‍යවස්ථාපිත බලයක් මිනිස්සු අපට දීලා නැහැ. අපි ඕනෑ තරම් සාකච්ඡා දෙනවා. හැබැයි ඒ, තිබෙන ක්‍රමවේදයන්ට අනුගත වෙමින්. ඒ නිසා තමයි මේ රටේ ප්‍රධාන පුරවැසියා නීතිඥ සංගමයට අවස්ථාවක් ලබා දුන්නේ, සාකච්ඡාවකට. මේ රටේ සියලු මිනිස්සු ඒ සාකච්ඡාව අහලා අපට වඩා හොඳට ඒ ගැන නිර්දේශ දුන්නා. විපක්ෂයේ ඔබතුමන්ලා වැඩිය කෑ ගහන්න එපා. මමත් ඔය කියන නීතිඥ සංගමය නියෝජනය කරන සාමාජිකාවක්. තවත් එවැනි ඕනෑ තරම් නීතිඥවරු අපේ ආණ්ඩු පක්ෂයේත් ඉන්නවා. නීතිඥ සංගමයේ කියලා දැන් දඟලන ගොඩක් අය හැම දෙනාගේම අදහස නොවෙයි ඉදිරිපත් කරන්නේ, ඒගොල්ලන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර. ඒකට ඔළුව නවන්න අපි ලැහැස්ති නැහැ. අපි ලැහැස්තියි මේ රටේ මිනිසුන්ට ඔළුව නවන්න සහ නීතිය, යුක්තිය, සාධාරණත්වය නිවැරදිව ක්‍රියාත්මක කරන්න. ඒක හොඳට මතක තබාගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය ගැන අපි අමුතුවෙන් කලබල වෙන්නේ නැහැ. අපි දන්නවා, අපේ රටේ මිනිසුන් අතර හොඳට තිබුණු ජාතික සමඟිය කුඩු සම්බල් කරලා, සුනු විසුනු කරලා පාස්කු ඉරු දින ප්‍රහාරය සිද්ධ වුණු බව. ඒ

පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ නඩුවේ තීන්දුව ඉතාම කෙටි කාලයක් තුළ ලැබෙනවා. ඒක තවත් ප්‍රමාද කරන්න කාට හෝ හෘදය සාක්ෂියට එකඟව අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඔවුන් මිනිස්සු වෙන්න බැහැ. මම දැක්කා එක අම්මා කෙනෙක් සමාජ මාධ්‍යයේ ලියා තිබුණා, "මගේ මහත්තයාත්, මගේ දරුවෝත් මට ආයෙත් කිසි දවසක දකින්න බැහැ, නමුත් මම මැරෙන්න කලින් මගේ දරුවන් දෙන්නාටත්, මගේ මහත්තයාටත් වෙච්ච අසාධාරණයට මොකක් හෝ සාධාරණයක් ලැබෙනවා නම් මම මේ වාතලයට මුසු කරන හුස්ම පොද මට නිදහසේ හෙළන්න පුළුවන්" කියලා. ඒ අම්මා එහෙම ලියා තිබුණා. ඒ අම්මා මේ රටේ දහසක් අම්මලාගේ හඬයි ඒ නඟන්නේ. අපට අහිමි වුණේ මිනිසුන් කොට්ඨාසයක් විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට අහිමි වුණේ මේ රටේ ජාතික සමගියයි. අපට අහිමි වුණේ මේ රටේ ස්ථාවරත්වයයි. අපට අහිමි වුණේ මේ රටේ පවත්වාගෙන ආපු ප්‍රෞඪ ඉතිහාසය හා අභිමානවත් ශ්‍රී ලාංකීය ජාතියයි. ඒ නිසා, මේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගැනීමේ කාලය දීර්ඝ කිරීමෙන් අධිකරණයේ ස්වාධීනත්වය කෙලෙසෙනවා කියලා කවුරු හෝ කියනවා නම්, ඒ මොන තර්කයක්ද ඉදිරිපත් කරන්නේ කියලා නීතිඥයන් විධියට අපට නම් තේරෙන්නේ නැහැ. ඔයගොල්ලන්ට තේරෙන වෙනත් මොකක් හෝ භාෂාවක් තිබෙනවා නම්, ඒ භාෂාවෙන් හරි අපට ඒක පැහැදිලි කරන්න. ඒ නඟන තර්කය ඇතුළේම තිබෙනවා, එහෙම නම් විනිශ්චයකාරවරුන් දැනුත් කටයුතු කරන්නේ සාධාරණ මානසිකත්වයකින් නොවෙයි කියන සැකය තිබෙන්නේ විපක්ෂයේ ඔයගොල්ලන්ටම තමයි කියන කාරණය. විපක්ෂයේ සමහර අය කිව්වා, මේක සම්මත කළොත් ආණ්ඩුවට ගෙදර යන්න වෙනවා කියලා. ඉතින් හොඳයි නේ. ඔයගොල්ලන්ට හොඳයි නේ, අපි ගෙදර යනවා නම්. අපි ගෙදර යන්නේත් නැහැ, අපි ගෙදර යන වැඩ කරන්නේත් නැහැ. හෙට දවසේ අප ගිහින් එළියේ සිටියත් අපට බය වෙන්න කිසිම කාරණයක් නැහැ. අප ඒ තරම් නීතිගරුකව සහ සම්ප්‍රදායානුකූලව රටට අවශ්‍ය, නවීනත්වයට අවශ්‍ය දේවල් කරමින් තමයි කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මාතෘකාව වෙනම කාරණයක්. අද අප කථා කරන්නේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවා ඇති ශ්‍රම වාසනා අරමුදල ඇවර කරමින් ඒ කටයුතු කම්කරු අමාත්‍යාංශයට පවරා ගැනීම පිළිබඳවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ විවිධ අරමුදල් ක්‍රියාත්මක වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ අරමුදල් පිහිටුවීමට විවිධ අරමුණු තිබිලා තියෙනවා. ඒ අරමුණු සාක්ෂාත් වුණාද කියන එකත් අපට දැන් තිබෙන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අමුණා ගත්, ඒ පටලවාගත්, ඒ පිහිටුවාගත් අරමුදල්වලින් කළේ ඇත්තටම උදව් කළ යුතු මිනිසුන්ට උදවු කරපු එක නොවෙයි; තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමයි. මම මෙහි තිබෙන කාරණා එකින් එක පැහැදිලි කරන්න යන්නේ නැහැ. අපට හොඳ ඉතිහාසගත මතක තිබෙනවා. ඒ අය ඇතැම් විට ඉස්කෝලෙ බෑග් බෙදුවා. ඉස්කෝල බෑග් 1,000යි බෙදලා තිබෙන්නේ, ඉස්කෝලෙටම. හැබැයි, ඒකට රුපියල් මිලියන, ට්‍රිලියන ගණන් වියදම් කරලා දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කර තිබෙනවා. ඒකට අපි, ඒ වාගේ අරමුදල් හෝ වෙනත් දේවල් පාවිච්චි කරන්නේ නැහැ. ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය විනිවිදභාවයෙන් යුතුව, අමාත්‍යාංශය යටතේ, ඉතා පැහැදිලිව මිනිසුන්ට ප්‍රශ්න කරන්න පුළුවන් විධියට අපි පවත්වාගෙන යනවා. අපට අවශ්‍ය නැහැ, අටවාගත් එක එක දේවල්. ඒවා අතර ක්‍රියාත්මක වුණු හොඳ දේවල් අපි අමාත්‍යාංශය යටතට පවරාගෙන ඒකාබද්ධව, එක තැනකින් විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කරනවා.

ඊළඟට තර්කයක් එන්න පුළුවන්, ශ්‍රම වාසනා අරමුදලෙන් කරපු දේවල් ඉදිරියේදී අපි කරන්නේ නැද්ද කියලා. ඒවා නොකර ඉන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි පාසල් දරුවන්ට ලබා දෙන ලිපි ද්‍රව්‍ය දීමනාව වැඩි කරලා තිබෙනවා. අපි බෑග් එකක් හරි කෙසෙල් ගෙඩියක් හරි මොකක් හරි දෙයක් දෙන කොට ඒකේ නම හෝ සලකුණ ගහලා දේශපාලන ව්‍යාපාරය විකුණන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. ආණ්ඩුව විධියට අපි දරුවන්ට අවශ්‍ය ශිෂ්‍යත්ව, ආබාධිත දරුවන්ට අවශ්‍ය ශිෂ්‍යත්ව, දීමනා ආදි සියල්ල ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩක් අයට මතක නැහැ අපට භාර දුන්නේ මොන වාගේ රටක් ද කියලා. අපට භාර දුන්නේ බංකොලොත් වෙලා, හොම්බ බිම ඇනිච්ච රටක්. ඒ රට තමයි අපි මේ ලෝකයේ දියුණු වන රටවල් අතර අංක 4 ස්ථානයට ඔසවා තැබුවේ. ඒ තත්ත්වයට ශ්‍රී ලංකාව ඔසවා තැබුවේ ජාතික ජන බලවේගයේ අපි. ඒ වාගේම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයත්, නීති සම්පාදනයත්, නීති ක්‍රියාත්මක කිරීමේ පසුබිම සැකසීමත්, සාමාන්‍ය මහ ජනතාව වෙනුවෙන් යුක්තිගරුක සමාජයක් ඇති කිරීමත් වෙනුවෙන් අපි වැඩ කරනවා. එහිදී විපක්ෂය "යැයි යැයි" ගාවි; "ඤං ඤං" ගාවි. ඒ එකක්වත් අපට අදාළ නැහැ. අප වැඩ කරන්නේ මේ රටේ පොදු මිනිසුන් එක්ක එකතු වෙලා. ඒකෙදි අපට ඔයගොල්ලන් කියන කථා, විපක්ෂයේ අඳෝනා අදාළම නැහැ කියන එක සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Thurairasa Ravikaran. You have eight minutes.

[பி.ப. 11.55]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய விவாதத் தலைப்புக்குள் நுழைவதற்கு முன்னர், முல்லைத்தீவு மாவட்டம் சம்பந்தமாகச் சில முக்கிய விடயங்களைக் கூற விரும்புகின்றேன். நேரம் இருந்தால் விவாதத் தலைப்பு பற்றி கதைக்கின்றேன். இல்லாவிட்டால், அது சம்பந்தமான எனது உரையை ஹன்சாட்டில் சேர்த்துக்கொள்வதற்காக சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள கொக்குத்தொடுவாய் மத்தி கிராம அலுவலர் பிரிவில் அத்துமீறி அமைக்கப்படும் உப்பளம் தொடர்பாக கடந்த 6 மாதங்களாக முல்லைத்தீவில் குரலெழுப்பி வருகின்றோம். இந்த விடயம் தொடர்பில் எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்களும் மனோ கணேசன் MP அவர்களும் குரலெழுப்பி இருந்தார்கள். நானும் அந்த விடயத்துக்கு வருகின்றேன். இது தொடர்பில் மாவட்டச் செயலாளர், கரைதுறைப்பற்று பிரதேச செயலாளர் ஆகியோரால் அதனைத் தடுத்து நிறுத்துவதற்குரிய கடிதங்கள் உரிய தரப்பினருக்கு அனுப்பப்பட்டன. இவ்வாறான அடாத்தான செயற்பாடுகளில் ஈடுபடுவது மகாவலி

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

அதிகாரசபைதான். இது தொடர்பாக 2026.03.12 அன்று வவுனியா மாவட்டச் செயலகத்தில் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் கௌரவ கே.டி. லால் காந்த அவர்கள் தலைமையில் நடைபெற்ற விசேட கூட்டத்தில் கௌரவ அமைச்சர் உள்ளிட்ட அதிகாரிகளுக்கும் தெரியப்படுத்தப்பட்டது. குறித்த பகுதியில் அமைக்கப்படும் உப்பளம் தனியார் காணியில் அமைக்கப்படவில்லை என மகாவலி அதிகாரசபையினரால் அன்றைய தினம் குறிப்பிடப்பட்டது. இப்பிரச்சினையை மாவட்டச் செயலாளர் தலைமையில் ஆராயுமாறு அன்றைய தினம் அமைச்சர் அவர்களால் பணிக்கப்பட்டது. பின்னர் எமது கோரிக்கைக்கு அமைய, மாவட்டச் செயலாளர் மற்றும் கரைதுறைப்பற்று பிரதேச செயலாளர் ஆகியோரின் உத்தரவுக்கு அமைய, குறித்த பகுதி தனியார் காணியே என நில அளவை அத்தியட்சகரால் உறுதிப்படுத்தப்பட்டது. அதன் அடிப்படையில், தனியார் காணியில் மேற்படி உப்பளம் அமைக்கும் நடவடிக்கையை உடனடியாக நிறுத்துமாறு இலங்கை மகாவலி அதிகார சபையின் பணிப்பாளர் நாயகத்துக்கு கரைதுறைப்பற்று பிரதேச செயலாளரால் 2026.07.28 அன்று கடிதம் அனுப்பப் பட்டது.

அந்தக் கடிதத்தின் பிரதி தற்பொழுது என்னுடைய கையில் உள்ளது. அதன்பின்னரும் இலங்கை மகாவலி அதிகாரசபை அதற்கு இணங்காத வகையில் தன்னிச்சையாகச் செயற்படுவதையே அவதானிக்க முடிகின்றது. இலங்கை மகாவலி அதிகாரசபை இந்தத் தீவிலுள்ள அரசாங்கத்துக்கு - NPP - கட்டுப்படாமல் வட, கிழக்கில் இனப்பரம்பலை மாற்றும் எண்ணத்தோடு தன்னிச்சையாகச் செயற்படும் ஓர் அமைப்பாகவே இருக்கின்றது. கொக்குத்தொடுவாய் மத்தி கிராம சேவையாளர் பிரிவில் அடாத்தாக அமைக்கப்பட்ட உப்பளமும் அதற்கு ஒரு சான்றென இப்பேரவையில் மீண்டும் பதிவு செய்கின்றேன். தேவைப்பட்டால் இவற்றுக்கான சான்றுகளை உரிய தரப்பினருக்கு வழங்குவோம் என்பதையும் தெரிவித்துக் கொள்கின்றேன். நான் நாகரிகமாகத்தான் பாராளுமன்றத்தில் கதைக்கின்றேன். ஆனாலும், மகாவலி அதிகாரசபையின் செயற்பாடுகள் பொறுக்கித்தனமானவை என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி மாவட்டங்களுக்கென தனியான நீர் வழங்கல் முகாமையாளர் அலுவலகம் நிறுவப்பட வேண்டும். இலங்கையிலேயே பிராந்திய நீர் வழங்கல் முகாமையாளர் அலுவலகம் இல்லாத இரண்டு மாவட்டங்கள் முல்லைத்தீவும் கிளிநொச்சியும்தான். 2026 சனவரி மாதத்தின் படியான தரவுகளின்படி, முல்லைத்தீவு மாவட்டத்தில் 8,500 குடும்பங்களுக்கு நீர் இணைப்பு கொடுக்கப்பட்டு இருக்கின்றது. தொடர்ந்தும் நீர் இணைப்புகள் வழங்கப்பட்டுக் கொண்டுதான் இருக்கின்றன. வட மாகாணத்தில் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களுக்கும் மேற்படி பிராந்திய முகாமையாளர் காரியாலயங்களைக் கொண்டுவருவதில் உள்ள மட்டுப்பாடுகள்தான் என்ன?

முல்லைத்தீவில் மொத்தமாக இதுவரை 921 சிறுநீரக நோயாளிகள் இருப்பதாக புள்ளிவிபரங்கள் சுட்டிக்காட்டு கின்றன. கரைதுறைப்பற்றில் 79 பேரும், புதுக்குடியிருப்பில் 109 பேரும், ஒட்டுசுட்டானில் 171 பேரும், துணுக்காயில் 168 பேரும், Manthai Eastஇல் 152 பேரும், மணலாறில் 240 பேரும் என மொத்தம் 919 பேர் கொடுப்பனவு பெறும் சிறுநீரக நோயாளிகளாக இருக்கின்றனர். முல்லைத்தீவுக்கென தனியான பிராந்திய நீர் வழங்கல் முகாமையாளர் அலுவலகம் அமையும்போது, இன்னும் முல்லைத்தீவில் சேவை வழங்கல் விரிவுபடுத்தப்படும். முல்லைத்தீவு மாவட்டத்தில் கடந்த ஆண்டு பொறியியல் தொழில்நுட்பப் பிரிவில் முதலாமிடம் பெற்ற மாணவன் பரமேஸ்வரன் பானுஜன் இரண்டு சிறுநீரகங்களும் செயலிழந்துதான் மரணித்திருக்கிறார். அங்கு இன்னும் பல இடங்களில் நீர் வழங்கல் வசதியை மேற்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. எனவே, காலந்தாழ்த்தாது மேற்படி இரண்டு மாவட்டங்களிலும் பிராந்திய நீர் வழங்கல் முகாமையாளர் அலுவலகங்களை நிறுவ வேண்டுமென அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, தித்வா புயலின் போதான இழப்பீடுகள் வழங்கலிலும் ஒவ்வொரு துறையிலும் முழுமைப்படுத்தப்படாத தரவுகள் வன்னித் தேர்தல் மாவட்டத்தில் பரவியுள்ளன. தித்வா - மீன்பிடி! மீன்பிடி சார்பாக, 80க்கும் மேற்பட்ட பகுதியளவு சேதமடைந்த படகுகளுக்குரிய கொடுப்பனவு, 5 காணாமல் போன படகுகளுக்குரிய நிவாரணம் என்பன மன்னார் மாவட்டத்தில் இன்னும் தேக்க நிலையிலே உள்ளன. முல்லைத்தீவு மாவட்டத்தில் 30 படகுகள் முற்றாகச் சேதமுற்றும் காணாமலும்போன நிலையில், இதுவரை 13 படகுகள் மட்டுமே வழங்கப்பட்டுள்ளன. பகுதியளவில் சேதமடைந்த 15 படகுகளுக்குரிய இழப்பீடுகள் இதுவரை முழுமைப்படுத்தப்படவில்லை.

அடுத்து, வீடமைப்புக்குரிய நிலுவைத் தொகை! தேசிய வீடமைப்பு அதிகாரசபையால் 2019ஆம் ஆண்டு ஆரம்பிக்கப் பட்ட வீட்டுத்திட்டத்தில் முல்லைத்தீவு மாவட்டத்தில் 2,212 வீடுகள் உள்ளீர்க்கப்பட்டு, அவற்றுக்கான 1,689 மில்லியன் ஒதுக்கீட்டு நிதியில் 369.85 மில்லியன் நிதியே இதுவரை வழங்கப்பட்டுள்ளது. அத்திவார மட்டத்தோடு 820 வீடுகளும், சுவர் மட்டத்தோடு 1,063 வீடுகளும், கூரை மட்டத்தோடு 316 வீடுகளும், கதவுகள் மற்றும் சாளரங்கள் இல்லாத நிலையில் 13 வீடுகளும் இருக்கின்ற நிலையில், இவற்றுக்கு 2019ஆம் ஆண்டின்படி 1319.15 மில்லியன் நிதி வழங்கப்படவேண்டி உள்ளது.

இவ்வாறான வீட்டுத்திட்டங்கள் எப்போது நிறைவுறுத்தப் படும்? ஒவ்வொரு கட்டமும் நிறைவுறுத்தப்பட்ட பின்னரே பணம் வழங்கப்படும் என்ற நிலையில், பலர் நகைகள், உடைமைகளை வைத்து கடன்பட்டு வீடுகளைக் கட்டிய நிலையில், அவர்களுக்கு உறுதியளித்த மிகுதிப் பணத்தை ஏழு ஆண்டுகளாக அரசு வழங்கவில்லை. இவ்வாறான தாமத நிலைகளுக்கு எப்போது இந்த அரசாங்கம் முற்றுப்புள்ளி வைக்குமென கேட்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thurairasa Ravikaran, your time is up.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, please give me one more minute.

அடுத்து, இந்திய வீட்டுத்திட்டம்! 2011-2012 காலப்பகுதியில் வழங்கப்பட்ட இந்திய வீட்டுத்திட்டத்தின் ஊடாக முல்லைத்தீவில் நிர்மாணிக்கப்பட்ட 226 வீடுகளில் 214 வீடுகள் வசிப்பதற்கு உகந்த நிலையில் இல்லாத வகையில் சேதமடைந்துள்ளன. இது தொடர்பில் மாவட்ட ஒருங்கிணைப்புக் குழு ஊடாக உரிய தரப்பினருக்கு

அறிவிக்கப்பட்டுள்ளது. ஆலயங்களின் துப்புரவுப் பணிகளுக் காகக் கொடுக்கப்பட்ட 25,000 ரூபாய் நிதி, மன்னாரில் விண்ணப்பித்த 56 தேவாலயங்களுக்கு வழங்கப்படவில்லை யெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Padmasiri Bandara. You have ten minutes.

[අ.භා. 12.04]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම පිළිබඳව විවාද කරන මේ මොහොතේ විපක්ෂය පැත්තෙන් අපට විවිධ වූ ඓතිහාසික තත්ත්වයන් පිළිබඳ විමර්ශනයක්, ඓතිහාසික තත්ත්වයන් පිළිබඳව අදහසක් දැනෙමින් තිබෙනවා. අපේ පාර්ලිමේන්තුව ඉතිහාසයේ කුමක් සඳහාද පාවිච්චි කළේ, පැවැති පළාත් සභාව කුමක් සඳහාද පාවිච්චි කළේ, පැවැති සහ පවතින ප්‍රාදේශීය සභාව එදා කුමක් සඳහාද පාවිච්චි කළේ කියන එක පිළිබඳව අපට පුංචි අදහසක් හදාගන්න වෙයි. ඇත්තෙන්ම අපේ රටේ මීට කලින් තිබිච්ච පාර්ලිමේන්තු සෙල්ලම් කඩ, මොන්ටිසෝරි වාගේ තමයි තිබුණේ. විවිධ තත්ත්වයන් ඇති කරමින් සෙංකෝලය අරගෙන එහේට මෙහේට දුවන, එකිනෙකා මයික් කඩාගෙන ගහගන්න, සරම් කැහැපොට ගහගෙන ඉස්සරහට පැනලා හූ කියා ගෙන බැණ ගන්න, පොඩි එවුන්ගේ මොන්ටිසෝරියක් වාගේ තමයි අපේ රටේ පාර්ලිමේන්තුව තිබුණේ. විනයක් නැති පාර්ලිමේන්තුවක් තිබුණේ. හැබැයි වර්තමාන ආණ්ඩුව පැමිණිලා විනයානුකූලව කටයුතු කරන තත්ත්වයට පාර්ලිමේන්තුව පත් කර තිබෙනවා. නමුත්, විපක්ෂ නායකතුමා අද උදේ කරපු ඉල්ලීම දිහා බැලුවාම අපට පෙනුණේ, පසුගිය කාලය පුරාවට තිබිච්ච ක්‍රියාකාරකම් හා සමාන ඉල්ලීමක් තමයි එතුමා ඒ කළේ කියන එක. විපක්ෂ නායකවරයකු හැටියට එතුමා මීට වඩා හිතන්න ඕනෑ; මීට වඩා හිතලා කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම පාර්ලිමේන්තුව ඇතුළේ මීට වඩා වෙනස් විධියක හැසිරීමක්, නායකත්වයක් දැරිය යුතුයි කියන එක තමයි අපේ ස්ථාවරය.

එදා පාර්ලිමේන්තුවේ සම්මත කරපු අණ පනත් තමයි අදත් මේ තිබෙන්නේ. ඒවායින් එකක් තමයි අද අපි ඇවර කරන්න සූදානම් වෙන්නේ. පසුගිය තොරතුරු විශ්ලේෂණය කර බැලුවොත්, මේකේ අරමුණ ඉතාම හොඳයි. හැබැයි, භාවිතය දේශපාලනිකයි. මොකද, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නේ අටදෙනායි. ඒකෙන් හතරදෙනෙක් පත් කරන්නේ, දේශපාලන අධිකාරිය නැත්නම් ඇමතිවරයා විසින්. ඒ කාලයේ මේ අරමුදලෙන් කළේ එක්කෝ පොත් බෙදුවා; එක්කෝ බෑග් බෙදුවා; එහෙම නැත්නම් ප්‍රසංගයක් පැවැත්වූවා. ඒ වාගේ පොඩි සෙල්ලම් වැඩ ටිකක් තමයි කළේ. පාසල් දරුවන්ට බෑග් දෙන එක හොඳයි. හැබැයි කළේ මොකක්ද? පොදු අරමුදලෙන් වුණත් තමන්ගේ නම ගහලායි බෙදුවේ. පොදු අරමුදල තමන්ගේ නම වෙනුවෙන්, දේශපාලනය වෙනුවෙන් පාවිච්චි කළා. අපේ රටේ තව ඕනෑතරම් සුබසාධන අරමුදල් තිබෙනවා. එදා හිටපු දේශපාලනඥයන් ඒ සෑම අරමුදලක්ම පාවිච්චි කර තිබෙන්නේ තමන්ගේ දේශපාලන කටයුතු වෙනුවෙන්. ඒ නිසා ආණ්ඩුවක් හැටියට, දේශපාලන පක්ෂයක් හැටියට, රජයක් හැටියට, මේ අරමුදල්වල තිබෙන විනාශකාරී තත්ත්වය අපි දැක්කා. මේ අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නේ නිලධාරින් අටදෙනායි. ඒකෙන් හතරදෙනෙක් ඇමතිවරයා පත් කරන්න ඕනෑ. මේ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවකින් පසු අපි තීන්දුවක් ගත්තා, මේක ඇවර කර ඒ හා සම්බන්ධ ආයතනත් එක්ක ඒකාබද්ධ කරලා මේ අරමුදල පවත්වා ගෙන යන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි මෙය ඇවර කිරීමේ යෝජනාව අද සංවාදයට අරගෙන තිබෙන්නේ.

අපි දන්නවා, අපේ රටේ පවුල් හැටපන්ලක්ෂයකින් පවුල් තිස්පන්ලක්ෂයක්ම ඉතාම දුප්පත් තත්ත්වයේ සිටින බව. ඒ අය පාවිච්චි කරමින් එදා හිටපු පාලකයන් දේශපාලන ක්‍රියාකාරකම් කළා. ඒ ක්‍රියාවලි වෙනුවෙන්, තමන්ගේ දේශපාලන කටයුතු වෙනුවෙන් විවිධ අරමුදල් භාවිත කළා. ජනාධිපති අරමුදල ගත්තොත්, 2025 අවුරුද්දේ මුල් කාලය තුළ ජනාධිපති අරමුදලෙන් - අහිංසක ජනතාව වෙනුවෙන්, අහිංසක දරුවන් වෙනුවෙන් බෙදා දීමට, පරිත්‍යාග ලබා දීමට තිබිච්ච අරමුදලෙන් - මොන තරම් මුදල් කන්දක්; විශාල ධනස්කන්ධයක් තමන්ගේ දේශපාලන වුවමනාකම් වෙනුවෙන්, දේශපාලනඥයන්ගේ පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන් පාවිච්චි කළාද කියන එක පිළිබඳව බොහෝ සංවාද, විසංවාද මේ සමාජය තුළ හැදිලා තිබුණා. එම අරමුදල්වලින් කළේ මොනවාද? සමහරු තමන්ගේ ගෙට ගිනි තියාගෙන අරමුදලෙන් සල්ලි ගත්තා. මෙහිදී රුපියල් මිලියන 25ක්, රුපියල් මිලියන 50ක් දක්වා ගත්ත අයත් හිටියා. රුපියල් මිලියන 92ක් ගත් ඇමතිවරයෙකු ගැනත් ඒ දවස්වල මාධ්‍යවල කියැවෙනවා, අපි දැක්කා. ඒ කියන්නේ, අයථා විධියට තමයි එම අරමුදලේ මුදල් පාවිච්චි කළේ. ජනාධිපති අරමුදල කියන්නේ, සුවිශේෂී වූ අරමුදලක්. අපි අද එම අරමුදලෙන් කරන්නේ මොකක්ද? විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යාධාරය වැඩි කරලා, ඒ වැඩි කළ මුදලෙන් යම් ප්‍රමාණයක් ජනාධිපති අරමුදලෙන් ලබා දෙනවා. එදා ජනාධිපති අරමුදලෙන් ප්‍රතිකාර සඳහා හෝ operation එකක් සඳහා මුදලක් දුන්නා නම්, එම මුදල ගන්න ඊට වඩා වැඩි මුදලක් වියදම් කරන්න සිදු වුණා. නමුත්, අද එම අරමුදලේ බලය විමධ්‍යගත කරලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා එහි තිබෙන අයදුම් පත්‍රය සම්පූර්ණ කරලා පහසුවෙන් එම මුදල ලබා ගන්න පුළුවන් ක්‍රමයක් අපි හදලා තිබෙනවා. එදා මෙවැනි සරල ක්‍රමයක් තිබුණේ නැහැ. එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා පිටුපස ගිහිල්ලා, ඇමතිවරයා පිටුපස ගිහිල්ලා තමයි ජනාධිපති අරමුදලෙන් මුදල් ලබා ගන්න තිබුණේ. අහිංසක, දුප්පත් මිනිසුන්ට ඒ අවස්ථාව උදා කිරීම සඳහා පසුගිය පාලන තන්ත්‍රය සරල ක්‍රමවේදයක් හදලා තිබුණේ නැහැ. ඒකට හේතුව තමයි, තමන් සතු බලය අහිංසක ජනතාවට අනිසි ලෙස පාවිච්චි කිරීම සඳහා එම අරමුදල් භාවිත කිරීම.

මා මුලින් සඳහන් කළ පරිදි, මෙවැනි කටයුතුවලට අරමුදල් පාවිච්චි කළා; විවිධ හොරකම් කළා. පළාත් සභාවලත් අරමුදල් තිබෙනවා. පළාත් සභාවල තිබෙන අරමුදලුත් පසුගිය ඉතිහාසයේ විශාල වශයෙන් අයථා ලෙස පාවිච්චි කර තිබෙනවා. එම අරමුදල් පාවිච්චි කර තිබෙන්නේ, අරමුදල ඇති කිරීමේ අරමුණ අනුව නියමිත ක්‍රමවේදයට නොවෙයි. පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශ COPE එකට ගෙන්වලා අද විමසීම් කරලා බලනකොට අපට පෙනෙනවා, ඉදිකිරීම් සඳහා බිලියන ගණන් වියදම් කර තිබෙන බව. ඒ ගැන සොයා බලනකොට ඒකෙන් සැහෙන මුදලක් එවකට හිටපු දේශපාලනඥයන්ගේ සාක්කුවට දමාගෙන තිබෙන බව පෙනෙනවා. පළාත් සභා අරමුදලුත් එලෙස අයථා ලෙස පාවිච්චි කර තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට මේ මොහොතේ ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, හත්අට දෙනෙකුගෙන් පමණ අටවාගෙන තිබෙන මේ විවිධ වූ අනවශ්‍ය ආයතන තම තමන්ගේ වුවමනාවන් වෙනුවෙන් පාවිච්චි කරනවා වෙනුවට, රටේ මුළු මහත් ජනතාවගේ උන්නතිය වෙනුවෙන් පාවිච්චි කිරීම සඳහා තමයි අද මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ කියන එක. ඒවායේ තිබෙන අඩුපාඩු සකස් කරලා

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

පූර්ණ ආයතන බවට පරිවර්තනය කිරීමේ අරමුණින් තමයි අද දවසේ සාකච්ඡාවට ගෙන තිබෙන මේ ශ්‍රම වාසනා අරමුදල සම්බන්ධව වූ යෝජනාව අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

ප්‍රාදේශීය සභා අරමුදල් ගත්තත්, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු අත්තනෝමතික ලෙස එම අරමුදල් පාවිච්චි කර තිබෙනවා. එම අරමුදල් විශාල ලෙස තමන්ගේ සුඛවිහරණය වෙනුවෙන් පාවිච්චි කරපු අවස්ථා ගැන මේ දවස්වල පුවත් පත්වල, වෙනත් මාධ්‍යවල වාර්තා වෙලා තිබෙනවා අපට පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි ඉමහත් විනාශකාරී රටක්, පාලනයක් තමයි වත්මන් පාලකයන් හැටියට අපට භාර ගන්න වුණේ. එහි වංචාව, දූෂණය, අල්ලස, නාස්තිය සෑම ආයතනයක් පුරාම ගිහින් තිබෙනවා. මේ වෙනකොට විවිධ වාර්තා අනුව, සමීක්ෂණ අනුව ඒ සෑම ආයතනයකම තිබුණු හොරකම, අල්ලස, නාස්තිය අපට අහුවෙමින් තිබෙනවා. පසුගිය දවස්වල පුවත් පත්වල වාර්තා වුණා, විවිධ ද්‍රව්‍ය ගෙන්වීමට කියලා ඇමෙරිකානු ඩොලර් බිලියන එකක් අපේ රටින් පිට රටවලට යවා තිබූ නමුත් කිසිවක් නොගෙන්වූ තත්ත්වයක් පිළිබඳව. කවුද, ඒක කරලා තිබෙන්නේ? දේශපාලනඥයන්ට සම්බන්ධ වෙච්ච නිලධාරි පෙළැන්තිය විසින්. තමන්ගේ වුවමනාවන් වෙනුවෙන් දේශපාලනඥයන්ට කඩේ ගිහිල්ලා, අවසානයේ අද හිර ගෙවල්වලට ගිහින් වද විඳින තත්ත්වයට පරිවර්තනනය වෙලා තිබෙන්නේ මේ අයථා ගනුදෙනු සහ වංචා, අල්ලස්, දූෂණ නිසායි. ඒ නිසා අපේ ස්ථාවරය වන්නේ හොරා කන්න හදාගත්ත මේ කුඩා, කුඩා දොරවල් වසා දමලා, පොදු ජනතාවගේ යහපත, උන්නතිය ඇති කිරීම සඳහා අවශ්‍ය කරන වටපිටාව ගොඩ නැඟීමයි. ඒ සඳහා මෙම ශ්‍රම වාසනා අරමුදල අහෝසි කරලා, එය පොදු අරමුදලක් බවට පරිවර්තනය කිරීම සුදුසුයි කියන යෝජනාව අවසාන වශයෙන් ඉදිරිපත් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.13]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන මන්ත්‍රීවරයෙක් කිව්වා, "සුන්බුන් විපක්ෂය" කියලා. "සුන් බුන්" எண்டா என்ன எண்டு எங்களுக்கு தமிழ்ல தெரியாது. "සුන්බුන්" කියන එක අපි දෙමළෙන් දන්නේ නැහැ. පොඩ්ඩක් දෙමළෙන් කියලා දෙන්නකෝ, "සුන්බුන්" කියන්නේ මොකක්ද කියලා. මට කියන්න තිබෙන්නේ, "දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හෝතු ච, ඵීතෝ භවතු ලෝකෝ ච - රාජා භවතු ධම්මිකෝ" කියලායි. රට පාලනය කරන මිනිස්සු එච්චර හොඳ නිසා රටේ එක පැත්තක මිනිසුන්ට, සතුන්ට බොන්න වතුර නැහැ, නියඟය. රටේ අනෙක් පැත්තේ නාය යනවා, වහිනවා, "දිට්වා" වාගේ සුළි කුණාටු එනවා. ඕක තමයි රාජා භවතු ධම්මිකෝ කියන්නේ. එච්චරට හොඳයි. මේ රට පාලනය කරන අය එච්චර හොඳයි කියලා හිතෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ශ්‍රම වාසනා අරමුදල ගැන කථා කළා නේ. විශ්වවිද්‍යාල සිසුන්ට ලබා දුන් රුපියල් 400ක මහපොළ ශිෂ්‍යාධාරය ගත්ත කෙනෙක් මේ ළඟදි මට කිව්වා, අපි රුපියල් 400න් අඩු කාලා, - සම්පූර්ණයෙන් කන්නේ නැහැ. රුපියල් 2.50ට අඩු කෑවා ලු. අඩු කාලා රුපියල් 200ක් ඉතිරි කරලා ඒකත් JVP ගිණුමටලු, දැම්මේ. ඒ කියන්නේ රුපියල් දෙකේ අඩු කාලා, - අඩු කියන්නේ බත් එකේ භාගය. ඒක රුපියල් දෙකයි. ඒ කාලයේ විශ්වවිද්‍යාලයේ හිටපු කෙනෙක් කිව්වේ. රුපියල් දෙකේ අඩු කාලා රුපියල් 200ක් දෙනවා කිව්වා, පක්ෂයේ අරමුදලට පක්ෂය හදන්න. එහෙම හදපු පක්ෂයේ ලාල් කාන්ත ගෙවල් දෙකක් හදනවා. එහෙම හදපු පක්ෂයේ වසන්ත සමරසිංහ දෙනවා කෙළියට වැඩේ. ඒ මනුස්සයා ජීම් එකේදී මට කිව්වේ මේවා. මේ කොළඹ මනුස්සයෙක්. "අපි අඩු කාලා ඉතුරු කළා, අන්න අරුන් ඇවිල්ලා සුද්ද කරනවා" කියලා කිව්වා. මරු වැඩේ. පක්ෂ අරමුදලට දෙනවා, මහපොළ අරමුදලෙන් දුන්න ශිෂ්‍යාධාරය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව මේකයි. ජනාධිපතිතුමා කියනවා, Bribery Commission එකේ මිනිසුන්ට හොඳට පඩි ගෙවන්න ඕනෑ, ඉන්න දෙන්න ඕනෑ කියලා. ඊළඟට නීතිපති එකේ කට්ටියට හොඳට දෙන්න ඕනෑ, ඒගොල්ලන්ට සැලකිය යුතු වැටුපක් දෙන්න ඕනෑ කියලා කියනවා. එතකොට අනෙක් රාජ්‍ය සේවකයන් දෙවේලයි කන්නේ. Bribery Commission එකේ මිනිස්සු විතරයි තුන්වේල කන්නේ. අනෙක් රාජ්‍ය සේවකයන් කුකුළු මස් කටු කන්නේ. මේගොල්ලන් කුකුළු මස් කන්නේ. අනෙක් මිනිස්සු යටට අඳින්නේ නැහැ. Bribery Commission එකේ කට්ටිය විතරයි යටට අඳින්නේ. මේ, කියන ඒවා තමයි.

එතකොට, නීතිපති එකේ කට්ටිය, Sri Lanka Customs එකේ කට්ටිය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රටේ මුදල් එකතු කරන ආයතන තිබෙනවා නේ. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල අයට විශේෂයක් නැහැ. Sri Lanka Customs එකේ කට්ටියට විතරක් ලාභයෙන් සියයට 40ක් දෙනවා. එතකොට Sri Lanka Customs එකේ මිනිස්සු කරන්නේ මොකක්ද? ඒ ලැබෙන සියයට 40ත් ගන්නවා, මෙතැනින් බඩු එළියට දමනකොට "සම්තිං" එකත් ගන්නවා. බඩු එළියට දාලා "සම්තිං" එකක් අරගෙන, ආයෙත් බිස්නස්කාරයින්ගේ ගෙවල්වලට පනිනවා. වෙළෙඳ ව්‍යාපාරිකයෝ වට්ටන්නේ එහෙමයි. ඉස්සරහට Sri Lanka Customs එකේ මහත්වරුන් මුදලාලිලා වෙනවා; මුදලාලිලා හිඟන්නෝ වෙනවා. මොකද, අතැනින් "සම්තිං" එකක් අරගෙන බඩු ටික එළියට දාලා, ආයෙත් ගිහිල්ලා මොකක්ද tax එකක් ගහනවා. ඒ වාගේ දේවල් සිදු වන මාර රටක් මේක. මේ රටේ රාජ්‍ය සේවකයෝ කාටද ඡන්දය දුන්නේ? ඒ වුණාට Sri Lanka Customs එකේ අයයි, නීතිපති දෙපාර්තමේන්තුවේ අයයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයයි විධියට කිහිප දෙනෙක් තමයි ඒගොල්ලන්ට ඕනෑ. ජනාධිපතිතුමා වටෙන් එන්නේ පොල් පැළේ කන්න කියලා අපි දන්නවා. ජනාධිපතිතුමා, වටෙන් ඇවිත් පොල් පැළේ කන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් Bribery Commission එකේ අයට සන්තෝසම් ටිකක් දීලා, පඩිය ටිකක් වැඩියෙන් දීලා අනික් අය හිරේ දමන්නයි. ඒ වාගේම නීතිපති එකේ අයත් ටිකක් සන්තෝස කරලා, Sri Lanka Customs එකේ අයත් සන්තෝස කරලා යන ගමනකට මේ

ලැහැස්ති වෙන්නේ. අනෙක් රාජ්‍ය සේවකයෝ මේක මතක තබාගන්න. මේ රටේ රාජ්‍ය සේවකයින්ගෙන් සියයට 90ක් ඡන්දය දුන්නේ මේ මාලිමාවට. හැබැයි, අරගොල්ලන්ට දෙන ඒවා අනික් රාජ්‍ය සේවකයින්ට දෙන්නේ නැහැ. අරගොල්ලන්ට කුකුළු මස් දෙනකොට, අනෙක් රාජ්‍ය සේවකයින්ට දෙන්නේ කුකුළු කටු. ඒ විධියට තමයි මේ වැඩේ කරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට ටිකකට කලින් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා සභාවේ හිටියා. හැබැයි, එතුමා දැන් ගියා. බලගල්ල මන්ත්‍රීතුමාත් ගියා. අද වන විට මහියංගනයේ ඉස්කෝල 36ක වැඩබලන විදුහල්පතිවරුන්ට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය මහියංගනයේ විතරක් නොවෙයි, රටේම තිබෙනවා. මහියංගනයේ පාසල් 36ක වැඩබලන විදුහල්පතිවරුන් හෙට ගුරුවරුන්ට පඩි ගෙවන්නේ නැහැ. ඒ ඇයි? ඒ වැඩබලන විදුහල්පතිවරුන්ට රුපියල් 2,500ක දීමනාවක් ගෙව්වා. මම මේ කියන්නේ මහියංගනයේ, රිදීමාලියද්දේ පාසලක් ගැන. මේ, සමන්ත විද්‍යාරත්න මහත්තයාගේ ගමේ. කන්දේගම විද්‍යාලය කියන්නේ සමන්ත විද්‍යාරත්න මහතාගේ ගෙදර අසල පිහිටි කන්ද මුදුනේ තිබෙන ඉස්කෝලයක්. ඊළඟට, රිටිගහඅරාව, දික්කෙන්ද යාය, ගල්පෝරුයාය කියන ප්‍රදේශවල තිබෙන මේ ඔක්කෝම පාසල්වල ඉන්නේ වැඩබලන විදුහල්පතිවරුන්. අපේ කාලයේදී මේ අයට රුපියල් 2,500ක දීමනාවක් දුන්නා. දැන් මොකද කරන්නේ? ඒක නීතිවිරෝධීයි කියලා ඒ 2,500 නැවත අය කර ගන්න යනවා. හෙට මේ වැඩබලන විදුහල්පතිවරුන් කරන්න යන්නේ මොකක්ද? මේ වැඩබලන විදුහල්පතිවරුන්ගේ ගිණුම්වලට තමයි ගුරුවරුන්ගේ පඩි ගෙවන්න සල්ලි දමන්නේ. වැඩබලන විදුහල්පතිවරුන් කියන්නේත් විදුහල්පතිවරුන්ම තමයි. හෙට ගුරුවරුන්ට පඩි ගෙවන්නේ, ඒ ගිණුම්වලට දමන මුදල්වලින්. හැබැයි, හෙට පඩි ගෙවන්න වෙන්නේ නැහැ. මොකද, හෙට ඒ වැඩබලන විදුහල්පතිවරුන් එක්කෙනෙක්වත් අත්සන් කරන්නේ නැහැ. ඒ නිසා පඩි නැහැ. මම මේ මහියංගනයේ පවතින තත්ත්වය ගැන කිව්වේ. මහියංගනයේ විතරක් නොවෙයි, වැලිකන්ද, මඩකලපුව, අම්පාර යනාදී මායිම් ගම්මානවල තිබෙන පාසල්වල ඉන්නේත් වැඩබලන විදුහල්පතිවරු. දැන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා කියනවාලු, බදුල්ලේ ටවුමේ විදුහල්පතිවරුන් 65දෙනෙක් ඉන්නවා, ඒ 65දෙනා මහියංගනයට දමනවා කියලා. ඒගොල්ලෝ යයි, මහියංගනයට. මොකක්ද මේ වැඩේ?. මහියංගනයට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් යන්නේ නැහැ. තල්ලු කර දැම්මත් යවාගන්න බැහැ. ඒක නිසා දැන් මොකක්ද කරන්න යන්නේ? අරගොල්ලන් හෙට පඩි ගෙවන්නේ නැහැ. හත්වැනි දාට ඒ ඔක්කෝම ඉස්කෝලවල යතුරු අරගෙන එනවා. අන්න, ඉස්කෝල භාර ගන්න. භාරගෙන කාට හෝ යතුර භාර දීලා වැඩේ කරන්න කියලා ඒගොල්ලන් හත්වැනි දාට යතුරු අරගෙන එනවා. ඔන්න ඕක තමයි අද පවතින තත්ත්වය.

Sri Lanka Customs එකත් හදන්න ඕනෑ; Bribery Commission එකත් හදන්න ඕනෑ; නඩුකාරතුමන්ලාත් හදන්න ඕනෑ. මේ රටේ ඊට වැඩිය හදන්න තැන් තිබෙනවා. මේ, ඇත්ත කථාව; මේ අපි දන්නා කථාව. යට හදාගෙන එන්න ඕනෑ උඩට. යට හදන්නේ නැතුව කොහොමද උඩ හදන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නඩුකාරතුමන්ලාට අපි මොකුත් කියන්නේ නැහැ. නඩුකාරතුමන්ලාගේ විශ්‍රාම වයස දීර්ඝ කරන්න, ඕනෑ එකක් කරන්න. හැබැයි, නඩුකාරතුමන්ලා තමයි කලින් විශ්‍රාම යන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දොස්තර නේ. ගරු කථානායකතුමාත් දොස්තර නේ. දොස්තරලාගේ විශ්‍රාම වයස දීර්ඝ කරන්න එපායැ. මැරෙන්න ඉන්න මිනිහා බේරාගන්න ඉන්නේ දොස්තර නේ! දොස්තරගේ කාලය දීර්ඝ කරන්නේ නැතුව මොකක්ද මේ කරන්නේ? නඩුකාරතුමන්ලාට stress; ඔළුවේ ප්‍රශ්න. මම දැන් හැම දාම යනවා නේ නඩුවලට. කොච්චර නඩුද? කොච්චර තීන්දු දෙනවාද? අර අලුත්කඩේ අංක එක උසාවියට ගිහින් බැලුවාම පෙනෙනවා. අම්මෝ! ඒ නඩුකාරතුමාගේ ඔළුවට තිබෙන ප්‍රශ්න. මස්ඤං වෙනවා. ඒ මිනිස්සු 60න් නොවෙයි, අනිවාර්යයෙන්ම 55න් පෙන්ෂන් යවන්න ඕනෑ. මොකද, ඒගොල්ලන්ට පීඩනය වැඩියි. ඒ මිනිස්සු පෙන්ෂන් යවා හොඳ වාහන පර්මිට් එකක් දුන්නා නම් හරි. මේ මොකක්ද කරන්නේ? අනෙක් ආණ්ඩු ඔක්කෝම රජයේ සේවකයින්ට වාහන පර්මිට් දුන්නා. මේගොල්ලන්ට මේ ගැන මම කිව්වා, කිව්වා, කිව්වා. නමුත් තව වනතුරු එක රජයේ සේවකයෙකුටවත් පර්මිට් දුන්නේ නැහැ. නඩුකාරවරුන්ට වාහන පර්මිට් එකක් දීලා ඒගොල්ලන් නිදහසේ තියන්න ඕනෑ. නඩුකාරතුමා ඉන්නේ කවුරුන් එක්කද? Court sergeant, driver, නඩුකාරතුමා. ඒගොල්ලන්ට තිබෙන්නේ එක තැනකට කොටු වෙච්ච ජීවිතයක්. දේශපාලනඥයින් නම් කමක් නැහැ. මොකද, එක පාරක් ඇමති වෙනවා; ආයෙත් මන්ත්‍රී වෙනවා; ආයෙත් පැරදෙනවා; ගෙදර යනවා; මළ ගෙදර යනවා; ක්ලබ් එකට යනවා; අඩියක් ගහනවා; චූන් එකේ ඉන්නවා. ඉතින් මන්ත්‍රීට ඕක ප්‍රශ්නයක් නැහැ, ඇමතිට ඕක ප්‍රශ්නයක් නැහැ. දැන් අර ඉන්නේ අපේ හිටපු බලශක්ති ඇමතිතුමා. එතුමා ඇමති විධියට එක පුටුවක හිටියා. දැන් මන්ත්‍රී වෙලා තවත් පුටුවක ෂෝක් එකට ඔය වාඩි වෙලා ඉන්නේ. ඉතින් ඒ වාගේ මන්ත්‍රීලාට, ඇමතිලාට ඕක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, නඩුකාරතුමන්ලාට ඕක ප්‍රශ්නයක්. ඒගොල්ලන් විශ්‍රාම යන වයස අවුරුදු 65 කරලා සේවා කාලය දීර්ඝ කිරීම නොවෙයි කරන්න ඕනෑ. ඒගොල්ලන් කලින් විශ්‍රාම යවන්න ඕනෑ. කලින් විශ්‍රාම යවලා ඒගොල්ලන්ට දෙන්න තිබෙන දීමනා, වරප්‍රසාද දෙන්න ඕනෑ. නමුත් ඒවා දෙන්නේ නැහැ. වාහන පර්මිට් එකක් දීලා, ඒ වාගේ උදව්වක් කළා නම්, ඔයිට වැඩිය හොඳයි.

මේ ළඟදී ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, රාජ්‍ය සේවකයෝ කාර්යක්ෂම වෙන්නේ කොයි වෙලාවේද කියලා. උදේ පාන්දර මරදාන දුම්රිය පොළෙනුයි, කොටුව දුම්රිය පොළෙනුයි, කොම්පඤ්ඤ වීදියේ දුම්රිය පොළෙනුයි දුවගෙන එනවාලු, එහෙම දුවලා ගිහිල්ලා මැෂින් එකේ ඇඟිල්ල තියන්නලු, ඔවුන් කාර්යක්ෂම වෙන්නේ. ඊට පස්සේ නැවත සවස ගෙදර යන්න කෝච්චිය අල්ලන්නලු, කාර්යක්ෂම වෙන්නේ. මරු, නියමයි! රාජ්‍ය සේවකයින්ට. ඕවා අහගන්න නේ, ඔයගොල්ලෝ ඡන්දය දුන්නේ ලාල් කාන්ත ඇමතිතුමන්ලාට. රාජ්‍ය සේවකයෝ ඕවා අහගන්න. ඇඟිලි සලකුණ තියන මැෂින් එකේ ඇඟිල්ල තියන්නලු, රාජ්‍ය සේවකයෝ දුවන්නේ. අනික් වෙලාවට ඔෆිස් එකේ නිකම් ඉන්නවාලු. තේ කෝප්පයක් බොනවාලු; කයිවාරුවක් ගහනවාලු; අනුන්ගේ ඒවා හොයනවාලු. ඔන්න ඔහොම තමයි ලාල් කාන්ත ඇමතිතුමා කිව්වේ. ඔයගොල්ලෝ කොහොම වුණත් එකක් හිතාගන්න, ඔයගොල්ලන් කරපුවා තිබෙනවා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමා පොඩ්ඩක් බුද්ධාගම එහෙම දන්නවා නේ. ඔබතුමා දන්නවා ඇති, අංගුලිමාල ඇඟිලි කැපුවා, කැපුවා, කැපුවා. අන්තිමේදී අංගුලිමාල රහත් වුණාට අංගුලිමාල, අංගුලිමාලම තමයි. අංගුලිමාල අංගුලිමාලම නේ? අංගුලිමාල බුදු වුණත් අංගුලිමාලමයි.

මම ඊළඟට කියන්න කැමැතියි, ග්‍රාම නිලධාරින් ගැන. ඇමතිතුමා, ග්‍රාම නිලධාරියකුගේ ගමන් දීමනාව රුපියල් 600යි. ග්‍රාම නිලධාරිට රුපියල් 600ට පෙට්‍රල් ගහගෙන වසමේ යන්න බැහැ. මේ ඊයේ පෙරේදා දවස් දෙකක් උද්ඝෝෂණයකුත් තිබුණා. මරණයක් වෙලා ග්‍රාම නිලධාරී අත්සන් කරන්නේ නැහැ, මිනිය ගන්න. මරණයක් වෙලා පැය 12ක් තියාගෙන හිටියා, ග්‍රාම නිලධාරී එන්නේ නැහැ. ඊට පස්සේ මම ගිහිල්ලා පොලීසියේ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

entry එකක් දාලා, coroner එක්කත් ඇවිල්ලා, පොලීසියේ රාළහාමි එක්කත් ඇවිල්ලා තමයි බොහොම අමාරුවෙන් මිනිය එළියට ගත්තේ. ග්‍රාම නිලධාරියාගේ ගමන් දීමනාව රුපියල් 600යි කියන්නේ, දවසකට රුපියල් 20යි, ඔහුට පෙට්‍රල් ගහගෙන වසමේ යන්න ලැබෙන්නේ. ආණ්ඩුකාරතුමන්ලාට සලකන්න ඉස්සෙල්ලා ග්‍රාම නිලධාරින්ට සලකලා ඉන්න. නඩුකාරතුමන්ලාටත් සලකන්න. ග්‍රාම නිලධාරිගේ ගමන් දීමනාව වන රුපියල් 600ක මුදල රුපියල් 3,000ක්ද, 3,500ක්ද කරන්න කියලා තමයි ඒ මිනිස්සු ඉල්ලන්නේ. ලංකාවේ ග්‍රාම නිලධාරි වසම් ගණනත් 14,000ක් පමණ වනවා. එතකොට ග්‍රාම නිලධාරින් 14,000ක් විතර ලංකාවේ ඉන්නවා. අන්න ඒ මිනිස්සුන්ගේ දීමනාව පොඩ්ඩක් වැඩි කරලා දෙන්න. ඒ වාගේම ඔය වැඩබලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයත් බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලාල් කාන්ත ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. ඒ වුණාට මම මේක කියන්න ඕනෑ. වාණිජ/කෘෂිකර්ම ඉඩම් කියලා තිස් අවුරුදු බද්දට ඉඩම් වගයක් දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම නුවර ගිය වෙලාවක මට මේක කිව්වේ සංගක්කාර කියලා ඔබතුමන්ලාගේ ගමේ මහත්තයෙක්, ඔබතුමා දන්නවාත් ඇති. පොළොන්නරුවේ මිනිස්සු කෘෂිකර්ම කටයුතු කරපු කෘෂිකාර්මික/වාණිජ ඉඩම්වල, hotels ගහපු ඉඩම්වල බදු කාලය දීර්ඝ කරන්න ඉල්ලීම් කරලා තිබෙනවා. නමුත් මේ බදු කාලය දීර්ඝ නොකරන්නේ ඇයි? ඒ, මොනවා හරි සන්තෝසමක් බලාපොරොත්තුවෙන්ද දන්නේ නැහැ. කොහොම හරි, ඒ කටයුත්ත වෙන්නේ නැහැ. ජනාධිපති ලේකම් කාර්යාලයටත් ෆයිල් ගිහිල්ලාපු, ඉඩම් අමාත්‍යාංශයටත් ෆයිල් ගිහිල්ලාපු, නමුත් තවම ඒක ගැන මොනවත් වෙන්නේ නැහැ.

ඊළඟ කරුණ මෙයයි. පොලීසියට සලකනවා කියලා ඔබතුමන්ලා කිව්වා. ජනාධිපතිතුමා එදා කථාවේදී කිව්වා, පොලීසියටත් සලකන්න ඕනෑ, පොලීසියේ 70,000යි ඉන්නේ කියලා. දැන් මාර වැඩක් නේ, වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා. කොළඹට ආපු පොලීසියේ නිලධාරින්ට කොළඹින් quarters දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඔවුන්ට ඉන්න quarters දෙනවා නේ. ඒවා එච්චර quality නැහැ. බොහොම අමාරුවෙන් තමයි ඒ මිනිස්සු ඒවායේ ජීවත් වෙන්නේ. දැන් මේ අලුත් ඇමතිතුමායි, අලුත් පොලිස්පතිතුමායි ඒ police quarter එකක කුලිය විධියට රුපියල් 45,000ක් දාලා තිබෙනවා. Police quarter එකේ කුලිය රුපියල් 45,000ක් ආපුවාම ඒ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? ඒ මිනිස්සු කන්නේ කොහොමද? ඒක ගෙව්වේ නැත්නම් එතැනින් එළියට දානවා. රුපියල් 45,000 ගෙව්වේ නැත්නම් එළියට දාලා, ඒ හිටපු කාලයට රුපියල් 45,000 ගාණේ පඩියෙනුත් කපනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට කොහොමද ඒ මිනිස්සු ජීවත් වෙන්නේ? ඒ මිනිස්සුන්ගේ ළමයි හොඳ ඉස්කෝලවලට යන්නේ. කොළඹට ආවාම පොලිස් නිලධාරියෙක් හෝ වෙනත් ඕනෑම මනුස්සයෙක් කැමැතියි, තමන්ගේ දරුවෙක් හොඳ ඉස්කෝලයකට දා ගන්න. කොහොම නමුත්, දැන් මේ කුලිය රුපියල් 45,000ක් කරලා තිබෙනවා. මේවා හෙණ ගහන වැඩ. එහෙම කරන්න එපා. නඩුකාරතුමන්ලාට සලකනවා වාගේම අනෙක් ක්ෂේත්‍රවලටත් සලකන්න ඕනෑ.

ඊළඟ එක තමයි, පැල්වත්ත සීනි සමාගම පිළිබඳ කාරණය. දැන් මේ සභාවේ කර්මාන්ත විෂය භාර ඇමතිතුමා හිටියා. මේ දවස්වල පැල්වත්තේ උක් ගස්වලට ගිනි තියනවා. උක් ගස්වලට ගිනි තැබුවාම රුපියල් 3,000ක් කපනවා. මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිතුමාත් අන්න අතැන ඉන්නවා. එතුමාගෙන් ඒ ගැන අහගන්න. කෙළින්ම රුපියල් 3,000ක් කපනවා, ටොන් එකකට. ටොන් එකකට රුපියල් 3,000ක් කැපුවාම ඒ මිනිස්සුන්ට මොකුත් ඉතුරු වෙන්නේ නැහැ. ඇයි, ඒ? උක් ගස් කපන්න යන වියදමයි, ගෙනියන්න යන වියදමයි ඔක්කෝම බැලුවාම ඒ මිනිස්සුන්ට හුළං. හුළං, ඒ මිනිස්සුන්ට. පැල්වත්තේ ඔක්කෝම උක් ගස්වලට ගිනි තියනවා. ගිනි තියන්නේ මොකෙන්ද කියන්න මම දන්නේ නැහැ. ඒක තමයි පැල්වත්ත සීනි සමාගමට අත් වෙලා තිබෙන තත්ත්වය.

පැල්වත්තේ සීනි කඩයක් දැම්මා, “දුඹුරු සීනි කඩය” කියලා. இப்ப இருக்கா அந்த சீனிக் கட? கொழும்பில நீங்க பாக்கிற இல்லயா? அந்த சீனிக் கட எங்க இருக்கு? இப்ப இருக்கா? නැහැ. දැන් සීනි කඩය වහලා. එක බිස්නස් එකයි මේ ආණ්ඩුව කළේ. සීනි කඩයක් දැම්මා. දැන් ඒකත් වහලා. ඒක ඉවරයි. உப்பு කඩත් දැම්මා, සීනි කඩත් දැම්මා, அரிசி කඩත් දැම්මා, எல்லாம் முடிஞ்சு. ඒකත් ඉවරයි. ඒ නිසා මම ඒ ගැන පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ.

ඊළඟ කාරණය මේකයි. ත්‍රිකුණාමලයේ නිලාවේලි පරවි දූපතට යන්න එක සංචාරකයෙකුගෙන් ගන්නවා, රුපියල් 13,000ක්. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එහෙම ගන්නේ. ඒ අනුව එක සංචාරකයෙකුගෙන් රුපියල් 13,000ක් ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 13,000ක් ගන්නවා, එක සංචාරකයෙකුගෙන්. අපෙන් ගන්නේ රුපියල් 1,000යි. රුපියල් 13,000ක් දීලා, සංචාරකයෙක් පරවි දූපතේ මොනවා බලන්නද යන්නේ? කිමිදිලා මාළු බලන්න, නැත්නම් මුහුදු මල් බලන්න. ඒවා බලන්න තමයි පරවි දූපතට යන්නේ. ඉස්සර රට එතැනට Navy එකෙන් ආලා හිටියා. දැන් Navy එකේ අය එතැන නැහැ. දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සල්ලි ගන්නවා. නමුත් එතැන බලාගන්න කවුරුවත් නැහැ. දහස් ගණනක් එතැනට යනවා. ත්‍රිකුණාමලයේ නිලාවේලි ප්‍රදේශයේ තිබෙන හෝටල්වලට තමයි ඒ ආදායම යන්නේ. ඔක්කෝම පරවි දූපතට යන්නේ කිමිදිලා මාළු බලන්නයි, මුහුදු මල් බලන්නයි. නමුත් ඒවා බලන්නේ කොහොමද? රට ඇවිල්ලා එතැන ඩයිනමයිට් ගහනවා. රට ඇවිල්ලා ඩයිනමයිට් ගැහුවාම මොකද වෙන්නේ? Navy එකෙන් එතැන නැහැ නේ. ඒ නිසා රට ඇවිල්ලා ඩයිනමයිට් ගහනවා. ඉතින් මේවා ගැන ආණ්ඩුවක් හැටියට සොයා බලන්න ඕනෑ. අපි විපක්ෂයේ හිටියත් අපට දෙන තොරතුරු හරියාකාරව මේ සභාවට ඉදිරිපත් කරනවා. මේ සභාවේදී හරි ඒවා ගැන දැනගෙන ගිහිල්ලා ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අවසාන කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා තමයි මේ රටේ වැඩිම කාලයක් සෞඛ්‍ය ඇමති වශයෙන් හිටියේ. එතුමාගේ ගම බදුල්ලේ, කඳන. බදුල්ල ටවුමේ ඉඳලා ටිකක් ඈත. එතුමාගේ ගමේ තිබුණා, ස්ප්‍රිංවැලි කියලා ඉස්පිරිතාලයක්. "දිට්වා" ව්‍යසනය ආපු වෙලාවේ ඒ ඉස්පිරිතාලයට පොඩ්ඩක් එහා පැත්තෙන් නාය ගියා. දැන් ඒ ඉස්පිරිතාලය නැහැ. අනේ! අර මනුස්සයාගේ නමටවත් ඒ ඉස්පිරිතාලය අරින්න කියන්න. ස්ප්‍රිංවැලි ඉස්පිරිතාලය සුද්දන්ගේ කාලයේ ඉඳලා තිබුණේ. දැන් ඒක වහලා. දොස්තරලා නැහැ. ඇම්බියුලන්ස් එක වෙන තැනකට අරගෙන ගිහිල්ලා. නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමාගේ අම්මා ඒ ඉස්කෝලේ ඉගැන්නුවේ. එතුමිය ටීචර් කෙනෙක්. තාත්තා ඒ ඉස්කෝලේ. නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා බදුල්ල ටවුමේ

මනුස්සයෙක් නොවෙයි. එතුමා ඉන්නේ දුෂ්කර ගමක. ඉතින්, ඒ ඉස්පිරිතාලයත් දැන් වහලා. මේවා අපි පාර්ලිමේන්තුවේදී කියනවා. අපි එහෙම කියනකොට ආණ්ඩුව අපට නිකම් එහෙන් මෙහෙන් අරවා මේවා දමනවා. හැබැයි, එහෙම එහෙන් මෙහෙන් දැම්මාට කමක් නැහැ. කාටවත් උදවු කරන්න ගිහිල්ලා, අනෙක් පැත්ත ගංගාව වාගේ ගලාගෙන යනවා. අනෙක් පැත්තෙන් යනවා; "සයිඩ්" වෙලා ඔක්කෝම යනවා. ඒ නිසා ඒවා ගැන බලලා වැඩ කරන්න කියලා ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළ නිසා මම මේ කාරණය කියන්නේ. වැඩබලන විදුහල්පතිවරු සම්බන්ධයෙන් එතුමා සඳහන් කළා. ඇත්තටම ඔවුන් යම් සේවාවක් කළා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. කන්දේගම, කුකුළාපොළ වාගේ අතිදුෂ්කර ප්‍රදේශවල පාසල්වල ඒගොල්ලන් වැඩ කළා තමයි. හැබැයි, 2016දී පැවති ආණ්ඩුව ඒ පත්වීම් දෙනකොට ඒවා විධිමත් ක්‍රමයකට දුන්නේ නැහැ. ඒ කියන්නේ, විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවා. එක්කෝ, විභාගයක් තියලා පත්වීම් දෙන්න තිබුණා. අඩුම තරමින් Cabinet approval එකක්වත් අරගෙන තිබුණේ නැහැ. විපක්ෂය විසින් ඒ ප්‍රශ්නය හදලා, ඒ ගැනම විපක්ෂය මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනවා. වැරදි ක්‍රමයකට දුන්නු පත්වීම්වලට අදාළව ගත්ත ක්‍රියාමාර්ගය වැරදි නිසා තමයි අගමැතිතුමියට එහෙම උත්තරයක් දෙන්න වෙන්නේ. ඒ නිසා මේ ආණ්ඩුවෙන් ඒක නිවැරදි කරන්නම්. ඇත්තටම ඒ වැඩබලන විදුහල්පතිවරුන් කරපු සේවාවට අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් ඔවුන් අපහසුතාවට පත් කළේ විපක්ෂය. විපක්ෂය ප්‍රශ්නය හදලා, පාර්ලිමේන්තුවටත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ඒකයි වුණේ. එතුමන්ලා යම් කාර්යයක් කළා. ඒක වෙනම දෙයක්. නමුත් විපක්ෂයෙන් තමයි ඒ ප්‍රශ්නය හැදුවේ. පාර්ලිමේන්තුවට ප්‍රශ්නය ඉදිරිපත් කළේත් විපක්ෂය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is an adequate clarification.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ඒ ගැන කියන්න තත්පර 15ක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
විපක්ෂය වැරදි කරපු නිසා තමයි බලගල්ලට මනාප 50,000ක් දුන්නේ මහියංගනයේ මිනිස්සු.

ඊළඟ කාරණය මේකයි. රුපියල් 2,500 ගණනේ හරි ඒ අයට ගෙව්වේ මම, මහ ඇමති කාලයේ. *[බාධා කිරීමක්]* වැරදි නොවෙයි, ඔබතුමාත් ඒකට අත ඔසවලා තිබෙනවා. මම හැන්සාඩ් වාර්තාව ගෙනෙන්නම්, පළාත් සභාවේ. ඔබතුමායි, සමන්තයි දෙන්නාම රුපියල් 2,500 දෙන්න අත ඔසවලා තිබෙනවා. හැන්සාඩ් වාර්තාවේ ඒ ගැන තිබෙනවා, ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. මම ඒ හැන්සාඩ් වාර්තාව ගෙනැල්ලා පෙන්වන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කම්කරු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම පිළිබඳ කාරණය තමයි අපි අද උදේ ඉඳලා විවාද කරමින් ඉන්නේ.

මෙහිදී මම එක් කාරණයක් කිව යුතුව තිබෙනවා. මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් විධියට නොවෙයි ක්‍රියාත්මක වුණේ. ඒ වාගේම, සේවා නියුක්තයන්ගේ සුබසාධනය සඳහා අවශ්‍ය මුදල් සැපයීම ඇතුළු විවිධ අරමුණු මෙම ශ්‍රම වාසනා අරමුදල තුළ තිබුණා. මේ අරමුදලට ලොතරැයි මණ්ඩලයේ ශ්‍රම වාසනා ටිකට් පතෙන් මුදල් ලැබුණා. පසුව "NLB Jaya" කියන ටිකට් පත හරහා ලැබෙන ආදායම ඒකාබද්ධ අරමුදලට යොමු කරලා, ඒකාබද්ධ අරමුදලෙන් තමයි කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වුණු ශ්‍රම වාසනා අරමුදලට මුදල් සැපයීම කළේ.

මේ වෙලාවේ ඉතාම කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි දන්නවා, ව්‍යවස්ථාපිත වුවත්, නැතත් අපේ රටේ තිබුණු අරමුදල් සම්බන්ධයෙන් ඉතාම ඛේදනීය සහ

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

අම්හිරි අත්දැකීමක් තමයි ශ්‍රී ලංකාවේ පුරවැසියන් විධියට අපි කාටත් තිබෙන්නේප කියන එක. ඉතාම නීත්‍යානුකූලව පවත්වාගෙන යන ජනාධිපති අරමුදල වුවත්, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු එක් එක් කුමාරවරුන්ගේ උපන්දිනවලට සාද පවත්වන්න, මැති ඇමතිවරුන්ගේ වෙනත් වුවමනා වෙනුවෙන් සීමාව ඉක්මවා මුදල් පාවිච්චි කරන්න, විවිධ දේවල් කරන්න යොදා ගන්නවා අපි දැක්කා. ඒ විධියට ඉබාගාතේ ගිය, තමන්ට ඕනෑ ඕනෑ විධියට මුදල් භාවිත කරන්න පාවිච්චි කරපු අරමුදල් බොහෝ ප්‍රමාණයක් අපේ රටේ තිබුණා. ජනතාවගේ වුවමනාව නිසි පරිදි නියෝජනය නොවන ආකාරයට තමයි මේ අරමුදලත් තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම ශ්‍රම වාසනා අරමුදල තනිකරම දේශපාලන වුවමනාවන් වෙනුවෙන් පාවිච්චි වුණු අරමුදලක් බව කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශය භාරව මීට කලින් කටයුතු කළේ මනූෂ නානායක්කාර හිටපු අමාත්‍යවරයා. පසුගිය ජනාධිපතිවරණයේදී රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ජයග්‍රහණය අපේක්ෂාවෙන් ශ්‍රම වාසනා අරමුදලේ මුදල් ඉතාම භයානක විධියට සහ නාස්තිකාර විධියට කාබාසිනියා කළා. මම පුංචි උදාහරණයක් කියන්නම්. එවකට හිටපු ජනාධිපතිවරයාගේ ජය තහවුරු කිරීමේ වැඩසටහන් එතුමා සෑම දිස්ත්‍රික්කයකම පැවැත්වූවා. ඒ සඳහා පාවිච්චි කළේ මේ ශ්‍රම වාසනා අරමුදලේ මුදල්. ඒ වකවානුවේ හෝමාගම ආසනයේ, හෝමාගම නගරයේ තිබෙන ක්‍රීඩාංගණයේ රැස්වීමක් තිබුණා. ඒකට සෙනඟ ගේන්න හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම නිලධාරින්ට බස් 10ක් වෙන් කරලා දුන්නා. කොළොන්නාවේ DS Office එකට ලබා දුන් බස් 10න්ම ආවේ තුන්දෙනායි. මහරගම DS Office එකට ලබා දුන් බස් 10න්ම ආවේ ඉතාම සුළු පිරිසයි. මෙම අරමුදල්වල තිබෙන නිවැරදි අරමුණු සාක්ෂාත් කරනවා වෙනුවට, ඉතා විනාශකාරී ලෙස මුදල් නාස්ති කරමින් තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් මෙවැනි අරමුදල් පාවිච්චි කළා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වත්මන් ආණ්ඩුව එදා පැවැති ආණ්ඩු ඒ ඒ දේශපාලන පක්ෂවලට තමන්ගේ දේශපාලන වුවමනා, අරමුණු ඉටු කර ගන්න, ප්‍රතිරූප පුම්බන්න ජනතා අරමුදල් නාස්ති කරපු ඒ විනාශකාරී ක්‍රමවේදය වෙනස් කරලා, අද යම් යම් අරමුදල් වඩා නීත්‍යානුකූලව සහ ඒ අරමුදලින් අපේක්ෂා කරන අරමුණු ඊට වඩා ඵලදායී විධියට ක්‍රියාත්මක කරන්න අවධානය යොමු කර තිබෙනවා. ඒ නිසා තමයි මේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරලා, එම අරමුදලේ අපේක්ෂාවන් සහ බලාපොරොත්තු ඊට වඩා විධිමත්ව අමාත්‍යාංශ වගකීමක් යටතේ සිදු කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඉදිරියේදී මෙම අරමුදලට රුපියල් මිලියන 50ක් වැනි මුදලක් වෙන් කරලා, සේවා නියුක්තයන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් භාවිත කරන්න රජය අවධානය යොමු කරලා තිබෙනවා.

අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පස්සේ විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ඊයේත්, අදත් විශාල ගාලගෝට්ටියක් කරනවා අපි දැක්කා. පසුගිය දවස්වල පුවත් පතක පළ වුණු කාටූනයක් A3 size කොළවල printouts අරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරු මෙතැන ප්‍රදර්ශනය කරනවා අපි දැක්කා. ඒ කාටූන් එකෙන් මොකක්ද කියන්නේ? අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය ප්‍රධාන කුලුනු 3ක් මත ස්ථාපිත වෙලා තිබෙනවා කියන එකයි. ඒ ප්‍රධාන කුලුනු තුන තමයි, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය. අපි දන්නවා, පසුගිය ආණ්ඩු කාලයේ ඒ කුලුනු තුනම දූෂිත වෙලා, දුර්වර්ණ වෙලායි තිබුණේ කියලා. අපි දැක්කා, එදා හිටපු ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය එක්තරා පවුලක වුවමනාවට අධිකරණ තීන්දු දුන්නේ නැහැ කියලා, ඒ පවුලේ බලය පාවිච්චි කරලා, පාර්ලිමේන්තුවේ බහුතරය පාවිච්චි කරලා නියමිත කාලයටත් පෙර ධුරයෙන් නෙරපා හැරිය ආකාරය. ඊයේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරද්දී විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ඒ ගැන කථා කරමින් කිව්වේ, ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම කියලායි. මළගම තිබුණේ එදා. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඝාතනය කළා, කප්පම් ගන්න පාසල් දරුවන් අරගෙන ගිහින් ඝාතනය කළා, මාධ්‍යවේදීන් ඝාතනය කළා, විරුද්ධව ලියන මාධ්‍යවේදීන්ට තාඩන පීඩන එල්ල කළා. එදා තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම තිබුණේ. අද ජන වරමට ගරු කරමින්, ඒ ජන වරමේ අභිලාෂයන් ඉටු කරමින් ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් විධායකය, ව්‍යවස්ථාදායක සහ අධිකරණය කියන ප්‍රධාන කුලුනු ශක්තිමත් කිරීම සඳහා ඉතා දැවැන්ත වෙහෙසක්, මහන්සියක් ගන්නවා, කැප කිරීමක් කරනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කළ ඉතාම බරපතළ විධායක බලතල සහ වරප්‍රසාද පැත්තකින් තියලා ගරු අනුර දිසානායක සහෝදරයා රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරමින් සිටිනවා.

එදා මේ පාර්ලිමේන්තුවේ මිරිස් කුඩු ගහනවා, වතුර බෝතල්වලින් ගහනවා, මයික් කඩලා දානවා, කථානායකතුමාගේ ආසනය විනාශ කරනවා අපි දැක්කා. ඒ විධියට තමයි අද මෙතැන විරෝධතා බෝඩ් උස්සන අය එදා ප්‍රජාතන්ත්‍රවාදයේ සංකේතය වුණු මේ පාර්ලිමේන්තුවේ හැසිරුණේ. එතැන තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම තිබුණේ. අද අපි ඉතා පැහැදිලිව කියනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ තිබෙන්නේ ආණ්ඩුවක් විධියට, රජයක් විධියට ජනතා අභිලාෂයන් ඉටු කරමින් යන ගමනක වැඩ පිළිවෙළක් බව. රටේ ජනතාව බලාපොරොත්තු වන යුක්තිය, සාධාරණත්වය, නීතිය පසිඳලීමේ ක්‍රියාවලිය තව තවත් ශක්තිමත් කිරීමේ දිශාවට තමයි අද මේ ක්‍රියාවලිය යන්නේ. නමුත් අද විපක්ෂයේ වුවමනාවට විනිසුරු මඬුල්ලේ යම් නිශ්චිත තැන් ඉලක්ක කරගෙන මේ කාරණාව එක්කෙනෙකුට ලඝු කරන්න උත්සාහ කරනවා. නැහැ, මෙවා අධිකරණ පද්ධතිය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ සහ වෙනස්කම්. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අධිකරණ පද්ධතිය, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, අධිකරණ ධුරාවලිය කියන සියල්ල එකට අරගෙන - සංයුක්තව - මේ රටේ ජනතාව අපේක්ෂා කරන පරමාධිපත්‍යය සහතික කරන්නත්, ඒ වාගේම අධිකරණය පිළිබඳව තිබෙන විශ්වාසය ශක්තිමත් කරන්නත් තමයි මේ කටයුතු කරමින් යන්නේ.

ඊයේ විපක්ෂය පුවරු උස්සාගෙන මේ සභාවේ නැගිට්ටා. අපි දන්නේ නැහැ, කවුද විපක්ෂයට ඒ ජාතියේ උපදෙස් දෙන්නේ කියලා. එදා කළු වර්ණයෙන් තිබුණු කුලුනු අද ඉතාම පැහැදිලිව පිරිසිදු කරලා ඒ මත තමයි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ඒ ක්‍රියාවලිය තමයි වත්මන් ආණ්ඩුව සිදු කරමින් යන්නේ. ඕනෑ නම් අපි වාද විවාද කරමු ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම කොහොමද ඇති කළේ, ඒ කුමන වකවානුවේද කියලා. අපි ඉතාම පැහැදිලිව මේ රටේ පුරවැසියන්ට, ජනතාවට කියනවා, ඔබ අපේක්ෂා කරපු ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය සහතික කරන්න, තහවුරු කරන්න තමයි අද අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරමින් යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ එක්කම මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වුණා රාජ්‍ය සේවය පිළිබඳව. මට

කලින් කථා කළ මන්ත්‍රීතුමාත් යම් අදහසක් ඉදිරිපත් කළා. මේ රටේ රාජ්‍ය සේවකයන් 2006 වසරේ ඉඳන් මුහුණ දීපු ගැටලුවක් තිබුණා, වැටුප් විෂමතාව පිළිබඳව. ජාතික ජන බලවේගය එදා වැඩ කරන පන්තියේ ජනතාවත් එක්ක එකතු වෙලා ඒ වැටුප් විෂමතාවට එරෙහිව විසඳුම් අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වුණා. හැබැයි හිටපු ආණ්ඩු ඒවාට අවශ්‍ය නිසි පියවර ගත්තේ නැහැ. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා 2026 අය වැය ඉදිරිපත් කරමින් කිව්වේ, වැටුප් විෂමතා සහ අනෙකුත් ගැටලු විසඳීම සඳහා විධිමත් කොමිෂන් සභාවක් පත් කරනවා කියලා. අද ඒක පත් කරලා තිබෙනවා. අපි ආදරණීය වෘත්තීය සමිති නායකයින්ගෙන් සහ වෘත්තීය සමිතිවලින් ඉතාම සහෝදරාත්මකව ඉල්ලනවා, විපක්ෂයේ ඇතැම් වුවමනා ඉටු කරන්න කටයුතු කරනවා වෙනුවට ඔබ ඔබේ වෘත්තීය ගැටලුව, වැටුප් විෂමතාව නිවැරදිව විසඳා ගැනීම සඳහා, දශක දෙකක් - අවුරුදු 20ක් - නොවිසඳුණු ගැටලුවලට අවශ්‍ය පියවර ගැනීම සඳහා ව්‍යවස්ථාපිත, ව්‍යවස්ථානුකූල, විධිමත් ආකෘති භාවිත කරමින් කටයුතු කරන්න කියලා.

ග්‍රාම නිලධාරින් පිළිබඳවත් සාකච්ඡාවක් මතු වුණා. වත්මන් ආණ්ඩුව පසුගිය අය වැයෙන් මේ රටේ රාජ්‍ය සේවකයන්ට ඒ මොහොතට යටත්ව දෙන්න පුළුවන් ඉහළම වටිනාකම් දුන්නා. 2016 වසරේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාත් හිටපු යහ පාලන ආණ්ඩුවෙන් මේ රටේ රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප අහිමි කරලා අවුරුදු 10ක් තිබුණා, ඒක විසඳුවේ නැහැ. හැබැයි වත්මන් ආණ්ඩුව 2026 අය වැය යෝජනාවක් අනුව ඒක ක්‍රියාවට නැංවූවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව තත්පර කිහිපයක් දෙන්න.

අපි මේ රටේ රාජ්‍ය සේවකයන් දශක ගණනාවක් මුහුණ දෙමින් සිටි ගැටලුවලට විසඳුම් ලබා දෙමින්, ඉදිරි විසඳුම් ලබා දීම සඳහාත් අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා. ඒ නිසා මේ රටේ සංවර්ධන නිලධාරින්, ග්‍රාම නිලධාරින්, විශ්‍රාමික ප්‍රජාව, ගුරුවරුන් සහ කළමනාකරණ සේවාවේ නිලධාරින් ආදි සියලුදෙනාගේ ගැටලුවලට අදාළව ඉතාම විධිමත්ව විසඳුම් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් මා කරනවා. විශේෂයෙන්ම මේ ශ්‍රම වාසනා අරමුදල එදා දේශපාලන වුවමනා වෙනුවෙන් පාවිච්චි කළා. ඒ මුදල් නිසි පරිදි යෙදවූයේ නැහැ. එම නිසා ඒවා කළමනාකරණය කරමින් නිවැරදි පාලනයක් තුළ ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු වඩා නිවැරදිව ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන මේ ක්‍රියාමාර්ගය ඉතාම නිවැරදි, ජනතාවාදී ක්‍රියාමාර්ගයක් බව සහතික කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාගේ කථාව මම අහගෙන හිටියා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කථා කරන එක ගැන අපි සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය ඔය වාඩි වෙලා ඉන්න ආසනයට වතුර දැම්මා කියලා චෝදනා කරද්දී, තමන් පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවා කියලා ඒ අයට අමතක වෙච්ච එක ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම, දළ දා මාළිගාවට පහර දීපු කණ්ඩායම, බැංකු කඩලා සල්ලි හොරකම් කරපු කණ්ඩායම, බැංකුවල තිබෙන රත්‍රන් ටික උස්සා ගෙන ගිහිපු කණ්ඩායම, ඒ වාගේම මාධ්‍යවේදීන්, වෛද්‍යවරුන්, ආචාර්යවරුන් ඇතුළුව 8,000කට ආසන්න තරුණයන් මරපු කණ්ඩායම අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. මොකද, එදා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න එතුමන්ලාට මතක් වුණා නම්, අද වන විට ඒ ජීවිත 8,000 අහිමි වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තවත් කාරණයකට අවධානය යොමු කරවන්න කැමැතියි. අද රටේ අධිකරණයට සිදු වන බලපෑම් අපට පෙනෙනවා. ඇයි මේ අධිකරණයට බලපෑම් එල්ල කරන්නේ කියන කාරණයට තමයි අද මා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරවන්නේ.

මම මේ කියන්න හදන්නේ ලංකා ඉතිහාසයේ වෙච්ච තවත් වංචාවක් ගැන. ශ්‍රී ලංකා රේගුව ඇතුළේ අර කන්ටේනර් 323ට අමතරව වෙච්ච වංචාවක් ගැන තමයි අද මම හෙළි කරන්න යන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අඩි 40ක කන්ටේනරයක වාහනවල අමතර කොටස් එනවා. වාහනවල සීට් වාගේම එන්ජින්වල කෑලි ආදි අමතර කොටස් රාශියක් ඒ කන්ටේනරයේ එනවා. කන්ටේනර් එනකොට පරීක්ෂා කරන්න සාමාන්‍යයෙන් රේගුවේ ක්‍රමවේද තුනක් තිබෙනවා. Green Channel එකක් තිබෙනවා. සාමාන්‍යයෙන් machine එකට දැම්මා, Green Channel එකෙන් එළියට දැම්මා. ඊළඟට, Amber Channel එක, එහෙම නැත්නම් Yellow Channel එක තිබෙනවා. ඒකෙන් සාමාන්‍යයෙන් සමහර ඒවා භෞතිකව පරීක්ෂා කරනවා, එහෙම නැත්නම් machine එකට දාලා එළියට දමනවා. ඒ වාගේම Red Channel එක තිබෙනවා. Red Channel එක කියන්නේ, අනිවාර්යයෙන්ම machine එකෙනුත් check කරන, ඒ වාගේම භෞතිකවත් check කරන එකයි. ඒ, Red Channel එක. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ එන කන්ටේනරය යන්නේ Red Channel එකටයි කියා හඳුනා ගන්නවා. Red Channel එකට ගියාම ඒකට අදාළව භෞතික පරීක්ෂාවත් කරන්න ඕනෑ, ඒ වාගේම machine එකටත් දමන්න ඕනෑ. ඒ කියපු කන්ටේනරය ආවාම ඒ කන්ටේනරයේ භෞතික පරීක්ෂාවට පළමුවැනි කණ්ඩායම රේගුවෙන් යවනවා. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි - අරුක්ගොඩ මහත්මයා තමයි

[ගරු ඩී.වී. චානක මහතා ]

එතකොට අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සිටියේ - පළමුවැනි කණ්ඩායම යවනවා. ඒ කණ්ඩායම කියනවා, ප්‍රශ්නයක් නැහැ කියලා. ඊට පස්සේ දෙවැනි කණ්ඩායම යවනවා. දෙවැනි කණ්ඩායමේ ප්‍රධානියා තමයි, එන්.එස්. කුමානායක, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ. කවුද මේ එන්.එස්. කුමානායක කියන්නේ? වර්තමානයේ ඉන්න ජනාධිපතිතුමාගේ- එහෙම නැත්නම් රටේ ඉන්න පළමුවැනි රාජ්‍ය නිලධාරියා. එතුමාගේ ප්‍රධානත්වයෙන් කණ්ඩායමක් යවනවා. ඒ කණ්ඩායම ගිහිල්ලා කන්ටේනරය පරීක්ෂා කර බලා කියනවා, ප්‍රශ්නයක් නැහැ, මේකේ ආසන 7ක් විතරක් වැඩිපුර ඇවිල්ලා තිබෙනවා කියලා. ඒක සාමාන්‍යයෙන් CCR - Central Case Register - පද්ධතියේ තමයි register කරන්න ඕනෑ. ඒක register නොකර සීට් 7ක් විතරක් වැඩිපුර තිබෙනවා කියලා, ඒ සීට් 7 රාජසන්තක කරනවා. ඊට පස්සේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පිළිබඳව පැමිණිල්ලක් නැවත වරක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට යනවා, ඒකේ සීට් 7ක් නොවෙයි, ඊට අමතරවත් දේවල් තිබෙනවා කියලා. ඊට පස්සේ රේගුවේම තිබෙන මධ්‍යම විමර්ශන අංශයට අධ්‍යක්ෂ ජනරාල්තුමා ඒක යොමු කරනවා. එසේ යොමු කළාට පස්සේ ඔවුන් ගිහිල්ලා බලනවා. ඔවුන් ගිහිල්ලා කන්ටේනර් ටික පරීක්ෂා කළාම සොයා ගන්නවා, මේකේ අයිතම 85ක් තිබෙනවා කියලා. සීට්, වාහනවල කෑලි, අමතර කොටස් ඇතුළු items 85ක් තිබෙන කොට ඒවායෙන් 45ක් පිළිබඳව රේගු සටහන්කරණයේ නැහැ; ඒ 85න්, 45ක්ම රේගු සටහන්කරණයේ නැහැ. ඒ වාගේම ඒ 45ට අයිති units 355ක් හොරට ඇවිල්ලා කන්ටේනර් එකේ තිබෙනවා. ඊට අමතරව ගත්තාම, ප්‍රකාශ කරපු items 15න් units 254ක් තිබෙනවා. ඒවාත් වැඩිපුර ඇවිල්ලා තිබෙනවා. ඊට අමතරව සටහන්කරණයේ තිබුණු 7ක් තිබෙනවා. ඒ, අඩුවෙන් tax ගෙවන items. ඒවා මේක ඇතුළේ නැහැ. ඊළඟට අයිතම 23ක් තිබෙනවා. ඒකේ units 474ක්. ඒවාත් අතුරුදහන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට අමතරව ඒකේ තිබෙනවා, වාහන ආසන 122ක්; ආනයන බලපත්‍ර නැති වාහන ආසන 122ක්. ඊළඟට, ඒකේ රිම් සහිත ටයර් 18කුත් අමතරව හමු වෙනවා. දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි, තුන්වැනි කණ්ඩායම ගිහිල්ලා 600කට වඩා දැකපු අයිතම දෙවැනි කණ්ඩායම දැක්කේ නැත්තේ ඇයි කියන එක. සීට් 129ක් ආවා නම් 122ක් මඟ හැරුණේ කොහොමද? අයිතම 600කට වඩා මඟ හැරුණේ කොහොමද?

අන්තිමට මේ පිළිබඳව පරීක්ෂණයක් කරනවා. මේ තිබෙන්නේ පරීක්ෂණ වාර්තාව. අධ්‍යක්ෂ ජනරාල්තුමා මේ පරීක්ෂණ වාර්තාව යවනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට. මේ පරීක්ෂණ වාර්තාව යන්නේ 2026.01.19වන දා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට. ලේකම් ලෙස ඉන්නේත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එතුමා තමන්ගේ යාළුවා, නියෝජ්‍ය ඇමතිතුමාව දැම්මා ලේකම් කරලා. ජනාධිපති ලේකම්වරයා වශයෙන් ඉන්නේත් එතුමාගේ කැලණිය විශ්වවිද්‍යාලයේ යාළුවා. ඔහු SLAS officer කෙනෙක් නොවෙයි. ඔහුට තමයි මේ චෝදනාව තිබෙන්නේ. අන්තිමට ලේකම්වරයා ගිහිල්ලා ජනාධිපතිතුමාට මේ පරීක්ෂණ වාර්තාව දෙනවා, බුද්ධි අංශයට පරීක්ෂණ වාර්තාව දෙනවා. හැබැයි, එහෙම දීලා තිබියදීත් තමන්ගේ හිතවතා, තමන්ගේ යාළුවා ආරක්ෂා කරන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පරීක්ෂණ වාර්තාවේ 5වැනි පිටුවේ නමත් එක්ක පැහැදිලිව තිබෙනවා, "එන්.එස්. කුමානායක නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂතුමා, වර්තමානයේ මෙම නිලධාරියා ජනාධිපති ලේකම් තනතුරට පත්ව ගොස් ඇත" කියලා. එහි වැරැදිවලට තිබෙනවා, "රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ නියෝගයක් මත දෙවැනි වරට පරීක්ෂා කිරීමක් බැවින් ආදායම් අධීක්ෂණ අංශයේ නිලධාරියෙකු වෙතින් අපේක්ෂා කරනු ලබන ධාරිතාවෙන් භාණ්ඩ පරීක්ෂා කරලා නැහැ" කියලා. මොකද අයිතම 600ක් පෙනෙනවා, හැබැයි 7ක් තමයි එතුමා දැකලා තිබෙන්නේ. CCR පද්ධතියේ මේක දාලා නැහැ කියලාත් එතුමාට චෝදනා තිබෙනවා. මොකද, Red Channel එකෙන් ආවා නම් ඒක පද්ධතියේ අනිවාර්යයෙන් දාන්න ඕනෑ. ඒකට අදාළව තිබෙනවා items 4ක්. පළමුවැනි එක, මේක check කළාද කියන එක. අනෙක් ඒවා තමයි, මේකේ progress එක කොහොමද, මේකේ නිරීක්ෂණ මොනවාද, නිගමන මොනවාද කියන එක. මේ 4න් එකක්වත් මේකේ දාලා නැහැ, මේ ඉන්න ජනාධිපති ලේකම්වරයා. ඒ බව සඳහන් කරලා මේ දූෂණය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට වාර්තාව දීලා තිබෙනවා. නමුත්, මේක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ හින්දා තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ජනාධිපතිතුමාට අධිකරණය ඕනෑ. මොකද, පළමුවැනි පේළියේ ඉන්න ඇමතිවරුන් දෙදෙනෙකුටම නඩු තිබෙනවා. නියෝජ්‍ය ඇමතිවරුන් තුන්දෙනෙකුට නඩු තිබෙනවා. ගල් අඟුරු වංචාවත් එක්ක තවත් නඩු පෝලිමක් දැන් එන්න තිබෙනවා. ඒක හින්දා තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

උත්සාහ කරන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ජනාධිපතිතුමා මේ පිළිබඳ ප්‍රකාශයක් අනිවාර්යයෙන්ම කරයි කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ නිලධාරින් පත් කර ගෙන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද රටේ ජනතාව දන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අබුබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.20]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1971ஆம் ஆண்டின் 38ஆம் இலக்க, நிதிச் சட்டத்தின் கீழான தீர்மானம் தொடர்பான - சிரம வாசனா நிதியத்தைக் கலைத்தல் - விவாதத்தில் கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

அண்மையில் இந்த நாடு முழுவதும் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற சம்பவம் தொடர்பில் பேசப்பட்டது. இனவாதத்தை அடிப்படையாகக் கொண்டு பேசப்பட்ட ஒரு விடயமாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். கல்முனையில் பெரும்பான்மையாக வாழுகின்ற முஸ்லிம்களும், 30 சதவீதத்துக்கும் அதிகமாக வாழும் தமிழ் மக்களும் ஆண்டாண்டு காலமாக மிகவும் அன்னியோன்னியமாக வாழ்ந்து வருவதை நாங்கள் சிறுபராயத்தில் இருந்தே பார்த்திருக்கிறோம். குறிப்பாக, தமிழ் சகோதரர்களின் நிகழ்வுகளுக்கு முஸ்லிம்கள் செல்வதும், முஸ்லிம்களின் நிகழ்வுகளுக்கு தமிழ் சகோதரர்கள் செல்வதும் மாத்திரமல்ல, அவர்களின் இன்ப, துன்பங்களில் பங்கு கொள்வதையும் நாங்கள் கடந்த காலங்களில் பார்த்திருக்கிறோம்.

எங்களுடைய கல்முனை வடக்கு ஆதார வைத்திய சாலையும் அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலையும் மிகப் பெரிய வைத்தியசாலைகளாகக் காணப்படுகின்றன. இந்த இரண்டு வைத்தியசாலைகளிலும் நாளாந்தம் தலா 1,500க்கும் மேற்பட்ட வெளிநோயாளர்கள் சிகிச்சை பெற்றுச் செல்கின்றனர். கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் வெற்றிடங்கள் இருப்பதாகவும், அங்கு வழமையான நடவடிக்கைகளைக் கொண்டுசெல்வதில் பல பிரச்சினைகள் இருப்பதாகவும் என்னால் அறியக்கூடியதாக இருந்தது. அதன் காரணமாக, இம்முறை அரசாங்கத்தால் வழங்கப்பட்ட நியமனத்தின்போது, 32க்கும் மேற்பட்டோர் அவ் வைத்தியசாலைக்கு நியமிக்கப்பட்டனர். குறிப்பாக, 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் நியமிக்கப்பட்டனர். அதுபோன்று ஏனைய பிரிவுகளுக்கும் நியமனங்கள் வழங்கப் பட்டன. கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் பணியாற்றுகின்ற அநேகமான வைத்தியர்கள் முஸ்லிம்களாக இருக்கின்றார்கள். நான் நினைக்கின்றேன், அங்கு 45க்கும் மேற்பட்ட முஸ்லிம் வைத்தியர்களும் 15க்கும் மேற்பட்ட முஸ்லிம் தாதியர்களும் பணிபுரிகின்றார்கள். அதேபோன்று, இன்னும் சில முஸ்லிம் உத்தியோகத்தர்களும் அங்கு வேலை செய்கின்றார்கள். கடந்த காலங்களில் அவர்களுக்கு இடையில் நல்ல அன்னியோன்னியம் நிலவியதை நாங்கள் பார்க்கக் கூடியதாக இருந்தது. குறித்த 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் தங்களுடைய கலை, கலாசாரத்தைப் பிரதிபலிக்கும் வகையில் 'ஹிஜாப்' அணிந்து வருவது சம்பந்தமான பிரச்சினை எழுந்துள்ளது. எங்களுடைய முஸ்லிம் சகோதரிகளில் நிறையப் பேர் வீடுகளில் இருக்கும்போதுகூட, 'ஹிஜாப்' அணிகின்றவர்களாக இருக்கின்றார்கள்.

சுகாதாரத்துறை மற்றும் பாதுகாப்புத்துறையில் எங்களுடைய முஸ்லிம் பெண்கள் இணைந்துகொள்வதற்கு விருப்பமற்றவர்களாக காணப்படுகின்றார்கள். அத்துறைகளில் இணைந்துகொண்டால், குறித்த சீருடைகளை அணிய வேண்டுமென்ற நிர்ப்பந்தம் இருக்கிறது. அதன் காரணமாக இப்படியான தொழில்வாய்ப்புகளில் அவர்கள் கரிசனை காட்டுவது குறைவாக இருக்கிறது. இருந்தாலும், இவ்வருடம் பல முஸ்லிம் சகோதரிகள் சுகாதாரத்துறையில் இணைந்து கொண்டார்கள். அவர்களுக்கான நியமனம் இம்மாதம் முதலாம் திகதி சுகாதார அமைச்சில் வழங்கப்பட்டது. தொடர்ந்து மூன்று நாட்கள் பயிற்சி பெற்றதன் பின்னர், கடந்த 6ஆம் திகதி குறித்த வைத்தியசாலைக்குச் சென்று கடமையைப் பொறுப்பேற்றுக் கொண்டார்கள். கடந்த 7ஆம், 8ஆம் திகதிகளில் அங்கு எந்தவிதமான பிரச்சினையும் ஏற்படவில்லை. அவர்கள் தங்களது கலை, கலாசாரத்தின் அடிப்படையில் உடையணிந்து கடமை புரிந்தார்கள். அங்கு பணிபுரிகின்ற தமிழ் சகோதரிகள் பொட்டு வைத்திருப்பார்கள். சிலவேளை அவர்களுடைய கையில் நூல் கட்டப்பட்டு இருக்கும். இவை அவர்களுடைய கலை, கலாசாரத்தின் அடிப்படையிலே இடம்பெறுகின்றன. அதேபோல்தான் இந்த முஸ்லிம் பெண்களும் தங்களுடைய மத நம்பிக்கையின் அடிப்படையிலேயே குறித்த ஆடையை அணிந்து செல்கின்றார்கள். நாங்கள் இதனை முற்றுமுழுதாக தமிழ், முஸ்லிம் மக்களுக்கு இடையிலான பிரச்சினையாகப் பார்க்கவில்லை.

இனவாதத்தை அடிப்படையாக வைத்துச் செயற்படுகின்ற குறிப்பிட்ட ஒரு கூட்டம் தமிழ் பிரதேசங்களிலும் காணப்படுகின்றது; முஸ்லிம் பிரதேசங்களிலும் காணப் படுகின்றது. தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வந்து கிட்டத்தட்ட இருபது மாதங்களாகின்ற நிலையில் அங்கு எந்தவிதமான சமூகப் பிரச்சினையும் காணப்படவில்லை. இந்தப் பிரச்சினையைக் கேள்விப்பட்டவுடன், எங்களுக்கு மிகவும் ஆச்சரியமாகத்தான் இருந்தது. வங்குரோத்து அரசியலுக்காக கல்முனை மாநகரை எப்போதும் பதற்றமான நிலையில் இக்கூட்டத்தினர் வைத்துக்கொண்டு இருப்பார்கள். பகல் நேரங்களில் சண்டை பிடிப்பார்கள்; இரவு நேரங்களில் தொலைபேசி மூலம் உரையாடி, நாளைக்கு என்ன செய்வது? எவ்வாறான பதற்றத்தை கல்முனையில் ஏற்படுத்துவது? என கலந்துரையாடுவார்கள். இப்படி மிக நீண்ட காலமாக பதற்றமான சூழல்நிலை அங்கு காணப்பட்டது. அந்த அடிப்படையிலே, 2026.08.09ஆம் திகதி குறித்த முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களுக்கு குறித்த ஆடையுடன் hospitalக்கு வரவேண்டாமென பணிக்கப்பட்டு இருக்கிறது.

அந்தப் பிரதேசத்தைச் சேர்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், அந்தப் பிரதேசம் பற்றியும் இந்த இரண்டு வைத்தியசாலைகள் பற்றியும் நான் நன்கு அறிவேன். கலாசார அடிப்படையில் அணியும் 'ஹிஜாப்' மற்றும் நீளமான காற்சட்டையை அணிந்து வரக்கூடாதெனவும், அணிந்து வந்தால் sign பண்ணவோ, கடமை புரிவதற்கோ விடமாட்டோமென அவர்களுக்கு கடந்த 09ஆம் திகதி கூறப்பட்டு இருக்கிறது. இந்தத் தகவல் எனக்கு வந்ததற்குப் பிற்பாடு, நான் அந்த வைத்தியசாலையின் வைத்திய அத்தியட்சகர் Dr. Sugunan அவர்களைத் தொடர்புகொண்டு, இது சம்பந்தமாகக் கேட்டபோது, நிறையப் பிரச்சினைகள் இருப்பதாகவும் அவற்றைத் தீர்க்க வேண்டுமெனவும் அவர் சொன்னார். அந்தப் பிரச்சினைகளை எதிர்வரும் காலங்களில் தீர்த்துக்கொள்வோமெனவும், இந்த சுகாதாரப் பணியாளர் களை அவர்கள் சாதாரணமாக வேலை செய்வது போன்று வேலை செய்ய அனுமதிக்க வேண்டுமெனவும் நான் சொன்னேன். அதன் பின்னர், அந்த சுகாதாரப் பணியாளர்கள் அங்கு கடமை செய்தார்கள்.

அதுமாத்திரமல்ல, குறிப்பிட்ட அமைச்சின் செயலாளர் மற்றும் பிரதி அமைச்சரோடு தொடர்புகொண்டு, அந்த வைத்தியசாலைக்கு இது சம்பந்தமாகத் தெரிவிக்க

[ගරු අබුබකර් අතම්බාවා මහතා]

வேண்டுமெனவும் நான் கேட்டுக் கொண்டேன். அதை அவர்கள் ஏற்றுக் கொண்டார்கள். அந்த முஸ்லிம் சுகாதார ஊழியர்களில் 6 பேர் கடந்த 9ஆம் திகதி எனது காரியாலயத்துக்கு வந்து என்னைச் சந்தித்தார்கள். "பாராளுமன்ற உறுப்பினர் அவர்களே! எங்களால் அங்கு வேலை செய்ய முடியாது; அங்கு பல பிரச்சினைகள் இருக்கின்றன. ஆகவே, பொருத்தமான இடத்துக்கு எங்களை transfer பண்ணுங்கள் - இடமாற்றம் செய்யுங்கள்" என்று அப்போது அவர்கள் சொன்னார்கள். "உரிமை அடிப்படையில் பார்க்கின்றபோது, நாட்டில் இருக்கின்ற எல்லா வைத்தியசாலைகளிலும் எல்லோரும் கடமைபுரிய முடியும். ஆகையால், உங்களுக்கு அவ்வாறு இடமாற்றம் வழங்க முடியாது. நீங்கள் அங்குதான் வேலை செய்ய வேண்டும். அதற்கான ஏற்பாடுகளை நாங்கள் செய்வோம்" என்று நான் அவர்களிடத்தில் சொன்னேன். இருந்தாலும், அங்கு அப்பிரச்சினை தொடர்ந்தும் காணப்பட்டது. நான் மீண்டும் வைத்திய அத்தியட்சகர் Dr. Sugunan அவர்களைத் தொடர்பு கொள்ள முயற்சித்தபோதும் அவரை தொடர்புகொள்ள முடியாமல் இருந்தது. அவர் விபத்து ஒன்றில் சிக்கி வீட்டில் இருப்பதாகக் கூறப்பட்டது. உண்மையிலேயே அவர் அப்போது வீட்டில்தான் இருந்தார்.

அங்கு கடமைக்குப் பொறுப்பான இன்னுமொரு வைத்தியர் இருந்தார். அவருடன் தொலைபேசியில் தொடர்புகொள்ள முற்பட்டபோது, அவருடனும் எந்தவிதமான தொடர்பையும் ஏற்படுத்த முடியவில்லை. அங்கு தொடர்ந்து இந்தப் பிரச்சினை காணப்பட்டதன் காரணமாக, நேற்று நாங்கள் - நானும் ஆளும் கட்சியிலுள்ள உறுப்பினர்களும் - கௌரவ சுகாதார அமைச்சரைச் சந்தித்து இந்த விடயம் சம்பந்தமாகப் பேசினோம். அண்மையில் இருக்கின்ற அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு அந்த சுகாதாரப் பணியாளர்களைத் தற்காலிகமாக இடமாற்றம் செய்வதாக அவர் கூறினார். இந்த இடமாற்றமானது உண்மையிலேயே இந்தப் பிரச்சினைக்கு நாங்கள் எதிர்பார்க்கின்ற தீர்வு அல்ல என்பதை உணர்கின்றோம். ஆகவே, இது தொடர்பாக நாங்கள் தொடர்ந்து பேசினோம். இந்த நாட்டில் இருக்கின்ற சட்டதிட்டங்களின் அடிப்படையில் பார்க்கின்றபோது, இவர்களை இடமாற்றம் செய்வதுதான் இதற்கான தீர்வு அல்ல. கௌரவ அமைச்சருடன் பேசும்போது அவர் சொன்னார், "நிச்சயமாக இது தற்காலிகமான ஒரு தீர்வு மாத்திரமே. எதிர்காலத்தில் நாங்கள் இது சம்பந்தமாகப் பேசவேண்டி இருக்கின்றது" என்று. அண்மையில் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் மத்தியில் நடந்த கலந்துரையாடலின்போது, சுகாதாரத்துறையில் பணிபுரியும் முஸ்லிம் பெண்களின் உடை சம்பந்தமாக நாங்கள் பேசியிருந்தோம்.

இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம் மக்கள் கடந்த ஆட்சிக் காலத்தில் பல பிரச்சினைகளை எதிர்கொண்டார்கள். குறிப்பாக, மஹர பள்ளிவாசல் சம்பந்தமான பிரச்சினை, வடக்கு, கிழக்கில் இருக்கின்ற காணிப் பிரச்சினை, நுரைச்சோலை சுனாமி வீட்டுத்திட்டப் பிரச்சினை, புத்தளத்திலுள்ள நுரைச்சோலை சம்பந்தமான பிரச்சினை, அல்-குர்ஆன் பிரதிகள் சம்பந்தமான பிரச்சினை அதாவது, endnote இடுவதா footnote இடுவதா? என்ற பிரச்சினை எனப் பல பிரச்சினைகளை எதிர்கொண்டார்கள். எங்களுடைய ஆட்சிக் காலத்தில் இந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு காண முடியும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. அந்த அடிப்படையில், நாங்கள் தொடர்ந்து முயற்சிப்போம். எதிர்காலத்தில் இந்த நாட்டில் இவ்வாறான பிரச்சினைகள் ஏற்படக் கூடாது.

தேசிய மக்கள் சக்தியின் ஆட்சியில் நாங்கள் இனவாதம், மதவாதம், பிரதேசவாதம் ஆகியவற்றைக் கடந்து பயணிக்கின்றோம் என்பது உங்களுக்குத் தெரியும். மிகக் கவலையான விடயம் என்னவென்றால், யாரோ செய்கின்ற இந்த அடாத்தான செயலை மக்கள் மத்தியில் பரப்பி, மிக அன்னியோன்னியமாக வாழ்ந்து வருகின்ற இரண்டு சமூகங்களுக்கு இடையில் இவ்வாறானதொரு பிரச்சினை இருப்பதாக வடக்கு மற்றும் கிழக்குக்கு வெளியே வாழும் மக்களுக்கும் இப்பொழுது காட்டப்படுவதுதான். எதிர்வரும் காலங்களில் நாங்கள் தனிநபர் பிரேரணைகள்மூலம் இந்த நாட்டில் வாழும் தமிழ் பேசும் மக்களுக்கு இருக்கின்ற பிரச்சினைகளை குறிப்பாக முஸ்லிம் மக்களுக்கு இருக்கின்ற பிரச்சினைகளைப் பாராளுமன்றத்துக்குக் கொண்டுவர இருக்கின்றோம். அதன்மூலம் பிரச்சினைகளுக்கு நிரந்தர தீர்வு காண முடியும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது எனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.30]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்துக்குரிய விடயதானம் வேறொன்றாக இருந்தபோதிலும்கூட, எனக்கு முன்பு உரையாற்றிய நண்பர் ஆதம்பாவா அவர்கள் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை விஷயத்தில் தான் எடுத்த நடவடிக்கைகள் சம்பந்தமாக விளக்கமளித்தார். ஆளுந்தரப்பைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் சுகாதார அமைச்சரைச் சந்தித்ததைப் போன்று, நேற்று காலையில் எதிர்க்கட்சியைச் சேர்ந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்களும் அவரைச் சந்தித்தோம். அதற்கான வாய்ப்பை அவர் தந்திருந்தார். அந்தச் சந்திப்பின்போது அவர் எங்களிடம், "இந்த இடமாற்றம் தற்காலிகமானதுதான்; இது நிரந்தரத் தீர்வு அல்ல" என்று சொல்லி இருந்தபோதிலும்கூட, நாங்கள் அவரிடமும் நண்பர் ஆதம்பாவா போன்றவர்களிடமும் எதிர்பார்ப்பது, சீருடை விஷயத்தில் முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களுக்கு மாத்திரமல்ல, சுகாதாரத்துறையில் பணியாற்றுகின்ற எல்லா முஸ்லிம் பெண்களும் தங்களுடைய கலாசார அடையாளத்தைப் பேணும் வகையில் உடையணிந்து வருவதற்கு அனுமதி வழங்கப்பட வேண்டும் என்பதை அரசாங்கம் அங்கீகரிக்கிறதா என்பதை வெளிப்படையாகச் சொல்ல வேண்டும் என்றுதான். ஏனெனில், இதுதான் இன்று இந்தப் பிரச்சினைக்கு மூலகாரணமாக இருக்கின்றது.

அரசாங்கம் இந்த விவகாரத்தில் முஸ்லிம்களின் பக்கம் இருக்கின்ற நியாயத்தை ஏற்றுக்கொண்டு, இச்சுகாதார உதவியாளர்களுக்கு மாத்திரமல்ல, அரச சேவையில் அனைத்து இடங்களிலும் சீருடை சம்பந்தமான சுற்றறிக்கைக்கு அமைய மேலதிகமாக தங்களுடைய கலாசார மற்றும் சமய ஏற்பாடுகளுக்கு அமைவாக அந்தந்தத் துறைகளில் பாரிய பாதிப்பு ஏற்படாத வகையில் முஸ்லிம் பெண்கள் உடையணிந்து பணியாற்றுவதற்கு இடமளிக்கப்படும் என்ற கொள்கை ரீதியான முடிவை எடுக்க வேண்டும் என்றுதான் நாங்கள் எதிர்பார்க்கின்றோம். வெறும் சீலைக்கு மேலால்

சொறிகிற ஒரு விடயமாக இதைத் தொடர்ந்தும் வைத்துக் கொண்டு இருப்பது அவ்வளவு நாகரிகமான விடயம் அல்ல: அது ஆபத்தானதும்கூட என்பது சமூக வலைத்தளங்கள் ஊடாக மேற்கொள்ளப்படும் கருத்துப் பரிமாறல்களைப் பார்க்கின்றபோது எங்களுக்குத் தெரிகின்றது. இதைத்தான் அண்மையில் நான் பொது நிகழ்வொன்றில் பேசும்போது, முள்ளை முள்ளால் எடுக்க வேண்டுமெனச் சொன்னேன். இந்தப் பிரச்சினை ஏற்பட்டது சுகாதாரச் சேவையில் இருக்கின்ற உள்ளூர் நிருவாகமொன்றின் ஊடாகவாகும். அந்த உள்ளூர் நிருவாகம் என்ற முள்ளை, அரச மேலிடம் என்ற அடுத்த முள்ளைப் பாவித்துத்தான் எடுக்க வேண்டும். அரச மேலிடத்தின் உண்மையான தலையீடு, இந்தப் பிரச்சினையை முளையிலேயே கிள்ளி எறிவது என்பதாக இருந்தால், அதை மிக ஆபத்து இல்லாமல் செய்து முடிப்பதற்கு இருக்கின்ற ஒரேயொரு வழி, இந்தச் சுற்றறிக்கையில் இருக்கின்ற குறைபாடுகளை நீக்குவதற்குத் தாங்கள் கொள்கை ரீதியாக முடிவெடுத்துவிட்டோம் என்பதை அரசாங்கம் அறிவிக்க வேண்டும். அதைச் செய்வதற்கு ஒருசில நாட்கள் அல்லது வாரங்கள் தாமதமானாலும், இந்தப் பதற்ற நிலை தணிவதற்கு இது மிக அவசியமான விடயம் என்பதை நாங்கள் சொல்லிவைக்க விரும்புகின்றோம்.

நான் இங்கு Public Administration Circular 13/2019 (I)ஐ சுட்டிக்காட்ட விரும்புகின்றேன். That was overriding of that Public Administration Circular, which also applied to the health sector subject to their uniform requirements. It very clearly and in detail laid out particularly what the female officers should wear. Paragraph 03.I. of that Circular states, I quote:

> ".... dressed in saree, Kandyan saree (Osari) or any other appropriate and modest attire so as to preserve the dignity of the public service. An officer should always be dressed in a manner which exposes the full face (except ears) and causes no hindrance to the provisions made with regard to public security."

Then, paragraph 03. IV states, I quote:

> "If there are officers who have arranged their clothing according to certain religious customs, such officers should be attired in the manner indicated in I above and use an additional clothing item to keep their religious identity but so as to expose their full face (except ears) ensuring their clear identification."

இந்தச் சுற்றறிக்கையை 2022இல் மாற்றுவதற்கு எடுத்த தீர்மானத்தை வாய்ப்பாகப் பயன்படுத்தித்தான், இன்று கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை நிருவாகம் இந்த நெருக்கடியை உருவாக்கி இருக்கிறது என்பது மிகத் தெளிவான விஷயமாகும். இதற்கு "பழைய சுற்றறிக்கையை மீளக் கொண்டுவருகிறோம்" என்று அறிவித்தாலே போதுமானது. இதை cancel பண்ணிவிட்டு, பழைய சுற்றறிக்கையை மீளக் கொண்டுவர வேண்டும். இப்படி ஒரு சின்ன விஷயத்தைச் செய்வதன்மூலம் பாரிய குழப்ப நிலையைத் தவிர்க்கலாம். அது அரசாங்கத்துக்கு மாத்திரமல்ல, இந்த நாட்டில் சமாதானத்தை விரும்புகின்ற அனைவருக்கும் சந்தோசமான விஷயமாகும்.

நான் இங்கு இன்னுமொரு விஷயத்தைச் சொல்ல வேண்டும். நண்பர் ஆதம்பாவா சொன்ன கருத்தை நான் ஏற்றுக்கொள்கின்றேன். கல்முனையில் இன முரண்பாடுகள் ஆங்காங்கே இடம்பெற்றாலும், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் நடந்த சில விடயங்களை நாங்கள் பாராட்டிப் பேசத்தான் வேண்டும். அங்கு நோன்பு காலங்களில் முஸ்லிம்கள் கூட்டாக நோன்பு திறப்பதற்கான ஏற்பாட்டை அந்த வைத்தியசாலை நிருவாகம் செய்திருந்தது. அதை நாங்கள் வரவேற்கின்றோம்; பாராட்டுகின்றோம். அதேபோல, அங்கு முஸ்லிம்கள் தொழுவதற்கான தொழுகை அறையும் ஏற்பாடு செய்யப்பட்டு இருக்கிறது. அதையும் நாங்கள் பாராட்ட வேண்டும்; வரவேற்க வேண்டும். எனவே, நாங்கள் குற்றங்களை மாத்திரம் சொல்வதல்ல முக்கியம். இது ஒரு குற்றம் என்று சொல்வதல்ல! ஒரு தவறு நடந்து விட்டது. அந்தத் தவறைத் திருத்த வேண்டும். என்னைப் பொறுத்தமட்டில், தேவையில்லாமல் அங்கிருக்கின்ற சுகாதார சேவை உத்தியோகத்தர்களைப் பயன்படுத்தி ஆர்ப்பாட்டம் செய்வதும், செய்தியாளர் மாநாட்டை நடத்துவதும் disciplinary actionஐ attract பண்ணுகின்ற விஷயமாகும். அவர்களுக்கு எதிராக ஒழுக்காற்று நடவடிக்கை எடுக்கப்படுமா? என்ற கேள்வியையும் கேட்டுக்கொண்டு இருக்கிறார்கள். யார் தண்டிக்கப்பட வேண்டும் என்பதைவிட, சேவைக்கு வந்து ஓரிரு நாட்களில் பலவந்தமாக இடமாற்றம் செய்யப்பட்டு இருக்கின்ற இந்த சுகாதார உதவியாளர்களுக்கு நடந்திருக் கின்ற அநீதியை உடனடியாக நீக்குவதற்கு அரசாங்கம் நடவடிக்கை வேண்டுமென நாங்கள் வலியுறுத்துகின்றோம். I must say that uniform and uniformity should be flexible to accommodate diversity and about the need to encourage inclusivity in the Public Service. அதுதான் important. பொதுச் சேவைக்குள் எல்லா இனங்களையும் உள்வாங்கக்கூடிய அந்தத் தேவைப்பாட்டை நிவர்த்தி செய்கின்ற நெகிழ்வுத்தன்மைப் பற்றித்தான் நாங்கள் இங்கு பேசுகிறோம். There is a talk about female labour force participation.

மற்றைய நாடுகளைவிட எங்களுடைய நாட்டில் பெண்கள் வேலைக்குச் செல்கின்ற வீதம் மிகக் குறைவாகவே இருக்கின்றது. அதாவது, 32 சதவீதம்தான் இருக்கின்றது. அதுவும் எமது நாட்டில் ஆடை தொழிற்சாலைகள் இல்லையென்றால், பெண்கள் வேலைக்குச் செல்லும் வீதம் இன்னும் குறைவாக இருக்கும். நேபாளத்தைவிடவும் பெண்கள் வேலைக்குச் செல்கின்ற வீதம் எங்களுடைய நாட்டில் குறைவு. எங்களைவிடக் குறைவான நாடு பாகிஸ்தான் மாத்திரம்தான். பெண்கள் வேலைக்குச் செல்வது குறைவாக இருப்பது, பொருளாதாரத்துக்குப் பாதிப்பான விஷயம் என்பதை பொருளாதார வல்லுநர்கள் சொல்கின்றார்கள். எமது நாட்டிலுள்ள female labour forceஇல் பௌத்தர்கள் 83 சதவீதம் இருக்கிறார்கள்; இந்துக்கள் 10.6 சதவீதம் இருக்கிறார்கள். ஆனால், முஸ்லிம்கள் 4.3 சதவீதம் மாத்திரம்தான் இருக்கிறார்கள். அதிலும், பெரும் பான்மை யானோர் கல்விச் சேவையில் ஆசிரியர்களாகப் பணியாற்றுப வர்கள் என்பது எல்லோரும் அறிந்த விஷயமாகும். தாதியர்களாக வருவதற்கு இப்பொழுதுதான் ஆரம்பித்து இருகிறார்கள். ஏற்கெனவே பலர் இருந்தாலும், கிழக்கு மாகாணத்தில்தான் கூடுதலானவர்கள் இருக்கிறார்கள்.

சில கிழக்கு மாகாண வைத்தியசாலைகளில் இருக்கின்ற பெண் ஊழியர்கள் தங்களுடைய தலையை மூடுவதற்கு அணிகின்ற 'ஹிஜாப்' சம்பந்தமாக இருக்கின்ற பிரச்சினையை அங்குள்ள வைத்திய உயர் அதிகாரிகள் கண்டுகொள்ளாமல் இருப்பதால் அவர்கள் அதை அணிந்து வருகிறார்கள். ஆனால், வேறு வைத்தியசாலைக்குப் போகின்றபொழுது ambulance க்குள் 'ஹிஜாப்'ஐக் கழற்றி வைத்துவிட்டுப் போகுமாறு அவர்கள் நிர்ப்பந்திக்கப்படுகிறார்கள். அப்படியான பீதியில்தான் அவர்கள் இந்தத் தொழிலில் ஈடுபட்டுக்கொண்டு இருக்கிறார்கள் என்பதை அரசாங்கத்துக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, இதற்கு முழுமையானதொரு தீர்வை அரசாங்கம் உடனடியாகத் தருவதற்கான ஓர் அறிவிப்பைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

நேற்று இவ்விடயம் தொடர்பில் கலந்துரையாடுவதற்கு எங்களுக்கு வாய்ப்பளித்த கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூறுகின்ற அதேநேரம், அரசாங்கம் இதற்கு உண்மையிலேயே தீர்வைத் தருவதற்குத் தயாராக இருக்கிறது என்பதை வெளிப்படையாகச் சொல்ல வேண்டுமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026.07.24වැනි දා පාර්ලිමේන්තු විවාද වාර්තාවේ - හැන්සාඩ් වාර්තාවේ - 1517 සිට 1520 දරන තීරුවල මම ප්‍රශ්නයක් නඟා තිබෙනවා, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා ගැන. ඒ පිළිබඳව පිළිතුරු ලැබිලා මුද්‍රණය වෙලා තිබෙනවා. මේකේ මම අහලා තිබෙන ඉතා වැදගත් ප්‍රශ්නයකට පිළිතුරු දීලා නැහැ. මම අහලා තිබෙන ප්‍රශ්නය වන්නේ, එතුමා ලංකාවේ පුරවැසිභාවය ලබා ගත්තේ කවද්ද කියලා. ඒ ප්‍රශ්නයට පිළිතුරු නොදී "පුරවැසියෙකි" කියලා, පුරවැසි අංකය සඳහන් කරලා තිබෙනවා. දිනය නැහැ. වැදගත් වෙන්නේ එතුමා පාර්ලිමේන්තු මැතිවරණයට නාම යෝජනා භාර දෙන විට එතුමා ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන ප්‍රශ්නයයි. ඒ ඉතා වැදගත් ප්‍රශ්නය වාර්තා නොවීම මගේ වරප්‍රසාද කඩ කිරීමක්; වැදගත් කරුණක් වසන් කිරීමක්. මම මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා. හැන්සාඩ් වාර්තාව නිසි ලෙස වාර්තා වෙලා තිබෙනවාද, එතුමා දුන් පිළිතුර වරද්දලා වාර්තා කරලා තිබෙනවාද, නැත්නම් මේක පාර්ලිමේන්තුවේ අඩුපාඩුවක්ද, එතුමාගේ අඩුපාඩුවක්ද කියලා සලකා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපි ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.42]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதம் சிரம வாசனா நிதியம் தொடர்பானது. இந்த நிதியமானது, 1998ஆம் ஆண்டின் 12ஆம் இலக்க, சிரம வாசனா நிதியச் சட்டத்துக்கு இணங்க ஸ்தாபிக்கப்பட்டது. விசேடமாக, தொழிற்றுறையில் ஈடுபடும் தொழிலாளர்களைப் பாதுகாப்பதும் அவர்களுக்கான நலன்புரிச் சேவைகளை முன்னெடுப்பதுமே இதன் நோக்கமாக இருந்தது. குறிப்பாக, தொழிலாளர்களின் பிள்ளைகளுக்கான கல்வி உதவித்தொகை, தொழிலாளர்களுக்கான இலவச சட்ட உதவி, தொழிலின்போது விபத்துக்குள்ளாகும் தொழிலாளர் களுக்கான நிவாரணம், தற்காலிகமாக சேவை இடைநிறுத்தப்பட்ட தொழிலாளர்களுக்கான உதவித்தொகை, பாதிக்கப்பட்ட தொழிலாளர்களுக்கான இடைப்பட்ட கால தொழிற்பயிற்சி எனப் பல்வேறுபட்ட நன்மைகளை இந்த நிதியம் வழங்கி வந்தது. ஆனால், கடந்த அரசாங்க காலத்தில் இருந்த சில அமைச்சர்கள் மேற்கொண்ட ஊழல் காரணமாக இந்த நிதியத்தின் நிதி தவறான முறையில் பயன்படுத்தப் பட்டுள்ளதாக விசாரணைகள்மூலம் வெளிவந்து இருக்கிறது. விசேடமாக, 2024ஆம் ஆண்டு கிட்டத்தட்ட 66 மில்லியன் ரூபாயை செலவு செய்து புத்தகப் பைகளை வாங்கி யிருக்கிறார்கள். இந்த நாட்டில் பல ஊழல்களைச் செய்த கடந்த கால ஆட்சியாளர்கள், பாடசாலை மாணவர்களின் பெயரைப் பயன்படுத்தி, அவர்களின் கல்வி நடவடிக்கைக்கு உதவி செய்வதாகக் கூறி, பல மில்லியன் ரூபாயை ஊழல் செய்திருக்கிறார்கள்.

இந்த நிதியத்தின் சேவைகளை தொழில் அமைச்சின்கீழ் இயங்குகின்ற ஏனைய நிறுவனங்கள் வழங்குவதால், இந்த நிதியத்தைக் கலைப்பதற்குத் தீர்மானிக்கப்பட்டுள்ளது. எனினும், தொழிலாளர்களுக்கு வழங்கப்படுகின்ற சேவை களை தொழில் அமைச்சு தொடர்ச்சியாக வழங்குமென நான் இங்கு கூறிக் கொள்கின்றேன். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அன்று பாரதியார் பராசக்தியைப் பார்த்து பின்வரும் கவிதையைப் பாடினார்:

"காணி நிலம் வேண்டும் - பராசக்தி
காணி நிலம் வேண்டும்;- அங்கு
தூணில் அழகியதாய் - நன்மாடங்கள்
துய்ய நிறத்தினவாய் - அந்தக்
காணி நிலத்தினிடையே - ஓர் மாளிகை
கட்டித் தரவேண்டும் - ....."

202 வருட வரலாற்றைக்கொண்ட மலையக மக்கள் காலங் காலமாக தங்களுக்கான காணி உரிமை, வீடு, கல்வி, சுகாதாரம் எனப் பல்வேறுபட்ட தேவைகளுக்காக தொடர்ச்சியாகக் குரலெழுப்பி வருகிறார்கள். 2023ஆம் ஆண்டு பதுளை மாவட்டத்தின் கபரகல பிரதேசத்தில் மிகப் பெரிய மண்சரிவு ஏற்பட்டது. அந்த மண்சரிவால் பாதிக்கப்பட்ட மலையக மக்கள் - கிட்டத்தட்ட 50 குடும்பங்களைச் சேர்ந்தவர்கள் - பாழடைந்த தொழிற்சாலை யில் தொடர்ச்சியாக தங்கவைக்கப்பட்டனர். தங்களுக்கான வீட்டுரிமையைப் பெற்றுத்தருமாறு அவர்கள் அக்காலத்தில் இருந்த அரசாங்கத்திடம் பல கோரிக்கைகளை விடுத்தார்கள்; அதற்காகப் பல போராட்டங்களையும் நடத்தினார்கள். எனினும், அவர்களுடைய கோரிக்கைகள் நிறைவேற்றப்பட வில்லை.

தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்பு, இந்த மக்களுக்கான வீடுகளைக் கட்டிக்கொடுப்பதற்கு முன்வந்தது. அதன் அடிப்படையில், கடந்த காலத்தில் அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மலையக மக்களுக்கு 397 வீடுகளைக் கட்டிக்கொடுப்பதற்கு அரசாங்கம் நிதி ஒதுக்கியிருந்தது. அதன் ஓர் அங்கமாக கபரகல மக்களுக்காக 50 வீடுகளை நாங்கள் கட்டிமுடித்து இருக்கிறோம். அந்த வீடுகள் சர்வசாதாரணமானவை கிடையாது. கடந்த காலத்தில்

கட்டிய வீடுகள் போன்ற வீடுகளல்ல. இது அந்த மக்களுடைய நம்பிக்கை; எதிர்பார்ப்பு! எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் அந்த மக்களுக்கு வீடுகளைக் கட்டியிருக்கிறது. எதிர்வரும் 28ஆம் திகதி எங்களுடைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் தலைமையில் அந்த வீடுகள் அந்த மக்களிடம் கையளிக்கப்பட இருக்கின்றன. வீடு கட்டுவதற்கு 28 இலட்சம் ரூபாயையும் உட்கட்டமைப்பு வசதிகளுக்காக 4 இலட்சம் ரூபாயையும் நாங்கள் ஒதுக்கீடு செய்திருந்தோம்.

கடந்த காலங்களில் ஒப்பந்தக்காரர்களுக்கு வழங்கப்பட்டு, கட்டப்பட்ட மலையக மக்களுக்கான வீடுகள் அம்மக்களிடம் கையளிக்கும்பொழுது, வீட்டின் தரை வெடித்திருக்கும்; கூரை பறந்திருக்கும்; மின்சாரம் இல்லை; நீர் வசதி இல்லை; வீதிகள் இல்லை. ஆனால், இன்று கபரகலயில் கட்டப்பட்டிருக்கும் வீடானது, மாளிகை போன்றது. எனவே, தேசிய மக்கள் சக்தி அரசாங்கம் மலையக மக்களுக்குக் கட்டிக்கொடுக்கும் வீடுகளை எதிர்வரும் 28ஆம் திகதி கபரகலவுக்கு வந்து பார்க்குமாறு நான் எதிர்க்கட்சியில் இருக்கின்ற மலையகப் பாராளுமன்ற உறுப்பினர்களுக்கு இந்தப் பாராளுமன்ற உரை ஊடாகத் திறந்த அழைப்பு விடுக்கின்றேன். அந்த வீட்டுத்திட்டத்தில் நேர்த்தியான பாதைகள் அமைக்கப்பட்டு இருக்கின்றன; முறையான வடிகாலமைப்புகள் அமைக்கப் பட்டுள்ளன. கடந்த காலத்தில் மலையக மக்களுக்குக் கட்டிக்கொடுக்கப்பட்ட வீடுகளுக்குக் காணி உரித்து வழங்கப்படவில்லை. முதன்முறையாக மலையக மக்களுக்குக் காணி உரித்தை நாங்கள் வழங்குகின்றோம்.

இந்த நாட்டுக்கு முகவரியைப் பெற்றுக்கொடுத்தவர்கள் தோட்டத் தொழிலாளர்கள்! இன்று உலகத்தில் "Ceylon Tea" என்றால், இலங்கை என்று தெரியும். "Ceylon Tea" என்ற வர்த்தக நாமத்தை உலகுக்கு வழங்கியவர்கள் தோட்டத் தொழிலாளர்கள்! எனினும், அந்தத் தோட்டத் தொழிலாளர் களுக்கு முகவரி இருக்கவில்லை. முதன்முறையாக இந்த கபரகல வீட்டுத்திட்டத்தின் மூலமாக அந்த மக்களுக்கு நாங்கள் முகவரியை வழங்குகின்றோம். அதுமாத்திரமல்ல, தனியான பாதுகாப்பு மதில், சூரிய சக்தியில் இயங்கும் மின்விளக்கு, தனியான முகவரி, ஒவ்வொரு வீட்டுக்கும் தனித்தனி தபால்பெட்டி, ஒவ்வொரு வீட்டுக்கும் நீர்த்தாங்கிகள், பூர்த்தி செய்யப்பட்ட உட்கட்டமைப்பு வசதிகள் என்பவற்றையும் நாங்கள் வழங்குகின்றோம்.

மலையக மக்களுக்கு இருக்கின்ற முக்கிய பிரச்சினைகளில் ஒன்றுதான் கல்விப் பிரச்சினை. கௌரவ பிரதமரும் கல்வி அமைச்சருமானவருடன் மூன்று சுற்றுப் பேச்சுவார்த்தைகளை நாங்கள் பாராளுமன்றக் கட்டிடத்தொகுதியில் நடத்தி இப்பிரச்சினை தொடர்பாகப் பேசியிருக்கிறோம். அடுத்து, காணி உரிமை! மலையக மக்களுக்கு எவ்வாறு வீடு கட்டுவதற்குக் காணி இருக்கவில்லையோ, அதேபோல்தான் மலையகப் பாடசாலைகளுக்கும் காணியுரிமை கிடையாது. எனவே, மலையகப் பாடசாலைகளுக்கு குறைந்தபட்சம் 2 ஏக்கர் காணியை வழங்குவது தொடர்பாக - அதிகபட்சம் எவ்வளவாகவும் இருக்கலாம் - நாங்கள் ஆராய்ந்து வருகின்றோம். அதேபோல, ஆசிரியர் பற்றாக்குறை, வளப் பற்றாக்குறை போன்ற பிரச்சினைகளுக்கும் தீர்வுகளைப் பெற்றுக் கொடுப்பதற்காக நாங்கள் பேச்சுவார்த்தை நடாத்தி வருகின்றோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

மலையக மக்களுக்கு சுகாதாரத் துறையிலும் பிரச்சினைகள் காணப்படுகின்றன. கடந்த காலங்களில் பெருந்தோட்டப் பகுதிகளிலுள்ள வைத்தியசாலைகள் தோட்ட நிருவாகத்தால் முறையாகப் பராமரிக்கப்படாமையால் பெரும்பாலான வைத்தியசாலைகள் மூடப்பட்டு இருக்கின்றன. அந்த வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்று மக்களுக்கு சுகாதார சேவையை வழங்குவதற்குத் தீர்மானித்திருக்கிறது. அதேபோல, மலையக மக்களுக்கான தபால் சேவையை முறையான விதத்தில் வழங்குவதற்கும் நாங்கள் தீர்மானங்களை மேற்கொண்டு வருகின்றோம். ஒட்டு மொத்தத்தில் தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, மலையக மக்களுக்கு ஒளிமயமான எதிர்காலத்தை உருவாக்கி வருகின்றது. எனவே, வளமான நாடு - அழகான வாழ்க்கையை மலையக மக்களுக்கும் பெற்றுக்கொடுப்பதற்கு எமது அரசாங்கம் நடவடிக்கையெடுத்து வருகின்றது. நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 1.53]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධිකරණයට පමණක් අදාළ වුණත්, අපේ රටේ අනාගතය, ඉතිහාසය ඇතුළු සියල්ලටම බලපාන විශාල ප්‍රශ්නයක් බවට පත් වන සංශෝධනයක් කියායි මා හිතන්නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු - විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු - මේ සම්බන්ධයෙන් අදහස් දක්වනවා මම දැක්කා. විශේෂයෙන්ම අධිකරණ ඇමතිවරයා කිව්වා, මේක මෙච්චර කළු යකෙක් නොවෙයි කියලා. හැබැයි, මීට මාස එකහමාරකට කලින් මේ ගැන කියද්දි මම එතුමාට මතක් කළා, සිම්බාබ්වේ රටේත් සිදු වෙලා තිබෙන්නේ මේ කාරණයමයි කියන එක. මෙහෙම දෙයක් වෙන්න යනවා කියලා එතුමාට මතක් කරද්දි එතුමා විපක්ෂ නායකතුමාට කිව්වා, ඔබතුමා යකෙක් මවනවා, මෙහෙම එකක් අපි හිතලාවත් නැහැ කියලා. පිටිපස්සේ හිටපු ඇමතිවරුත් කියනවා මම අහගෙන හිටියා, එහෙම එකක් අපි හිතලාවත් නැහැ, මෙහෙම සංශෝධනයක් වෙන්නේ නැහැ, විනිසුරුවන්ගේ ධුර කාලය වෙනස් කරන්නේ නැහැ, දීර්ඝ කරන්නේ නැහැ කියලා. එතුමා තදින්ම එහෙම කියලා හැන්දෑවේ ඒක වෙනස් කරගත්තා. එතුමාට ලැබුණු උපදෙස් අනුව එතුමා කිව්වා, නැහැ, මෙහෙම සාකච්ඡාවක් යනවා කියලා.

මේකේ තිබෙන භයානකකම මොකක්ද? විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ අවධානය මම මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. එතුමන්ලා කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තමයි මෙය කරන්නේ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තමයි ඉතිහාසයේ සිදු වුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී දේවල් සිදු වුණේ. මට මතකයි, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ජනමත විචාරණයක් තියලා පාර්ලිමේන්තු නිල කාලය දීර්ඝ කරගත්ත ආකාරය. මම හිතන විධියට, ඒ වකවානුව අපේ දෙමව්පියන් එක්සත් ජාතික පක්ෂයට පොඩ්ඩක් සහයෝගය දක්වපු කාලයක්. එතුමන්ලා දෙදෙනාම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ අය. මේකට පක්ෂව ඡන්දය දෙන්නේ නැත්තේ ඇයි කියලා පොඩි කාලයේ අපි අහනකොට මගේ දෙමව්පියන් කිව්වා මට මතකයි, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන, හකුළන දේවල්වලට අපි සහයෝගය දෙන්න හොඳ නැහැ කියලා. ඒ වෙලාවේදී ඒගොල්ලන් ඒකට විරුද්ධව ඡන්දය දුන්නා. මට ඒ ගැන ආඩම්බරයි.

ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ සංවර්ධන සභා මන්ත්‍රීවරු ඒ ගැන කියපු දේවල් කිහිපයක් 1982.12.07වන දින "ලංකාදීප" පුවත් පතේ සඳහන් වනවා. ඒ පුවත් පත මම හොයා ගත්තා. ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ තමයි ජනමත විචාරණයට සහාය දැක්වීම කළේ. ඔබතුමන්ලා ඒ අවස්ථාවේදී යකා නැටුවා. ඒක හොඳයි. ඒක හරි. ඒ අවස්ථාවේදී ඔබතුමන්ලා මොකක්ද කිව්වේ?

1982.12.07වන දින "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

> "සංවර්ධන සභා මන්ත්‍රී උදය හෙළකුමාර, ජගත් සාන්ත බණ්ඩාර මහතා (ජවිපෙ) -
>
> ජනමත විචාරණයක් සඳහා රජය පදනම් කරගෙන තිබෙන කරුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී ඒවා. මහ මැතිවරණයක් පැවැත්වීමෙන් පාර්ලිමේන්තුවට ශ්‍රීලනිප දාමරික මන්ත්‍රී පිරිසක් ඒම වළක්වාලීම රජය විසින් කළ යුතු දෙයක් නොව ජනතාව විසින් තීරණය කළ යුතු දෙයක්.
>
> සංවර්ධන සභා මන්ත්‍රී උපතිස්ස ගමනායක මහතා (ජවිපෙ) -
>
> ජනමත විචාරණය පිළිබඳ පක්ෂ දේශපාලනයෙන් යුතුව සලකා නොබැලිය යුතුයි."

මහජනයා සිය නියෝජිතයා තෝරා පත් කර ගැනීමේදී මේකට සම්පූර්ණයෙන් විරුද්ධ වෙනවා. ඊට පස්සේ රෝහණ විජේවීර මැතිතුමා මේකට විරුද්ධව උසාවි යනවා, 1982දී. ඔබතුමන්ලා කියනවා වාගේ මේක විශාල යකෙක් බවට පත් කරනවා. විශේෂයෙන්ම විනිසුරුවන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කළාට පස්සේ,- *[බාධා කිරීමක්]* කෑ ගහලා වැඩක් නැහැ. මම කියන දේ අහගෙන හිටියා නම් හොඳයි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. *[බාධා කිරීම්]* මොකක්ද? *[බාධා කිරීම්]* ඔව්, ඔයගොල්ලන් ඒකට විරුද්ධ වුණු සෙල්ලම තමයි මම මේ කියන්නේ. *[බාධා කිරීම්]* අපි ඒක වැරදියි කියලා කියනවා නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
*නීති විරෝධීයි.*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ඒක නීති විරෝධී වෙන්නේ කොහොමද? ඒක ව්‍යවස්ථාපිතයි. මේක කරනකොට හරි. ඒක තමයි "කන්න හිතුණාම කබරගොයාත් තලගොයා වෙනවා" කියන්නේ. ඔහොමම තමයි රාජපක්ෂලාත් ඒ කාලයේ හිටියේ කියන එක මට මතකයි. රාජපක්ෂලාට විරුද්ධ වුණු ශිරානි බණ්ඩාරනායක අග විනිසුරුතුමිය හැටියට පත් කරපු විධියත් වැරදියි. ශිරානි බණ්ඩාරනායක එම තනතුරට පත් කළේ ජී.එල්. පීරිස් මහත්මයා සමඟ තිබෙන හැඳුනුම්කමට. එහෙම නැතුව, එතුමියට ජ්‍යෙෂ්ඨත්වයක් තිබුණේ නැහැ, එතුමිය පත් කරනකොට. ඒකට අපි විරුද්ධ වුණා. හැබැයි, එතුමිය පත් කළාට පස්සේ එවකට ආණ්ඩුවට පක්ෂග්‍රාහී නොවන හේතුව මත එතුමියව ධුරයෙන් අයින් කළා. ඒකටත් අපි විරුද්ධ වුණා. රාජපක්ෂවරු ඒ කාලයේ ඔබතුමන්ලා වාගේම උද්ධච්ච විධියට හිටියා කියන එක මට මතකයි. ඔහොමම තමයි. ඔබතුමන්ලා වාගේමයි රාජපක්ෂලාත් ඒ කාලයේ හිටියේ. ඔබ දෙගොල්ලන්ගේම හැසිරීම එක වාගේයි. බලය තිබෙන්නේ පොඩි කාලයයි. රිළවු වාගේ කෑ ගහන්න පුළුවන්. ඒ වුණාට බලය තිබෙන්නේ පොඩි කාලයයි කියන එක මතක තියා ගන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ කරනකොට සැපයි වාගේ දැනෙනවා. දන්නේ නැති ඒවා ගැන නේ කථා කරන්නේ.

මගේ නඩුවක් තිබෙනවා, දිසා අධිකරණයේ. නීතිඥවරුත් ඉන්නවා නේ. ඒ අය නඩු කථා කරනවාද මම දන්නේ නැහැ. මම "The Sunday Times" පුවත් පතට විරුද්ධව නඩුවක් දාලා තිබෙනවා, මට අපහාස කිරීම සම්බන්ධයෙන්. ඒ නඩුවට දැන් අවුරුදු 10ක් වනවා. දිසා අධිකරණයේ තමයි ඒ නඩුව අහන්නේ. දිසා අධිකරණයේ විනිසුරුතුමාගේ ධුර කාලය වැඩි කළා කියලා නඩුව ඉවර කරන්නේ කොහොමද? *[බාධා කිරීම්]* කෑ ගහන්න එපා. අහගෙන ඉන්නකෝ. විනිසුරුවරයාගේ ධුර කාලය තව අවුරුදු 10ක්, 15ක් තිබෙනවා. ඒක කොහොමද කරන්නේ කියලා කිසිම හේතුවක්, කිසිම කරුණක් දක්වන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔහේ කෑ ගහනවා. වාර්තාවක් නැහැ. මම ඔබතුමාට ඒ ගැන පෙන්වන්නම්. වාචාලකම විතරයි තිබෙන්නේ. මම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහිත් යොමු කරවනවා. ඕස්ට්‍රේලියාවේ මේ වාගේ වැඩක් කරන්න ගිහිල්ලා අකුළා ගත්තා. මෙවැනි දේවල් කරන්න ගිය හැම රටක්ම අකුළා ගත්තා. සිම්බාබ්වේ රටේ විතරයි මෙවැනි දෙයක් සිදු වුණේ,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සිම්බාබ්වේ රටේ මෙවැනි දෙයක් සිදු වෙලා ඒ රට විනාශ වුණා. අධිකරණ පද්ධතිය විනාශ වුණා. මොකක්ද මේ කරන්නේ? වෙන රටවල එහෙම දෙයක් කරන්නේ ඊළඟට එන විනිසුරුවරුන්ට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ඔබතුමාගේ ධුර කාලය අවුරුදු දෙකක් වෙනස් කරනවා නම්, ඔබතුමා ඒ ධුර කාලය වෙනස් කරපු පුද්ගලයාට ඕනෑ විධියට වැඩ කරනවා නේ. එහෙම නැද්ද? ඔබතුමාත් මනුෂ්‍යයෙක් නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනිසුරුවන් අධිකරණයට බඳවා ගන්නකොට එහෙම සම්බන්ධතා තිබෙන්න බැහැ. නඩුවක් අහනකොට අපිව අඳුරනවා නම්, අපිව කොහේදී හරි දැකලා තිබෙනවා නම් ඒ විනිසුරුතුමා කියනවා, "මට මේ නඩුව අහන්න බැහැ. මෙතුමා මම දන්නවා" කියලා. අඳුනා ගන්න ඕනෑ නැහැ. එහෙම සඳහන් කරන්නේ ඒ අධිකරණවල පක්ෂග්‍රාහීකමක් නොවෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු දෙකක කාලයකින් විනිසුරුවන් විශ්‍රාම යන වයස දීර්ඝ කරනවා නම් ඒ රටවල් එලෙස දීර්ඝ කරන්නේ ඊළඟට එන නඩුකාරයන්ගේ. නැත්නම් ඒක තනිකරම ඒ නඩුකාරවරයාට දෙන පගාවක් බවට පත් වෙනවා.

අනෙක් කාරණය තමයි, මේ සංශෝධනය හිටිහැටියේම ගෙන ඒම. එක වතාවට ගෙනෙනවා, හිතා ගන්නවත් බැරි විධියට. සිම්බාබ්වේ රටේ විතරයි මේ කාර්යය සිදු වෙලා තිබෙන්නේ. ඒ රටේ ගහෙන් ගෙඩි එනවා වාගේ එක වතාවට ඒක ගෙනාවා. ඒ විනිසුරුවරයාගේ ධුර කාලය වෙනස් කළා. මහාධිකරණය ඒක නැවැත්වූවා. අනෙක් අධිකරණයේ විනිසුරුවරයා ඒ නඩු අහලා එතුමාම විශ්‍රාම යන වයස දීර්ඝ කර ගත්තා. එම නිසා ඒ රට විනාශ වුණා.

ඊළඟට, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, to what happened in Australia in 1977. Australia introduced a mandatory retirement age of 70 for Federal Court and High Court Judges, replacing their previous life tenure. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාකච්ඡා කරලා ඔක්කෝම එහෙම කරන්න සූදානම් කළා. How was it implemented? That required a constitutional Referendum. The proposal was written so as to apply only to judges appointed after the change took effect, and the judges already sitting at the time were allowed to have their life tenure and were not forced to retire at 70. What finally happened? The Referendum passed with 80 per cent approval because it was only prospective. ඒ රටේ අන්න මෙහෙමයි කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, what happened in Poland during the period from 2017 to 2019. The government lowered the retirement age of Supreme Court Judges from 70 to 65. දැන් අපේ රටේ කරන්න යන දේ අනෙක් පැත්ත ඔවුන් කළා.

එතකොට, how was it implemented? The law applied immediately to judges already sitting, forcing many into early retirement right away. ඒකත් වරදක්. ඉන්න judgesලාගේ කාලය අඩු කරලා අයින් කරන්න බැහැ, ඒගොල්ලන්ට. හැබැයි, මේ රටේ නම්, බලයේ ඉන්නවා නම් පුළුවන් කියලා කරනවා. මම දන්නේ නැහැ, බලයේ ඉන්නකොට ඔළුව මක්කුං වෙනවාද කියලා. බලයේ හිටපු රාජපක්ෂවරු වාගේමයි මේ අය. කිසිම වෙනසක් නැහැ. At the same time, their President was given personal power to selectively grant extensions to individual judges, letting the government pick which judges could stay. What finally happened? The EU's top court, the Court of Justice of the EU, ruled in 2019 that that violated judicial independence and the EU law, because it let the Executive reshape the court's makeup by forcing the judges who were not under its control to retire while keeping the favoured ones. So, Poland was forced to reverse the law and reinstate the judges who had been pushed out; ඒක reverse කළා.

ඊට පස්සේ මම සඳහන් කරනවා, what happened in Hungary in 2012. What finally happened was - සියලු කාරණා මම සඳහන් කරන්නේ නැහැ, මට වෙලාව අඩු හින්දා - the Court of Justice of the EU ruled that that was unjustified age discrimination. Hungary's own courts and later, the European Court of Human Rights also found violations.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේ විනාඩි 12ක කාලය මට ලැබෙනවා. Thank you.

That episode is widely cited as an example of using a "neutral-looking" age rule to purge specific judges. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිම්බාබ්වේ රටේ මේක සිදු වුණා. මේ සිදුවීම තුළින් සිම්බාබ්වේ රටම විනාශ වුණා. අධිකරණ පද්ධතිය විනාශ වුණා. අධිකරණ පද්ධතිය විනාශ වුණා කියන්නේ, රට විනාශ වුණා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවධානයට මේ කාරණයත් යොමු කරනවා. මම ඇමතිවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, මේ අවුරුද්දේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවල තත්ත්වය කොහොමද කියලා. සාමාන්‍යයෙන් මූලික අයිතිවාසිකම් නඩු 400ක් විතර ඉදිරිපත් වෙනවා. මේ අවුරුද්දේ මාස 6ට ඉදිරිපත් වෙලා තිබුණේ 25ක් වාගේ අඩු ප්‍රමාණයක්. ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම තමයි, අපට ගන්න පුළුවන් අවසාන පියවර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, සරත් එන්. සිල්වා මැතිතුමා පත් කරද්දී යම් යම් දේශපාලන,- *[බාධා කිරීමක්]* හැබැයි, ව්‍යවස්ථාව ඇතුළේ ඒ කටයුතු කළේ. මොහාන් පීරිස් මැතිතුමා පිළිබඳ කාරණයත් ව්‍යවස්ථාව ඇතුළේ සිදු කළේ. හැබැයි, ඒ දෙයින් මේ රටේ අධිකරණ පද්ධතිය විනාශ වුණා. ඒ විනාශ වීම තවදුරටත් බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හිතන්නකෝ, මෙගොල්ලන් කියන විධියට මේ අවුරුදු දෙක යනකොට තව අවුරුදු දෙකක් දීර්ඝ කරන්න ඕනෑ කියලා හිතෙනවා. තව අවුරුදු දෙකක් දීර්ඝ කරනවා. ඊළඟට එන ජනාධිපතිවරයා වයස අවුරුදු 65 අවුරුදු 60 කරන්න ඕනෑ කියලා කියන්න පුළුවන්. වයස අවුරුදු 65 වෙනකොට තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩ කරන විධිය - ස්නායු පද්ධතිය, අනෙකුත් සියලු දේවල් - සලකා බලා තමයි ඉන්දියාවේ, පාකිස්තානයේ, ලංකාවේ අවුරුදු 65 කියලා මේ වයස නම් කර තිබෙන්නේ. 1994දීත් පිරිමි අයගේ ආයු කාලය වයස අවුරුදු 74යි, 75යි. දැනුත් ආයු කාලය අවුරුදු 74යි, 75යි. එතකොට මැරෙන්න ළං වනකල් නඩු අහන්න කියන එකද මේ

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

කියන්නේ? මේක ඉතා බැරෑරුම් කාර්යභාරයක් නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නඩුවක් අහනවා කියන්නේ, තව කෙනෙකුගේ ජීවිතය සම්බන්ධයෙන්, තව කෙනෙකුගේ අනාගතය සම්බන්ධයෙන්, රටේ අනාගතය සම්බන්ධයෙන් තීන්දු කරන එකක්. වෙදා වෘත්තිය වාගේ නොවෙයි. වෙදා වෘත්තියෙත් වැඩිම දීර්ඝ කර තිබෙන්නේ වයස අවුරුදු 63 දක්වා පමණයි. එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමන්ට වුවමනාවට කරන්නේ. දැන් අපි අභියෝගයක් ඉදිරිපත් කළා, පුළුවන් නම් මේක ජනවාරි මාසයේ කරන්න කියලා. ජනවාරි මාසයේ කරන්නේ නැහැ. ඇයි? තමන්ට ඕනෑ පුද්ගලයෙකු හරියටම ඉලක්ක කරගෙන අනෙක් අයත් ඒකට හසු කරගෙන මේ හදන්නේ තමන්ට අවශ්‍ය- *[බාධා කිරීමක්]*

දැන් මෙතුමන්ලා කියනවා නේ, නඩු තිබෙනවා කියලා. *[බාධා කිරීමක්]* එතකොට නායක ස්වාමීන් වහන්සේලා මේකට විරුද්ධව කථා කරන්නේ භයටද? මහා නායක ස්වාමීන් වහන්සේලා මේකට විරුද්ධව කථා කරන්නේ භයටද? අස්ගිරි, මල්වතු මහා නායක ස්වාමීන් වහන්සේලා කථා කරන්නේ භයටද? එතකොට පිට රට ඉන්න LAWASIA එකේ එක්කෙනා කථා කරන්නේ භයටද? Commonwealth Lawyers Association එකේ එක්කෙනා කථා කරන්නේ භයටද? නීතිඥ සංගමය විරුද්ධව කථා කරන්නේ භයටද? ඔයගොල්ලන්ගේ lawyersලා - රියෙන්සි අර්සකුලරත්න - මේකට විරුද්ධව කථා කරන්නේ භයටද? එතකොට මේ කට්ටිය කථා කරන්න ඇති. ඒ භයටද? සාලිය පීරිස් මහත්මයා භයටද? උපුල් කුමරප්පෙරුම මහත්මයා භයටද? මහනුවර ඉන්න අපේ ලාල් විජේනායක මහත්මයා භයටද? මහා නායක ස්වාමීන් වහන්සේලාට ද මේ අවනම්බු කරන්නේ? අතැන ඉන්නවා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති. එතුමා කථා කරන්නෙත් භයටද? සාධාරණව එතැන දෙනවා, තීන්දු. *[බාධා කිරීමක්]* එතකොට අනෙක් විනිසුරුවරුන්ට අපි භය නැද්ද? මාර කථාවක් මේක. එක විනිසුරුවරයෙකු විතරක් තමන්ට ඕනෑ විධියට හසුරුවා ගෙන, අනෙක් විනිසුරුවරු ඔක්කොම හොරු කියලාද කියන්නේ? ඒ කියන විධියට ලංකාවේ ඉන්න අනෙක් විනිසුරුවරු ඔක්කොම මේගොල්ලන්ගේ යාළුවෝ නොවෙයි. *[බාධා කිරීමක්]* ඔබතුමා හරි, ඔබතුමා හරි.

දැන් බලන්න, කෝදාගොඩ මහත්මයාට නඩු කීයද අහන්න තිබෙන්නේ කියලා. Under the "Bench to hear them all", මේකේ තිබෙනවා, කෝදාගොඩ මහත්මයාට - ඊළඟට ඉන්න ජ්‍යෙෂ්ඨ නඩුකාරතුමාට - නඩු 129යි කියලා. සූරසේන මහත්මයාට නඩු 1,041යි. එතකොට අනෙක් විනිසුරුවරුන්ට තිබෙන නඩු ප්‍රමාණය ඉතාම අඩුයි. එතකොට, ඔක්කෝම නඩු වීසි කළාට පස්සේ කියනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ ඇපෑල් අධිකරණයේ නඩු නැහැ කියලා. ඇපෑලක් කරන්න බැහැ, මූලික අයිතිවාසිකම් නඩුවක් දාන්න බැහැ, වීසි කළාට පස්සේ කොහොමද ආයෙත් නඩු අහන්නේ? මේ තත්ත්වය ඇති කරලා ඔබතුමන්ලා දේශපාලනික වශයෙන් පොඩි වාසියක් ගනීවි. හැබැයි, මම ඔබතුමන්ලාට මේකත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම ඔබතුමන්ලා ජනාධිපතිතුමාට මේ දෙන ලණුව බලන්න. මේ නින්දා ඉදිරි අනාගතයේදී එතුමාගේ නාමයට කැළැලක් ඇති වෙනවා. මේකෙන් විනාශ වෙන්නේ මොකක්ද? අපට හිතන්න පුළුවන් මේ පත් කරන එකෙන්,-*[බාධා කිරීම්]* ඔබතුමන්ලා නිනා වෙනවා. ඔබතුමන්ලා නීතිය ගැන දන්නේත් නැහැ; සමහර උදවිය ප්‍රජාතන්ත්‍රවාදය ගැන දන්නේත් නැහැ කියලා. ඒ නින්දා නිනා වෙනවා. බලයේ ඉන්නකොට ඔය වාගේ තමයි. මට මතකයි, මේ වාගේ අපි රාජපක්ෂවරුන්ටත් කියන කොට ඒගොල්ලන් කිව්වේත් ඔහොම තමයි. අංකල් ඉන්නවා කිව්වා, බාප්පා එනවා කිව්වා. ඔක්කෝම එක්ක අවුරුදු විස්සක් ඉන්නවා කිව්වා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අවුරුදු 75ක් ඉන්නවාය කිව්වා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අවුරුදු 75ක් ඉන්නවා කිව්වා. දැන් මේ කට්ටිය කියනවා, අවුරුදු විස්සක් ඉන්නවා කියලා. ජනාධිපතිතුමා කියනවා, "මම හෙට යනවා" කියලා. එතුමාට එහෙම තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මම දන්නවා, අමාරුයි.

හඳුන්නෙත්ති මහත්මයා ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා කියනවා, ඕස්ට්‍රේලියාව වාගේ රටක් බවට පත් කරනවාලු, ලංකාව. දුඹුරු සීනිවලින් රුපියල් 3,000ක් පාඩු කරලා. ඒ වාගේ ෆැක්ටරි ඇරලා ද, කර්මාන්තශාලා ඇරලා ද එහෙම කරන්නේ? තව ඇමතිවරයෙක් කියනවා, කෙසෙල්බඩ දැම්මාම එහා පැත්තෙන් ඇඳුම් එනවා කියලා. මේ වාගේ දේවල් කරන්න ගිහිල්ලා රටේ ජනතාවගේ ප්‍රසාදයක් නැති වෙනකොට, කොහෙන් හරි තමන්ට පුළුවන් දේ කරලා, ප්‍රජාතන්ත්‍රවාදය හකුළලා, ඒ වාගේම මර්දනය හැම තැනම පතුරුවලා මේක කරගෙන යන්න හදනවා. ඔබතුමන්ලා ඕක 1988-89 කාලයේත් කළා. 1970 ගණන්වලත් ඔබතුමන්ලා ඒක කළා. ඒක කළේ අධිකරණය හරහා නොවෙයි. ඔබතුමන්ලා කැලෑ උසාවි හරහා ඒක කළා. ඒ කාර්යභාරය ඔබතුමන්ලාගේ ඇඟේ genesවල තිබෙනවා. ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත් වුණා. අපේ රටේ ජනතාව ඔබතුමන්ලාට ඒ වරම ලබා දුන්නා. ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැන මීට වැඩිය හිතන්න ඕනෑ කියලායි අපි ඔබතුමන්ලාට කියන්නේ.

මෙන්න මේ සම්බන්ධවත් මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන්ම ආණ්ඩු පාර්ශ්වයේ නීතිඥ මහත්වරුත් මේ සභාවේ ඉන්නවා. මම අගය කරන නීතිඥ මහත්වරු දෙතුන් දෙනෙකුත් මේ අතර ඉන්නවා. ඒ අය මමත් එක්ක මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේත්, අනෙකුත් කාරක සභාවලත් වැඩ කරනවා. මම මේ කාරණය ඒ අයගේ අවධානයට යොමු කරනවා. බලන්න, High Court එකේ ඉන්න senior judgesලා ඔක්කෝම කොළඹින් එළියට එළවා තිබෙනවා. මේක ඔබතුමන්ලා අනුමත කරනවාද? මගේ හිතවත් නීතිඥ මහත්මයෙකුත් මෙතැන ඉන්නවා. එතුමා සාධාරණ මහත්මයෙක්. ඔබතුමන්ලා දේශපාලනය අමතක කරන්නකෝ. මේ, ජ්‍යෙෂ්ඨ නඩුකාරවරු. මම ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා එතුමන්ලාගේ නම් සඳහන් කරන්නම්. සේතුංග මහත්මයා ඉන්නේ තුන්වන ස්ථානයට. අබේරත්න, ගුණසේකර, ඉර්සදීන්, කහඳගමගේ, තෙන්නකෝන්, සපුවිද, සූරවීර, අබේරත්න, මාපාබණ්ඩාර, අමරතුංග, ප්‍රනාන්දු, අබ්දුල්ලාහ්, පිලපිටිය, සූසෙයිතාස්, රත්නායක, සහබ්දීන්, කුමාර, සෝමරත්න, කාරියවසම්, විජේරත්න, ප්‍රනාන්දු, දිසානායක, තල්ගොඩපිටිය, කාලිංගවංශ, සෙනෙවිරත්න, නානායක්කාර, රාමකමලන්, ට්‍රොට්ස්කි, ලක්මාලි - ලක්මාලි කෙනෙකුත් ඉන්නවා - රාජකරුණා, රණසිංහ, වැලිවත්ත, පීරිස්, මංචනායක, වීරසූරිය, හේවාවසම්, ප්‍රභාකරන් - ප්‍රභාකරන් කෙනෙකුත් ඉන්නවා - පරණගමගේ, ටිකිරි කේ. ජයතිලක, ඇලෙක්ස්රාජා, අමරසිංහ, මහින්ද, එල්.ඩී.එච්. ද සිල්වා, විජේසේකර ඉන්නවා. තව අය ඉන්නවා. මම මේ ලේඛනය **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ ඉතාම දක්ෂ, ජ්‍යෙෂ්ඨ නඩුකාරවරු තල්ලු කරලා, තමන්ට ඕනෑ පිරිසක්, ඉතාම ආධුනික පිරිසක් තමන්ට ඕනෑ විධියට තමන්ගේ අධිකරණ ටිකට දා ගන්නවා. මේ කාර්යභාරය කරන්න තමයි ඔබතුමන්ලා කඩිමුඩියේ මේ දේවල් කරගෙන යන්නේ. අපට අවශ්‍ය කරන්නේ ස්වාධීන අධිකරණයක්. ඒ වාගේම, දිසා අධිකරණයේ ලේඛනයත් මම **සභාගත*** කරනවා.

පහළ අධිකරණවල විනිශ්චයකාරවරු මේ අයට විරුද්ධ නොවන අයට ඇප දෙන්නේ නැත්නම් මොකද කරන්නේ? මම දැක්කා Mount Lavinia Courtsවල ආණ්ඩුවේ ඇමතිවරු තුන්දෙනෙක් අත්අඩංගුවට ගන්න කියලා නියෝගයක් දීලා තිබුණා. ඒ නඩුකාරතුමා එවැනි නියෝගයක් දීලා තිබුණා. ඊට පස්සේ ඒ නඩුකාරතුමා මාරු කළා. ඊට පස්සේ,- *[බාධා කිරීමක්]* නම අහගන්න. නම කියපු ගමන් නැඟිටිනවා නේ. එතකොට මගේ කථාවට බාධා වෙනවා නේ. ඔබතුමන්ලා දන්නවා නේ. කිව්ව ගමන් "ටක්" ගාලා දන්නවා නේ. *[බාධා කිරීමක්]* මොළේ දනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්නම්. *[බාධා කිරීමක්]* නම් නොවෙයි, කියන්න ගොඩක් දේවල් තිබෙනවා. ඒවා කියන්න මට වෙලාව නැහැ. මෙතැන ඉස්සරහා ඉන්න ඉක්කෝම ඇප පිට, සැක පිට හිදීව් වෙනත් ආණ්ඩුවක් එනකොට. 159 දෙනාගෙන් සියයකට වැඩි පිරිසක් එහෙමයි. ඒක අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. දැන් මේගොල්ලන් අධිකරණ ටික ෂේප් කරගෙන - ඒවාට විරුද්ධව නඩු වැටෙන්නේ නැහැ. ඒවාට විරුද්ධව අදාළ ආයතන නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ - රාජපක්ෂවරු කරපු වැඩේම කරනවා. ඔය දේවල් කරලා තමයි රාජපක්ෂවරුත් විදෙව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණය ගැනත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ තමයි, ප්‍රීති පද්මන් සූරසේන මහත්මයා, අචල වෙන්ගප්පුලි මහත්මයා සහ මහින්ද සමයවර්ධන මහත්මයා යන විනිසුරුවරුන් දුන් නඩු තීන්දුවක් පිළිබඳව. එතුමන්ලාගේ නඩු තීන්දුවේ මොකක්ද සඳහන් කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (4)සී යටතේ තමයි, අනිවාර්යයෙන්ම ජනමත විචාරණයකට යන්න ඕනෑය කියලා කියන්නේ. ඒ කියන්නේ, එහි යම් දෙයක් සංශෝධනය කරනවා නම්, වෙනස් කරනවා නම්. SC/FR/35/2024 කියන නඩු තීන්දුවේ සඳහන් වෙනවා, විශේෂයෙන්ම විනිසුරුවරුන්ගේ වැටුප් සහ ධුර කාලය වෙනස් කරනවා නම් අනිවාර්යයෙන්ම (4)සී එක්ක කියැවෙන්න ඕනෑ කියලා. එහෙම නම් ඒ සඳහා අනිවාර්යයෙන්ම ජනමත විචාරණයකට ඉදිරිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, FR case number SC/FR/282/2018 සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ ඉන්නවා, මහින්ද සමයවර්ධන මැතිතුමා, ශිරාන් ගුණරත්න මැතිතුමා සහ තුරෙයිරාජා මැතිතුමා. Paragraph 104 of the Judgment states, I quote:

> "In ***Re Inland Revenue (Amendment) Bill***, this Court further opined that '[*a*]*ny Constitutional amendment to the retirement age or the period of office impacting on incumbent judges, whether directly or indirectly,* ***will impinge on the independence of the judiciary and [be] violative of Article 3 which requires a Referendum.***' "

ඒ වාගේම, paragraph 106 states, I quote:

> "This submission of the Petitioner is also supported by the Irish Constitutional experience. In 2011, when Ireland attempted to reduce the salaries of Irish judges, the question had to be placed before the people at a referendum. The decision to reduce the salaries was then carried out, after being approved by a referendum on 27th October, 2011."

ඊට පස්සේ, under "Findings", paragraph 187 states, I quote:

> "If I were to frame my findings in the simplest of terms, Article 108(2) of the Constitution prohibits the reduction of salaries and pension entitlements of the Judges of Superior Courts, by overt or covert methods. While such salaries and pension entitlements may be increased as and when appropriate, any reduction or amendment to such entitlements that could potentially cause benefits to be deflated at a future time, can only be done by law approved by a two-thirds majority in Parliament as well by the People at a referendum, as the reduction of salary and pension benefits will violate Article 108 read with Articles 3..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ට මේ කාරණය කියනවා. ඔවුන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තමයි මේ පෙත්සම ඉදිරිපත් වෙන්නේ. මම දන්නවා, ඊළඟට retire වෙන්න ආසන්නයේ ඉන්නේ සූරසේන මහත්මයා, සමයවර්ධන මහත්මයා සහ නවාස් මහත්මයායි කියලා. ඔවුන් තුන් දෙනාටම මේ නඩුව - තමන්ගේ නඩුවක් තමන්ටම - අහන්න බැහැ. එතකොට තවත් විනිසුරුවන් 10දෙනෙක් ඉන්නවා. අපි ඉල්ලා සිටිනවා, ඒ 10දෙනාටම මේ නඩුව අහන්න අවස්ථාව ලබා දෙන්න කියලා. Full Bench නොවෙයි, complete Bench. "අපේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම අපට තීන්දු කරන්න බැහැ. මේක Referendum එකක් හරහා ජනතාවට අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න ඕනෑ" කියන තීන්දුව ඒ විනිසුරුවන්ගෙන් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, අපි එය ඔවුන්ට භාර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නේ පාර්ලිමේන්තුව අධිකරණය හරහායි. අප ඒක කඩාකප්පල් කළොත් මොකද වෙන්නේ? දේශපාලනමය වශයෙන් අපට හිතෙන්න පුළුවන්, අපට ඕනෑ ඕනෑ කෙනා හිරේ දමන්න මෙන්න මේ වෙනස්කම් ටික කරන්න අවශ්‍යයි, අපට මෙන්න මේ දේ ස්ථාපිත කර ගන්න ඕනෑ, අපට ඕනෑ විධියට දේශපාලනය කර ගන්න පුළුවන් කියලා. ඒ කාර්යභාරය ඉතාම සීමිත කාලයකට - පොඩි කාලයකට - විතරයි කරන්න පුළුවන් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කැට තියලා කියනවා, මේගොල්ලෝ නීති විරෝධී ලෙස, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස මේ විනිසුරුවරයන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කළොත් අනිවාර්යයෙන්ම මේගොල්ලන්ට දෛවයෙන් පාඩම් හම්බ වෙනවා කියලා. ඔබතුමා එය ලියලා තියා ගන්න. ඒකෙන් පස්සේ අවුරුද්දක් දෙකක් තුනක් යනකොට ජනාධිපතිවරයා විනාශ වෙයි. හැබැයි, ඒකෙන් ජනාධිපතිතුමා පමණක් නොවෙයි, ඔබතුමන්ලා පමණකුත් නොවෙයි විනාශ වෙන්නේ. විනාශ වෙන්නේ මේ රටයි; අධිකරණ පද්ධතියයි. මුළු රටම අගාධයකට යනවා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා මෙය කරන්න එපා කියලා.

රාජපක්ෂවරුත් මේ වගේමයි හැසිරුණේ. එතකොටත් අපි මේ දේවල් කිව්වා. රාජපක්ෂවරුන් මේ වාගේ හැසිරෙන කොට අවුරුද්දක් යන්න කලින් ජනතාව ඒ අයව ගහලා පැන්නුවා. මාලිමාවේ හොඳ මන්ත්‍රීවරු ඉන්නවා. මම දන්නවා, මේකට අකමැත්තෙන් ඉන්න කට්ටියත් ඉන්න බව. ඒ වාගේම, ඉඳලා හිටලා කඩේ යන කට්ටියත් ඉන්නවා, පොඩි තනතුරක් අරගෙන. එහෙම කට්ටිය ගැන නොවෙයි මම කියන්නේ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා පරණ ජේවීපී මහත්මයෙක්.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

මම හිතනවා, එතුමන්ලා මේ ගැන සාධාරණ ලෙස හිතයි කියලා. ඒ වාගේම තවත් නීතිඥ මහත්මයෙක් ඉන්නවා. එතුමා මාත් එක්ක පාර්ලිමේන්තුවේ කාරක සභාවල එකට කටයුතු කරන මන්ත්‍රීවරයෙක්. කියන කොටම අර එන්නේ. එතුමන්ලා අඩුම ගණනේ තමන්ගේ දේශපාලන පැවැත්ම ගැන පමණක් හිතන්නේ නැතිව, රට ගැන හිතලා මේ සම්බන්ධයෙන් තමන්ගේ විරෝධතාව ප්‍රකාශ කරලා මෙය ඉවත් කර ගනියි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.14]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

කථාව පටන් ගන්න කොටම කාරණයක් කියන්න ඕනෑ. අද උදේ වරුවේ විපක්ෂ නායකතුමා වෙතින් වැරැදි ප්‍රකාශයක් කෙරුණා, නීතිඥ සංගමය විසින් එතුමාට එවා තිබෙන ලිපිය ගැන. ඒ ලිපිය මාධ්‍යවල පළ කරලා තිබුණා. එතුමා කිව්වා, පාර්ලිමේන්තුවට එන එක ගැන වෙලාව සම්බන්ධයෙන් විතරයි නීතිඥ සංගමයට ප්‍රශ්නයක් තිබුණේ කියලා. මම හිතනවා, මේක නීතිඥ සංගමය විසින්ම සමාජයට පැහැදිලි කරලා, clear කරලා දෙන්න ඕනෑ දෙයක් කියලා. මේ ලිපිය බැලුවාම අපට පෙනෙන දෙයක් තිබෙනවා. මේ ලිපියට අනුව නීතිඥ සංගමය විශේෂයෙන්ම කියා තිබෙනවා, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය යන දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙන්නේ නැත්නම් මෙවැනි සාකච්ඡාවකට සම්බන්ධ වෙන්න එතුමන්ලා කැමැති නැහැ කියලා. ඒ නිසා අපි අවධාරණය කරන්න කැමැතියි, නීතිඥ සංගමයටත් අපි බොහොම ගරුත්වයෙන් මතක් කර දෙන්න කැමැතියි, නීතිඥ සංගමය සමඟ කිසිදු සම්මන්ත්‍රණයක් හෝ සාකච්ඡාවක් කිරීමට මේ පාර්ලිමේන්තුව තුළ මේ වන විට ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ කිසිදු එකඟතාවක් නැති බව. ඒ නිසා මේ 2026.08.04 දිනැති ලිපියේ දක්වා ඇති ස්ථාවරයේම එතුමන්ලා අදත් ඉන්නවා ඇති කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි මේ කාරණයත් මතක් කර දෙන්නට ඕනෑ. මා හිතන විධියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපත් මේක තේරුම් ගන්න ඕනෑ. ඕනෑම කෙනෙකුට මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට යෝජනා ඉදිරිපත් කිරීමට පුළුවන්. මොකද, අපි ඡන්දය දීලා නීති සම්මත කරන නිසා සහ ව්‍යවස්ථා සංශෝධනයක් වැනි දෙයක් කියන්නේ ඉතාම බරපතළ නීති සංශෝධනයක් වන නිසා, ඕනෑම කෙනෙකුට ඒ සම්බන්ධයෙන් තමන්ගේ අදහස්, යෝජනා මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට ලබා දෙන්න පුළුවන්. නමුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් එක් තැනකට කැඳවලා පාර්ලිමේන්තුව තුළදී සම්මන්ත්‍රණයක් කරලා, ඒකට තමන්ගේ අදහස් පළ කිරීම වැනි සුවිශේෂී වරප්‍රසාද කිසිදු සංගමයකට ලබා දීම සුදුසු නැහැ කියන එක තමයි අපේ මතය වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ලංකාවේ ජනතාව ගොඩක් ඉන්නවා. ඒ හැමෝටම ප්‍රශ්න තිබෙනවා; ඒ හැමෝටම කියන්න දේවල් තිබෙනවා සහ ඔවුන් ඒක කියන විධියකුත් තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කර සිටිනවා එවැනි ආකාරයකට නීතිඥ සංගමයේ මතය ප්‍රකාශ කරනවා නම් හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස කිහිපය තුළම නීතිඥ සංගමයේ සභාපතිතුමා ඇතුළු අනෙකුත් නීතිඥවරුන් විශේෂයෙන් මාධ්‍ය තුළ මේ සම්බන්ධයෙන් අදහස් පළ කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස වරින් වර ප්‍රකාශ කර තිබෙනවා; මාධ්‍ය නිවේදන නිකුත් කර තිබෙනවා. ඒ නිසා අපි ඒ ගැන දැනුවත්. නමුත්, රජයේ මන්ත්‍රීවරුන් හැටියට අපට මේ ව්‍යවස්ථා සංශෝධනය ගැන නිශ්චිත අදහසක් තිබෙනවා. අපට නිශ්චිත ස්ථාවරයක් තිබෙනවා, මේ ව්‍යවස්ථා සංශෝධනය ගැන. ඒ ස්ථාවරය වෙනස් කිරීමට හැකි කිසිදු තර්කයක් මේ වනතෙක් නීතිඥ සංගමය විසින් පළ කර තිබෙන කිසිම අදහසක නැහැ කියන එකත් අපි පෙන්වා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් නීතිඥ සංගමය සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පළ කරන අදහස් ගත්තාම, නිශ්චිත වශයෙන්ම මොකක්ද මේ අධිකරණයට සිදු වෙලා තිබෙන හානිය, අධිකරණයේ ස්වාධීනත්වයට මොන ආකාරයකින්ද මේ සංශෝධනය හරහා බාධා වෙන්නේ කියන එක මේ මහත්වරු පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ කියා අපි හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නැත්නම් ඇත්තටම අපට මේ ගැන පැහැදිලි කිරීම් කරන්න, පිළිතුරු දෙන්න දෙයක්වත් නැති වෙලා යනවා.

මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා ඉතා දීර්ඝ වෙලාවක් අරගෙන කථා කළා, අධිකරණයේ විනිසුරුවරුන්ගේ වයස අඩු කිරීම සම්බන්ධයෙන් සහ අධිකරණයේ විනිසුරුවරුන්ගේ වැටුප් අඩු කිරීම සම්බන්ධයෙන් ලබා දී තිබෙන ජාත්‍යන්තර තීන්දු, ඒ වාගේම රට තුළත් ලබා දී තිබෙන තීන්දු සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිත් එකඟ වෙනවා, විශේෂයෙන් sitting judgesලාගේ; දැනට සේවයේ නිරත අධිකරණ විනිසුරුවරුන්ගේ වැටුප් අඩු කිරීමක් සිද්ධ වෙනවා නම්. මා හිතන්නේ මේ සමහර judgmentsවල දීලා තිබෙන්නේ එහෙම වැටුප් අඩු කිරීමක් සිද්ධ වුණත්, බදු ගැසීම හරහා ඒක ගැටලුවකුත් නැහැ කියන එක. කෙසේ වෙතත්, අපිත් හිතනවා වැටුප් අඩු කිරීමක් සිදු කිරීම සහ වයස් මට්ටම අඩු කිරීම හරහා, එහෙම නැත්නම් එතුමාත් කිව්වා වාගේ බලහත්කාරී ලෙස විශ්‍රාම යැවීමට සැලැස්වීම - forced retirement එකක් - හරහා අධිකරණයේ ස්වාධීනත්වයට බාධාවක් විය හැකියි කියලා. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය කියන මූලධර්මයේ තිබෙන ප්‍රධානම කොටස් දෙක තමයි ධුර කාලයේ ආරක්ෂාව සහ වැටුප්වල ආරක්ෂාව කියන එක. අපි කැමැතියි, පාර්ලිමේන්තුව තුළ හෝ පිටත සිටින මේ කුමන හෝ මහත්මයෙක් හෝ මහත්මියක් කියනවා නම්, කොහොමද අධිකරණයේ ස්වාධීනත්වය කියන මූලධර්මයට මෙයින් බලපෑමක් වෙන්නේ කියලා. මේ ව්‍යවස්ථා සංශෝධනය තුළ දැනට සිටින sitting judgesලාගේ කිසිදු අයිතිවාසිකමක් ඉවත් කරන්නේ නැහැ. ඔවුන්ගේ වැටුප් අඩු කරන්නේ නැහැ. ඔවුන්ගේ ධුර කාලය අඩු කරන්නේත් නැහැ. එතකොට අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධව තිබෙන සම්මත අදහස් පද්ධතියට අනුව,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, -

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

I am not willing to give my time, Sir.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

But, you mentioned my name.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

No, I did not mention anybody's name. I do not want to give my time, Sir. Please, let me continue my speech. - *[Interruption.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

No, she did not mention a name.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]* He is disrupting my speech, Sir. නම් කිව්වේ නැහැ මම. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

නම කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

නම කිව්වේ නැහැ.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධ සම්මත අදහසට අනුව සඳහන් වන්නේ කුමක්ද? ජාත්‍යන්තර නීතිය තුළත් - 1984දී සම්මත කරන ලද අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මූලධර්මවල පවා - සඳහන් වෙන්නේ මොකක්ද? ධුර කාලය ආරක්ෂාවට අදාළව reference එකක් තිබෙනවා. ඒ වාගේම ආදායම් ආරක්ෂාව කියන එක තිබෙනවා. මොකද, ආණ්ඩුවකට, විධායකයකට, පාර්ලිමේන්තුවකට අධිකරණයට බලපෑම් කළ හැකි විධිය ඒක තමයි. දැනට වැඩ කරන විනිසුරුවරයන්ට බලපෑමක් කළ හැකි විධිය තමයි ඔවුන්ගේ ධුර කාලය අඩු කිරීම, එහෙම නැත්නම් වැටුප් අනාරක්ෂිත කිරීම. ඒක තමයි ශිරානි බණ්ඩාරනායක මහත්මියට වුණේ. ශිරානි බණ්ඩාරනායක මහත්මියගේ සේවය නිසි කාලයට පෙර අවසන් කිරීම නිසි පටිපාටියට සිද්ධ වුණේ නැහැ. ව්‍යවස්ථාවට අනුව impeachment එකක් ගෙනැල්ලා අග්‍ර විනිශ්චයකාරවරයා ඉවත් කිරීමේ හැකියාව තිබෙනවා. නමුත්, එහෙම කරද්දී නිසි පටිපාටියට අනුව සිද්ධ කරන්න අවශ්‍යයි. එතුමියගේ සේවය අවසන් කිරීම නිසි පටිපාටියට සිද්ධ වුණේ නැහැ කියන කාරණය තමයි අධිකරණයේ ස්වාධීනත්වය ගැන ඒ වෙලාවේ මතු වෙච්ච ගැටලුව. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තුළ නිසියාකාරයෙන් මේ විවාදය සිද්ධ කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන කරුණු කථා කරන එක ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත්, නිකම් ඔහේ කරුණු කියන්නේ නැතුව ඔබතුමන්ලා නිශ්චිතව පෙන්වන්න, මොකක්ද මෙතැන අධිකරණයේ ස්වාධීනත්වයට සිදු වන බාධාව කියලා.

දැනට ධුරයේ සිටින අග්‍ර විනිශ්චයකාරතුමා ගැන විපක්ෂය නිතර නිතර කථා කරන නිසා අපි ඒ කාරණයත් පැහැදිලි කරගෙන යන්න ඕනෑ. එතුමා වත්මන් පාලන අධිකාරියෙන් - අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් - ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකාරණයට හෝ මහාධිකරණයට පත්වීම් ලැබූ විනිසුරුවරයෙක් නොවෙයි. එතුමාගේ පත්වීම් ලැබිලා තිබෙන්නේ හිටපු එක් එක් ජනාධිපතිවරුන් යටතේ. එතුමා අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වන්නේ ජ්‍යෙෂ්ඨත්වය මත පමණයි. අපි අධිකරණයට මැදිහත් වීම් කරන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයේ - Supreme Court එකේ - අග්‍ර විනිශ්චයකාරතුමා - Chief Justice - හැටියට ජනාධිපතිවරයාට කිට්ටු පුද්ගලයෝ පත් කළ අවස්ථා ඉතිහාසයේ නැතුවා නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඒක කළා. මීට පෙර මන්ත්‍රීවරයෙකුත් කිව්වේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියගේ කාලයේදීත් ශ්‍රේෂ්ඨාධිකරණයට තමන් කැමැති විනිසුරුවන් පත් කර ගත්තා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඒක කළා වෙන්න පුළුවන්. බොහොම පැහැදිලිව, ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කරලා තමන්ට කැමැති අග්‍ර විනිශ්චයකාරවරයෙක් පත් කර ගත්තා. ඒක පාර්ලිමේන්තුව තුළින් ප්‍රතික්ෂේපත් කළා. ඉතින් එහෙම පත් කරපු අවස්ථා නැතුව නොවෙයි. දැනට පවතින නීතිය තුළත් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට කැමැති අග්‍ර විනිශ්චයකාරවරයෙක් පිටතින් පත් කර ගැනීමේ හැකියාවක් නැතුවත් නොවෙයි. අපි මේක තේරුම් ගන්න ඕනෑ. මේ කියන ආකාරයට අග්‍ර විනිශ්චයකාරවරයෙක් ගැන ප්‍රශ්නයක් නම් තිබෙන්නේ, අග්‍ර විනිශ්චයකාරතුමෙක් පිටතින් පත් කිරීමේ හැකියාවක් දැනටත් තිබෙනවා. එහෙම කරලාත් තිබෙනවා. ඒකට precedent එකක් ලංකාවේ තිබෙනවා. නමුත් අපි එහෙම කරන්නේ නැහැ. අපි එහෙම කරලත් නැහැ, අපි එහෙම කරන්නෙත් නැහැ.

අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු Supreme Court එකේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු දෙකකින් දික් කිරීමක් ලැබුණාට පස්සේ, ඉතුරු අවුරුදු දෙකට ශ්‍රේෂ්ඨාධිකරණයට කිසිම විනිසුරුවරයෙක් පත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා අපම lock කරගෙන තමයි අපි මේ extension එක කරන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයට විතරක් නොවෙයි, අභියාචනාධිකරණයට, මහාධිකරණයට, දිස්ත්‍රික් උසාවිවලට සහ මහෙස්ත්‍රාත් අධිකරණයට එය අදාළයි. මොකද අපි හිතනවා, සමස්ත අධිකරණ පද්ධතියේ වෙනස්කමක් සිදු වෙන්න ඕනෑ කියලා. ඒ වාගේම තමයි අග්‍ර විනිශ්චයකාරතුමාගේ පත් කිරීම සිදු වුණේ Constitutional Council එකේ සිටින හැමෝම එකඟ වෙලා, unanimously. එහි විපක්ෂ නායකතුමා ඉන්නවා, විපක්ෂයේ නියෝජිතයන් ඉන්නවා, විපක්ෂයේ අනෙකුත් පක්ෂ නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්නවා. ඒ කිසිම කෙනෙකුගේ විරෝධයක් නැතුව තමයි එතුමා පත් වුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න. මේ කාරණය කියලා කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, ඒ පත් කිරීම සිදු වන අවස්ථාවේ කිසිදු විරෝධයක් ආවේ නැහැ. ඒ පත් කිරීම සිදු වන අවස්ථාවේ නැති විරෝධයක් දැන් ඇයි? එතකොට පත් කිරීම සාධාරණයි; එතකොට impartial. එතකොට පක්ෂග්‍රාහී නොවුණු විනිසුරුවරයෙක් කොහොමද එකපාරටම අසාධාරණ සහ පක්ෂග්‍රාහී විනිසුරුවරයෙක් හැටියට සමාජයට කරුණු ඉදිරිපත් කරන්නේ? ඉතාම නරක ආකාරයට තමයි මේ අග්‍ර විනිශ්චයකාරතුමාට මේ පාර්ලිමේන්තුවේ සමහර අය සහ සමහර නීතිඥවරු සලකන්නේ. ඒකට නිශ්චිත කාරණය කියන්න. එතුමා රජයට පක්ෂව මොනවා හෝ තීන්දු ලබා දීලා තිබෙනවාද?

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

මොකක්ද ඒ නිශ්චිත චෝදනාව? එහෙම චෝදනාවක් කරන්නේ නැතිව, ඕපාදූප, කේළාම් කියනවා වාගේ මේ වාගේ කථා කරන එක ඔබින්නේ නැහැ නීතිඥවරුන්ටත්, ඔබින්නේ නැහැ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්. විශේෂයෙන් අග්‍ර විනිශ්චයකාරතුමා සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයට නැවත කියන්නේ, අධිකරණයේ ස්වාධීනත්වයට තිබෙන බාධාව ගැන ඔබතුමන්ලා නිශ්චිත තර්කය ඉදිරිපත් කරන්න කියලයි. ආදායම් සහ එතුමන්ලාගේ ධුර කාලයට කොහොමද හානියක් වෙන්නේ, අධිකරණයේ කාර්යභාරය පාර්ලිමේන්තුව කරන්න හදනවා ද, අධිකරණයේ කාර්යභාරය විධායකය කරන්න හදනවා ද, මොකක්ද මේ ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ප්‍රශ්නය කියලා නිශ්චිතව කරුණු ඉදිරිපත් කරන්න. එතකොට අපටත් පුළුවන් නිශ්චිත උත්තර දෙන්න. ඒ සංවාදය මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ තියා ගනිමු. නීතිඥ සංගමයට අවශ්‍ය නම් ඒ ගැන දැනුවත් කිරීමේ ක්‍රම ඕනෑ තරම් තිබෙනවා. එහෙම කරන්න. එහෙම නැතුව ඒ ගැන සම්මන්ත්‍රණ තියන්න අපේ එකඟතාවක් නැහැ කියන එක අපි සඳහන් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.25]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதிச் சட்டத்தின் கீழான தீர்மானம் தொடர்பான இன்றைய விவாதத்தில் பேசுவதற்கு நேரம் ஒதுக்கித் தந்தமைக்கு நன்றி கூறுகின்றேன்.

கடந்த காலங்களில் ஆட்சிக்கு வந்த ஒவ்வோர் அரசாங்கமும் தமக்கு ஏற்றாற்போல் செயற்றிட்டங்களை பல பகுதிகளில் செய்தன. அந்த வகையில், எமது பகுதிகளிலும் பாரிய வேலைத்திட்டங்கள் நடைபெற்றன என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன். அதில் பிழைகள், மோசடிகள் நடந்திருக்கும். அவற்றில் மாற்றங்களைக் கொண்டு வருவதற்காகத்தான் இந்த அரசை மக்கள் பெரும்பான்மைப் பலத்துடன் ஆட்சியில் அமர்த்தியிருக்கிறார்கள். இதை நான் தொடர்ச்சியாகக் கூறி வருகின்றேன்.

இன்று எங்களுடைய மாவட்டத்தில் பாரியதொரு பிரச்சினை ஏற்பட்டு இருக்கின்றது. அண்மையில் இந்து மக்களின் வரலாற்றுச் சிறப்புமிக்க புனித தலமான திருக்கேதீஸ்வர ஆலயத்துக்குச் சென்று, யாருக்கும் தெரியாமல் - கள்ளத்தனமாக என்றுதான் சொல்ல வேண்டும் - தொல்பொருளியல் திணைக்களத்தினர் எல்லைக் கற்களை இட்டு அடையாளப்படுத்தி, அப்பகுதிக்குள் எந்தவித அபிவிருத்தியும் செய்ய இயலாது என்று கூறினால், அங்குள்ள மக்கள் என்ன செய்வது? தொல்பொருளியல் திணைக்களம் நுழைந்தால் எதுவும் செய்ய இயலாது. அந்தப் பகுதிக்குள் போனால் பாரிய சட்டப் பிரச்சினைகளை ஏற்படுத்துகிறார்கள். நீதிமன்றம் வரை செல்லவேண்டிய நிலையும் ஏற்படுகின்றது. தொல்பொருள் என்பது இலங்கையில் இருக்கின்ற ஒரு சமூகத்துக்கு மட்டும் உரியதல்ல. மற்றைய சமூகங்களுடனும் கலந்தாலோசித்து இது பற்றி முடிவெடுக்கலாம். அங்கு செயற்கையாக ஓர் அமைப்பு உருவாக்கப்பட்டு இருப்பதாக அங்குள்ள மக்கள் சந்தேகப்படுகிறார்கள். எனவே, இந்த விடயத்தைக் கவனத்திலெடுத்து, உரிய முடிவுகளை எடுப்பதற்கு முன்வர வேண்டும்.

இம்மாதம் 15ஆம் திகதி வரை மடு மரியாள் ஆலயத்தில் நடைபெற்ற விசேட ஆராதனைக்கு இலட்சக்கணக்கான மக்கள் வருகைதந்து இருந்தார்கள். அதனைச் சுற்றிவர உள்ள காணிகள் Forest Conservation Departmentக்குரிய காணிகளென அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றது. வெளியிலிருந்து வருகின்ற மக்களுக்கு இது சம்பந்தமாக எதுவும் தெரியாது. அவர்கள் அந்தப் பகுதிக்குள் போகும்போது சட்ட நடவடிக்கை எடுக்கின்ற அளவுக்கு Forest Conservation Departmentஇன் செயற்பாடுகள் இருக்கின்றன. எனவே, மக்கள் சிரமப்படாத வகையில் எதிர்காலத்தில் உங்களுடைய நடவடிக்கைகள் இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று தேசிய மட்டத்தில் பேசுபொருளாக இருப்பது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் புதிதாக நியமிக்கப்பட்ட 9 முஸ்லிம் பெண் சுகாதாரப் பணியாளர்கள் இலங்கையின் அரசியலமைப்பால் பாதுகாக்கப்பட்ட தங்களுடைய மத, கலாசார ஆடையை அணிந்துகொண்டு பணிக்குச் செல்வதில் ஏற்பட்டுள்ள பிரச்சினையாகும். தற்பொழுது, அவர்கள் கல்முனை அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு தற்காலிகமாக மாற்றப்பட்டு இருக்கிறார்கள். இது இவ்வாறு இருக்கையில், பொல்கஹவல பகுதியிலுள்ள வைத்தியசாலை ஒன்றில், 'ஹிஜாப்'ஐ கழற்றினால்தான் சிகிச்சை அளிக்கப்படுமென வைத்தியர் ஒருவர் கூறியிருக்கிறார். இது நமது நாட்டை எங்கே கொண்டுசெல்லப் பேகின்றதெனத் தெரியவில்லை.

ஒரு சமூகத்தின் கலாசார உடையை அணிவதில் என்ன தவறு இருக்கின்றது? இந்த ஆடையால் மருத்துவ ஒழுக்கத்துக்குப் பாதிப்பு ஏற்படுகின்றதா? என்று முதலில் பார்க்க வேண்டும். இவ்வளவு காலமும் முஸ்லிம் பெண்கள் சமூகமயமாகுவதில் இருந்த பிரச்சினை இந்த ஆடைப் பிரச்சினைதான். திணைக்களங்களிலுள்ள அதிகாரிகள் 'ஹிஜாப்'ஐ அணிய அனுமதித்ததால், இன்று பல துறைகளிலும் முஸ்லிம் பெண்கள் கடமை புரியக்கூடியதாக இருக்கின்றது. குறுகிய நோக்கத்தின் அடிப்படையில், இந்த ஆடைக்குத் தடைகளை விதிப்பதால் மறுபடியும் அவர்கள் தொழிலுக்கு வரும் வீதம் குறைவடையும்.

முஸ்லிம் பெண்கள் அணியும் 'ஹிஜாப்' ஆடையின் விளக்கம்: இப்போது எல்லோரும் Facebookஇல் பார்க்கிறார்கள். நீளக் காற்சட்டை மற்றும் நீளக் கையுடைய சட்டையை அணிந்து, தலையை cover பண்ணி, முகம் தெரியக்கூடியதாக அணியும் ஆடைதான் 'ஹிஜாப்'. இது சாதாரணமாக எல்லோருக்கும் தெரியும். உதாரணத்துக்கு, முஸ்லிம் பாடசாலைக்குச் செல்கின்ற உயர்தர மாணவிகள் அணிகின்ற ஆடை; அவர்கள் முகத்தை மூடுவதில்லை. பிழையான வரைவிலக்கணத்தை எடுத்துக்கொண்டு, சிலர் 'அபாயா' என்று இங்கு பிழையாகச் சொல்கின்றார்கள். அதாவது, முகத்தை மூடியதாகச் சொல்கின்றார்கள். அங்கு ஏற்பட்டது முகத்தை மூடுகின்ற பிரச்சினை அல்ல.

இவ்வாறு ஆடை அணிவதில் என்ன பிரச்சினை இருக்கிறது? ஏன் இதைப் பெரிதுபடுத்துகின்றீர்கள்? இந்த நாட்டில் பல அனர்த்தங்கள் நடந்திருக்கின்றன. யுத்த காலப்பகுதிகளில் எவ்வளவு ஒற்றுமையாக வாழ்ந்தார்கள். ஒருசிலர் எல்லா சமூகங்களிலும் இருக்கிறார்கள். அவ்வாறான வர்கள் எடுக்கின்ற தவறான முடிவுகள் பிரச்சினைகளை உருவாக்குகின்றன. இதில் சமூக வலைத்தளங்கள் முக்கிய மானவை. சிறியதொரு விஷயத்தையும் பெரிதுபடுத்து கிறார்கள். ஆனால், இது சிறியதொரு விஷயம் அல்ல. இந்த விடயத்தை மிகவும் பக்குவமாகக் கையாண்டு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். இந்த விடயத்தை அரசியல்வாதிகள் பேசினால், அரசியல் சார்ந்த விடயம் என்று சொல்வார்கள். கௌரவ மனோ கணேசன் அவர்கள் இந்த விடயம் சம்பந்தமாக மிக அழகாகப் பேசினார். இதை அவர் அரசியலுக்காகப் பேசியதாகக் கூறுவார்கள். அவர் மாத்திரமல்ல, doctors மற்றும் வைத்தியசாலைகளின் பணிப்பாளர்கள் இது பற்றி தங்களது Facebookஇல் எவ்வளவு அழகாகப் பதிவிட்டு இருக்கிறார்கள். சொல்லப்போனால், இது ஒரு பிரச்சினையே அல்ல.

நான் என்ன சொல்ல வருகின்றேன் என்றால், மாறி மாறி ஆட்சிக்கு வருபவர்கள் தங்களுக்குத் தேவையான முறையில் காலத்துக்குக்காலம் சுற்றுநிருபங்களை மாற்றுவதை விடுத்து, அரசியல் யாப்பின்மூலம் உறுதிப்படுத்தப்பட்டு இருக்கின்ற இந்த ஆடையுடன் தொடர்புடைய விடயத்தைச் சட்ட பூர்வமாக்க வேண்டும் என்பதைத்தான். சுகாதாரத்துறையில் இந்தப் பிரச்சினை வருவதால், இந்த விடயத்தை அமைச்சரவைக்குச் சமர்ப்பித்து, அதன் அனுமதியோடு சட்டமாக்குங்கள்! முஸ்லிம் பெண்கள் அணிகின்ற இந்த உடையில் என்ன பிரச்சினை இருக்கிறது? இது சம்பந்தமாக நீங்கள் அமைச்சரவையில் கலந்தாலோசித்து, இந்த உடையில் பிரச்சினை இல்லையென அங்கீகரித்தால் பாதுகாப்புத்துறை உட்பட சகல துறைகளிலும் முஸ்லிம் பெண்கள் பணிபுரிவதற்கு முன்வருவார்கள். முஸ்லிம் பெண்களை அடக்கி வைத்துக்கொண்டு இருக்கிறார்கள், அவர்களை ஒன்றும் செய்ய விடுகிறார்கள் இல்லை என்பது பொய்! ஏனைய நாடுகளில் குறிப்பாக, முஸ்லிம் நாடுகளில் இதற்கு அனுமதி வழங்கப்பட்டு இருக்கிறது. அந்த நாடுகளிலுள்ள யுவதிகள் கலாசார உடையோடு football விளையாடுகிறார்கள். அவ்வாறு விளையாடுவதற்கு எமது நாட்டிலும் அனுமதித்தீர்கள் என்றால், இங்குள்ள முஸ்லிம் யுவதிகளும் விளையாட்டில் ஈடுபட முன்வருவார்கள். எனவே, தயவுசெய்து இந்த ஆடை விடயத்தை பெரிதுபடுத்த வேண்டாம். எங்களுடைய பகுதிகளில் இருக்கின்ற மக்கள் அந்நியோன்னிய மாகத்தான் பழகுகின்றார்கள்; உறவு முறையுடன்தான் பழகுகின்றார்கள். மக்களுக்கு மத்தியிலும் அதிகாரிகளுக்கு மத்தியிலும் இவ்வாறான பிரச்சினை இல்லை. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒருசிலர் யாருடைய தூண்டுதலால் இவ்வாறான செயற்பாடுகளைச் செய்கின்றார்களோ தெரியவில்லை. இதற்கு இடங்கொடுக்கக் கூடாது. இந்தப் பாராளுமன்றத்தில் தேசிய மக்கள் சக்திக்கு 159 ஆசனங்கள் கிடைத்திருக்கின்றன. அந்தளவுக்கு எல்லா சமூகத்தைச் சேர்ந்த மக்களும் உங்களுடைய பக்கம் நின்றிருக்கிறார்கள்.

எனவே, எந்தச் சமூகத்துக்கும் பாதகமான முடிவுகளை எடுக்காமல், எல்லா அரச நிறுவனங்களிலும் முஸ்லிம் பெண்கள் 'ஹிஜாப்' அணிந்து பணிபுரிய முடியும் என்பதைச் சட்டபூர்வமாக்குங்கள்! இந்த விடயம் சட்டபூர்வமாக இல்லை என்பதைத்தான் அங்குள்ள பணிப்பாளரும் கூறுகின்றார். எனவே, விரைவாக இதனைச் சட்டபூர்வமாக்கி, முஸ்லிம் பெண்கள் பல துறைகளிலும் சாதனைபுரிவதற்கும் தொழில் நிறுவனங்களில் சேவை செய்வதற்கும் சாத்தியமானதொரு திட்டத்தைச் செயற்படுத்துமாறு கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු එච්.එම්. සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**

(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)

(The Hon. Sarath Kumara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1971 අංක 38 දරන මුදල් පනත යටතේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීමටත්, ඇවරකරුවන් පත් කිරීමටත් වන මේ යෝජනාව සම්මත කිරීමට අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරන පනත යටතේ තමයි ආරම්භ කළේ. 2019 අංක 15 දරන සංශෝධන පනත මඟින් මේ පනත සංශෝධනයට ලක් වෙලා තිබෙනවා. ඇත්තටම ශ්‍රම වාසනා අරමුදල ආරම්භ කළේ ඉතා වැදගත්, යහපත් චේතනා පදනම් කරගෙනයි. ශ්‍රම වාසනා අරමුදල එහෙම ආරම්භ කළාට එය පවත්වා ගනිමින් කටයුතු කිරීමේදී ඒ, ඒ කාල වකවානුවල අපේ රටේ දේශපාලනඥයන් විවිධ අත්දමින් අක්‍රමික ආකාරයෙන් කටයුතු කිරීම නිසා ශ්‍රම වාසනා අරමුදල සම්බන්ධයෙන් ගැටලු ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා.

ඇත්තටම ශ්‍රම වාසනා අරමුදල ආරම්භ කිරීමේදී පැවති අරමුණ තමයි අපේ රටේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය. සේවා නියුක්තිකයන්ගේ රැකියාව අහඹු ලෙස අහිමි වන අවස්ථා තිබෙනවා කියලා අපි දන්නවා. ඒ වාගේම ව්‍යසන අවස්ථාවලට මුහුණ දෙනවා. රෝගාබාධවලට මුහුණ දෙනවා. අන්න එවැනි අවස්ථාවල ඒ සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය වෙනුවෙන් කිසියම් වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. ඒ වෙනුවෙන් සුබසාධන කටයුතු සඳහා තමයි මේ ශ්‍රම වාසනා අරමුදල ක්‍රියාත්මක වුණේ. ඒ වාගේම විශිෂ්ට සේවා නියුක්තිකයන් ඇගයීමේ කාර්යත් ශ්‍රම වාසනා අරමුදල ආරම්භ කරන අවස්ථාවේ අරමුණක් හැටියට යොදා ගෙන තිබුණා. එහෙම යහපත් අරමුණුවලින් ආරම්භ කරපු ශ්‍රම වාසනා අරමුදල අක්‍රමික ආකාරයෙන් ඒගොල්ලන් භාවිත කළ ආකාරය පිළිබඳව අපි මේ විවාදය තුළ අවස්ථා කිහිපයකම සාකච්ඡා කර තිබෙනවා. ඒ නිසාම තමයි මේක ගැටලුවක් බවට පත් වෙන්නේ. ඒ නිසා, 2024 අවුරුද්දේදී අපි රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනයට ලක් කරන්න සමාලෝචන කමිටුවක් පත් කළා. ඒ සමාලෝචන කමිටුව අපේ රටේ ආයතන 160ක් සමාලෝචනයට ලක් කරලා තිබෙනවා. ඒ අතර ශ්‍රම වාසනා අරමුදල සම්බන්ධයෙනුත් නිර්දේශ ලබා දීලා තිබෙනවා. ඒ නිර්දේශ මත පදනම් වෙලා තමයි ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරලා ඇවර කිරීමට අපි තීන්දු කරලා තිබෙන්නේ.

ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හරින්නේ ඇයිද කියන කාරණාව දැන් අපි බලමු. ප්‍රධානම කාරණාව තමයි ආයතනය පිහිටුවීමේ අරමුණුවලින් අපගමනය වීම. ඊළඟට වෙනත් විෂය පථයන්ට මේ ශ්‍රම වාසනා අරමුදලේ ක්‍රියාකාරකම් ඇතුළත් වෙලා තිබීම, ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය සාධනය දුබල තත්ත්වයක තිබීම, ආයතන ශක්තිය දුබල වීම, වත්කම් ඌන උපයෝජිත තත්ත්වයකට පත්වීම කියන කාරණා නිසා තමයි ශ්‍රම වාසනා

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

අරමුදල විසුරුවා හරින්න සිදුවුණේ. අපේ රටේ ඉතිහාසය ගත්තාම, එක එක අමාත්‍යාංශය මඟින් කළමනාකරණය කරන ලද මෙවැනි ආයතනවලට අත් වුණු ඉරණම මොකක්ද කියන එක සම්බන්ධයෙන් අපට ඕනෑ තරම් සාකච්ඡා කරන්න පුළුවන්.

මෙහිදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ලොතරැයි මණ්ඩලය පිළිබඳව. පසුගිය කාලයේ අපේ රටේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් හිටියා, සරණ ගුණවර්ධන කියලා. දැන් එතුමාට හිර දඬුවම් හම්බ වෙලා තිබෙනවා. එතුමා ලොතරැයි මණ්ඩලයට විශාල බලපෑමක් කරපු දේශපාලනඥයෙක්. කවුරුත් දන්නවා, ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින ස්වභාවය ගැන. විශේෂයෙන් ටියුෂන් අධ්‍යාපනයට විශාල ඉල්ලුමක් තිබෙන ප්‍රදේශයක් තමයි අපේ ගම්පහ දිස්ත්‍රික්කය. ඒ කාලයේ ටියුෂන් ගුරුවරු එක පෙළට තියලා ඒගොල්ලන්ගෙන් කප්පම් එකතු කරපු ඇමතිවරු හිටියා. අන්න ඒගොල්ලන්ගේ ග්‍රහණයට ලක් වුණු ආයතනයක් තමයි මේ ශ්‍රම වාසනා අරමුදල. එවැනි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් හැටියට ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හරින්න අද අපට සිදු වෙලා තිබෙනවා. මම බොහොම වගකීමෙන් කියන්න කැමැතියි, ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරියත්, ඒ අරමුදලින් අපේක්ෂිත අරමුණු කිසිවකින් අපි රජයක් හැටියට ගැළවෙන්නේ නැහැ කියන එක. ඒ නිසා, මේ සේවා නියුක්තිකයන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න කම්කරු අමාත්‍යාංශය මේ වෙනකොට සම්පූර්ණයෙන්ම වගකීම භාර ගෙන තිබෙනවා. දැනට මේක හිඟ ණය නොමැති ආයතනයක් හැටියට තමයි හඳුනාගෙන තිබෙන්නේ. ලැබිය යුතු මුදල් ඒකාබද්ධ අරමුදලේ තැන්පත් කිරීම සඳහාත් මේ වනකොට නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා අපි මේ රටේ සේවා නියුක්තිකයින්ට කියන්න කැමැතියි, මේ අරමුදල විසුරුවා හැරීම හරහා ඔබට කිසිදු අගතියක් සිදු වන්නේ නැහැ කියන කාරණය. මේ වෙලාවේදී එම සහතිකය අපි විශේෂයෙන්ම ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ඉදිරිපත් කර තිබෙන මුදල් පනත යටතේ වන යෝජනා සම්මතය පිළිබඳව අදහස් දක්වන අතරතුර අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් විවිධ අවස්ථාවල වෙනත් විෂයයන් ගැනත් කරුණු දක්වපු ආකාරය අපි දැක්කා. විශේෂයෙන්ම අපි පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂ මන්ත්‍රීවරුන් විවිධ අදහස් මතු කළා. එක මන්ත්‍රීවරයෙක් අදහස් දක්වමින් කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන මෙම සංශෝධනය නිසා අපි ජාත්‍යන්තරයේ කුණු බක්කියට යනවා කියලා. ජාත්‍යන්තරයේ කුණු බක්කියට අපි යන එක කොහොම වුණත්, තමුන්නාන්සේලා දැන් ඉන්නේ කොහේද කියා බලන්න. එසේ අදහස් දක්වන තමුන්නාන්සේලා දැන් ඉන්නේ ඉතිහාසයේ කුණු බක්කිය අබිමුව කියන එකත් මේ වෙලාවේ විශේෂයෙන්ම මම කියන්න ඕනෑ.

අප සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සලකා බලන්නේ කොහොමද, ජාත්‍යන්තරයේ තිබෙන ඇගැයීම් මොනවාද කියන එක සම්බන්ධවත් මේ අවස්ථාවේදී මම වචනයක්, දෙකක් එකතු කරන්න කැමැතියි. Transparency International කියන්නේ ජාත්‍යන්තර ආයතනයක්. ඒ ආයතනය විසින් රටවල් පිළිබඳව, ඒ රටවල ආර්ථිකය පිළිබඳව විවිධ තොරතුරු, දත්ත ඉදිරිපත් කරනවා. මගේ අතේ තිබෙන මේ ලේඛනයේ සඳහන් වනවා, ඒ ආයතනය විසින් එසේ ඉදිරිපත් කළ දත්ත කිහිපයක්. මම මේ ගැන විශේෂයෙන්ම කියන්නේ අපි ජාත්‍යන්තරයේ කුණු බක්කියට යනවා, system change එකක් ගැන තිබුණු බලාපොරොත්තු සිහින බවට පත් වනවා යනාදී වශයෙන් මේ රටේ ජනතාව භීතියට පත් කරන විධියේ ප්‍රකාශ කිහිපයක් විපක්ෂයේ මන්ත්‍රීවරුන් සිදු කළ නිසායි. අන්න එතුමන්ලාට තමයි මම මේ ගැන කියන්නේ.

නීතියේ ආධිපත්‍යය දර්ශකය තුළ අපි බලයට පත් වන්න කලින් අපේ රට තිබුණේ 75වැනි ස්ථානයේ. නමුත් මේ වන විට අපි එම දර්ශකය තුළ 74වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. මේක ජයග්‍රහණයක්. එක ස්ථානයකින් අපි ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි රජයේ බලතල සීමා පිළිබඳ දර්ශකය තුළ අපි බලය අත්පත් කර ගන්නකොට, අපේ රට 76වැනි ස්ථානයේ සිටියේ. නමුත් දැන් අපි 67වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ අපි ඒකක නවයකින් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම විවෘත රජය පිළිබඳ දර්ශකය ගත්තාම අපි බලයට එන්න කලින් අපේ රට සිටියේ එම දර්ශකයේ 63වැනි ස්ථානයේ. දැන් අපි 59වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ඒකක හතරක වර්ධනයක් අපි පෙන්වා තිබෙනවා. දූෂණ විරහිතබව සම්බන්ධයෙන් වන දර්ශකය තුළ අපේ රට සිටියේ 63වැනි ස්ථානයේ. දැන් අපි 61වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ඒ දර්ශකයෙනුත් අපි ඒකක දෙකකින් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. මූලික අයිතිවාසිකම් පිළිබඳ දර්ශකය තුළ අපි බලයට එන්න කලින් අපේ රට තිබුණේ 86වැනි ස්ථානයේ. දැන් 85වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ එක ඒකකයකින් අපි වර්ධනයක් පෙන්වා තිබෙනවා. ඊළඟට, සිවිල් යුක්තිය පිළිබඳ දර්ශකය තුළ අපේ රට සිටියේ 103වැනි ස්ථානයේ. දැන් ඉන්නේ සියයේ. ඒ කියන්නේ ඒ දර්ශකය තුළත් ඒකක තුනක වර්ධනයක් අපි පෙන්වා තිබෙනවා. ඒ වාගේම තමයි දූෂණ සංජානන දර්ශකය තුළ අපේ රට සිටියේ 121වැනි ස්ථානයේ. දැන් අපි 107වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ඒකක 14ක වර්ධනයක් පෙන්වනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් දැන් අපි අහන්න කැමැතියි, කවුද එතකොට ජාත්‍යන්තරයේ කුණු බක්කියට යන්නේ කියලා. අපි ජාත්‍යන්තරයේ කුණු බක්කියට යන්නේ නැහැ. අපි ජාත්‍යන්තරයේ සම්භාවනාවට පත් වන ආණ්ඩුවක් අපේ රටේ හදා තිබෙනවා කියන එක මේ වෙලාවේ විශේෂයෙන්ම මම අවධාරණය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට බියපත් වෙලා මේගොල්ලන් දඟලන්නේ මොකද කියන එක සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මම තව කාරණයක් කියන්න කැමැතියි. ඊයේ ඒ ගැන පොඩි කොටසක් එළියට ආවා. ඊයේ සියඹලාපිටිය මහතාගේ book launch එකක් තිබුණා. එතැනට ඔයගොල්ලන් කාගේත් නායකයා වන රනිල් වික්‍රමසිංහ ඇවිත් හිටියා. ඔහු එතැනදී ප්‍රකාශයක් කළා, "දැන් මේ රටට ඕනෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොවෙයි. දැන් මේ රටට ණය ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. IMF එකේ ගිවිසුමත් අවසන් වෙලා. රට බංකොලොත් වෙන්න ඔන්න-මෙන්න" යනුවෙන්. මේ කවුරුන්ද, බියපත් කරන්නේ? කාටද, මේ අනතුරු හඟවන්නේ? දැන් ඕවාට රැවටෙන්නේ නැහැ, මේ රටේ බුද්ධිමත් ජනතාව. කුරිරු, ද්වේෂ සහගත, පදනම් විරහිත ප්‍රකාශයක් තමයි රනිල් වික්‍රමසිංහ කළේ. ඔහුගේ වුවමනාව මොකක්ද? ඔහුටත් දැන් චෝදනා ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඔහු මේ රටේ මහජනතාවට අයිති රුපියල් ලක්ෂ 166ක් අක්‍රමික විධියට අවභාවිත කර තිබෙන එක සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොනු වෙලා තිබෙනවා. දැන් ඒගොල්ලන්ට මේවාට මුහුණ දෙන්න විධියක් නැහැ. ඒවාට මුහුණ දෙන්න පාර කපාගන්න තමයි ඒගොල්ලන් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව තැන් තැන්වල සංවිධානගත වන්නේ. ඒ නිසා මම බොහොම වගකීමෙන් කියනවා, අද මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව කටයුතු කරන බොහෝ අයට හෝ ඔවුන්ට ළඟැදියාවක් තිබෙන අයට අධිකරණයේ නඩු කටයුතු තිබෙන බව. එහෙමත් නැත්නම් ඒගොල්ලන් ඉදිරියේදී එවැනි නඩු ගොනුවීමට නියමිත උදවියයි. එම නිසා විපක්ෂය අපට එරෙහිව සිදු කරන ඒ අවලාදවලට අපි

කිසිසේත්ම සැලෙන්නේ නැහැ. මේ රටේ යුක්තිය අභිමි ජනතාව වෙනුවෙන්, මේ රටේ සාධාරණය අභිමි ජනතාව වෙනුවෙන් ජාතික ජන බලවේගයේ රජය දිගින් දිගටම පෙනී සිටින බවත්, මේ රටේ ජනතාවට ජයග්‍රහණ ගෙන ඒම වෙනුවෙන් අරගළ කරනවා කියන පණිවුඩයත් ලබා දෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.43]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த அரசாங்க காலத்தில் எமது நாட்டில் வாழுகின்ற முஸ்லிம் சமூகத்துக்குப் பெரும் சோதனைகளும் வேதனைகளும் நிகழ்ந்ததை இந்த நாடே அறியும். அந்த வகையில், எங்களுடைய முஸ்லிம் சமூகம் மறக்க முடியாத ஒரு விடயம் இருக்கின்றது. அதாவது, கொரோனா தொற்றால் இறந்தவர்களின் உடல்களை அடக்கம் செய்யலாம் அல்லது எரிக்கலாமென உலக சுகாதார ஸ்தாபனம் உட்பட சர்வதேச சமூகம் அறிவித்து இருந்தபோதிலும், சனாதிபதித் தேர்தலில் முஸ்லிம்கள் அப்போதிருந்த சனாதிபதிக்கு வாக்களிக்கவில்லை என்ற காரணத்துக்காக முஸ்லிம்களைப் பழிவாங்கும் நோக்கில் கொரோனா தொற்றால் இறந்த முஸ்லிம்களின் ஜனாஸாக்களை எரித்தார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கொரோனா காலத்தில் எரிக்கப்பட்ட ஜனாஸாக்களின் விபரங்களை இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்குமாறு அப்போது எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள் கௌரவ சுகாதார அமைச்சரிடம் கோரிக்கை விடுத்தார். எனினும், அமைச்சர் அவர்கள் அதைச் சமர்ப்பிக்கவில்லை. அதன் பின்னர், நான் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில், இலங்கையில் கொரோனா காலத்தில் எரிக்கப்பட்டவர்களுடைய விபரங்களைக் கேட்டேன். அதற்குச் சுகாதார அமைச்சின் செயலாளர், கொரோனா காலத்தில் எரிக்கப்பட்டவர்களுடைய தகவல்கள் தங்களுடைய அமைச்சில் இல்லை எனவும், பதிவாளர் நாயகத்தைத் தொடர்புகொண்டு அதைப் பெற்றுக் கொள்ளுமாறும் எனக்கு எழுத்துமூலம் அறிவித்திருந்தார். நான் இந்த விடயத்தை பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் முன்வைத்தபோது, கொரோனா காலத்தில் 25 மாவட்டங்களிலும் இயற்கையாக இறந்தவர்களுடைய எண்ணிக்கையை மாத்திரம் பதிவாளர்நாயகம் தந்தார்.

நான் இங்கு ஒரு விடயத்தைக் கேட்க விரும்புகின்றேன். கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில் கொரோனா தொற்றால் இறந்த முஸ்லிம்களின் எரிக்கப்பட்ட ஜனாஸாக்களின் பெயர் விபரங்களைக் கோரியபோது, தற்போது சனாதிபதியாக இருக்கின்ற அநுர குமார திஸாநாயக்க அவர்களும் அன்று எங்களுக்காகக் குரல்கொடுத்தார். அவ்வாறு இருக்கையில், அவருடைய ஆட்சியில் அந்த விபரங்களைப் பெறமுடியாமல் நாங்கள் ஒரு வருடமும் நான்கு மாதங்களும் காத்திருப்பது என்பது மிகவும் கவலையான விஷயமாக இருக்கின்றது. எனவே, கௌரவ சுகாதார அமைச்சர் உட்பட சம்பந்தப்பட்ட எல்லோரும் இணைந்து, கொரோனா தொற்றால் இறந்த முஸ்லிம்களின் எரிக்கப்பட்ட ஜனாஸாக்களுடைய விபரங்களைச் சமர்ப்பிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் நல்ல விடயங்களைப் பேச அருள்புரிய வேண்டுமெனவும், எந்தவொரு சந்தர்ப்பத்திலும் ஓர் இனவாதியாகப் பேசக்கூடிய சூழ்நிலையை ஏற்படுத்திவிடக் கூடாதெனவும் நாங்கள் இறைவனைப் பிரார்த்தித்துச் செயற்படுபவர்கள். நேற்று இந்தச் சபையில் உரையாற்றிய கௌரவ உறுப்பினர் ஒருவர், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் 'அபாயா' அணிந்து கடமைக்குச் சென்றதாகத் தவறானதொரு செய்தியைத் தெரிவித்திருந்தார். அப்போது, நான் சபைக்கு வெளியிலே இருந்தேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர் ஒருவர் சபையில் தவறான கருத்தொன்றைச் சொன்னால், அதனைத் திருத்துவதற்காக ஏனைய உறுப்பினர்களுக்கு ஒரு நிமிடம் வழங்கப்பட வேண்டுமென நாங்கள் ஏற்கெனவே ஒரு தீர்மானம் எடுத்திருக்கிறோம். ஆனால், துரதிருஷ்டவசமாக மேற்குறித்த தவறான செய்தியைத் திருத்துவதற்காக நான் point of Orderஐ எழுப்பியபோது, எனக்கு அனுமதி வழங்கப்படவில்லை. இதனை நான் மிக வேதனையுடன் இங்கு தெரிவித்துக் கொள்கின்றேன். இனிமேல் இந்தச் சபையில் அவ்வாறு யாருக்காவது சந்தர்ப்பம் வழங்கப்பட்டால், அது அநியாயமாக இருக்குமென நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் நியமிக்கப்பட்டமை உங்களுக்குத் தெரியும். கொடூர யுத்தம் அல்லது பயங்கரக் கொலைகள் நடைபெற்ற காலத்தில் தமிழ் பிரதேசங்களுக்குச் சென்று முஸ்லிம்களும், முஸ்லிம் பிரதேசங்களுக்குச் சென்று தமிழர்களும் சிகிச்சை பெற முடியாத நிலை இருந்தது. அதனால்தான் அன்று கல்முனையில் இரண்டு ஆதார வைத்தியசாலைகளை அமைக்கவேண்டிய தேவை ஏற்பட்டது. ஒன்று, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலை. மற்றையது, அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலை. கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்கு முஸ்லிம் நோயாளிகள் சிகிச்சைக்காகப் போகின்றார்கள். அதேபோல், அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு தமிழ் மக்கள் போகின்றார்கள். அங்கு தமிழ் வைத்தியர்கள் இருக்கிறார்கள், தமிழ் உத்தியோகத்தர்கள் இருக்கிறார்கள் என்று நான் நேற்று கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடம் சொன்னேன்.

அவசரப்பட்டு இணையத்தளத்தில் பதிவுகளை இட்டு, இனங்களை மோதவிடுவதிலிருந்து மௌத்தாகும் வரை எங்களை அல்லாஹ் காப்பாற்ற வேண்டும். நாங்கள் எல்லா இன மக்களோடும் சகோதரத்துவத்துடன் வாழக்கூடிய வகையில் இந்த மண்ணில் 30 வருட காலமாகப் பணிகளைச் செய்து வருகின்றோம். நாங்கள் இப்போது இந்தப் பாராளுமன்றத்துக்கு வந்தும் அதைத்தான் செய்துகொண்டு இருக்கின்றோம். சென்ற மாதம் இலங்கையில் வாழுகின்ற தமிழ் பேசும் அரசியல் கட்சிகள் அனைத்தும் ஒன்றிணைந்தது உங்களுக்குத் தெரியும்! அப்போது நாங்கள் சந்தோஷப் பட்டோம். பாராளுமன்றத்தில் நடைபெற்ற ஒரேயொரு

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

கூட்டத்துக்கு நான் சென்றிருந்தேன். அதில் நான், "கௌரவ தலைவர்களே, நீங்கள் ஒன்று சேர்ந்திருப்பது நல்ல விஷயம். அதேபோல், மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்திப்பதும் கௌரவ எதிர்க்கட்சித் தலைவரைச் சந்திப்பதும் நல்ல விஷயம். நீங்கள் இவ்வாறான விடயங்களில் தொடர்ச்சியாக ஈடுபடுவதோடு, முஸ்லிம், தமிழ் மக்களுக்கு இடையில் அல்லது சிங்கள மக்களுக்கு இடையிலுள்ள பிரச்சினைகளை அடையாளங்கண்டு தீர்த்து வைப்பதற்கான ஏற்பாடுகளையும் செய்தால் இந்த நாட்டு மக்கள் எங்கள்மீது நம்பிக்கை வைப்பார்கள்" என்று சொன்னேன்.

தமிழ் பேசும் கட்சிகள் ஒன்றிணைந்து இருக்கின்ற இந்தச் சூழ்நிலையில், வடக்கும், கிழக்கும் இணைய வேண்டும் என்றால் முஸ்லிம் மக்கள் உதவி செய்ய வேண்டுமென ஏற்கனவே கோரிக்கை விடுக்கப்பட்டு இருக்கின்ற சூழ்நிலையில், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் சுகாதார அமைச்சினால் நியமனம் செய்யப்பட்ட 9 முஸ்லிம் சகோதரிகள் 'ஹிஜாப்' அணிந்து சுகாதார உதவியாளர்களாக வேலைசெய்ய முடியாத ஒரு நிலை ஏற்பட்டு இருக்கின்றது. நாளை எவ்வாறு நாங்கள் இன ஒற்றுமை பற்றி பேசப் போகிறோம்? எனக் கேட்கின்றேன்.

கௌரவ ஆதம்பாவா அவர்கள், தான் தொலைபேசிமூலம் கௌரவ சுகாதார அமைச்சருடனும் அதன் பிரதி அமைச்சருடனும் கதைத்து இந்தப் பிரச்சினையைத் தீர்த்துவிட்டதாகச் சொன்னார். எப்படியோ இந்தப் பிரச்சினை தீரட்டுமென நாங்கள் பேசாமல் இருந்தோம். மறுநாள் அந்த 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களுக்கும் கடிதங்கள் வழங்கப்பட்டு இருக்கின்றன; நடவடிக்கை எடுப்போமெனச் சொல்லப்பட்டு இருக்கிறது. அடுத்த நாள் இடமாற்றத்தைச் செய்துவிட்டு, "நாங்கள் கல்முனையிலுள்ள பிரச்சினையைத் தீர்த்துவிட்டோம்" என்று இன்னொரு பாராளுமன்ற உறுப்பினர் சுகாதாரப் பிரதி அமைச்சர் போன்று இந்த நாட்டுக்குச் சொன்னார். கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்குக் கடமையைப் பெறுப்பேற்பதற்காகச் சென்ற குறித்த முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்கள் 'ஹிஜாப்' அணிந்து சென்றமைக்காக, அவர்களை அஷ்ரப் ஞாபகார்த்த வைத்தியசாலைக்கு இடமாற்றம் செய்தால் இந்தப் பிரச்சினை தீர்ந்துவிடுமா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේක ගැන කථා කරන්නම ඕනෑ.

මම රණ්ඩු කරන්න නොවෙයි මේක ගැන මෙච්චර කියන්නේ. අපරාදේ, ජනාධිපතිතුමා වාගේම Prime Minister කියනවා, "අපි සමගිය හදමු, අපි එකට ඉමු, අපට ජාති භේදයක් නැහැ" කියලා. හිජාබ් දාලා ඒ දෙමළ රෝහලට යන්න පුළුවන් වන විධියට ඒක අත්සන් කරන්න බැරි නම් අපි සමගිය හදලා තිබෙනවා කියන්නේ මොකක්ද? ඊයේ පෙරේදා වුණු දේවල් ඔයගොල්ලන් බැලුවා නේ. ඊයේ වුණේ මොකක්ද? පොල්ගහවෙල ඉස්පිරිතාලයට මොකක්ද වෙලා තිබෙන්නේ?

හිජාබ් එක කියන්නේ මූණ වහන එකක් නොවෙයි. මූණ, කට ඔක්කොම පේන්න තිබෙනවා. අතේ මැණික් කටුව දක්වා වහලා තිබෙනවා. ඒ ඩොක්ටර් මොකක්ද කියන්නේ? "යන්න යන්න, හිජාබ් එක ගලවලා එන්න. නීතිරීති මොකුත් නැහැ. ඔයා කුරුණෑගල පොලිසියටම ගිහිල්ලා entry එකක් දමන්න, ඔයාට බෙහෙත් දෙන්න නම්" කියලා කියනවා. ලජ්ජයි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දොස්තරලා තනිකරම ජාති භේදයෙන් කථා කරන්න ඉඩ දුන්නා, අලුතින් පත්වීම් ලැබූ මුස්ලිම් ළමයින්ට. ඒ ළමයින්ට පොල්ගහවෙලටත් මාරුවීම් ලබා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්නම්. ජාති භේදය ඇති කරන කට්ටිය මේ ආණ්ඩුව ආවට පසුව නිදාගෙන හිටියා. ඔයගොල්ලන් කල්මුනේ ඉඳලා දැන් ඒක පටන් ගත්තා. ඒගොල්ලන් ඒකට අනුබල දුන්නා. මගේ ළඟ circulars දෙකක් තිබෙනවා. 2019දී, තම තමන් අදහන හැම ආගමකටම අදාළ uniform ඇඳලා රාජකාරියට වාර්තා කරන්න කියලා කියා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඇවිල්ලා ඒක cancel කළා. ඇයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට ඒක ආපසු හරවන්න බැරි? විනාඩියකින් ඒක කරන්න පුළුවන්. 2019දී දුන්නු circular එක ක්‍රියාත්මක කරන්න කියලා ඇමති මණ්ඩලයට හරි සෞඛ්‍ය ඇමතිතුමාට හරි විනාඩියකින් ඒක කරන්න පුළුවන්. ඒක කෙරුවා නම් මුස්ලිම්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය ඉතාම සීමිතයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට මිනිත්තු කීපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා කරුණාකර ඒ circular එක cancel කරන්න. මේ ආණ්ඩුවේ ජාති භේදය නැහැ කියලා අපි සන්තෝෂ වෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව කාලයේ ආයෙත් ඒක පටන් ගත්තා කියලා ඉතිහාසයට එන්න එපා කියන ඉල්ලීම කරමින් මම කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සම්බන්ධව අද දිනයේදී සාකච්ඡා වෙනවා.

විවාදයට අදාළ කරුණු ඉදිරිපත් කරන්න කලින් මම කල්පනා කළා, අද දිනයේදී විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ අධිකරණ සංවිධාන පනතට සිදු කෙරෙන සංශෝධනය සම්බන්ධයෙන් විවිධ අදහස්, මතවාද සහ තර්ක ඉදිරිපත් කළ නිසා ඒ සම්බන්ධයෙන් යමක් කියන්න.

විශේෂයෙන්ම වර්තමාන රජය විධියට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලිකව කාරණා දෙකක් පිළිබඳව අවධානයට ලක් කර තිබෙනවා. එක කාරණයක් තමයි, මේ අසීමිත නඩු ප්‍රමාදයට පිළිතුරු දීම. අංක දෙක තමයි, අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් තිබෙන ජනතා විශ්වාසය ඉහළ නැංවීම. මේක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි පැහැදිලිව පොරොන්දු වෙච්ච කාරණා දෙකක්. ඒ වෙනුවෙන් අපි අවුරුද්දකුත් මාස අටක කාල පරිච්ඡේදයක් තුළ කටයුතු කරමින් සිටිනවා. අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ යම් සාධනීය වෙනස්කම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අපි අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම නව අධිකරණ ඉදිකිරීම සඳහා අපි පියවර ගෙන තිබෙනවා. පවතින අධිකරණවල හඳුනා ගත් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීලා තිබෙනවා. අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒ හරහා නඩු කටයුතු ශක්තිමත් කර තිබෙනවා. කාලය කළමනාකරණය කර ඒවා කාර්යක්ෂම කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මිනිස්සු අවුරුදු ගණන් තමන්ගේ නඩු වාරය එනකල් මුදල් එකතු කරගෙන, තමන්ට ඉටු නොවුණු යුක්තිය අධිකරණය හරහා ඉටු කරගන්න බලාපොරොත්තු සහගතව ඉන්නකොට ඒ නඩු කටයුතු ප්‍රමාද වීම වැළැක්වීම සඳහාත්, ජනතාවට අධිකරණය සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහාත් අවශ්‍ය කරන පරිසරය අපි රජයක් විධියට හදමින් යනවා. අන්න එතැනදී අධිකරණ පද්ධතිය තුළ පරිණත - අත්දැකීම් සහිත - විනිශ්චයකාරවරුන් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ රඳවා ගැනීම තුළින් ඒ ලබා දෙන යුක්ති සහගත තීන්දුවල ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය කරන්න අපට පුළුවන් වනවා කියලා අපි කල්පනා කරනවා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් සහ අධිකරණ සංවිධාන පනතට සිදු කිරීමට නියමිත මේ සංශෝධන තුළින් අපි ඉලක්ක කරන්නේ විපක්ෂය තර්ක කරන විධියට තනි පුද්ගලයෙක් ඉලක්ක කරගෙන කරන ව්‍යවස්ථා සංශෝධනයක් නොවෙයි. ප්‍රාථමික අධිකරණවලින් පටන් ගත්තාම උපරිමාධිකරණ දක්වා සමස්ත අධිකරණ පද්ධතියේම විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය වසර දෙකක් දීර්ඝ කිරීම හරහා කාගේවත් බලාපොරොත්තුවලට, අධිකරණ ක්ෂේත්‍රය තුළ උසස්වීම් සඳහා තිබෙන ඒ සිහිනවලට මේ වසර දෙකක සේවා දිගුව හරහා බලපෑමක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ වාගේම අපි ජාත්‍යන්තරයේ කුණු බක්කියට වැටෙනවා කියන විපක්ෂයටම තමයි අප මේ උත්තර දෙන්නේ. ලෝකයේ දියුණු රටවල්වල අධිකරණ පද්ධති තුළ ගුණාත්මක අධිකරණ සේවාවක් ලබා දෙන විනිශ්චයකාරවරුනුත්, සමහර රටවල සම්පූර්ණ ජීවිත කාලය පුරාම, සමහර රටවල පිළිගත් නිශ්චිත දීර්ඝ කාල පරිච්ඡේදයක් පුරාවටත් ඒ අය, ඒ අයගේ සේවාව එම රටේ ජීවත් වන මහජනතාව වෙනුවෙන්, අධිකරණ පද්ධතිය වෙනුවෙන් ලබා දෙනවා.

මට කියන්න තිබෙන්නේ මෙච්චරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂය බලාගෙන හිටියා, අපි ආණ්ඩුව භාර ගත්තාට පස්සේ මාස තුනෙන් ආණ්ඩුව ඉවරයි, අපි ගෙදර යනවා කියලා. ඊට පස්සේ මාස හයෙන් මේ ආණ්ඩුව කඩාගෙන වැටෙයි කිව්වා. මාස නවයෙන් ආණ්ඩුව කඩාගෙන වැටෙයි, මාස දොළහෙන් කඩාගෙන වැටෙයි කියා මාස තුනෙන් තුනට අපි කඩාගෙන වැටෙනකම් විපක්ෂය බලාගෙන හිටියා. දැන් කියනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා අධිකරණ සංවිධාන පනතට ගෙනෙන මේ සංශෝධනය හරහා ආණ්ඩුව කඩාගෙන වැටෙනවා කියලා. ඉතින්, ඔය විපක්ෂයම තමයි අපි මාස තුනෙන් තුනට වැටෙනකනුත් බලාගෙන හිටියේ. ඒක තමයි ඒ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ. අපි මේ රටේ මහජනතාවට පොරොන්දු වෙච්ච දෙයක් තිබෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය හරහා පොරොන්දු වෙච්ච දේ ඉෂ්ට කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට අදාළ කාරණා ගැන කල්පනා කළොත්, ශ්‍රම වාසනා අරමුදල කියන එක පිහිටෙව්වේම නිශ්චිත අරමුණු හයක් ඇතුවයි. පනතේ පැහැදිලිව කියා තිබෙන ආකාරයට මේක හරහා බලාපොරොත්තු වෙලා තිබෙනවා, සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම, ඒ අය සේවයේ යෙදී සිටියදී පූර්ව දැනුම්දීමක් නැතුව ඒ ආයතන වැහුවත්, ඒ අයට මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීම, වෛද්‍ය සහ වෙනත් පහසුකම් සැපයීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඒ කම්කරුවන්ට, සේවා නියුක්තිකයන්ට යම් යම් නීති කෘත්‍යයන් සඳහා නීති ආධාර අවශ්‍ය වෙනවා නම් ඒවා ලබා දීම පවා මේ ශ්‍රම වාසනා අරමුදලේ කාර්යභාරයන් විධියට හඳුනාගෙන තිබෙනවා. නමුත් පසුගිය කාල පරිච්ඡේදය තුළ එය ඉෂ්ට වුණේ නැහැ. ඒ වාගේම සේවා නියුක්තිකයන්ට විරුද්ධව යම්කිසි විනය පරීක්ෂණයක් ආරම්භ කරලා තිබෙනවා නම් ඔවුන්ට තාවකාලිකව ආධාර සැපයීම මේ අරමුදල හරහා සිදු කළ යුතුයි. ඒ වාගේම තමයි, ව්‍යසන අවස්ථාවල මූල්‍ය සහ වෙනත් පහසුකම් සැලසීම, සුබසාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති අයට ත්‍යාග පිරිනැමීම. මෙන්න මේවා තමයි පනතේ පැහැදිලිව දක්වා තිබෙන අරමුණු හය වන්නේ.

හැබැයි, පසුගිය කාල පරිච්ඡේදය දිහා බැලුවාම අපට හිතන්න වෙනවා, මේ අරමුදල මේ අරමුණු වෙනුවෙන් යොදවාගෙන තිබෙනවාද කියන කාරණය. 2018, 2019 සහ 2020 ජාතික විගණන කාර්යාලයේ ත්‍රෛවාර්ෂික වාර්තාව ඉතාම හොඳින් තත්වාගණනය කළ මතය යටතේ මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා තිබෙනවා, audit එක හරියටම කරලා තිබෙනවා කියලා. විගණන වාර්තාව අනුව කියනවා, ලොතරැයි ආදායම අඩු වෙමින් තිබෙන අවස්ථාවක අරමුදලේ අරමුණු වෙනුවෙන් නොවෙයි මේ මුදල් යොදවා තිබෙන්නේ කියලා. පැහැදිලිවම සඳහන් වෙනවා, 2020දී මේ අරමුදලේ ආදායම රුපියල් මිලියන 332ක් බව. 2021දී රුපියල් මිලියන 347යි; රුපියල් මිලියන 15කින් වැඩි වෙලා. 2022දී රුපියල් මිලියන 379යි; රුපියල් මිලියන 32කින් වැඩි වෙලා. 2023දී රුපියල් මිලියන 410යි. හැබැයි, 2024 වනකොට ඍණ රුපියල් මිලියන 59යි. ඒ කියන්නේ, රුපියල් මිලියන 351ක් දක්වා ආදායම අඩු වෙලා තිබෙනවා. ඒක ප්‍රතිශතයක් විධියට ගත්තොත්, 2023දී 8ක් වෙච්ච වර්ධනය ඍණ 14ක් දක්වා තමයි පහත බැහැලා තිබෙන්නේ. ලොතරැයි ආදායම අඩු වෙමින් තිබෙන අවස්ථාවක මේ ශ්‍රම වාසනා අරමුදල මොනවාටද මේ මුදල් යෙදෙව්වේ කියන එක පිළිබඳව ප්‍රශ්න කිරීමේ අයිතිය අපට තිබෙනවා. මොකද, අපි නියෝජනය කරන්නේ මේ රටේ මහජනතාව. දැන් අතීතයට පොඩ්ඩක් ගියොත්, 2018දී මේ අරමුදලෙන් ලබා ගත්ත මුදල් සැලසුම් සහගත සේවක සුබසාධන වැඩසටහන් සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කර නැහැ කියලා මේ විගණන වාර්තා අනුව දක්වා තිබෙනවා. මේ අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. 2019දී කියනවා, ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් 7ක් ක්‍රියාත්මක කළේ නැහැ කියලා. ඒ කියන්නේ, අරමුණුවලට මේ මුදල් යොදවා නැහැ. 2020දී මේ අරමුදලෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය නිසි පරිදි ගණනය කරලා නැහැ.

[ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

එතකොට කෝ, මේ "වගවීම" කියන එක? ඒවා ඉටුවෙලා නැහැ. ඒ වාගේම අතීතයට ගියොත්, එවකට කම්කරු විෂය භාර අමාත්‍යවරයා විධියට කටයුතු කළ මනූෂ නානායක්කාර හිටපු අමාත්‍යතුමා එවකට මේ අරමුදලෙන් "සුබසාධනය" කියන පරමාර්ථයෙන් යම්කිසි ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් මිලියන 6.6ක් වෙන් කරලා තිබෙනවා, Board එකෙන් අනුමත කරගෙන. ඒ, නිශ්චිතවම පාසල් බෑග්, පොත් මිලදීගෙන බෙදන්න. හැබැයි, 2024ට කලින් එහෙම ව්‍යාපෘතියක් මේ අරමුදලෙන් කරලා නැහැ. 2024දී තමයි ඒක කරන්නේ. එතකොට ඒකේ අරමුණ මොකක්ද කියලාත් මේ රටේ මහජනතාවට කල්පනා කරලා බලන්න පුළුවන්. එහෙම රුපියල් මිලියන 6.6ක් වෙන් කරගෙන යනකොට තවත් රුපියල් මිලියන 66ක් අතිරේකව ඒ project එකටම වෙන් කරනවා, "School Aid (Special)" කියලා. රුපියල් මිලියන 66ක්. ඒ අතරේ තිබෙනවා, අමතර පරිපාලන වියදම් විධියට රුපියල් මිලියන 10.86ක්. එතකොට ඒවා බෙදලා තිබෙනවා 2024දී, බුත්තල, වැල්ලවාය, ඒ වාගේම මහනුවර දරුවන්ට. දරුවන්ට ඒ පාසල් බෑග්, උපකරණ දීපු එක අපට ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, සැලසුම් සහගතව ඒ සියලුම ප්‍රතිලාභ, ප්‍රතිලාභ ලැබිය යුතු තැන්වලට යෙදෙව්වාද, ඒකේ අරමුණ මොකක්ද කියන එක ප්‍රශ්න කරන්න මේ රටේ මහජනතාව වෙනුවෙන් අපට අයිතියක් තිබෙනවා. ඒ නිසා මේකේ මූල්‍ය තිරසරභාවය පිළිබඳව, කළමනාකරණය පිළිබඳව, විනිවිදභාවය පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. ඒ අනුව අපි කල්පනා කරන්නේ, මේක ඇවර කරන්න ඕනෑ කියලා. හැබැයි, මේක ඇවර කරන්න අපි කමිටුවක් මඟින් නිර්දේශ කරන ගමන්ම ආණ්ඩුවක් විධියට අමතක කරපු නැති පැත්තකුත් තිබෙනවා. අරමුදලෙන් කරන ලද කාර්යභාරය තවදුරටත් ඉටු කිරීම සඳහා ආණ්ඩුවක් විධියට අපි පියවර අරගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඒ වෙනුවෙන් විවිධ පුද්ගලයන්ගෙන් යුත් විශේෂ කමිටුවක් නම් කරලා, ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අරමුදලෙන් බලාපොරොත්තු වෙච්ච අරමුණු 6ක් තිබෙනවා. මේ අරමුදල ඇවර කළා කියලා අපි ආණ්ඩුවක් විධියට කිසිම මොහොතක ඒ අරමුණු 6 අමතක කරන්නේ නැහැ. කම්කරු විෂය භාර අමාත්‍යවරයා තමන්ගේ විෂය පථය යටතේ මේ හරහා ඉටු වෙච්ච කාර්යභාරය තවදුරටත් ඉටු කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග මේ ක්‍රියාකාරී සැලැස්ම හරහා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ඉදිරියටත් කරනවා. මේ රටේ මහජනතාවගේ හැම බදු මුදලකටම, හැම රුපියලකටම වග කියන ආණ්ඩුවක් විධියට අපිට අද මේ ආයතනය ඇවර කරන්න සාධාරණ හේතු තිබෙනවා. හැබැයි, එතැනින් එහාට එහි අරමුණුවලින් මිදෙන්නේ නැතුව, මේ රටේ පොදු මහජනතාව වෙනුවෙන් තවදුරටත් ඒවා ඉටු කිරීම සඳහා ආණ්ඩුවක් විධියට අපි සාමූහික වගකීමක් දරන බවත් සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.04]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1998ஆம் ஆண்டின் 12ஆம் இலக்க, சிரம வாசனா நிதியச் சட்டத்தின்கீழ் நிறுவப்பட்ட சிரம வாசனா நிதியத்தைக் கலைத்து, அதனை முடிவுக்குக் கொண்டுவருவதற்கான தீர்மானம் தொடர்பான விவாதம் இன்றைய தினம் இச்சபையில் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. அரசாங்கத்துக்குச் சொந்தமான வணிகசாரா நிறுவனங்களை மறுஆய்வு செய்யும் குழுவின் பரிந்துரையின் பேரில் எடுக்கப்பட்டுள்ள இந்தத் தீர்மானம், அரசாங்கச் செலவினங்களை முறைப்படுத்துவதற்கும், நிருவாகத் திணைக்களங்களின் இரட்டைப் பணிகளைத் தவிர்ப்பதற்கும், நிதிச் சிக்கனத்துக்காகப் பொதுத்துறை நிறுவனங்களை மறுசீரமைப்பதற்கும் எடுக்கப்பட்ட அவசியமானதொரு நடவடிக்கையாகும். சிரம வாசனா நிதியத்தைக் கலைத் தலானது, மேலதிகமாகப் பணிகளைப் புரிகின்ற நிறுவனங் களின் சுமையைக் குறைப்பதற்கும், மக்களின் வரிப்பணம் மூலம் கிடைக்கின்ற நிதி வீண்விரயமாகுவதைத் தவிர்ப் பதற்கும் ஏதுவாக இருக்குமென நான் நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, "தாமதிக்கப்பட்ட நீதி மறுக்கப்பட்ட நீதிக்குச் சமம்" என்பது - justice delayed is justice denied - சட்டத்துறையிலும் மனித உரிமைகளிலும் பயன்படுத்தப்படும் முக்கியமானதொரு பொன் மொழியாகும். ஒரு நபருக்குச் சட்டத்தின்மூலம் கிடைக்கவேண்டிய நீதி சரியான நேரத்தில் கிடைக்காமல் நீண்ட காலம் தாமதமாகும்போது, அந்த நீதியால் கிடைக்கும் பலன் அல்லது மதிப்பு முற்றாக இழக்கப்படுகின்றது என்பதையே இது குறிக்கின்றது.

நேற்றைய தினம் கௌரவ நீதி அமைச்சர் அவர்கள் இந்தச் சபையில் அரசியலமைப்புக்கான இருபத்திரண்டாவது (திருத்தம்) சட்டமூலம் மற்றும் நீதித்துறை (திருத்தம்) சட்டமூலம் ஆகியவற்றைச் சமர்ப்பித்திருந்தார். இந்தச் சட்டமூலங்கள் தொடர்பாகப் பல்வேறுபட்ட வாதப் பிரதிவாதங்கள் கடந்த பல நாட்களாக இடம்பெற்று வருகின்றன. இந்தத் திருத்தச் சட்டமூலங்கள் எவ்வளவுதூரம் முக்கியத்துவம் வாய்ந்தவை என்பது, அவற்றில் இருக்கின்ற உள்ளார்ந்த விடயங்களை ஆழமாகப் பார்க்கும்போது இலகுவாகப் புரியும்.

இலங்கையிலுள்ள நீதிமன்றங்களில் கிட்டத்தட்ட 11 இலட்சம் வழக்குகள் இன்னும் நிலுவையில் இருக்கின்றன. வழக்கு விசாரணைகள் ஆண்டுக் கணக்கில் இழுத்தடிக்கப் படுகின்றன. இதன் காரணமாகப் பாதிக்கப்பட்டவர்கள் மன உளைச்சல், நிதி நெருக்கடி மற்றும் சமூக ரீதியான இன்னல்களுக்கு உள்ளாகின்றார்கள். சில வேளைகளில், வழக்கு விசாரணைகள் முடிவடைவதற்கு முன்னரே அவர்கள் இவ்வுலகை விட்டுப் பிரிகின்ற நிலையும் இருக்கின்றது. இலங்கையில் 10 இலட்சம் மக்களுக்கு 15 நீதிபதிகள் மட்டுமே உள்ளனர். எனவே, நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பது அத்தியாவசியமானதாகக் காணப்படுகின்றது. வழக்கு விசாரணைகளை விரைவாக நடத்தி முடிப்பதற்கும், சரியான தீர்ப்புகளை வழங்குவதற்கும் அனுபவம் வாய்ந்த நீதிபதிகளின் சேவை அவசியமாகும். எனவே, இது காலத்துக்குப் பொருத்தமானதொன்றாகக் காணப்படுகின்றது.

இங்குள்ள எதிர்க்கட்சியினர் இதனைப் பூதாகரமாக்கி, பேசுபொருளாக மாற்றி இருக்கிறார்கள். சர்வதேச ரீதியில் ஒப்பிடும்பொழுது, பிரித்தானியாவில் 70-75 வயது வரை Commonwealth judges காணப்படுகின்றார்கள். இங்கு நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லை நீடிப்பு என்பது எந்தவித உள்நோக்கமும் அற்றது என்பது இதன்மூலம் புலனாகின்றது. எனவே, இந்த விடயத்தில் உறுதியுடன் செயற்பட்டு, குறித்த சட்டமூலங்களை நிறைவேற்ற வேண்டியது காலத்தின் கட்டாயத் தேவையாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது வட மாகாணத்தில் மட்டுமல்ல, இலங்கை முழுவதிலும் முன்பள்ளி சம்பந்தமாகக் கூடிய கவனம் செலுத்தவேண்டி இருக்கிறது. வட மாகாணத்தில் 1,300க்கும் மேற்பட்ட முன்பள்ளிகள் காணப்படுகின்றன. இந்த முன்பள்ளிகளில் 35,000க்கும் மேற்பட்ட பிள்ளைகள் கல்வி கற்கின்றார்கள். குறிப்பிட்ட சில பிரதேச சபைகளுக்கு உட்பட்ட முன்பள்ளி களைத் தவிர, ஏனையவற்றில் கடமைபுரியும் 70 சதவீதமான ஆசிரியர்கள் மாதாந்தம் 10,000-15,000 ரூபாய் வேதனத்தையே பெறுகின்றார்கள். உண்மையிலேயே இது மிகவும் குறைவான வேதனமாகும். எனவே, இவர்களது அளப்பரிய பணிக்கு ஏற்ற வேதன உயர்வை வழங்குவதற்குப் பொருத்தமான நடவடிக்கைகளை நாம் மேற்கொள்ள வேண்டியது அவசிய மானதாகக் காணப்படுகின்றது. முன்பள்ளி களில் பணிபுரியும் 40 சதவீதமான ஆசிரியர்களே அங்கீகரிக்கப் பட்ட டிப்ளோமா பாடநெறியைப் பூர்த்தி செய்து இருக்கிறார்கள். ஏனைய 60 சதவீதமான ஆசிரியர்களுக்குப் போதியளவு பயிற்சிகளை வழங்கி முன்பள்ளித்துறையை ஊக்குவிப்பதன் ஊடாக நல்லதோர் எதிர்காலச் சந்ததியினரை - அறிவுள்ள சந்ததியினரை - உருவாக்கக்கக்கூடிய வாய்ப்பு ஏற்படும்.

எனவே, எதிர்வரும் வருடத்துக்கான வரவு செலவுத் திட்டத்தில் இது தொடர்பான விடயங்களை சம்பந்தப்பட்ட அமைச்சு உள்வாங்குவது சாலச் சிறந்ததாக இருக்கும். முல்லைத்தீவு, மன்னார், வவுனியா போன்ற மாவட் டங்களில் கிராமப் புறங்களில் காணப்படுகின்ற குறிப்பாக வறிய மக்கள் வாழுகின்ற பிரதேசங்களில் காணப்படுகின்ற அதிகமான முன்பள்ளிகள் அடிப்படை வசதிகள் அற்று மிகவும் மோசமான நிலையிலே காணப்படுகின்றன. அவற்றுக்கான அடிப்படை வசதிகளை ஏற்படுத்துவதற்குப் போதியளவு நிதியை வழங்கவேண்டிய தேவை இருக்கின்றது. இந்த முன்பள்ளிகளில் பொருத்தமான கட்டிட வசதிகள், மலசலகூட வசதிகள் மற்றும் பிள்ளை களுக்குத் தேவையான கதிரை, மேசைகளைச் செய்து கொடுக்கவேண்டிய தேவை இருக்கின்றது.

நாங்கள் கல்வித்துறையில் இரண்டு விடயங்களில் முக்கிய கவனத்தைச் செலுத்தவேண்டி இருக்கின்றது. முதலாவது, முன்பள்ளி. இரண்டாவது, தொழில்நுட்பக் கல்லூரிகள். தொழில்நுட்பக் கல்லூரிகளின் அவசியம் தற்போது உணரப்பட்டு இருக்கிறது. எமது புதிய கல்விச் சீர்திருத்தத்தில் தொழிற்கல்வியைப் பிரதான பாடமாக உட்புகுத்துவதன் ஊடாக, பாடசாலைகளில் இருந்து வெளியேறும் மாணவர்கள் ஏதேனும் ஒரு தொழிற் கல்வியைப் பெற்று, தமது வாழ்க்கையைச் சரியான முறையில் கொண்டுசெல்வதற்கும், இந்த நாட்டில் மனிதவள அபிவிருத்தியை ஏற்படுத்துவதற்கும் தொழில் நுட்பக் கல்லூரிகள் தேவையாக இருக்கின்றன. தொழில்நுட்பக் கல்லூரிகள் கூடுதலான டிப்ளோமா பாடநெறிகளைக் கொண்டவையாகக் காணப்படுகின்றன. அவற்றைப் பல்கலைக்கழகத் தரத்துக்கு உயர்த்தவேண்டிய தேவை இருக்கின்றது. குறிப்பாக, NVQ Level 7 வரைக்கும் செல்லக்கூடிய வகையில் பாடநெறிகளை மாற்றம் செய்து, தொழில்நுட்பக் கல்லூரிகளை பல்கலைக்கழகத் தரத்துக்கு உயர்த்துவதன் ஊடாக மனிதவள அபிவிருத்தியை மேற் கொள்ளக்கூடியதாக இருக்கும். வெளிநாடுகளில் தொழில் வாய்ப்பைப் பெற்றுக்கொள்வதற்கு தொழிற்றுறை சார்ந்த பட்டப்படிப்பு மிகவும் அவசியமானதாகக் காணப்படுகின்றது. அங்கு skilled workersக்குப் - தொழிற்றுறை சார்ந்து நிபுணத்துவம் பெற்றவர்களுக்குப் - பாரிய கேள்வி - demand - காணப்படுகின்றது. குறிப்பாக, வட மாகாணத்தில் இருக்கின்ற வவுனியா மற்றும் யாழ்ப்பாண தொழில்நுட்பக் கல்லூரிகளில் ஒன்றை பல்கலைக்கழகத் தரத்துக்கு உயர்த்தி, பாடநெறிகளில் மாற்றம் செய்து, அபிவிருத்தி செய்யவேண்டிய தேவை இருக்கின்றது. இதனூடாக மனிதவளம் மூலம் பெறக்கூடிய வருமானத்தை எங்களுடைய நாடு கூடுதலாக ஈட்டிக் கொள்ளக்கூடியதாக இருக்கும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
எனக்கு 15 விநாடிகள் தாருங்கள்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வியே மிகப்பெரிய சமத்துவத்தை உருவாக்கும் காரணி யாகும். நமது முன்பள்ளி முறையைச் சீரமைப்பதன்மூலம் நமது இளைய தலைமுறைக்கு வலுவான அறிவாற்றல் அடித்தளத்தை அமைக்கின்றோம். வட மாகாணத்தில் அதிநவீன தொழில் நுட்பப் பல்கலைக்கழகத்தை நிறுவுவதன் மூலம் இந்த செயற்கை நுண்ணறிவு யுகத்தில் நமது இளைஞர்கள் உலகளாவிய ரீதியில் போட்டியிடுவதற்கான கருவிகளை வழங்குகின்றோம். குறுகிய கால அரசியல் தீர்வுகளுக்கு அப்பால் சென்று, நமது நாட்டின் நீண்டகால மனித ஆற்றலில் முதலீடு செய்வோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.15]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ රටේ ඉතිහාසය දෙස බලන කොට, ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑම් එල්ල කරපු ව්‍යවස්ථා සංශෝධන ගණනාවක් අපි දැකලා තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමයේ බලතල විමධ්‍යගත කිරීමේ වුවමනාව තිබුණත්, යම් යම් අවස්ථාවලදී ඊට විරුද්ධව කටයුතු කළ අවස්ථා වාගේම, ස්වාධීන කොමිෂන් සභාවල බලය පිළිබඳව තිබුණු භයානක තත්ත්වයනුත් අපි මීට කලින් දැක තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක් යළි උදා වෙයි කියලා, විශේෂයෙන්ම අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ කාල සීමාවේදී එහෙම දෙයක් වෙයි කියලා අපි හීනෙකින්වත් හිතුවේ නැහැ. මොකද, පසුගිය කාල සීමාවලදී ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ කටයුතු සිදු වන

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

කොට අපත් එක්ක එකට අත්වැල් බැඳගෙන අපට හයියක් වුණු පුද්ගලයෙක් තමයි, අනුර කුමාර දිසානායක මැතිතුමා. එතුමා එදා විපක්ෂය පැත්තේ මාත් එක්ක මේ ළඟ ආසනයකයි සිටියේ. හැබැයි, මම දන්නේ නැහැ මේක ජනාධිපති පුටුවේ දෝෂයක්ද කියලා, ජනාධිපති පුටුවේ වාඩි වුණු ගමන්ම සිදු වන වෙනසක්ද කියලා. එදා හිටපු අනුර කුමාර දිසානායක නොවෙයි අද ඉන්නේ. එදා හිටපු අනුර කුමාර දිසානායක මීට වඩා සිය ගුණයක් හොඳයි. එතුමා එදා ජනතාව වෙනුවෙන් පෙනී සිටියා; ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ගැටලුවලට මුහුණ දුන්නා; ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කළා. මම දන්නේ නැහැ, අද ජනාධිපති අනුර කුමාර දිසානායකට මොකක් වෙලාද කියලා. එතුමා ඉස්සෙල්ලාම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එන්න කටයුතු කරලා තිබෙන්නේ මොකක් වෙනුවෙන්ද? මෙය කරන්නේ අධිකරණයේ කටයුතු වේගවත් කරන්නලු. මේගොල්ලෝ මේ වාගේ එක එක කථා කියනවා. නමුත්, එහෙම දෙයක් මේ කියන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු වෙනවාද? ඔබට ඉතා පැහැදිලි ඇති, ස්වාධීන අධිකරණය අද පැලවත්තට භාර කර ගන්නයි හදන්නේ කියන එක. පැලවත්තට ඕනෑ විධියට අධිකරණය මෙහෙයවන්න දරන උත්සාහයක් මේක.

එක්සත් ජාතීන්ගේ සංවිධානයත් අද මීට විරුද්ධව ප්‍රකාශයක් කරලා තිබෙනවා. ස්වාධීන ජාත්‍යන්තර සංවිධාන ගණනාවක් මීට විරුද්ධව ප්‍රකාශ නිකුත් කරලා තිබෙනවා. ගරුතර මහා නායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ ආගමික නායකයන් මීට විරුද්ධව කටයුතු කරනවා. ලංකාවේ දේශීය ස්වාධීන ආයතනවල, විශේෂයෙන්ම නීතිඥ සංගමය වාගේ සංවිධානවල ප්‍රකාශයන් සියල්ල අමතක කරලා, කුණු කූඩයට දමලා අද පැලවත්තට ඕනෑ විධියට අධිකරණය මෙහෙයවන්න යනවා. මොකක්ද, මේකට මෙච්චරටම තිබෙන තදියම? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා බලයට ආවේ, "ඉස්සෙල්ලාම අපි බලය විමධ්‍යගත කරනවා" කියලා උතුරට ගිහින් ද්‍රවිඩ ජනතාව රවට්ටලායි; ඒ වාගේම නැඟෙනහිරට ගිහින් මුස්ලිම් ජනතාව රවට්ටලායි. මේගොල්ලෝ ඉස්සෙල්ලාම කරනවා කිව්වේ මොකක්ද? පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලායි කිව්වේ. මෙච්චර තදියමක් තිබෙනවා නම් පළාත් සභා මැතිවරණය පවත්වන්න අවශ්‍ය නීතිමය වෙනස්කම් සිදු කරන්නකෝ. නමුත්, එහෙම දෙයක් කරන්නේ නැහැ. මහා ලොකුවට කථා කරලා ඩයස්පෝරාවත් රැවැට්ටුවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා, නීති වෙනස් කරලා අත්‍යවශ්‍ය දෙයක් කරන්න ඕනෑ නම් ඉස්සෙල්ලාම පවත්වන්න පළාත් සභා මැතිවරණය. දැන් අවුරුදු 2ක් ගත වෙලාත් පළාත් සභා මැතිවරණය ගැන එක වචනයක්වත් කථා කරන්නේ නැහැ. තනිකර බොරුවක් කරන්නේ, බොරුවට පාර්ලිමේන්තු කමිටු පත් කරලා. ඒ එක කමිටුවක මමත් ඉන්නවා. එය පත් කරලා මාස ගණනක් ගත වෙලාත් දෙවතාවයිද කොහේදෝ රැස් වෙලා තිබෙන්නේ. ඉතින් වැඩක් තිබෙනවාද? මේ කමිටු දමන්නේ ඡන්දය නොපවත්වන්න. කමිටු දමලා ඡන්දය නොපවත්වන්න එක එක ගේම් ගහනවා. ඇයි එහෙම කරන්නේ?

අපි අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කරනවා. අධිකරණයේ ස්වාධීනත්වයත් එක්ක තමයි අපේ රටේ reputation එක තිබෙන්නේ. ආයෝජකයන් මේ රටට එන්නේ එතකොටයි. නැත්නම් ජාත්‍යන්තර වශයෙන් යම් යම් බලපෑම් ඇති වෙන්න පුළුවන්, සම්බාධක පැනවෙන්න වෙන්න පුළුවන්. එහෙම වෙලා තිබෙනවා. එදා රාජපක්ෂ යුගයේදී එහෙම වුණා. අපට තමයි සිද්ධ වුණේ යහපාලන කාලයේදී ඒක නිවැරදි කරන්න. GSP plus සහනය අපට නැති වුණා. ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුතු සිදු වෙනකොට ජාත්‍යන්තර වශයෙන් බලපෑම් එන එක නතර කරන්න බැහැ. ඒ වාගේ අවස්ථා එන්න පුළුවන්. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයත් මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙනවා. අපි ඒ ජාත්‍යන්තර Missions එක්ක කථා කරනකොට තේරෙනවා, ඒ අයට මේ පිළිබඳව තිබෙන්නේ ඉතාම සෘණාත්මක දැක්මක් බව. එහෙම තිබෙද්දීත් ඇයි මේ විධියට වුවමනාවෙන් අපේ රට විනාශ කරන්න හදන්නේ? ඇයි ඒ මට්ටමට යන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙලාවේ විශේෂ ඉල්ලීමක් කරනවා, අධිකරණයෙන්. අධිකරණය කෙරෙහි තිබෙන ලොකු විශ්වාසය පලුදු කර ගන්න නම් එපා කියලා අපි විනිශ්චයකාරතුමන්ලාගෙන් ඉතාම බැඟෑපත්ව ඉල්ලීමක් කරනවා. මොකද, අද විනිශ්චයකාරතුමන්ලාගේත් මුහුණේ දැලි ගාන්න පටන් අරගෙන තිබෙනවා මේ ආණ්ඩුව. මොකද, විනිශ්චයකාරතුමන්ලාට විරුද්ධවත් යම් යම් ප්‍රකාශ කරනවා.

ඉතාම කනගාටුයි, එහෙම වෙන්න සුදුසු නැහැ. අපේ රටේ ගෞරවනීය විනිශ්චයකාර මඩුල්ලක් ඉන්නවා. මේකෙන් ඒ අයත් අමාරුවේ දමන දෙයක් වෙන්නේ. ඒ නිසාම තමයි අපේ පක්ෂයෙන්, සමගි ජන බලවේගයෙන් ඊට විරුද්ධව පෙත්සමක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. දේශපාලන පක්ෂ ගණනාවක් වාගේම ස්වාධීන සංවිධාන ගණනාවක් මීට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා මේක විභාග කරන්න full Bench එකක් දාන්න කියලා. තමන්ගේ නඩුව තමන් අහන සම්ප්‍රදායයක් නැහැ. "නඩුත් හාමුදුරුවන්ගේ - බඩුත් හාමුදුරුවන්ගේ" කියන ඒ සම්ප්‍රදාය ඇති නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. අපි ඉල්ලීමක් කරනවා මේකට ජනමත විචාරණයක් අවශ්‍යමයි කියලා. මොකද, මේ විධියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදු වෙනකොට අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් සහ ජනමත විචාරණයකින් එය සම්මත විය යුතුමයි. ඒ සඳහා අවශ්‍ය විධිවිධාන, අවශ්‍ය තීන්දු තීරණ ගන්න කියන එක ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන පුද්ගලයකු හැටියට මගේත්, ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සමාජයේත් එකම ඉල්ලීමයි.

අපි මේ ස්වාධීන ආයතන ආරක්ෂා කරන්න ඕනෑ. අධිකරණ ක්‍රියාවලියේ ගැටලුවක් තිබෙනවා. ඒ කටයුතු වේගවත් කළ යුතුමයි. අපට ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. නමුත් ඒ මුවාවෙන් අධිකරණයේ ස්වාධීනත්වයට හානියක් ගෙන දෙනවා නම්, ඒ මුවාවෙන් අධිකරණයට යම් බලපෑම් කරනවා නම් ඒවා නොවිය යුතුයි. මොකද, මේ පිළිබඳව කථා කරනකොට කියනවා, "ඒ නඩු තිබෙන අය, ඒ ඇප පිට ඉන්න අය" තමයි ඒ කථා කරන්නේ කියලා. එහෙම නම් අපි අහනවා, මහානායක ස්වාමීන් වහන්සේලාට නඩු තිබෙනවාද, ඇප පිටද ඉන්නේ? නීතිඥ සංගමයේ රජීව් අමරසූරිය මහත්තයා ඇප පිටද ඉන්නේ? එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඒ නිලධාරීන්ට නඩු තිබෙනවාද, ඇප පිටද ඉන්නේ? එහෙම නැහැ. ඒ නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින අයගේ අදහසට ඇහුම්කන් දෙන්න. ඔච්චර උද්ධච්ච වෙන්න එපා, ඔච්චර ආඩම්බර වෙන්න එපා. මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට ඉදිරියට යන්න නම් ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් කරන්න අවශ්‍යයි. එහෙම නම් ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඔබතුමන්ලා හැකි ඉක්මනින් පළාත් සභා මැතිවරණය පවත්වන්න. හැකි ඉක්මනින් පළාත් සභා මැතිවරණය පවත්වන්න. ඒක නේ වෙන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කටයුතු කරනවා නම්, ඒ වෙනුවෙන් පෙනී සිටිනවා නම් පළාත් සභා මැතිවරණය පවත්වන්න. එදා උතුරට ගිහිල්ලා, නැඟෙනහිරට ගිහිල්ලා කිව්වේ මොකක්ද? බලය විමධ්‍යගත කිරීම පිළිබඳව කථා කරන සියලුදෙනා බලාපොරොත්තු වෙන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය ශක්තිමත් කිරීමේ ප්‍රධානම මාර්ගයක් තමයි මැතිවරණ පැවැත්වීම. ඒ නිසා පළාත් සභා මැතිවරණය පවත්වන්න තමුන්නාන්සේලා

කටයුතු කරන්න. හැබැයි ඒකට  කිසිම තදියමක් නැහැ. පළාත් සභා මැතිවරණය තියන්නවත්, තමුන්නාන්සේලා පොරොන්දු වෙච්ච පරිදි විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන්නවත්, මිල සූත්‍රය අහෝසි කරන්නවත් නොවෙයි තමුන්නාන්සේලාට වුවමනාව තිබෙන්නේ අධිකරණය පැලවත්තකරණය කරන්නයි. ඒකටයි තමුන්නාන්සේලා දඟලන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.24]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද  විවාදයට ගැනෙන්නේ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත මඟින් පිහිටවපු ශ්‍රම වාසනා අරමුදල ඈවර කිරීම, එහෙම නැත්නම් විසුරුවා හැරීම පිළිබඳවයි. අපේ ආණ්ඩුවේ මූල්‍ය පතිපත්තිය අනුව, මූල්‍ය කළමනාකරණය අනුව පසුගිය දවස්වල ජනාධිපතිතුමා විවිධ ආයතනවල තිබෙන අරමුදල් පිළිබඳව තීන්දු ගන්න Cabinet Papers දාලා, කමිටුවක් පත් කරලා අදාළ තීන්දු ගත්තා. ඒකේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හරින්න තීරණය කළේ.

හැබැයි, මේ ශ්‍රම වාසනා අරමුදල පිහිටුවද්දී අරමුණු 7ක් තිබුණා. ඒ අරමුණු ගැන අපේ ඇමතිතුමාත්, අනෙකුත් මැති ඇමතිවරුත් කථා කළා. නමුත් ඒ කිසිදු අරමුණක් වෙනුවෙන් නොවෙයි මේ ශ්‍රම වාසනා අරමුදල පසුගිය කාලයේ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

මම ඒකට උදාහරණ දෙකක් විතරක් කියන්නම්. 2019දී මේ ශ්‍රම වාසනා අරමුදලින් රුපියල් මිලියන 32ක් වියදම් කරලා තිබෙනවා,  බෑග් ලබා දීම සඳහා. අපි ඒක වැරැදියි කියන්නේ නැහැ. නමුත්, මේ අරමුණ අනුව නොවෙයි ඒක ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. එයින් සියයට 50ක්, ඒ කියන්නේ රුපියල් මිලියන 16ක් වියදම් කරලා තිබෙනවා, පරිපාලන සහ ප්‍රවර්ධන වියදම් කියලා. ඒ අතරේ තිබෙනවා, 2019.09.02වැනි දා "Being payment for mobile service" කියලා රුපියල් 1,92,625ක්. 2019.09.30වැනි දා "Transport cost" කියලා රුපියල් 1,348,279ක් තිබෙනවා. ඒ වාගේම, 11වැනි මාසයේ 30වැනි දා transport cost එක රුපියල් 3,443,668යි. Transport cost කියලා තමයි දාලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, 2024දී හිටපු ඇමති, මනූෂ නානායක්කාර - මට මතක විධියට 2019දී ඇමතිවරයා විධියට හිටියේ රවීන්ද්‍ර සමරවීර - "Glocal Fair" කියලා රට වටා වැඩසටහනක් කළා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 75ක් වියදම් කළා. ඒකෙන් රුපියල් මිලියන 17ක් පරිපාලන වියදම්. මෙහෙම තමයි මේ ශ්‍රම වාසනා අරමුදල පාවිච්චි කළේ. ඒ නිසා ඒ අරමුදල ඈවර කරලා, විසුරුවා හැරලා ඒ අරමුදලින් ප්‍රතිලාභ බලාපොරොත්තු වෙන අයට අරමුණු හතරක් ඔස්සේ ප්‍රතිලාභ ලබා දීමට අපි කම්කරු අමාත්‍යාංශය ලෙස කටයුතු කරන්න සූදානම් වෙලා ඉන්නවා.

විශේෂයෙන්ම වෘත්තීය අනතුරුවලින් මිය ගිය හෝ සියයට 60කට වැඩි පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වෙච්ච අයගේ දූ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා ශිෂ්‍යත්ව ලබාදීමට අපි කටයුතු කරනවා. ඒක මේ අරමුදලේ අරමුණුවලින් එකක්. ඒ විතරක් නොවෙයි. සේවා නියුක්තිකයන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ කාර්මික ආරාවුලක් සම්බන්ධ  නඩු කටයුතුවලදී වන්දි කොමසාරිස් ඉදිරියේ විභාග වන නඩු සඳහා මූල්‍ය සහන ලබා දෙන්න, පූර්ව දැනුම්දීමකින් තොරව වහලා දමන කර්මාන්තශාලා හා ආයතනවල සේවා නියුක්තිකයන් සඳහා කෙටි කාලීන මූල්‍ය සහන ලබාදීම සහ වෘත්තීය අනතුරු සඳහා ප්‍රතිලාභ ලබා දීම කියන ඒ අරමුණු වෙනුවෙන් මේ අරමුදල ඉදිරියේදී භාවිත කරන්න කම්කරු අමාත්‍යාංශය ලෙස අපි සූදානම් වෙලා ඉන්නවා. පසුගිය කාලයක් තිස්සේ අපේ රටේ විවිධ අරමුදල්වලට අත් වෙච්ච සන්තෑසිය ගැන මේ රටේ ජනතාවට අත් දැකීමක් තිබෙනවා. ඒ සන්තෑසියම තමයි, මේ ශ්‍රම වාසනා අරමුදලටත් අත් වුණේ. ඒ නිසා තමයි අපි තීරණය කරලා තිබෙන්නේ, මෙය ඈවර කරලා එහි කටයුතු කම්කරු අමාත්‍යාංශය මඟින් පවත්වා ගෙන යන්න.

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේදීත් විවිධ කරුණු ගණනාවක් සම්බන්ධයෙන්  කරුණු මතු වුණා. මම දැක්කා, ඊයේ රනිල් වික්‍රමසිංහ කණ්ඩායමක් එකතු කරලා රට ගැන අනාවැකි කියනවා. ඔය රනිල් වික්‍රමසිංහලා තමයි මේ රට මේ තත්ත්වයට ඇද දමන්න එක පැත්තකින් කටයුතු කළේ. මේ රටේ ජනතාවට අමතක නැහැ, ඒ රනිල් වික්‍රමසිංහ තමයි කිව්වේ රට හදන්න 2048 වෙනකම් ඉන්න ඕනෑ කියලා. දැන් ඒ රනිල් වික්‍රමසිංහ කියනවා, 2028 වෙනකොට රට නැවත බංකොලොත් වෙනවාලු. බිල්ලෝ මවනවා. අපට මතකයි, මැතිවරණයට කලිනුත් මේ ජාතියේ බිල්ලෝ මැව්වා. ඒ නිසා අපි රටේ ජනතාවට කියනවා, රනිල්ගේ උපදෙස් අපට ඕනෑ නැහැ, රනිල්ගේ අවවාද අනුශාසනා අපට ඕනෑ නැහැ. රනිල් පෙන්වන බිල්ලන්ට මේ රටේ ජනතාව යළි රැවටෙන්නේත් නැහැ කියලා අපි අවධාරණය කරන්න ඕනෑ.

1956න් පස්සේ අවම අය වැය පරතරයක් තිබුණු වසර තමයි 2025 වසර; මාලිමාව ආණ්ඩුවේ වසර. සියයට 0.8ක් වෙච්ච 1956 වර්ෂයේ අය වැය පරතරය, සියයට 2.4ක තත්ත්වයේ තියා ගන්න පසුගිය වසරේ අපි සමත් වුණා. ඒ විතරක් නොවෙයි, ගිය වසර ආර්ථික වශයෙන් විවිධ පැතිවලින් රට ඉහළට ඔසවපු වසරක්. වැඩිම සංචාරක පැමිණීම, වැඩිම සංචාරක ආදායම, වැඩිම විදෙස් ප්‍රේෂණ ලැබීම්  වාර්තා වෙනවා. ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට අපේක්ෂිත ආදායමට වඩා බදු ආදායම ඉහළ දමා ගත්ත වසරක්. රුපියල් බිලියන 4,900 වෙනුවට බිලියන 5,200ක බදු ආදායම් ලබපු වසරක්. මේ වසරේ මුල් මාස හයට විතරක් රුපියල් බිලියන 3,000කට ආසන්න බදු ආදායම් ලබලා තිබෙනවා. ඒ නිසා රනිල්, ඔයා කියන විධියට නොවෙයි රට ගමන් කරමින් තිබෙන්නේ, ඊට වඩා වෙනස් තැනකට. මේ රටේ ආර්ථිකය අස්ථාවර වෙලා තිබුණා. බංකොලොත් කරලා තිබුණු රට ක්‍රමානුකූලව අද ඉහළට එසවෙමින් තිබෙනවා.

ඒ ගැන කලබල වෙච්ච අය විවිධ බිල්ලෝ මවමින්, රටේ ජනතාවට බිල්ලෝ මවන්න සූදානමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මීට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාත්, ඊට කලින් කථා කරපු බොහෝ දෙනෙකුත් අධිකරණයේ ස්වාධීනත්වය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළා. කවුද මේ? කවුද මේ? පසුගිය කාලය තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදය වළ දමන්න රාජපක්ෂලා ඇතුළු කණ්ඩායම කටයුතු කරනකොට නිහඬව හිටපු, ඇඳන් යට හිටපු මහත්වරු. මහ බැංකු වංචාව වෙනකොට, මහ බැංකු වංචාවක්

[ගරු මහින්ද ජයසිංහ මහතා]

සිද්ධ වුණේ නැහැ කියලා, "නැත්ත වෙනුවට ඇත්ත" කියලා පොත් ලියපු මහත්වරු - කර්තෘවරු -, වංචාවලට උඩ ගෙඩි දීපු, ඒ විධියට වංචා වෙන්න දීපු මහත්වරු අද රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්න එනවා. මීට කලින් කථා කරපු මහත්මයා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමත් එක්ක දුරකථන ඇමතුම් 64ක් අරගෙන තිබෙනවා. දුරකථන ඇමතුම් 64ක්! මොනවාටද? බැඳුම්කර වංචාවට සම්බන්ධ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමත් එක්ක ඒ විධියට කථා කරපු අය තමයි අද මේ විධියට බිල්ලෝ මවන්නේ.

ඒ විතරක් නොවෙයි. අධිකරණය දැන් මළගමක් වෙනවා කියලා කියනවා. ඡන්දයට කලිනුත් එහෙම තමයි කිව්වේ. ඡන්දයට කලින් මොනවාද නොකිව්වේ? රට ලේ විලක් වෙනවාය කිව්වා; මාලිමා ආණ්ඩුවකට බලය ගියොත් රට ලේ විලක් වෙනවාය කිව්වා. හැබැයි මතක තියාගන්න, මැතිවරණ තුනක් තිබුණා. විරුද්ධ පාක්ෂිකයින්ගේ හිත් රිදවන්න එක රතිඤ්ඤා කරලක් පත්තු කරපු නැති මැතිවරණ තුනක් ඒ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, ඉතිහාසයේ පැවැත් වූ ප්‍රජාතන්ත්‍රවාදීම මැතිවරණ තුන. ඒ විතරක් නොවෙයි. මැතිවරණවලින් පස්සේ කිසිදු පාක්ෂිකයෙකුට - විරුද්ධ පාක්ෂිකයෙකුට - හානියක් නොකරපු මැතිවරණ තුනක්, ඒ.

තව මොනවාද මෙතුමන්ලා නොකිව්වේ? මේක අවසන් පොහොය කිව්වා. ආයේ පන්සල්වලට දානේ නැහැ කිව්වා. පෙරහැර යන්න වෙන්නේ නැහැ කිව්වා. හැබැයි, අවුරුදු 16කට පස්සේ දළදා ප්‍රදර්ශනයක් පැවැත්වුවා, අපේ ආණ්ඩුවෙන්. වියට්නාමයේ පඤ්ඤාකර ස්වාමීන් වහන්සේ වැඩම කරවලා ජාත්‍යන්තර සාම පාගමනක් පැවැත්වුවා. ගංගාරාමයේ ධාතු ප්‍රදර්ශනයක් පැවැත්වුවා. මේ ආණ්ඩුව එහෙමයි කටයුතු කළේ. හැබැයි, මේ ආණ්ඩුව බලයට එන්න කලින් මොනවාද කිව්වේ? මේ විධියටම බිල්ලෝ මැව්වා. අද අධිකරණයේ මළගම ගැන කථා කරන මහත්වරු - රනිල්ලා, සජිත්ලා, නාමල්ලා කට්ටියම - එදා මේ ජාතියේම බිල්ලෝ මැව්වා. අද වනකොට ඒ සියල්ල බොරු බවට පත් වෙලා තිබෙනවා. IMF එක රට අත හැරලා යයි කිව්වා. "L" බෝඩ්කාරයෝ ටිකක් තමයි එන්නේ, පුරුදු නැහැ, දන්නේ නැහැ, වැඩ බැහැ කිව්වා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ආර්ථිකය ස්ථාවර වෙලා හැම දර්ශකයක්ම ඉදිරියට යමින් තිබෙනවා. ජාත්‍යන්තර සහයෝගය නැති වෙයි කිව්වා. අද වනකොට මුළුමහත් ජාත්‍යන්තරයම මේ ආණ්ඩුවට සහයෝගය දෙනවා. ඒ විතරක් නොවෙයි, ජාත්‍යන්තර දර්ශක හැම එකකින්ම මේ ආණ්ඩුව ඉහළට එසවිලා තිබෙනවා. ණය ශ්‍රේණිගත කිරීම්වලින් ඉහළට එසවිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගෝලීය සාම දර්ශකයේ ස්ථාන 30කින් අප ඉහළට ඇවිල්ලා තිබෙනවා. ගෝලීය දූෂණ සංජානන දර්ශකයේ අදූෂිත රටවල් අතර ස්ථාන 14කින් අපේ රට ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ විධියට හැම පැත්තකින්ම ඉදිරියට එන රටක් බවට අද වනකොට මේ රට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තව තවත් බිල්ලෝ මවන්න. නමුත් වර්තමාන මාලිමා ආණ්ඩුව රට කොහේටද ගෙනියන්නේ කියන එක ගැන මේ රටේ ජනතාව දන්නවා.

අද විවාදයේදී මෙතුමන්ලා කිව්වේ මොනවාද? ඩී.වී. චානක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමා කිව්වා, ත්‍රස්තවාදියෝ පිරිසක් ආණ්ඩු කරනවා කියලා. ඩී.වී. චානක මන්ත්‍රීතුමා, මතක තියාගන්න. ඔයගොල්ලෝ ගහපු සියලු මඩ, අවලාද සියල්ල පැත්තකට දාලා මේ රටේ ජනතාව අවස්ථා තුනකදී මාලිමා ආණ්ඩුවට බලය දීලා තිබෙනවා. ත්‍රස්තවාදියෝ කවුද කියලා කථා කරන්න ඕනෑ නම්, විපක්ෂයෙන් සතියක හරි විවාදයක් ඉල්ලන්න. අපි ලැහැස්තියි, විවාද කරන්න. කුඩාවැල්ල ජයවික්‍රම විද්‍යාලයේ ගෘහවිද්‍යාගාරයේ වීදුරු ජනේලයක් ළඟ ඉඳගෙන, සාරියක් පොරවා ගෙන ඔළුව වනපු කට්ටිය ගැන කියන්න අපි ලැහැස්තියි, ඩී.වී. චානක මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ තාත්තා, ඩී.වී. උපුල් තමයි ඔළුව වැනුවේ. ඒවා ගැන කියා දෙන්න, කථා කරන්න අපි ලැහැස්තියි. ඒ විතරක් නොවෙයි. මට මතක විධියට 2018 වාගේ කාලයේ උනාකුරුවේදී, ඩී.වී. උපුල්ගේ බස් එක කපාගෙන යනවා කියලා SLTB එකේ driver මහත්මයෙකුගේ ඔළුව පැළුවා. ඒ විතරක් නොවෙයි. එතුමාට වඩා වැඩි මිලට මාළු ගන්නවා කියලා මාළු ගන්න ආපු මාළු ව්‍යාපාරිකයින්ට මාතරදී, ගාල්ලේදී මොනවාද කළේ? ඔවුන්ගේ සහචරයෝ දාලා ගහලා එළෙව්වා. අපි ඕනෑ නම් කියලා දෙන්නම්. ඒ විතරක් නොවෙයි. ඔබතුමාගේ වර්තමාන නායක නාමල් රාජපක්ෂගේ තාත්තා; මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ කීර්තිමත් නීතිඥයෙක් වුණු, මේ රටේ ප්‍රගතිශීලී ජනතාව වෙනුවෙන් පෙනී හිටපු විජේදාස ලියනාරච්චි පාවා දීපු හැටි, ඔහුව ඝාතනය කරන්න මැදිහත් වෙච්ච හැටි, තොරතුරු දීපු හැටි ඕනෑ නම් අපි කියලා දෙන්නම්. අපි ඒවා ගැන කථා කරමු. ඒවා ගැන නම් කථා කරන්න එන්නේ, මහත්වරුනි, අපි ලැහැස්තියි. මේ පාර්ලිමේන්තුවේ සතියක් නොවෙයි මාසයක් විවාද කරන්න අපි ලැහැස්තියි. ත්‍රස්තවාදියෝ කවුද කියලා කියලා දෙන්න අපි ලැහැස්තියි.

ඒ විතරක් නොවෙයි. එහා පැත්තේ හිටපු සමහර මහත්වරුත් අපි ගැන කියනවා, අපි දැක්කා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, වර්තමානයේ ඔබතුමාගේ නායකයා වන සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා මේ රටට ආදරය කරපු, මේ රටට ප්‍රේම කරපු තරුණ තරුණියෝ 60,000ක් මැරුවා කියන එකත් මතක තියා ගන්න. ඔවුන්ව මරපු විධිය ගැන අපි කථා කරමු, විවාද කරමු. අපි ලැහැස්තියි, එවැනි විවාදයකට. ඒ නිසා, අපෙන් ඒ ගැන අහගන්න එපා. ඕනෑ නම් තව ගොඩක් දේවල් කියලා දෙන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද කාලය සීමිතයි. ඔබතුමාට තව තත්පර 30ක් විතර දෙන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි.

ආණ්ඩුවක් විධියට අපි ඉතාම පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. අපි දන්නවා, ඔයගොල්ලන් උත්සාහ කරනවා කියලා, විවිධ වංචා, දූෂණ චෝදනාවලට අපට ලේබල් ගහලා අපිත් ඔයගොල්ලන් වාගේ පිරිසක් කියලා කියන්න. නැහැ, වැරැදිච්ච තැන එතැන තමයි. මම මීට කලිනුත් කියලා තිබෙනවා, මේ ආණ්ඩුවේ 159දෙනා අතරේ කිසිදු වංචනිකයෙක්, දූෂිතයෙක් නැහැ කියලා. එහෙම හිටියොත් ඔයගොල්ලන් තීන්දු තීරණ ගන්න කලින් අපි ඒගොල්ලන් ගැන තීන්දු තීරණ ගන්න

පැකිළෙන්නේත් නැහැ කියලා අපි අවධාරණය කරනවා. අපි එහෙම ආණ්ඩුවක්. දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි මේ රටේ ජනතාවගේ ජනතා අභිලාෂයන් ඉටු කිරීම වෙනුවෙන් මැදිහත්වෙන, ඒ වෙනුවෙන් කටයුතු කරන ආණ්ඩුවක්. විශේෂයෙන් පසුගිය කාලයේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම ඉක්මනින් අවසන් කරනවා.

පසුගිය කාලයේ ශානිට, රවිට බය වුණා. රංගට බය වුණා. දැන් අලුතින් බය වෙලා තිබෙනවා, සුරසේනට. නිලධාරීන්ගේ නම් කිය කියා, නීතිඥවරුන්ගේ නම් කිය කියා, ඒ වාගේම විනිශ්චයකාරවරුන්ගේ නම් කිය කියා ඒගොල්ලන්ගේ බය තමයි පෙන්වමින් තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමන්ලා මොන දඟමිගැට ගැහුවත් අපි මේ රටේ ජනතාව වෙනුවෙන්, ජනතා අභිලාෂයන් ඉටු කිරීම වෙනුවෙන් පෙරට යනවා කියන කාරණය අවධාරණය කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.38]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டின் 15ஆம் இலக்கச் சட்டத்தால் திருத்தப் பட்ட,1998ஆம் ஆண்டின் 12ஆம் இலக்க, சிரம வாசனா நிதியச் சட்டத்தின் பிரகாரம் நிறுவப்பட்ட சிரம வாசனா நிதியத்தை 1971ஆம் ஆண்டின் 38ஆம் இலக்க, நிதிச் சட்டத்தின் 19ஆம் பிரிவின்கீழ் கலைத்து விடுவதற்காக எடுத்திருக்கும் தீர்மானம் மீதான இன்றைய விவாதம் தொடர்பில் உரையாற்றுவதற்கு முன்னர், சில விடயங்களை இந்தப் பாராளுமன்றத்தில் முன்வைக்கலாமென நினைக்கின் றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தங்களை மலையக மக்களின் தலைவர்களாகக் காட்டிக் கொண்டு இருக்கும் எதிர்க்கட்சியிலுள்ள சில உறுப்பினர்கள் தோட்ட வாரியாகச் சென்று அம்மக்களது பிரச்சினைகள் தொடர்பாகப் பேசிக்கொண்டிருப்பதை நாங்கள் கண்கூடாகக் காண்கின்றோம். 'தித்வா' அனர்த்தம் ஏற்பட்டு ஒரு வருடமாகின்ற இந்தக் காலப்பகுதியில், அவர்கள் தோட்ட வாரியாகச் சென்று மலையக மக்களுடைய வீட்டுப் பிரச்சினை யைத் தீர்க்கவில்லை என்று மக்களிடம் கூறிக்கொண்டு இருக்கின்றார்கள். இயற்கை அனர்த்தம் ஏற்படும் ஒவ்வொரு முறையும் இந்தத் தலைவர்கள் பாராளுமன்றத்துக்கு வந்து கூச்சலிடுவதைப் போன்று, இப்பொழுது தோட்டப் புறங்களுக்குச் சென்று மக்களை உசுப்பேற்றிக்கொண்டு இருக்கின்றார்கள்.

மலையக மக்களுக்கு வீடு இல்லை, காணி இல்லை என்றும் இயற்கை அனர்த்தங்களின்போது அல்லது மலையக மக்களுக்குப் பிரச்சினைகள் ஏற்படும்போது எமது அரசாங்கம் அம்மக்களைக் கவனிப்பதில்லை என்றும் மக்கள் மத்தியில் கூறிக்கொண்டு இருக்கிறார்கள். மேலும், இவர்கள் சமூக வலைத்தளங்கள் மற்றும் ஊடகங்கள் ஊடாக "அநுர அரசாங்கமானது மலையக மக்களை ஒதுக்கி வைத்துவிட்டு, ஏனைய மக்களுக்குச் சேவை செய்துகொண்டு இருக்கின்றது" என்ற செய்தியைப் பரப்பிக்கொண்டு இருக்கின்றார்கள். இவர்களுக்கு நாங்கள் ஒன்றைக் கூற விரும்புகின்றோம். அநுர அரசாங்கம் 2024ஆம் ஆண்டு இந்த நாட்டில் ஆட்சிபீடம் ஏறியது, மக்கள் பிரிவினருக்குத் தனித்தனியாக சேவை செய்வதற்கு அல்ல; தனித்தனியாக இனங்களைப் பார்த்து, மதங்களைப் பார்த்து, குலங்களைப் பார்த்து சலுகைகள் வழங்குவதற்கு அல்ல. இந்த நாட்டில் வாழும் சிங்கள, தமிழ், முஸ்லிம் மக்களாக இருக்கலாம், மலையக மக்களாக இருக்கலாம், வட, கிழக்கில் வாழும் மக்களாக இருக்கலாம், தென் பகுதியில் வாழும் மக்களாக இருக்கலாம், சகல மக்களுக்கும் உரிமைகளைப் பெற்றுக்கொடுக்கக்கூடிய வகையிலான ஓர் ஆட்சிதான் 2024ஆம் ஆண்டு இந்த நாட்டில் நிறுவப்பட்டது. அதனால் நான் இந்தத் தலைவர்களுக்கு ஒரு விடயத்தைக் கூறிக்கொள்கின்றேன். நீங்கள் இயற்கை அனர்த்தத்தைப் பயன்படுத்தி உங்களது அரசியல் வளர்ச்சியைப் பெற்றுக்கொள்வதாக இருந்தால், அது உங்களது விருப்பம்! மலையக மக்களின் பிரச்சினைகளை எடுத்துக்காட்டுவதன்மூலம் அம்மக்களது வாக்குகளைப் பெறமுடியுமென நீங்கள் நினைப்பீர்களேயானால், sorry. ஏனெனில், இப்போது மலையக மக்கள் உண்மையிலேயே எமது அரசாங்கத்தோடும் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களோடும்தான் இருக்கிறார்கள்.

இந்த நாட்டில் வாழும் சகல மக்களையும் சமமாகவும் ஒரே பார்வையிலும் பார்ப்பதனால்தான் எமது அரசாங்கம் 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் அரச மற்றும் தனியார்துறை ஊழியர்களின் சம்பளத்தை அதிகரித்தது போன்று தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தையும் அதிகரித்தது. அதாவது, அவர்களின் கையில் மாதத்துக்கு 10,000 ரூபாய் கிடைக்கும் வகையில், நாட்சம்பளத்தை 400 ரூபாயால் உயர்த்தியது.

மலையக மக்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கு எமது அரசாங்கம் எவ்வகையான தீர்மானங்களை எடுத்து அபிவிருத்தி வேலைகளை மேற்கொண்டுள்ளது என்பதை தேவை என்றால் மலையக மக்கள் வாழும் சகல பிரதேசங்களுக்கும் சென்று பாருங்கள்! கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கூறியதுபோல், மூன்றரை வருட காலமாக தொழிற்சாலையொன்றில் தங்கியிருந்த 54 குடும்பங்களுக்கு வீடுகளை அமைத்து, அவற்றை அம்மக்களிடம் கையளிக்கும் நிகழ்வு இம்மாதம் 28ஆம் திகதி பண்டாரவளை - பூனாகலைப்

[ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය]

பிரதேசத்தில் இடம்பெறவிருக்கிறது. நீங்கள் அங்கு வந்தீர்கள் என்றால், தேசிய மக்கள் சக்தி - NPP - அரசாங்கம் இந்த நாட்டு மக்களின் பிரச்சினைகளை எவ்வாறு தீர்க்கின்றது என்பதைக் கண்கூடாகப் பார்க்க முடியும். இப்படியான வேலைகளை எமது அரசாங்கம் செய்துகொண்டு இருக்கும்பொழுது, அரசியல் இலாபம் கருதியும் தமது தொழிற்சங்கத் தேவைகளை நிறைவேற்றிக்கொள்வதற்காகவும் மலையகத்தில் இருக்கும் சில தலைவர்களும் தொழிற்சங்கத் தலைவர்களும் மலையக மக்களை வெவ்வேறு வழிகளில் திசைதிருப்பிக்கொண்டு இருக்கின்றார்கள்.

மலையக மக்களது வீட்டுப் பிரச்சினையாக இருக்கலாம், காணிப் பிரச்சினையாக இருக்கலாம், கல்விப் பிரச்சினையாக இருக்கலாம், இயற்கை அனர்த்தத்தால் பாதிக்கப்பட்ட வீடில்லாத மக்களின் பிரச்சினைகளாக இருக்கலாம், இந்த அனைத்துப் பிரச்சினைகளுக்கும் நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுக்கக்கூடிய வேலைத்திட்டத்தை நாங்கள் இப்பொழுது செய்துகொண்டு இருக்கின்றோம் என்பதை மிகத் தெளிவாகக் கூறுகின்றோம். எனவே, இப்பிரச்சினைகள் தொடர்பில் அவதிப்படவேண்டிய அவசியமில்லை. மேற்குறித்த பிரச்சினைகளைக் கூறிக்கூறி உங்களது அரசியலைச் செய்ய வேண்டும் என்றால், அவ்வாறு செய்யுங்கள்! அதில் எங்களுக்குப் பிரச்சினை இல்லை. எதிர்காலத்தில் மலையக மக்கள் சரியான பதிலை உங்களுக்குப் பெற்றுத் தருவார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேசிய லொத்தர் சபையின்கீழ் இயங்கும் சிரம வாசனா நிதியமானது உண்மையிலேயே யாருக்காக செயற்படுத்த வேண்டுமென்பது எங்கள் அனைவருக்கும் தெரிந்த விடயமாகும். முக்கியமாக, ஊழியர் சேமலாப நிதியம், ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியம் என்பன ஏழைத் தொழிலாளர்களுக்குச் சேவை செய்வதற்காகவும் சில குறிக்கோள்களை நிறைவேற்றுவதற் காகவுமே உருவாக்கப்பட்டன. ஆனால், கடந்த காலங்களில் சிரம வாசனா நிதியத்துக்குப் பொறுப்புக்கூற ஒரு நிறுவனம் இருக்கவில்லை. அதனால்தான் இந்த நிதியம் தொழில் அமைச்சின்கீழ் கொண்டுவரப்பட்டது. இந்த நிதியத்தின்மூலம் இன்றுவரை மக்களுக்கு எவ்வகையான சேவைகள் வழங்கப்பட்டதோ, அதைவிட அதிகமான சேவைகளைப் பெற்றுக்கொடுப்பதே எமது நோக்கமாகும். அதனால்தான் 8 பேரைக் கொண்டு நடத்தப்படும் சிரம வாசனா நிதியத்தைக் கலைப்பதற்கான தீர்மானம் இன்று இந்தச் சபைக்குக் கொண்டு வரப்பட்டுள்ளது.

இந்த நிதியமானது, அரை அரச துறை ஊழியர்கள், தனியார்துறை ஊழியர்கள், தோட்டத் தொழிலாளர்கள் என அனைவருடனும் சம்பந்தப்பட்ட ஒரு நிதியமாகும். ஆனால், கடந்த காலங்களில் இந்த நிதியமானது அரசியல் தேவைகளுக்காக, அரசியல் நடவடிக்கைகளுக்காகப் பயன் படுத்தப்பட்டது. ஆளும் தரப்பிலுள்ள அனேகமான உறுப்பினர்கள் இது தொடர்பான தெளிவான விளக்கத்தை இந்தச் சபைக்குக் கொடுத்தார்கள். இந்த நிதியம் உண்மையிலேயே மக்களுக்கானதா? என்ற கேள்வி எழுந்தது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

ஒரு நிமிடம் தாருங்கள்!

2015ஆம் ஆண்டு இந்த நிதியத்திலிருந்து 67 சதவீதம் செலவழிக்கப்பட்டு இருந்த நிலையில், 2024ஆம் ஆண்டு எமது அரசாங்கம் வந்த பிறகு 81 சதவீதம் செலவழிக்கப்பட்டுள்ளது. எனவே, இந்த நிதியத்தின் ஊடாகப் பலன்பெறக்கூடிய ஊழியர்களுக்கு அதிகமான வரப்பிரசாதங்களைப் பெற்றுக் கொடுத்தது எமது அரசாங்கமே ஆகும். கடந்த காலங்களில் ஒவ்வோர் அமைப்பும் தனது அரசியல் தேவைகளுக்காக இந்த நிதியத்தின் பணத்தைப் பயன்படுத்தியது. எனவே, இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள இந்தத் தீர்மானத்தை நாங்கள் வரவேற்கின்றோம்; ஆதரிக்கின்றோம். எனவே, இந்தத் தீர்மானத்துக்கு எங்களது பூரண ஒத்துழைப்பை வழங்கு கின்றோமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ලක් වන්නේ 1971 අංක 38 දරන මුදල් පනත යටතේ ගෙන එන යෝජනා සම්මතය පිළිබඳවයි. 2019 අංක 15 දරන පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව ශ්‍රම වාසනා අරමුදල පිහිටුවා ක්‍රියාත්මක වනවා. අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් අරමුණු කර ගනිමින් ඔවුන්ගේ සුබසාධනය සහ ඊට අදාළ කටයුතු සම්බන්ධයෙන් උපකාර කිරීම, එහෙම නැත්නම් ආධාර කිරීම, එහෙමත් නැත්නම් සහයෝගය පළ කිරීම කියන තත්ත්වයන් යටතේ පවත්වාගෙන යන මේ ශ්‍රම වාසනා අරමුදල අහෝසි කිරීම, එහෙම නැත්නම් ඇවර කිරීම සහ ඊට අදාළ කටයුතු සම්පාදනය කර ගැනීම තමයි ඒ තුළින් බලාපොරොත්තු වන්නේ. විවිධ තත්ත්වයන් යටතේ ආයතන, අරමුදල් බිහි වෙනවා කියා මා හිතනවා. නමුත් ඒවායේ මූලික අරමුණින් බැහැර ක්‍රියාකාරිත්වය තුළ ආරම්භක අරමුණට පටහැනි බවක් අපි දකිනවා. ඒ තත්ත්වය මේ ශ්‍රම වාසනා අරමුදල කෙරෙහිත් ඒ ආකාරයෙන්ම පවතින බව කරන ලද අධ්‍යයනයකදී අනාවරණය වෙනවා වාගේම එය වාර්තා වෙනවා. ඒක ස්වාධීනව සිදු වන සමීක්ෂණයක්. ඒ සමීක්ෂණ වාර්තාවට අනුව එන නිර්දේශය තමයි, තවදුරටත් මේ අරමුදල පවත්වාගෙන යාම ඵලදායක නොවන බව. ඒ නිසා අද දවසේදී සිදු වන්නේ එම අරමුදල අහෝසි කිරීම සහ ගණන් බේරුම්කරණය කරමින් වසා දැමීම කියන කාරණාවලට අදාළ යෝජනා සම්මතය අනුමත කර ගැනීමයි.

ලොතරැයියක් කිව්වාම දිනුම් ඇදීමක් කියන එක තමයි අපේ රටේ ජනතාවට මතක් වන්නේ. රජය, එහෙම නැත්නම් ආණ්ඩුව නීත්‍යානුකූලව ලොතරැයිපත් අළෙවි කර ජනතාවගෙන් මුදල් එකතු කර ඒවා අරමුදල්ගත කිරීම තුළ සුවිශේෂ වූ කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ලංකාවේ ජාතික ලොතරැයි මණ්ඩලය වාගේම සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපිත වෙලා තිබෙන්නේ මෙන්න මේ කියන කටයුත්ත සඳහායි. භාවිතය තුළ අපි දකිනවා, ලොතරැයි විශාල ප්‍රමාණයක් වෙළෙඳ පොළ තුළ අළෙවි වන බව.

මේ සභාවේ ඉන්න සියලුදෙනාටම මේ කාරණය මතක ඇති කියා මා හිතනවා. අපි රුපියල් 10ට මිලදී ගත්ත ලොතරැයියක මිල ඊට පස්සේ රුපියල් 20, රුපියල් 40 ආදී වශයෙන් යම් ආකාරයකින් ඉහළ යාමක් සිදු වූ බව භාවිතය තුළ අපි දැක්කා. ඒ මිල ඉහළ යාමත් එක්කම අපි බලාපොරොත්තු වෙනවා, මෙන්න මේ අරමුදල්වල ප්‍රමාණයත් ඊට අනුකූලව වැඩි වෙයි කියලා. හැබැයි, සාක්ෂි හරියට හොයාගෙන යනකොට ඉතිහාසය පුරාවට මේ අරමුදල්වල ලොකු වර්ධනයක් සිද්ධ වුණා කියන කාරණාව අපිට පෙනෙන්නේ නැහැ.

විශේෂයෙන්ම 2020-2024 කාලය ගත්තාම සමහර අවුරුදුවල මෙහි වර්ධනයක් අපි දකින්නේ නැහැ. නමුත් සාමාන්‍ය තත්ත්වය යටතේ සියයට 8ක විතර පැවති වර්ධනය පසුකාලීනව - 2024 අවුරුද්ද විතර වාගේ වනකොට - සියයට 14ක සෘණ වර්ධනයක් දක්වා කඩා වැටීමක් සිදු වෙනවා. මේ සලකුණුවලින් අපට කියාපාන්නේ අපේක්ෂිත අරමුණු කරා මේ අරමුදල මෙහෙයවීමට පාලකයන් හෝ යම් ආකාරයකට පත් කරන ලද කළමනාකරණ මණ්ඩලය සාර්ථක වී නැහැ කියන එක සහ ඊට අතිරේකව දේශපාලන අධිකාරිය මෙන්න මේ කියන අරමුදල් ඔවුන්ගේ දේශපාලන වුවමනාව වෙනුවෙන් පාවිච්චි කළාය කියන කාරණාවයි. ඒ වාගේම මේ අරමුදල කළමනාකරණය කිරීම සඳහා අනුමත කාර්ය මණ්ඩලය 18දෙනායි. දැනට මෙහි වැඩ කරන්නේ ඉතා අතළොස්සක්. එවැනි පිරිසක් නඩත්තු කරන්න සමස්ත වියදමින් සියයට 40කට ආසන්න මුදලක් වැය කරනවාය කීම මම හිතන විධියට ප්‍රශ්නගතයි. ඒක නිසා අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමෙහිලා කරන වියදමින් සියයට 40ක් ආසන්න වශයෙන් පරිපාලන වියදම් වශයෙන් වැය වනවා නම් එතැන ගැටලුවක් තිබෙනවා. මෙම අධීක්ෂණ කමිටුව මේ සියලු දේවල් අධ්‍යයනය කරමින් තමයි මේ අරමුදල වසා දැමිය යුතු බවට, එහෙම නැත්නම් විසුරුවා හැරිය යුතු බවට නිර්දේශ සපයන්නේ. මෙහිදී මේ කිසිවක් නොවෙයි, ජනතාවගෙන් යම් ආකාරයකට විශ්වාසවන්තව එකතු කර ගන්නා අරමුදල් ඒ නිශ්චිත වූ අරමුණ සඳහා මුදා හැරීමේ ආණ්ඩුවට තිබෙන වුවමනාව තමයි මේ තුළින් අපි දකින්නේ. වත්මන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට මෙවැනි තත්ත්වයන් යටතේ, එහෙම නැත්නම් දූෂිත තත්ත්වයන් යටතේ මේ අරමුදල් තවදුරටත් පරිහරණය කරන්න ඉඩ දීලා හරියන්නේ නැහැ. එහෙම නම් නීති සම්පාදකයෝ විධියට අවශ්‍ය අරමුණේ ගළපා ගැනීමේ යුතුකම සහ වගකීම අපට තිබෙනවා. ඒ නිසා මම මේ වෙලාවේදී යෝජනා කරනවා, මේ ගෙනැත් තිබෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම ජනතා අභිලාෂයන් ඉටු කිරීමෙහිලා ඉතා වැදගත් යෝජනාවක් බව.

මේ අරමුදල ස්ථාපිත කිරීමේදී ප්‍රධාන වශයෙන් අරමුණු හයක් පිළිබඳව සඳහන් වෙනවා. සේවකයන්, එම සේවකයන්ගේ පවුල්වල අය, හදිසියේ සේවා අහිමිවීම්, කම්කරු ආරාවුල් වැනි තත්ත්වයන් තුළදී මූල්‍ය සහ වෙනත් ආධාර ලබා දීම කියන සිද්ධීන් ඒ අතර ප්‍රධාන වෙනවා. මේ මූලික අරමුණු සඳහා පිහිටුවන ලද රජයේ වෙනත් ආයතන තිබෙනවා.

එතකොට එකම කාරණය ආයතන කිහිපයකින් සිදු වනකොට ඒ සඳහා අවස්ථාව ඕනෑවටත් වඩා ජනතාවට තිබෙන නිසා මේ ආයතනය වසා දැමීම, නැත්නම් විසුරුවා හැරීම කියන කාරණාවේදී මෙකත් ඉතා වැදගත් වනවාය කියා මම හිතනවා. මොකද, එකී කටයුත්ත කරන්න සුවිශේෂී වූ ආයතනයක් තිබෙනවා නම් එතැනට ඒ අවස්ථාව ලබා දීලා ඵලදාවෙන් අඩු, ඵලදාවක් නැති, අකාර්යක්ෂම මේ ආයතනය වසා දැමීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. මෙහි ප්‍රතිලාභීන් විධියට අපි දකින සේවක ප්‍රජාව හෝ ඔවුන්ගේ පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන්, එහෙම නැත්නම් රෝගී තත්ත්වයන්ට පත් වන අපේ පුරවැසියන් මේ පිළිබඳ කනස්සල්ලක් ඇති කර ගත යුතු නැහැ. මොකද, අරමුදල වසා දමනවා කියන්නේ එහි කාර්යභාරය අවසන් කරනවා කියන එක නොවෙයි. එහි කටයුතු සියල්ලක්ම කම්කරු අමාත්‍යාංශය යටතට පවරාගෙන තවදුරටත් ජනතා සේවය ඉතා ඉහළින් ලබා දීමට කටයුතු කරන බව තමයි මේ අවස්ථාවේදී මට මේ සභාව හමුවේ කියන්න තිබෙන්නේ.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න අවශ්‍යයි, විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන්. 2019දී විගණන නිරීක්ෂණයක් කර තිබෙනවා, මේ අරමුදල පිළිබඳව. රුපියල් මිලියන 2.41ක් වෙන් කළත් ඒ කාලච්ඡේදය පුරාවටම මේ අරමුදල විසින් කර තිබෙන්නේ කාර්යයන් 7ක් වැනි ඉතාම අඩු සංඛ්‍යාවක් පමණයි. එහිදී අපට පෙනෙනවා, මුදල් වෙන් කළත් ඒ අවශ්‍ය කරන අපේක්ෂා ඉෂ්ට කර ගැනීමට මේ අරමුදල ශක්තිමත් වෙලා නැහැ, එහෙම නැත්නම් ඒ සඳහා මැදිහත් වෙලා නැහැ කියලා. ඒ වාගේම රුපියල් මිලියන 3.3ක් වෙන් කරලා වැඩසටහන් 85ක් සංවිධානය කරලා තිබෙන අවස්ථාවේදීත් ඉෂ්ට කරලා තිබෙන්නේ වැඩසටහන් 15ක් පමණයි. එහි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම, මූල්‍ය ප්‍රගතිය සියයට 39ක් සහ භෞතික ප්‍රගතිය සියයට 17ක් බවට මේ විගණන වාර්තාවලින් අනාවරණය වනවා. මේ සියලු සාක්ෂිවලින් අපට පැහැදිලි කරලා දෙන්නේ මේ ශ්‍රම වාසනා අරමුදල තවදුරටත් පැවැත්වීම ගැටලු සහගත බව සහ එය ඵලදායක නොවන බවයි. ඒ නිසා මේ අරමුදල අහෝසි කිරීමෙන් පසුව මේ යටතේ මෙතෙක් ප්‍රතිලාභ ලැබූ ජනතාවට, සේවක ප්‍රජාවට සහ ඔවුන්ගේ පවුල්වල දූවා දරුවන්ට වඩා යහපත් වූ සේවයක් ලබා දීම කම්කරු අමාත්‍යාංශය හරහා සිදු කිරීමට අවශ්‍ය කටයුතු සියල්ල මේ වනකොට සූදානම් කරමින් පවතිනවා. ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන ශ්‍රම වාසනා අරමුදල අහෝසි කිරීම සහ ඇවර කිරීම සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතය පිළිබඳව අපි බියක්, කනස්සල්ලක් ඇති කර ගත යුතු නැහැ. ජනතා අභිලාෂ ඉෂ්ට කරන්න මේ රජය ගන්නා වූ තවත් සාධනීය පියවරක් වශයෙන් අපි මෙය සලකන බව මේ ගරු සභාව හමුවේ තබමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.59]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Presiding Member, කරුණාකරලා සමාවෙන්න, මම stopwatch එක off කළා. මේක මම පාර්ලිමේන්තුවට එන අන්තිම සතිය. ඒ නිසා මම තත්පරයක්වත් නාස්ති කරන්න කැමැති නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කාලය තත්පරයක්වත් අඩු කරන්නේ නැහැ, වැඩියෙන් දෙනවා මිසක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Sir. මේ, මම පාර්ලිමේන්තුවේදී කථා කරන අන්තිම සතිය. *[බාධා කිරීමක්]* කථාව අහන්න කෝ. ඇයි, කෑ ගහන්නේ?

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கும் விடயத்தைத் தவிர்த்து, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற முஸ்லிம் மக்களுடைய அடிப்படை உரிமை தொடர்பான சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். ஏற்கனவே நான் பல்வேறு இடங்களில் பல தடவை இது தொடர்பாகக் கதைத்திருக்கிறேன். ஆனால், அண்மைய தினத்தில் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் அபூபக்கர் ஆதம்பாவா அவர்களுடைய video ஒன்றைப் பார்த்தேன். "இன்றோடு எல்லாப் பிரச்சினையும் முடிந்துவிட்டது. ஆகவே, இதை அரசியலாக்காதீர்கள்!" என்று அவர் அதில் குறிப்பிட்டுள்ளார். அதைப் பார்த்து மிகவும் சந்தோஷப் பட்டவர்களில் நானும் ஒருவன்.

இரண்டாவதாகப் பார்த்தால், பாராளுமன்ற உறுப்பினர்கள் சிலருடன் எங்களுடைய இளங்குமரன் அவர்கள் சுகாதார அமைச்சருடன் ஒரு meeting நடத்தி, "இத்தோடு எல்லாம் முடிந்துவிட்டது" என்று சொன்னார்கள். நானும் அப்படித்தான் நினைத்தேன். கவலை என்னவென்றால், அந்த 9 உதவி சுகாதாரப் பணியாளர்களும் இடமாற்றப்பட்டு இருக்கிறார்கள். இலங்கையில் நான் மருத்துவனாக 10 வருடங்கள் வைத்திய சாலைகளில் பணியாற்றி இருக்கின்றேன். Administratorஆக 2 வருடங்கள் பணி செய்திருக்கின்றேன். 2006ஆம் ஆண்டி லிருந்து Faculty of Dental Sciences, University of Peradeniyaஇல் இருந்திருக்கின்றேன். என்னைப் பொறுத்தவரைக்கும் இங்கே சொல்லக்கூடிய ஒரு விடயம் இருக்கின்றது. அதாவது, ஓர் இனத்துக்கு எதிராக நடக்கின்ற அடக்குமுறைகளைப் பற்றி எந்த இனம் அடக்குகின்றதோ அந்த இனத்திலிருந்து ஒருவன் கதைக்காவிட்டால் அந்த அடக்குமுறைகள், இனவாதங்கள் ஒருபோதும் இந்த நாட்டில் அழியாது. *பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!* அந்த வகையில், எங்களுடைய முஸ்லிம் சகோதரர்களுக்காக, என்னுடைய பாராளுமன்ற கடைசி நாட்களிலே 4-5 நிமிடங்களைச் செலவழிப்பதையிட்டு என்னுடைய மக்கள் சார்பாக சந்தோஷப்படுகின்றேன்.

நான் ஆரம்பத்திலேயே சொன்னேன், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் கடமையாற்றுகின்ற சுகுணன் அவர்கள் மிக மோசமான ஓர் இனவாதி என்று. முதலில் கருணாவுடன், அதற்குப் பிறகு ரணிலுடன் அவர் செயற்பட்டார். திட்டமிட்ட முறையில் இப்போது அவர் செய்கின்ற அரசியலில் ஈடுபட இந்த அரசாங்கம் முதுகெலும் பில்லாத ஓர் அரசாங்கமா? என்று கேட்க விரும்புகின்றேன்.

அடுத்து பார்த்தால், எல்லை நிர்ணயம் செய்வதற்காக அமைக்கப்பட்ட குழுவில் ஒரு முஸ்லிம்கூட இல்லை. வெட்கமடா! வெட்கம்! வெட்கம் என்று சொல்வதும் வெட்கமாக இருக்கிறது. வெட்கம் என்ற wordக்கே வெட்கம் ஐயா! இவர்களுடைய அமைச்சரவையில் முஸ்லிம் இனத்தைச் சேர்ந்த ஒருவர்கூட இல்லை. ஏதோ கடவுள் புண்ணியத்தால் பிரதிச் சபாநாயகர் கதிரையில் ஒரு முஸ்லிமை இருத்தியிருக் கிறார்கள். அவரோடு எதிர்க்கட்சியினர் இணக்கமாகச் செயற்படுகிறார்கள் என்று என்றைக்கு அவரைத் தூக்குகிறார்களோ தெரியாது. *இன்ஷா அல்லாஹ்!*

இன்னுமொன்றைச் சொல்ல விரும்புகின்றேன். என்னுடைய இனத்துக்கு எந்தவொரு முஸ்லிம் நபராவது ஒரு காலத்தில் உதவி செய்திருந்தால் அதற்கு நன்றிக்கடனைச் செலுத்துவதற்காக எனது பாராளுமன்ற இறுதி நாட்களில் சில நிமிடங்களைப் பயன்படுத்த விரும்புகின்றேன். நான் நினைக்கின்றேன், 1995ஆம் ஆண்டு சந்திரிகா அவர்களின் ஆட்சிக்காலத்தில் தமிழ் செய்தி வாசிப்பாளர்கள் நெற்றியில் பொட்டு அணிந்து ரூபவாஹினியில் செய்தி வாசிக்க இயலாது எனத் தடை விதிக்கப்பட்டு இருந்தது. அந்தத் தடைக்கு எதிராக எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் தன்னுடைய இனத்தின் வலிகளைவிட்டு தமிழ் மக்களுக்காகப் போராடினார். இன்றைய என்னுடைய பேச்சுக்கான முக்கிய காரணம், அதற்கு நன்றிக்கடன் செலுத்துவதாகும். அவர் அன்று ஆங்கிலத்தில் கூறியதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன்:

I wish to state something mentioned in the Holy Quran. Sir, the Holy Quran states that people's destiny will not be changed unless people change their destiny.

சகோதர முஸ்லிம் மக்களிடம் நான் ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். என்னுடைய இனத்திலிருந்து உங்களுடைய இனத்துக்கு கல்லெறியப்படுமாக இருந்தால் அந்தக் கற்களை எங்களுடைய இதயம் தாங்கிக்கொள்ளும். இதேநேரத்தில், நாங்கள் பாராளுமன்றத்தில் இல்லாத காலத்தில் எங்களுடைய இனம் நோக்கி உங்களுடைய முஸ்லிம் அடிப்படைவாதிகள் யாராவது இனவாதக் கருத்துகளைத் தெரிவித்தால் அன்றைக்கு உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் இந்தப் பாராளுமன்றத்தில் அதற்கெதிராகக் கதைப்பார்கள் என்று நாங்கள் எதிர்பார்க் கின்றோம்.

வடக்கு மாகாணத்தில் சுகாதாரத்துறையில் அதிமோசமாகச் சீரழிந்த பிரதேசங்களாக பொம்மைவெளி, காக்கைதீவுப் பிரதேசங்கள்தான் இன்றுவரை காணப்படுகின்றன. முஸ்லிம் மக்களை யாழ்ப்பாண மாவட்டத்தில் பொம்மைவெளி, காக்கைதீவுப் பகுதிகளில் மீளக்குடியமர்த்துகின்றோம் என்ற போர்வையில் கடந்த காலங்களில் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளைப் போய் பாருங்கள்! வடக்கு மாகாண சபையின் அதிகாரம் எப்போது எனது கைக்குக் கிடைக்குமோ அப்போது நான் முதல்முதலாக அபிவிருத்தி செய்வது பொம்மைவெளி, காக்கைதீவுப் பகுதிகளைத்தான். மழை பெய்தவுடன் சாரத்தைக் கட்டிக்கொண்டுபோய் நிற்பார்கள். ஏனென்றால், diasporaவிடம் காசு வாங்கி முஸ்லிம் மக்களுக்கு உதவித் தொகை கொடுக்கிறோம் என்று. செய்ய வேண்டியது அதுவல்ல. ஓர் இனம் பாதிக்கப்படுகின்றபோது, எந்த இனம் பாதிப்பை ஏற்படுத்துகின்றதோ அந்த இனத்திலிருந்து கதைப்பதுதான் முதுகெலும்புள்ள மனிதன் செய்யவேண்டிய காரியம்.

இன்னுமொன்றையும் சொல்ல விரும்புகின்றேன். "தவறைத் தவறு என்று சொல்லும் துணிச்சல் உனக்கு இல்லை என்றால், நீ அடிமைத்தனத்தின் இறுதிக் கட்டத்தில் இருக்கிறாய்" என்பது சே குவேராவின் பொன்மொழியாகும். இந்த முஸ்லிம் பெண் உதவி சுகாதார பணியாளர்களின் சீருடை விடயம் சம்பந்தமாக நாளை ஒத்திவைப்புப் பிரேரணையைக்கூட முன்மொழிய இருக்கின்றேன். நாங்கள் முஸ்லிம் மக்களோடு நகமும் தசையும்போல வாழ்ந்தவர்கள். கிழக்கு மாகாணத்தில் EROSஇலிருந்து வந்து 40 வருஷமாக 'சுபாஷ்' என்ற வெங்காயமொன்று அரசியல் செய்கிறதாம்! இன்றைக்கும் நான் சொல்கின்றேன், கிழக்கு மாகாணத்தில் EROS போன்ற இயக்கங்கள்தான் முஸ்லிம் மக்களை வெட்டிக்கொன்றது. அவற்றைத் தமிழீழ விடுதலைப் புலிகள்தான் செய்ததென்று ஒட்டுமொத்தமாக எங்களுடைய தேசியத் தலைவர் பிரபாகரனின் கையில் போய் விழுந்தது. அதேநேரத்தில், ஒருசில முஸ்லிம்கள் செய்த கொலைகள்தான்

ஒட்டுமொத்த முஸ்லிம்களையும் தமிழர்களையும் இன்று வரைக்கும் பிரித்து வைத்திருக்கின்றது. அடிபட்டு அடிபட்டு எவ்வளவு காலம்தான் அடிபடப் போகின்றோம்? எனக்கு விளங்கவில்லை. கௌரவ காதர் மஸ்தானிடம் நான் கேட்டேன், "அண்ணன், இந்தப் பிரச்சினைகளுக்காக எத்தனை நாட்கள் அடிபடப் போகின்றோம்?" என்று. என்றைக்கு நாங்கள் இதனை நிறுத்துகின்றோமோ அப்போதுதான் இதற்கு முடிவு கிடைக்கும்.

பாராளுமன்ற உறுப்பினர் கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் கதைத்தபோது, எங்களுடைய சுகாதார அமைச்சருக்கு நன்றி கூறினார். அந்த 9 உதவி சுகாதாரப் பணியாளர்களையும் இடமாற்றுவது அல்ல, இதற்கான தீர்வு! நான் நாளையதினம் இது தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவர இருக்கின்றேன் என்பதை மீண்டும் தெரிவித்துக் கொள்கின்றேன். முஸ்லிம் பெண்களுக்கு கட்டாயம் பொலிஸ் சேவையில் இணைந்து பணியாற்று வதற்கும் ஆவன புரிய வேண்டும்.

களுபோவில வைத்தியசாலையில் என்னோடு interns செய்த 2 முஸ்லிம் பிள்ளைகள் இப்போது consultantsஆக இருக்கிறார்கள். அவர்கள் scarf போட்டிருப்பார்கள். அவர்கள் என்னுடைய தங்கச்சிமார் மாதிரி. அரசாங்கத்திலே இருக்கின்ற இந்த சமூகத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களைப் பற்றி பேசாதீர்கள்! பாவம், அவர்கள் பேச மாட்டார்கள். கவலையாக இருக்கின்றது. அவங்களுக்கு வாயுமில்லை; வேறு இடத்தில் இருக்கிறதும் இல்லை. எல்லாவற்றையும் அடைத்து வைத்திருக்கிறார்கள். அதுதான் அவர்களுடைய நிலைமை! அவர்கள் வந்து canteenஇல் எங்களுடன் கதைக்கும்போதுதான் அவர்களுடைய நிலைமை எங்களுக்கு விளங்குகிறது. அவர்கள் சொல்லித்தான் நான் இந்த இடத்திலே கதைக்கிறேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அது தொடர்பாக அரசாங்கம் முக்கியமாக நடவடிக்கையெடுக்க வேண்டும்.

මම මේ කාරණාව සිංහලෙන් කියලා මගේ කථාව අවසන් කරනවා. සමහර වෙලාවට මේ මම පාර්ලිමේන්තුවට එන අන්තිම සතිය වෙන්න පුළුවන්. සමහර විට තවත් සතියක් මට එන්න පුළුවන් වෙයි. මම ඇත්තටම මේ පාර්ලිමේන්තුවට එනකොට ගොඩක් බලාපොරොත්තු තියාගෙනයි ආවේ. මම අනුර කුමාර දිසානායක මහත්මයාට support එකක් දෙන්න කියලා ටී-ෂර්ට් එක දාගෙන හිටපු පොරක් නේ. එතකොට මම ගොඩක් දේවල් බලාපොරොත්තුවෙන් ආවේ. මම හිතුවා, මේ රට සම්පූර්ණයෙන්ම ලස්සන කරලා, තිබෙන වල් පැළ ටිකත් අයින් කරලා, මල් පැළ ටිකක් ගෙනැවිත් තියාවි කියලා. අන්තිමට අපි මේ පාර්ලිමේන්තුවේ ගෙනැල්ලා තිබ්බේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම ඇත්තටම කනගාටු වෙනවා, මේ පාර්ලිමේන්තුවේ MP කෙනෙක් නැඟිටලා stopwatch එක බලාගෙන කථා කරන්න ඕනෑ තැනට මේ පාර්ලිමේන්තුව පත් කර තිබෙන එක පිළිබඳව. ඇත්තටම ඔබතුමන්ලා හිතලා බලන්නකෝ, ඔබතුමන්ලාට girlfriend කෙනෙක් ඉඳලා ඒ girlfriend හැමදාම බොරුවක් කියනවා නම්, පවයක් ගහනවා නම්, රෑට නිදාගන්නවත් කැමති වෙයි ද? නැහැ නේ. ඒ වාගේ තමයි, අපේ රටට අපේ ලොක්කාව අපි 2024දී පත් කර ගත්තා. හැමදාම කියන්නේ බොරු නේ අනේ. හැම එකකටම කියන්නේ බොරු.

ඔබතුමන්ලා කිව්වා, ජාතිවාදී ආණ්ඩු නැහැ, එවැනි කිසි දෙයක් නැහැ කියලා. දැන් නැඟෙනහිර පළාතේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, මුස්ලිම් දරුවන්ගේ scarf එක සම්බන්ධයෙන්. ඊට පස්සේ මම මාධ්‍යවලින් දැක්කා, කිලිනොච්චියේ අක්කර පණහක් අල්ලාගෙන, ඒකේ තට්ටු තුනක බිල්ඩින් එකක් හදාගෙන, එල්ටීටීඊ කඳවුරක් හදනවා කියලා human rightsවලට සම්බන්ධ කවුරු හරි කෙනෙක් ගිහිල්ලා media statement එකක් දෙනවා. අනේ මේ, මම එකක් කියන්නම්. මේ රටේ නැවතත් එල්ටීටීඊ එක ගැන කියලා ජාතිවාදය හදන්න ඕනෑ නැහැ. මේ මම පාර්ලිමේන්තුවේ කථා කරන අන්තිම දවස වෙන්න පුළුවන් නිසා මම එකක් අහන්න කැමැතියි. මෙතැන කවුරු හරි ඇත්තටම ජේවීපීකාරයෙක් ඉන්නවා නම් කියන්න, ප්‍රභාකරන් ත්‍රස්තවාදියා කියලා. මේ අන්තිම දවසේ කරුණාකරලා කියන්නකෝ අනේ. නැත්නම් ලජ්ජයි. ඔබතුමන්ලාට ලජ්ජයි. අඩුම ගාණේ තමුන්නාන්සේලා වෙනුවෙන් මිය ගිය රණ විරුවන්ට "රණ විරුවෝ" කියන්නකෝ. අන්තිම දවසේ අහන්නේ. ආයෙත් මට මෙතැනදී ඒක අහන්න වෙන්නේ නැහැ. එළියේ ඉඳන් තමයි අහන්න වෙන්නේ.

මම දැක්කා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙනවා කියලා CIABOC එකේ ගිහිල්ලා නඩුවක් දාලා තිබෙනවා. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා පළමුවැනි දවසේම හැප්පුණේ කථානායකතුමාත් එක්ක. ඔබතුමන්ලාට ඒක මතක ද? අන්තිමට චමින්ද කුලරත්න අයියාව එළියට දැම්මා. ඔහු දැන් FR case එකක් දාලා Supreme Court යනවා. ලජ්ජයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

CIABOC එකේ නඩුවක් දාලා තිබෙනවා. ඊට අමතරව backdate කරලා ලියුමක් ගන්න හැදුවාලු, අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කැබිනට් මණ්ඩලයෙන් ලියුමක් ගන්න හැදුවාලු. අන්තිමට Prime Minister කියලා ඒක දෙන්න බැහැ කියලා. ඒ දේවල් මාධ්‍යවල තිබෙනවා. ඒ නිසා දුකයි.

කන්ටේනර් 323ක් ගිය තැන ගැන හොයා ගන්න බැහැ. හැබැයි, අපි yellow line එකේ වාහනයක් නැවැත්තුවා නම් අපට නඩුවක් වැටෙනවා. මට දාපු නඩුවලින් එකකටවත් මම වැරදිකාරයා වෙලා තිබෙනවාද කියන්නකෝ. අවුරුදු 39ක් මම මේ system එකේ හිටියා. මේ පාර්ලිමේන්තුවට එන්න කලින් මට විරුද්ධව එක නඩුවක් තිබුණා ද කියන්නකෝ. ඔබතුමන්ලා ගැන ගොඩක් බලාපොරොත්තු තියාගෙනයි මම මේ පාර්ලිමේන්තුවට ආවේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් විධියට පළමුවෙන්ම ඉවත් වෙන්නේ මම වෙන්න ඇති. ඇත්තටම මගේ හෘදය සාක්ෂියට අනුව මම ඔබතුමන්ලාට ගොඩක් ආදරෙන් හිටියේ. මම මේ පාර්ලිමේන්තුවට එනකොට ලොකු බලාපොරොත්තුවක් තිබුණා. ඇත්තම කියන්නම්. මම හිතුවා මේ රට සම්පූර්ණයෙන් ලස්සන වෙයි කියලා.

ඊළඟට තව මන්ත්‍රීවරයෙක් කිව්වා, අපට වාහනයක් අඩුම මිලට ගන්න පුළුවන් කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තව තත්පර 20ක් දෙන්න.

ඔබතුමන්ලා විට්ස් කාර් එක රුපියල් ලක්ෂ 12කට දෙන්න ඕනෑ නැහැ. අඩුම ගාණේ විට්ස් කාර් එක රුපියල් ලක්ෂ 80ට, 90ට වත් ගන්න පුළුවන් විධියට මොනවා හරි ක්‍රමයක් හදා ගන්නකෝ, අනේ. පුළුවන් නම් doctorsලාට vehicle permit එක දෙන්නකෝ. Doctorsලා ඔක්කෝම පිටරට යනවා. ඕනෑ නම් මටත් පිටරට ගිහිල්ලා ජීවත් වෙන්න පුළුවන්. මට SLMC registration එක තිබෙනවා. GMC examinations ටික ලියා ගත්තා නම් මමත් පිටරට යනවා. අවුරුද්දකට කෝටි දෙකහමාරක විතර පඩියක් හම්බ වෙනවා නේ. අනේ, පොඩ්ඩක් හිතලා බලන්නකෝ. අපි නැති කාලයකවත් මේ කියන දේවල් පොඩ්ඩක් හිතට අරගෙන ලබන අවුරුද්දේ හරි doctorsලාට vehicle permit එක දෙන්න. Doctorsලා 1,200 ගණනක් රටින් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ ගැන කල්පනා කරලා ඔබතුමන්ලා කල්පනාවෙන් වැඩ කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.09]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ සභාව තුළ මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් දක්වපු අදහස් පිළිබඳව මට කරුණු කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. ඊයේ දිනයේ පොල්ගහවෙල ප්‍රදේශයේ වෙච්ච සිද්ධියක් උලුප්පමින් ඒ පිළිබඳව අදහස් දැක්වූවා. ශුද්ධ වූ අල්-කුරාණය තුළ අපට දී තිබෙනවා ඉතා වැදගත් පණිවුඩයක්. මනුෂ්‍යයන් ලෙස අපි හැම කෙනාටම ඒ පණිවුඩය වටිනවා කියලා මා විශ්වාස කරනවා. ඒ පණිවුඩය මෙසේයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

*"යා අය්යුහල්ලදීන ආමනු ඉන්ජාඅකුම් ෆාසිකුම් බිනබඉන් ෆතබය්යනු අන් තුසීබූ කව්මම් බිජහාලතින් ෆතුස්බිහූ අලා මා ෆඅල්තුම් නාදිමීන්"*

ඒ පණිවුඩය තුළ තිබෙන හරය තමයි, "ඔබට යම් ප්‍රවෘත්තියක් ආවා නම්, ඔබට යම් පණිවුඩයක් ආවා නම්, ඒ ප්‍රවෘත්තියේ සත්‍ය අසත්‍ය සොයා ඒක පිළිගන්න" කියන එක.

ප්‍රවෘත්තියක් ආ සැණින් එහි පසුබිම, එහි තිබෙන කරුණු කාරණා පිළිබඳව සොයා නොබලා එය පිළිගැනීම සිදු නොකළ යුතුයි. ඒ සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් ලෙස අපට අන් අයට වඩා විශාල වගකීමක් තිබෙනවා. එම නිසා අපි ඉතා වගකීමෙන් කටයුතු කළ යුතුයි. මහජන නියෝජිතයන් ලෙස අපගේ වගකීම වන්නේ, මේ රට තුළ සිටින ජනවාර්ගිකයන් අතර තවදුරටත් වෛරය වපුරන එකවත්, ක්‍රෝධය වපුරන එකවත්, අසත්‍ය වපුරන එකවත් නොවෙයි, සැබෑ ලෙසම ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්, ඔවුන්ගේ යහපත වෙනුවෙන් කටයුතු කරන එකයි. විවිධ ආගම් නියෝජනය කරන, විවිධ භාෂා කථා කරන, විවිධ ප්‍රදේශවල ජීවත් වන මනුෂ්‍යයන් ලෙස එකිනෙකා සමඟ ගනුදෙනු කරන විට අප අතින් අඩු පාඩු සිද්ධ වෙන්න පුළුවන්; අප අතින් වැරදි සිද්ධ වෙන්න පුළුවන්. එවැනි දේ සිද්ධ වුණාම, සමාජය නිවිය යුතු මහජන නියෝජිතයන් වන අපි ඒ තනි සිද්ධිය සමාජ සිද්ධියක් බවට පත් කරලා සමාජය පත්තු කරන තත්ත්වයකට පත් වෙනවා නම් ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

ඒ සිද්ධිය පිළිබඳව ඇසූ සැණින් මම අදාළ ප්‍රදේශයේ ඉන්න විශ්වාස කළ හැකි පිරිස් සමඟ සම්බන්ධ වෙලා එහි ඇත්ත නැත්ත සොයා බැලුවා. ඒ ප්‍රදේශයේ ඉන්න බොහෝ පිරිස් ඒ සිද්ධිය පිළිබඳව අදහස් දක්වා තිබුණා. ඒක ඇත්තටම ඉතාම සරල සිද්ධියක් ලෙසයි ඔවුන් දකින්නේ. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. අල්කුර්ආනයෙන්ම අපට ලබා දී තිබෙන පණිවුඩය මේකයි. අප නියෝජනය කරන, අපේ මතවාදය නියෝජනය කරන කෙනා වැරදි කළත්, අපට කොන්දක් තිබෙන්න ඕනෑ, එයා වැරදියි කියලා කියන්න. අපේ සමාජයේ කෙනා වැරදි කළාම ඒක නිවැරදියි කියලා කියනවා නම්, මා හිතන විධියට ඒකයි ජාතිවාදය. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින් ඒ සිද්ධිය පිළිබඳව ප්‍රකාශ කරමින් සමාජය නොමඟ යැවීම පිළිබඳව විශාල කනගාටුවක් දැනෙනවා.

මේ රටේ අතිබහුතරයක් ජනතාව බලාපොරොත්තු වන්නේ, සාමයෙන්, සතුටින්, එකමුතුව සහ සහෝදරත්වයෙන් ජීවත් වීමයි. අප පාලකයන් ලෙස, වග කිව යුත්තන් ලෙස ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් ඒ වෙනුවෙන් කටයුතු කරනවා මිස සමාජය අවුලෙන් අවුලට තල්ලු කරන තත්ත්වයට පත් නොකළ යුතුයි.

විපක්ෂය නියෝජනය කරන එක්තරා මන්ත්‍රීවරයෙක් අද උදේ අපේ ආණ්ඩුවේ ස්ථාවරයක් පිළිබඳව විමසා සිටිනවා මම දැක්කා.

இன்று காலை எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், இந்த அரசாங்கம் - அநுர அரசாங்கம் - முஸ்லிம்கள் தங்களது கலாசார ஆடையை அணிவதற்கு அனுமதிக்கின்றதா? என்ற கேள்வியைக் கேட்டிருந்தார். அண்மையில் ஏற்பட்ட குறித்த நிகழ்வானது இந்த நாட்டில் இனங்களுக்கிடையில் முறுகல் நிலையைத் தோற்றுவிக்காமல் தடுப்பதற்கான தற்காலிகமான சில நடவடிக்கைகளை உடனடியாக மேற்கொள்ளவேண்டிய தேவை ஏற்பட்டது. நேற்றைய தினம் வழங்கப்பட்ட தற்காலிக இடமாற்றமானது இதற்கான ஒரு தீர்வு அல்ல. இந்தப் பிரச்சினை ஓர் இனமோதலாக மாறாமல், அதனைச் சுமுகமாக முடிப்பதற்கான தற்காலிகமான ஒரு நிலைப்பாடாகத்தான் நாங்கள் அதனை மேற்கொண்டிருந்தோம். அந்த ஆடையை அணிய அனுமதிப்பதன் காரணமாகத்தான் அதனை அணிய முடியுமான ஒரு வைத்தியசாலைக்குத் தற்காலிகமாக நாம் அவர்களை இடமாற்றம் செய்தோம். இன்று இந்த விடயங்களைப் பற்றி பேசுகின்றவர்கள், கலந்துரையாடுகின்றவர்கள் ஒரு விடயத்தை மட்டும் மனதிற்கொள்ள வேண்டும். இந்த ஆடை சம்பந்தமான பிரச்சினை இன்று, நேற்று உருவாகியது அல்ல. நீண்ட காலமாக இது சம்பந்தமான பல கோரிக்கைகள் விடுக்கப்பட்டு இருக்கின்றன; கலந்துரையாடல்கள் செய்யப்பட்டு இருக்கின்றன.

1989ஆம் ஆண்டளவில் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்திய உறுப்பினர், 1992இல் முஸ்லிம் பெண் தாதியர்களின் சீருடை விவகாரம் தொடர்பாகத் தனிநபர் பிரேரணை ஒன்று கொண்டுவரப்பட்டதாக ஊடகங்களுக்குக் கருத்துத் தெரிவித்திருக்கின்றார். குறிப்பிட்ட ஆடையை அணிய முடியும் என்று சட்டத்தில் குறிப்பிடப்பட்டிருந்தால், அவர் குறிப்பிடுவதைப்போன்று கடந்த வாரம் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் பிரச்சினை ஏற்பட்டிருக்காது என்பதை நான் அவருக்கு மிகத் தெளிவாகச் சொல்கின்றேன். கடந்த காலத்தில் ஒரே அரசாங்கத்தில் - Cabinetஇல் - 4 முஸ்லிம் அமைச்சர்கள் இருந்திருக்கிறார்கள். இருந்தபோதிலும், இந்த நிலையை உணர்ந்து, அந்தச் சந்தர்ப்பத்தில் அதிகாரங்களைப் பயன்படுத்தி, இது தொடர்பாக ஒரு சுற்றுநிருபத்தை வெளியிட்டிருந்தால், இப்போது இப்பிரச்சினை ஏற்பட்டிருக்காது.

இந்தச் சந்தர்ப்பத்தில் சொல்லப்பட வேண்டிய முக்கியமான ஒரு விடயம் இருக்கின்றது. உண்மையிலே இந்த இரண்டு வருடத்துக்குள் இந்தப் பிரச்சினை தீர்க்கப்பட்டிருக்க வேண்டும். இது குறித்து கௌரவ சுகாதார அமைச்சர், கௌரவ பிரதி அமைச்சர் மற்றும் துறைசார்ந்தவர்களுடன் நாங்கள் கலந்துரையாடி வருகின்றோம். அத்துடன், சமூகத்தில் அக்கறையுள்ளவர்களுடனும் நாங்கள் கலந்துரையாடி வருகின்றோம். இந்தப் பிரச்சினை தீர்க்கப்பட வேண்டும் என்பதுதான் எமது அவா. எல்லோருடனும் கலந்துரையாடி, இந்தப் பிரச்சினையைச் சுமுகமாகத் தீர்ப்பதற்கான முயற்சிகளை அரசாங்கம் என்ற வகையில் நாங்கள் எடுத்து வருகின்றோம். இது இனவாதத் தீயினால் மூட்டப்பட்டிருந்த ஒரு நாடு. எனவே, எந்தத் தீர்வுகளைப் பெறுகின்ற போதும் அதற்கெதிராகச் செயற்படக்கூடிய சந்தர்ப்பங்கள் இருக்கின்றன. இன்று தமிழ் மொழியிலுள்ள விடயங்களைச் சிங்கள மொழியில் மொழிபெயர்த்து, அதனை வெப்தளங்களில் பதிவிட்டுச் செயற்படுகின்ற ஒரு விடயத்தையும், அதற்குப் பின்னால் பாரியதொரு சதி இருப்பதையும் நான் மிகத் தெளிவாகக் காணுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුහුණු පොතේ තිබුණු, මේ මොහොතට අදාළ එක්තරා පණිවුඩයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්.

"අවුරුදු 76ක් තිස්සේ වපුරපු ජාති, ආගම් ක්‍රෝධය AKD ආණ්ඩුවට අවුරුදු දෙකකින් විසඳන්න පුළුවන් කියලා හිතනවා නම් මම හිතන්නේ අපි සාර්ථකයි."

නිදන්ගතව තිබෙන දේවල් වෙනස් කරමින් පොහොසත් රටක් තුළ ලස්සන ජීවිතයක් අපි හැම කෙනාටම අවශ්‍යයි. ඒ ගමන වෙනුවෙන් අපි ඒ අභියෝග සියල්ල ජය ගනිමින් පෙරට යනවාය කියන පණිඩුවය මම ලබා දෙන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 4.20]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත මඟින් පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සඳහා වන යෝජනාව තමයි අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් වෙන්නේ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සාකච්ඡා වෙන මොහොතේ විපක්ෂය පැත්තෙන් වැඩිපුර සාකච්ඡා වුණේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. ඒ මොකද, පසුගිය කාලයේ මේ රට පාලනය කරපු විපක්ෂයට මේ අරමුදල් ගැන කථා කරන්න බැහැ. ඒ මොකද? මේ අරමුදල් පටන්ගන්නකොට තිබුණු අපේක්ෂිත අරමුණු පූජනීයයි, හොඳයි, පිරිසිදුයි. හැබැයි, මේ විපක්ෂය, රට පාලනය කරපු මේ අය ඒ අරමුදල්වලින් ජනතාවට වෙන්න ඕනෑ දේ නොවෙයි කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසාම මේ ශ්‍රම වාසනා අරමුදලට අදාළවත් 2024.12.18වන දින සමාලෝචන කමිටුවක් පත් කළා. ඒ පත් කළ කමිටුවෙන් පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා, මේ ශ්‍රම වාසනා අරමුදල පාවිච්චි කරපු පාලකයෝ,

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

ඒවාට නායකත්වය දීපු අය මේ අරමුදල යොදවා තිබෙන්නේ ඉතා අනවශ්‍ය දේවල්වලට බව. "අපනයනය පිහිටුවීම වෙනුවෙන් නිර්ණය කළ අරමුණින් අපගමනය වීම, අදාළ අපනයන කාර්යභාරය වර්තමාන අරමුණ හා නොගැළපීම සහ වෙනත් ආයතනවල විෂයයන්වලට ඇතුළත් වීම" වාගේ කාරණා ගණනාවක් නිසා ඒ අරමුදල විසුරුවා හරින්න ඒ විද්වත් කමිටුව විසින් තීරණය කර තිබෙනවා. ඒ ගැන තමයි අද මේ සාකච්ඡා වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක කාලයක මනූෂ නානායක්කාර කියලා ගාල්ල පැත්තේ ඇමතිවරයෙක් හිටියා. මට මතකයි, මනූෂ නානායක්කාර කියන ඇමතිවරයා ඒ කාලයේ මේ අරමුදල පාවිච්චි කරලා 10x10 canopyවලට - හට්වලට - රුපියල් ලක්ෂ 15, 20 ගත්තා. ඒවා ගාල්ලෙන් අරගෙන යාපනයට අරගෙන ගියා. එහෙම ඒවාට තමයි මේ අරමුදල පාවිච්චි කළේ. රුපියල් 1,000ක බෑග් එක රුපියල් 2,000ට අරගෙන දුන්නා. පසුගිය දවස්වල මේ පාර්ලිමේන්තුවේදීම අපට අහන්න ලැබුණා ජනාධිපති අරමුදල පාවිච්චි කරලා තිබෙන්නේ කොහොමද කියලා.

හිටපු සෞඛ්‍ය ඇමති කොහොමද ජනාධිපති අරමුදල පාවිච්චි කරලා තිබෙන්නේ කියලා අපට අහන්න ලැබුණා. දැන් පාර්ලිමේන්තුවේ මහා ලොකුවට නීතිය ගැන කථා කරන, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධව කථා කරන මන්ත්‍රීවරු එදා කොහොමද ජනාධිපති අරමුදල පාවිච්චි කරලා තිබෙන්නේ කියලා අපට අහන්න ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා අමුතු දේවල් නොවෙයි.

2024 අවුරුද්දේ - පාර්ලිමේන්තු මහ මැතිවරණය තිබුණු අවුරුද්දේ - ශ්‍රම වාසනා අරමුදලේ වියදම මිලියන 75යි. මේ අරමුදලින් එතුමන්ලා මොනවාද කළේ? එතුමන්ලා ඒ අරමුදලේ සල්ලි සම්පූර්ණයෙන්ම තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිවලට යෙදෙව්වා. සමහරු ඒ අරමුදලින් party දුන්නා, සමහරු බෑග් බෙදුවා, සමහරු රැස්වීම් පැවැත්වූවා. ඒවා තමයි මේ අරමුදලින් කළේ. එවැනි විවිධ දේවල් කළා. අද අපි සාකච්ඡා කරන්නේ ශ්‍රම වාසනා අරමුදල ගැන. හැබැයි, විපක්ෂයේ බොහෝ දෙනෙක් කථා කළේ ඒ ගැන නොවෙයි. එතුමන්ලා වෙනත් විවිධ කාරණා කිව්වා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගැන, අධිකරණය ගැන කථා කළා. නීතිය වල් වැදුණු විධිය අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා අධිකරණයට ගල් ගහපු කට්ටිය, මැතිවරණ සිතියම හකුළපු කට්ටිය, රටේ හිටපු පුරවැසියෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කරපු කට්ටිය, දේශපාලන පක්ෂ තහනම් කරපු කට්ටිය දැන් කථා කරනවා නීතිය ගැන. ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා එතුමන්ලා රට පාලනය කළේ කොහොමද කියලා. ඒ වාගේම රට බංකොලොත් කළ විධියත් අපි දන්නවා. මෙවැනි අරමුදල්, මේ රටේ තිබුණු මහ ජනතාවගේ ධනය දේශපාලන වුවමනා වෙනුවෙන් විනාශ කළාට පස්සේ රට බංකොලොත් වනවා තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියල්ල අපේ රටේ තිබුණු ධනය. ඒ ධනය තමයි එතුමන්ලා විනාශ කළේ. ඒවායේ ප්‍රතිඵලය හැටියට තමයි මේ රට 2022 වනකොට බංකොලොත් වුණේ. රට බංකොලොත් වෙලා ඒකේ ප්‍රතිඵල මේ රටේ ජනතාව භුක්ති වින්දා. දවස් හතර පහ තෙල් පෝලිම්වල හිටපු මිනිස්සු මැරුණා. ගෑස් ටික ගන්න පෝලිම්වල හිටපු මිනිස්සු මැරුණා. එතුමන්ලා දැන් අපට කියලා දෙන්න එනවා රටේ තිබෙන තත්ත්වය ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා රටේ සියල්ල විනාශ කරලා, මේ රට බංකොලොත් කළා. නීතිය වල් වද්දලා මේ රට දැවැන්ත විනාශයකට ඇද දමපු අය තමයි අද මේ ඉතා සුජාත ලෙස කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අරමුදල අහෝසි කරලා, ජනතාවට අහිතකර විධියට බල නොපාන විධියට හා මෙම අරමුදලින් ප්‍රතිලාභ ලැබෙන ජනතාවට වඩාත් විධිමත්ව එම ප්‍රතිලාභ කම්කරු අමාත්‍යාංශය තුළින්ම ලැබෙන විධියට දැන් කටයුතු සලස්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුව ශිෂ්‍යත්ව අරමුදල වැඩි කරලා රට පුරාම දරුවන්ට ලැබෙන ප්‍රතිලාභ වඩාත් යහපත් විධියට ලබා දෙනවා. එම නිසා අපි විශ්වාස කරනවා, මෙම මුදල අහෝසි කිරීම නිසා ඒකෙන් ලැබුණු කිසිදු ප්‍රතිලාභයක් අහිමි නොවන බව. සෑම ප්‍රතිලාභියෙකුටම අසාධාරණයක් නොවන විධියට එම කටයුතු වඩාත් යහපත් ආකාරයට සූදානම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අරමුදල අහෝසි කිරීමෙන් ජනතාවට කිසිදු අසාධාරණයක් සිද්ධ වෙන්නේ නැහැ කියන පණිවුඩය ලබා දෙමින්, මට කථා කරන්න කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 08ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.28]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் சிரம வாசனா நிதியம் சம்பந்தமான நிதிச் சட்டத்தின் கீழான தீர்மானம் பற்றி விவாதிக்கப்படுகின்றது. அது பற்றி ஒருசில விடயங்களைக் கூறியாக வேண்டும். கடந்த காலத்தில் இந்த நிதியம் தவறான விதத்தில் பயன்படுத்தப்பட்டது என்பதும், இந்த நிதியத்தைச் சரியான முறையில் பயன்படுத்துவதற்காக எடுத்த முடிவு இந்த நிதிச் சட்டத்தின் கீழான தீர்மானம் என்பதும் புரியக்கூடியதாக இருக்கின்றது.

கடந்த ஆண்டில் வரவு கூடியிருப்பதாகவும் செலவினங்கள் குறைந்திருப்பதாகவும் கூறப்படுகின்றது. மேலும், 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களை மீளக் கட்டியெழுப்பு வதற்காக அமைக்கப்பட்ட நிதியத்தில் இதுவரை 30 சதவீதம்தான் செலவு செய்யப்பட்டு இருப்பதாகவும் சொல்லப் படுகின்றது. அப்படிப் பார்த்தால், வரவு அதிகரித்திருக்கின்றது; செலவு குறைந்திருக்கின்றது. 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களை மீளக்கட்டியெழுப்புவதற்காக அமைக்கப்பட்ட நிதியத்தில் 70 சதவீதம் வரை நிதி இருக்கின்றது. அந்த வகையில், நிதி முறையாக முகாமைத்துவம் செய்யப்பட்டு இருக்கின்றது என்பதை இதன்மூலம் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. கடந்த காலத்தில் தேசிய வீடமைப்பு அதிகாரசபை மூலமாகக் கட்டப்பட்ட பல வீடுகள் அரையும் குறையுமாகக் காணப் படுகின்றன. அதேநேரம், வீடற்றவர்களும் காணப்படுகின் றார்கள். இந்த நிதியத்தின் நிதிமூலம் அரைகுறையாக இருக்கின்ற வீடுகளைக் கட்டிக்கொடுத்தால் ஏழை மக்கள் வாழ்வதற்கு வழிவகுத்ததாக இருக்கும். மலையகத்திலும்கூட 'லயன்' வீடுகளில் இருக்கின்ற வர்களுக்கு வீடுகளைக் கட்டிக் கொடுப்பதற்கு இந்த நிதியத்தின் நிதியைப் பயன்படுத்தலாம்.

இன்னுமொரு முக்கியமான விடயம் என்னவென்றால், எமது இளைஞர், யுவதிகள் தொழிலற்றவர்களாகக் காணப் படுவதுதான். அவர்கள் அநேகமாக மத்திய கிழக்கை நோக்கித்தான் படையெடுக்கின்றார்கள். அவர்களுக்குத் தொழில் வாய்ப்புகளை வழங்கவேண்டிய அவசியம் இந்த அரசாங்கத்துக்குக் காணப்படுகின்றது. எனவே, இந்த நிதியை இதற்குப் பயன்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அண்மையில் பட்டதாரியான டிலக்ஷன் என்பவர் மேசன் வேலை செய்யச் சென்று சுவர் இடிந்து விழுந்ததில் மரணித்திருக்கிறார்.

அடுத்து, போட்டிப் பரீட்சை தொடர்பாகக் குறிப்பிட வேண்டும். போட்டிப் பரீட்சைகளில் பரீட்சார்த்திகள் பெறுகின்ற புள்ளிகளை வெளிப்படையாக அறிவிக்கவேண்டிய தேவையிருக்கின்றது. அண்மையில் மருந்தகக் கூட்டுத் தாபனத்தில் போட்டிப் பரீட்சை ஒன்று நடைபெற்றது. 1, 2, 3 எனக் குறிப்பிடப்பட்டு பரீட்சார்த்திகளுக்குரிய கடிதங்கள் அனுப்பப்பட்டு இருந்தன. இரண்டாம் இடத்தில் சென்றவர், தனக்கு இன்னும் நியமனம் கிடைக்கவில்லை என்பதை ஆதங்கத்தோடு தெரிவித்திருந்தார். போட்டிப் பரீட்சைகளில் பரீட்சார்த்திகள் பெறுகின்ற புள்ளிகளை வெளிப்படையாக அறிவித்தால் அவர்கள் அதனை ஏற்றுக்கொள்வார்கள். எனவே, அதனைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நெல் சம்பந்தமாக ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். எனக்கு மட்டக்களப்பில் இருந்து கிடைத்த தகவலின்படி, கள்ளியங்காட்டுக்குப் பக்கத்தில் பல வண்டி களில் நெல்லை சந்தைப்படுத்துவதற்காக வந்திருக்கிறார்கள். எனினும், பணம் இல்லை என்பதாகச் சொல்லப்பட்டு இருக்கின்றது. அதன்பின்னர் நாங்கள் அரசாங்க அதிபரோடு தொடர்புகொண்டு கதைத்தபோது, அதற்குரிய நிதியை வழங்குவதாகச் சொன்னார். எனவே, நெல்லுக்கான உத்தரவாத விலையை நிர்ணயிக்க வேண்டியதும், நெல்லைக் களஞ்சியப்படுத்த வேண்டியதும் விவசாயிகள் சார்பாகச் செய்யப்பட வேண்டிய வேலைகளாகக் காணப்படுகின்றன. மேலும், மட்டக்களப்பிலுள்ள விவசாயத் திணைக்களத்தில் நிருவாக அதிகாரிகளுக்குப் பற்றாக்குறை இருக்கையில், அங்கு இருக்கின்றவர்களை இடமாற்றம் செய்து, விவசாயத்துறை பாதிக்கக்கூடிய நிலையை ஏற்படுத்தக் கூடாதெனக் கேட்டுக் கொள்கின்றேன்.

சர்வதேச காணாமல் ஆக்கப்பட்டோர் தினம் இம்மாதம் 30ஆம் திகதி வருகின்றது. வலிந்து காணமால் ஆக்கப்பட்டவர் களைத் தேடுகின்ற முயற்சி நீண்டகாலமாக நடைபெறு கின்றது. அன்றைய காலத்தில் செம்மணியில் புதைகுழி ஒன்று இருப்பதாகவும், அதில் 600க்கும் மேற்பட்டவர்கள் புதைக்கப்பட்டு இருப்பதாகவும் சிறையில் இருக்கும் சோமரத்ன ராஜபக்ஷ என்ற கைதி சொன்னார். அவருடைய கருத்து இப்போது உண்மையாகி வருகின்றது. இதுவரை 572 என்புக்கூடுகள் அடையாளம் காணப்பட்டு இருக்கின்றன. அக்காலத்தில் அந்த முகாமில் இருந்த இராணுவத்தினர் யார்? யார் அதிகாரிகளாக இருந்தார்கள்? இந்தப் படுகொலைகளைச் செய்து இந்தத் தேசத்துக்கு அவர்கள் ஒரு கெட்டபெயரைப் பெற்றுக்கொடுத்து இருக்கிறார்கள். எனவே, இந்த விடயம் தீர்க்கமாக விசாரிக்கப்பட்டு, குற்றவாளிகள் கண்டறியப்பட்டு, அவர்களுக்குரிய தண்டனைகள் வழங்கப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, சுகாதார உதவியாளர் நியமனம் பற்றி சொல்ல வேண்டும். இன்று பரவலாக எல்லோரும் இந்த விடயம் தொடர்பாக பேசிக்கொண்டு இருக்கின்றார்கள். இது பற்றி பேசக்கூடாது என்று இருந்தாலும்கூட, சில பேச்சுகள் பேசப்பட்டதனால், இவ்விடயம் குறித்து நான் அறிந்த தகவல்களைச் சொல்லவேண்டி இருக்கின்றது. எனக்கு முன்னர் பேசிய பிரதி அமைச்சர் ஒருவர் அழகாகச் சொல்லியிருந்தார், எந்தவொரு வார்த்தையைக் கேட்டாலும் உண்மையைக் கண்டறிய வேண்டும் என்று. 'திருக்குறள்' பின்வருமாறு கூறுகின்றது:

> "எப்பொருள் யார்யார்வாய்க் கேட்பினும் அப்பொருள்
> மெய்ப்பொருள் காண்ப தறிவு"

அதாவது, யார் எதைக் கதைத்தாலும் உண்மையைக் கண்டறிய வேண்டுமெனச் சொல்லப்படுகின்றது. யோகர் சுவாமி சொல்லியிருக்கிறார், "விளங்கும் முன் விளம்பாதே" என்று. நான் இந்த விடயத்தை அறிந்ததும், அந்த வைத்தியசாலையின் மூத்த நிருவாக அதிகாரிகள், நிருவாக உத்தியோகத்தர்கள், Hospital Committee என்று சொல்லப்படுகின்ற அந்த வைத்தியசாலைக் குழுவின் தலைவரான சந்திரசேகரம் ராஜன், முரளீஸ்வரன் போன்ற பணிப்பாளர்களைத் தொடர்புகொண்டு உண்மையைக் கண்டறிய முனைந்தேன். நான் இதுவரை வெளியில் இந்த விடயங்கள் பற்றி பேசவில்லை. இப்போது பரவலாக இது தொடர்பான பேச்சுகள் இடம்பெறுகின்றபடியால், இதனைச் சொல்கின்றேன். மூத்த நிருவாக உத்தியோகத்தர் ஒருவர் என்னிடம் சொன்னார், "எங்களுக்கென தாபன விதிக்கோவை இருக்கிறது; சுற்றுநிருபம் இருக்கிறது. சுற்றுநிருபத்தையோ, தாபன விதிக்கோவையையோ மீறினால் மேலதிகாரிகள் எங்கள்மீது நடவடிக்கை எடுப்பார்கள். நாங்கள் தாபன விதிக்கோவை மற்றும் சுற்றுநிருபத்துக்கு அமைவாகத்தான் செயற்பட்டு இருக்கின்றோமே ஒழிய, இந்த விடயத்தில் எந்தவித பாரபட்சமும் காட்டவில்லை" என்று.

இங்கு RDHS, Dr. G. Sukunan அவர்கள் பற்றியும் பேசப்பட்டது. அவர் ஓர் இனவாதி என்றும் சொல்லப்பட்டது. குறித்த சம்பவம் நடந்தபோது அவர் அங்கு இருக்கவில்லை. ஏனெனில், அவர் விபத்துக்கு உள்ளாகி நீண்டகாலமாக வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டு இருந்தார். இங்கு கௌரவ கோடீஸ்வரன் அவர்கள் பற்றியும் சொல்லப்பட்டது. அதாவது, அவர் சுகாதார அமைச்சருக்கு நன்றி கூறினார் என்ற விடயம் சொல்லப்பட்டது. அவர் சுகாதார அமைச்சரிடம் கேட்டுக்கொண்ட விடயம் என்னவென்றால், இந்தப் பிரச்சினையைச் சுமுகமான முறையில் தீர்த்து வைக்கும்படி தான். இதற்கானதொரு தீர்வு வழங்கப்பட்டுள்ளதாக கௌரவ அமைச்சர் அவர்கள் சொன்னபோது, அவருக்கு நன்றி சொன்னாரே ஒழிய, அவர் தவறாக எதுவும் சொல்லவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Please give me one more minute, Sir.

சமூக ஊடகங்களில் இந்த விடயத்தைப் பெரிதுபடுத்தி மோசமான முறையில் விமர்சனங்களை மேற்கொண்டபோது, இது தொடர்பாகப் பேசும்படி எங்களிடமும் பலர் கேட்டுக் கொண்டார்கள். எனினும், நாங்கள் பேசவில்லை. ஒவ்வொருவரும் பேசிப் பேசி இந்தப் பிரச்சினையைப்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பூதாகரமாக்கிவிடக் கூடாது என்பதற்காகத்தான் நாங்கள் பேசவில்லை. இது பற்றி எல்லோரும் பேசியபடியால், இதற்குரிய விளக்கத்தை குறித்த வைத்தியசாலையின் பணிப்பாளரிடம் கேட்டபோது, "நாங்கள் தாபன விதிக்கோவை மற்றும் சுற்றுநிருபத்துக்கு அமைவாகச் செயற்பட்டோமே ஒழிய, யாரையும் வஞ்சிக்க வேண்டும் என்ற எண்ணத்தில் செயற்படவில்லை" என்று சொன்னதை மீண்டும் ஞாபகமூட்டுகின்றேன். சீருடை தொடர்பான சுற்றுநிருபத்தில் திருத்தங்கள் மேற்கொள்ளப்பட்டால், அதன்பின்னர் அவர்கள் அதனைப் பின்பற்றுவார்கள் என்பதைக் கூறிக்கொண்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி விடை பெறுகின்றேன். வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1998 අංක 12 දරන පනතින් ශ්‍රම වාසනා අරමුදල නමින් ආයතනයක් ස්ථාපිත කළා. එම ආයතනය විසුරුවා හැරීම සඳහා මේ වන විට කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ වෙනුවෙන් අද දවසේ පැවැත්වෙන විවාදයට තමයි මේ විධියට අපි සම්බන්ධ වෙන්නේ. මේ ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වුණේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ සුබසාධනය සහ ඔවුන්ට මූල්‍ය ආධාර සැපයීමයි. රජයට අයත් වාණිජමය නොවන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ඇවර කිරීමේ වැඩ පිළිවෙළ යටතේ තමයි මේ ආයතනය ඇවර කිරීමට සිද්ධ වෙලා තිබෙන්නේ. ඇවර කළා කියලා මේ ආයතනය තුළින් සිදුවෙච්ච කාර්යභාරය කිසිදු ආකාරයකට නතර වීමක් හෝ එයට හානිවීමක් සිද්ධ වෙන්නේ නැහැ. එම අරමුදල යටතේ කරන ලද සියලු අත්‍යවශ්‍ය සේවා අනාගතයේදී කම්කරු අමාත්‍යාංශය හරහා ඉෂ්ට කරනවා. මේ හා සම්බන්ධ ප්‍රතිලාභීන් කවුරුන් හෝ ඉන්නවා නම් ඔවුන් කිසිවෙකුත් බිය විය යුතු නැහැ. අපේ රජය යටතේ, කම්කරු අමාත්‍යාංශය හරහා ඔවුන්ගේ අවශ්‍යතා සියල්ල ඉෂ්ට කරනවා. එවැනි වටපිටාවක ඉඳගෙන තමයි අපි අද මේ විවාදයට සම්බන්ධ වෙන්නේ.

මෙයත්, අපේ රටේ ව්‍යවස්ථා සම්පාදනය කරන අවස්ථාවක්. පාර්ලිමේන්තුව කියන්නේ, රටක ව්‍යවස්ථා සම්පාදනය කරන, අලුත් නීති රීති ගෙනෙන තැනක්. මේ මොහොත වෙනකොට දැඩි කථා බහකට ලක් වෙලා තිබෙන දෙයක් තමයි ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ විනිශ්චයකාරුවන්ගේ විශ්‍රාම යාමේ වයස ඉහළ දැමීමේ කාරණය. ඒ වෙනුවෙන් විපක්ෂයෙන් බොල් හඬක් මතු වෙනවා. අපි මේ ගෙනෙන සංශෝධනයට විරුද්ධව නැඟී සිටින්න ඔවුන්ට කිසිදු ආකාරයක සුජාත අයිතියක් නැහැ. තමන්ට බාධාවක් වුණා කියලා එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. එහෙම කළේ එතුමාට ව්‍යවස්ථාවෙන් තිබුණු බලය පදනම් කරගෙනයි. තමන් සමඟ තරගයට ආවා කියලා හිටපු යුද හමුදාපති සරත් ෆොන්සේකා මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහිමි කළා විතරක් නොවෙයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ව්‍යවස්ථාව තුළින් තමන්ට තිබුණු බලය පාවිච්චි කරලා සරත් ෆොන්සේකා මැතිතුමාව සිරගත කිරීමටත් කටයුතු කළා. තමන්ගේ මතයට අනුව වැඩ කළේ නැහැ කියලා, එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර තනතුර දරපු ශිරානි බණ්ඩාරනායක මැතිතුමියව දෝෂාභියෝගයක් ගෙනැල්ලා අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ඉවත් කළා. ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවෙන් ලැබුණු බලය පදනම් කරගෙන තමයි එදා ඒ විධියට කටයුතු කළේ. ඒවාට තමයි අවභාවිත කිරීම් කියලා කියන්නේ. ඉදිරියට මැතිවරණයක් තියනවාද, නැද්ද කියන එක වෙනුවට ජනමත විචාරණයක් තියලා මේ රටේ ජනතාවගෙන් ජන මතය විමසුවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තිබුණු පළමුවැනි ජනමත විචාරණය වන ලාම්පු, කළගෙඩි සෙල්ලම ඔබට මතක ඇති. තමන්ගේ ආණ්ඩුව තවත් ඉදිරියට පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා ලාම්පුවත්, කළගෙඩියත් සංකේත හැටියට පාවිච්චි කරලා ඡන්දයක් ඕනෑද, එපාද කියන එක ජාතික වටිනාකමක් තිබෙන ප්‍රශ්නයක් හැටියට මතු කළා. ඒ විධියට, එදා ලාම්පු, කළගෙඩි සෙල්ලම තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි තුනක කාලයක් ලබා ගන්න පුළුවන්.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

වැඩිපුර විනාඩි 3ක් හම්බ වෙනවාද? ඒ කියන්නේ, විනාඩි 10ක්?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔව්.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඡන්දය ඉල්ලන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි වෙලා. ඒ වෙනුවෙන් තමයි හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ඡන්දය ඉල්ලුවේ. එතුමා ඡන්දය ඉල්ලුවේ, මහනුවර දිස්ත්‍රික්කයෙන්. එතුමා ඡන්ද පොළට යනකොට එතුමාගේ ඡන්දෙත් දාලා තිබුණා. එහෙම තමයි එදා මේ රටේ ව්‍යවස්ථාව අවභාවිත කළේ. එහෙම අවභාවිත කරපු දේශපාලන සංස්කෘතියක් නියෝජනය කරන විපක්ෂයේ මහත්තුරු දැන් මේ ඉල්ලන්නේ මොකක්ද? අපි ඉදිරිපත් කරන්නේ යහපත් රටක් නිර්මාණය කිරීම සඳහා වන හොඳ ව්‍යවස්ථා සංශෝධනයක්; ව්‍යවස්ථා සම්පාදනයක්.

ඒ වෙනුවෙන් තමයි මේ පාර්ලිමේන්තුවට අපි පත් කර එවලා තිබෙන්නේ. අපි පත් කරලා එව්වේ මේ රටේ මහජනතාව. මේ රටේ ජනතාව විසින් අපේ පක්ෂයේ 159දෙනෙකුට දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික ලැයිස්තුව හරහා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව උදා කර දුන්නා. එම නිසා ජනතාව බලාපොරොත්තු වෙච්ච දේ අපි ඉෂ්ට කරන්න ඕනෑ.

අපේ රටේ අධිකරණ පද්ධතිය, අපිම හදා ගත් එකක් නොවෙයි. අපේ රටේ තිබුණු අධිකරණ යන්ත්‍රණය විෂම

අධිරාජ්‍යවාදීන් විසින් වෙනස් කළා. පළමුවෙන්ම ඒක වෙනස් කළේ ලන්දේසීන් ලංකාවට ඇවිල්ලා. අපේ රටේ තිබුණු අධිකරණ පද්ධතිය තුළට, විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය අධිකරණ පද්ධතිය තුළට, අපට ආවේණික අධිකරණ පද්ධතිය තුළට ඔවුන් විවිධාකාර අධිකරණ ආයතන හඳුන්වා දුන්නා. ඒවාට Landraden කිව්වා, Civiele Raden කිව්වා, කොළඹදී Raad van Justitie කිව්වා. ඔවුන් අධිකරණ යන්ත්‍රණයට ගෙනාවේ අපේ රටේ නීති නොවෙයි.

ඔවුන් ගෙනාවේ Batavian නීති, Batavian ව්‍යවස්ථා. එතැන සිටි අග්‍රාණ්ඩුකාරවරයාගේ සහ Political Board එකේ කැමැත්ත තමයි අපේ රටේ නීතිය බවට පත් වුණේ. එහෙම නීති රීති සම්පාදනය කරලා අපේ රටේ අධිකරණ යන්ත්‍රණය වෙනස් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙනස් කරපු නීති රීති තමයි අදටත් අපේ රටේ තිබෙන්නේ. ඒ අනුව වසර 400කට ආසන්න කාලයක් පැරණි නීති රීති පද්ධතියක් තමයි තිබෙන්නේ.

ලංකාවේ අද ක්‍රියාත්මක වන අධිකරණ යන්ත්‍රණය ගැන අපි බලමු. 1798දී ලංකාවට ෆ්‍රෙඩ්රික් නෝර්ත් කියන ආණ්ඩුකාරවරයා පත් වෙලා එනවා. ඒ ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා 1800 අවුරුද්ද පටන් ගන්නකොට මේ රටේ අධිකරණ යන්ත්‍රණය සඳහා අග්‍ර විනිශ්චයකාරවරයා සහ තවත් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් යුත් ශ්‍රේෂ්ඨාධිකරණයක් හඳුන්වා දෙනවා. ඒ විධියට ඔවුන් හඳුන්වා දුන් අධිකරණ යන්ත්‍රණය 1833 දක්වා ක්‍රියාත්මක වුණා.

1833දී කෝල්බෲක් සහ කැමරන් කියලා දෙදෙනෙක් ශ්‍රී ලංකාවට ආවා. ඒ, අපේ රටේ සමාජය, ආර්ථිකය, දේශපාලනය, සංස්කෘතිය ඔවුන්ට ඕනෑ විධියට හැඩගස්වන්න. ඒ සඳහා ඔවුන් මොකද කළේ? 1833දී ගෙනාපු කෝල්බෲක්-කැමරන් යෝජනා හරහා සී.එච්. කැමරන්, නැත්නම් චාල්ස් හේ කැමරන් මේ රටේ අධිකරණ යන්ත්‍රණය වෙනස් කළා. එහිදී අධිකරණය හා සම්බන්ධව අපේ රටේ තිබුණු ගම් සභා ක්‍රමය සතුව තිබුණු බලතල අහෝසි කරනවා. අහෝසි කරලා ඔවුන්ගේ අධිකරණ යන්ත්‍රණය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නා. ඒ, අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න. අධිරාජ්‍යවාදීන් ඒ නීති රීති භාවිත කරලා මේ රටේ ජනතාව දැවැන්ත පීඩාවකට ලක් කළා. ඒ වාගේම වියදම් අධික අධිකරණ යන්ත්‍රණයක් හැදුවා. ඒකට එරෙහිව තමයි මේ රටේ ජනතාව 1848දී මහතලා හටන කළේ. ගොංගාලේගොඩ බණ්ඩා - පැලියගොඩ ඩේවිඩ් -, කුඩාපොළ හාමුදුරුවෝ, ගිරාණගම හාමුදුරුවෝ, වීර පුරන් අප්පු වැනි මේ රටට ආදරය කරපු මිනිස්සු අරගළ කළේ ඒ අධිකරණ යන්ත්‍රණය පරාජය කරන්නයි. ඒ අධිකරණ යන්ත්‍රණය තමයි අපේ රටේ ක්‍රියාත්මක වුණේ.

අප බලයට ගෙනාවේ මේ රටේ සාමාන්‍ය මිනිස්සු. ඒක මතක තියාගන්න. දැතේ හයියෙන් හේනේ වැඩ කරන, කම්මලේ වැඩ කරන මිනිස්සු තමයි අප බලයට ගෙනාවේ. ඒ, ඔවුන්ගේ රාජ්‍යයක් නිර්මාණය කරන්න; ඔවුන්ගේ අනාගතය හදන්න. ඒ සඳහා තමයි "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන තේමාවත් එක්ක අපි මේ රටේ දේශපාලනය වෙනස් කළේ. දේශපාලනය වෙනස් කළා වාගේම ජනතාවට අවශ්‍ය වන ආකාරයට මේ රටේ නීති රීතිත් වෙනස් වෙන්න ඕනෑ. ඉතාම සුළුතරයක් වෙච්ච ධනපති පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් සකස් වුණු නීතියක් වෙනුවට මේ රටේ අතිබහුතරයක් ජනතාව වෙනුවෙන් නීති රීති පද්ධති හැදෙන්න ඕනෑ; සංශෝධන කෙරෙන්න ඕනෑ. "පොහොසත් රටක් -ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති මාලාව යටතේ අපි කියලා තිබෙනවා, 1978දී හඳුන්වා දුන් දෙවන ජනරජ ව්‍යවස්ථාව වෙනුවට මේ රටට ගැළපෙන අලුත් ව්‍යවස්ථාවක් හදනවා කියලා. ඒ පොරොන්දුව මත අපි ඉදිරි අවුරුදු තුනකට ආසන්න කාලය තුළ ඒ නීති රීති සංශෝධනය කරලා අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කරනවා. ඒ සංශෝධනය වීමත් එක්ක අපට අලුත් ව්‍යවස්ථාවක් අත්විඳින්න පුළුවන් වෙයි. ඒ ව්‍යවස්ථාව එනකම් මේ රටේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන යම් යම් අකටයුතුකම් වැළැක්විය යුතුයි. විශේෂයෙන්ම මේ රටේ වැරදි කරපු වූදිතයින්ට හරියට දඬුවම් දෙන්න බැරි වෙලා තිබෙන නිසා අධිකරණ යන්ත්‍රණය තුළ පැහැදිලි වෙනස්කමක් ඇති විය යුතුයි. ඒ සඳහා තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්නේ. මම හිතන විධියට, ඉදිරි මාස දෙක තුන ඇතුළත අනිවාර්යයෙන් මේ සංශෝධනය මේ පාර්ලිමේන්තුවේ සම්මත වනවා. ඒකට ජනමත විචාරණයක් අවශ්‍ය වන්නේ නැහැ. ඒකට හේතුව, අධිකරණය තුළ ඉන්න විනිශ්චයකරුවන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම හා සම්බන්ධව ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ කිසිම තැනක සඳහන්ව නොතිබීමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික වශයෙන් වැදගත් වූ ප්‍රශ්න සම්බන්ධයෙන් තමයි ජනමත විචාරණයකට යන්න තිබෙන්නේ. අපේ රටේ ජාතික ගීය වෙනස් කිරීම, ජාතික කොඩිය වෙනස් කිරීම, පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීම, ජනාධිපතිවරයාගේ නිල කාලය දීර්ඝ කිරීම වැනි ජාතික වශයෙන් වැදගත් වූ අවස්ථාවල විතරයි ජනමත විචාරණයකට යන්න තිබෙන්නේ. නමුත් අපේ විපක්ෂය උත්සාහ කරනවා, මේ තත්ත්වය යට ගහලා, මේක වෙන පැත්තකට අරගෙන ගිහිල්ලා මහජනතාවගේ සුබසාධනය වෙනුවෙන්, යහපත වෙනුවෙන් ගන්න මේ උත්සාහය අසාර්ථක කරන්න. මේක අපි අනිවාර්යයෙන් පරාජය කරනවා. වගකිව යුතු රජයක් හැටියට අපි මේ ව්‍යවස්ථා සංශෝධනය අනිවාර්යයෙන්ම සම්මත කරන බව ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම නතර කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරා මේ පාර්ලිමේන්තු සභා ගැබ තුළ සාකච්ඡාවට භාජන වුණු, 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රම වාසනා අරමුදල විසුරුවා හැරීම සම්බන්ධයෙන් වූ විවාදයේ අවසාන කොටස තමයි මේ පැවැත්වෙන්නේ.

අද දිනට අදාළ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට අනුව විවාද කරනු ලබන නිශ්චිත, ප්‍රස්තුත කරුණ මේකයි. හැබැයි, මේ පාර්ලිමේන්තුවේදී අද දවස පුරාම පැවති විවාදය නිරීක්ෂණය කරනකොට, පරීක්ෂණයට ලක් කරනකොට අපට දකින්න ලැබුණේ විපක්ෂය පැත්තෙන් නඟන එකම එක අඳෝනාවක්, එකම එක අඬ ඇඬියාවක්, එකම එක විලාපයක් විතරයි. ඒ හැරෙන්න අද විවාදයට ගනු ලබන යෝජනා සම්මතයට අදාළව කිසිදු කරුණක් විපක්ෂය පැත්තෙන් පාර්ලිමේන්තුව තුළදී සාකච්ඡා කෙරුණේ නැහැ. විපක්ෂ නායකතුමා විපක්ෂය පැත්තෙන් විවාදය ආරම්භ කරද්දිත්, විපක්ෂයේ අනෙකුත් සියලු කථිකයන් කථා කර අවසන් කරද්දිත් මතු කළේ එකම එක දෙයයි. ඒ කාරණය තමයි, ඊයේ දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඔවුන් ඒ කාරණය සම්බන්ධව පමණයි විවාද කළේ, වෙන කිසිවක් නොවෙයි. අද දින මුදල් පනත යටතේ ශ්‍රම වාසනා අරමුදලට අදාළව සම්මත කිරීමට ඉදිරිපත් කළ යෝජනා සම්මතය ගැන කිසිදු කරුණක් ඔවුන් මේ පාර්ලිමේන්තුව තුළදී කථා කළේ

[ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා]

නැහැ. විපක්ෂයට ශ්‍රම වාසනා අරමුදල අහෝසි කිරීම - ඇවර කිරීම - පිළිබඳ කරුණ තහනම් වචනය බවට පත් වෙලා තිබුණා. ඒ අනුව විපක්ෂයේ එකම මාතෘකාව, එකම භීතිකාව බවට පත් වෙලා තිබුණේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ කාරණයයි. ඒක ගැන මේ පාර්ලිමේන්තුවේදී විවාද කරනවා. ඒකට අවස්ථාව තිබෙනවා. ඒකට තව කල් තිබෙනවා. හැබැයි, එසේ තිබියදීත් විශේෂයෙන්ම විපක්ෂය පැත්තෙන් යම් විරෝධයක් මතු කරනවා. ඊයේ දිනයේදීත් විපක්ෂය පැත්තෙන් විරෝධයක් ඉදිරිපත් කළා, උද්ඝෝෂණයක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදායය තුළ ප්‍රජාතන්ත්‍රවාදයට අදාළ කුලුනු තුනක් සම්බන්ධ පාඩමක් අපට කියා දී තිබෙනවා. ඒ තමයි ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන කුලුනු තුන. වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුව ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන කුලුනු තුන මත ප්‍රජාතන්ත්‍රවාදයේ දෙවොල පිහිටා තිබෙනවා කියා තමයි අපට දේශපාලන විද්‍යාව තුළ ඉගැන්නුවේ. ඒ තුළ ව්‍යවස්ථාදායක බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුව සතුව තිබෙන බලතල, අධිකරණය සතුව තිබෙන බලතල සහ විධායකය සතුව තිබෙන බලතල එකිනෙකට ස්වායත්තයි; ස්වාධීනයි; එකිනෙකට වෙනස්. එකක් අබිබවා තව එකක් යනු නොලබයි.

හැබැයි, අපේ රටේ විපක්ෂ නායකතුමා අද උදේ මේ විවාදය ආරම්භ කරලා මේ පාර්ලිමේන්තුවට වැරදි පූර්වාදර්ශයක් සහ නරක දේශපාලන භාවිතාවක් උගන්වා ගියා. ඒ, මොකක්ද? එතුමා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් වන සාකච්ඡාවකට ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ආරාධනා කළා. එතුමා නීතිඥ සංගමය මේ පාර්ලිමේන්තුවට කැඳවීමටත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාටම සහභාගි වෙන්න වැඩ මුළුවක් පැවැත්වීමටත් මේ විවාදය තුළ කරුණු ඉදිරිපත් කරනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමා තමයි මූලාසනයේ වාඩි වෙලා හිටියේ. විපක්ෂ නායකතුමා එතුමාටත් නියෝගයක් දීලා ගියා, එම වැඩ මුළුවට ගරු කථානායකතුමාටත් එන්න කියන්නය කියලා. එම නියෝගය ආවේ කොහෙන්ද? ඒක කාගේ නියෝගයක්ද? ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව - තුළ සිටින මන්ත්‍රීවරුන්ට, පාර්ලිමේන්තුවට එවැනි නියෝගයක් නිකුත් කරන්න නෛතික බලයක් තිබෙනවාද? එහෙම හැකියාවක් තිබෙනවාද? පාර්ලිමේන්තුව සතු බලතල අවභාවිත කරන්න විපක්ෂ නායකතුමාට බලයක් නැහැ, හැකියාවක් නැහැ, අයිතියක් නැහැ. ඒකට මේ පාර්ලිමේන්තුවේ ඉඩකුත් නැහැ. එතුමාට ඒකට ජන වරමකුත් නැහැ. ඒක හොඳට තේරුම් ගන්න. තමන්ගේ තරාතිරම දැනගන්න ඕනෑ. තමන්ගේ තරම හඳුනා ගන්න ඕනෑ. එහෙම තමන්ගේ තරම හඳුනා නොගෙන පාර්ලිමේන්තුවට නියෝග නිකුත් කරන්න බැහැ, පිටස්තර අය ලවා. මම සමාජ මාධ්‍ය තුළත් දැක්කා, ශ්‍රේෂ්ඨාධිකරණයටත් එවැනි නියෝගයක් නිකුත් කර තිබෙන බවක්. මීට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කර තිබෙනවා. ඊයේ තමයි එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පළමුවන වර කියෙව්වේ. හැබැයි, ඊයේ දවස ඇතුළත පෙත්සම් හයක්ද, අටක්ද ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා.

ඒ පෙත්සම් විභාග සියල්ලටම ශ්‍රේෂ්ඨාධිකරණයේ සියලු විනිසුරුවරුන් වාඩි විය යුතුයි. එම නියෝගය කාගේද? ශ්‍රේෂ්ඨාධිකරණයට එහෙම නියෝග දෙන්න තරම් තැනකට එන්න පුළුවන්ද? ඒකද අධිකරණයේ ස්වාධීනත්වය? මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළව අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන මේ මහත්වරුන්, නීතිඥයන්, නීති විශාරදයන් ගෙනෙන තර්කය ඒකද? ඒක අධිකරණයේ ස්වාධීනත්වයද? නැහැ. ඒක අධිකරණයේ ස්වාධීනත්වය නොවෙයි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ ගොඩගැහිලා තිබෙන නඩු ටික, පෙළ ගැහිලා තිබෙන නඩු ටික ඉක්මනින් විසඳා රටේ ජනතාවට නීතියේ ආධිපත්‍යයේ ගරුත්වය, නීතියේ ආධිපත්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න පුළුවන් වන විධියේ ප්‍රතිපාදන, ඒ ක්‍රමවේදය සකස් කරන එකට විපක්ෂය කලබල වෙලා තිබෙන්නේ ඇයි? ඇයි, විපක්ෂය කලබල? ඇයි විපක්ෂය, භූමිතෙල් ගැවුණු කවුද වාගේ දඟලන්නේ? විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ සහ අනෙකුත් උපරිමාධිකරණවල විනිසුරුවරුන්ගේ ධුර කාලය වෙනස්වීම තුළ මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට වෙන හානිය මොකක්ද? ඒ ගැන කොහේද පැහැදිලි කරලා තිබෙන්නේ? ඒ කිසිවක් නැතුව දැන් අර මැක්කා වාගේ තමයි. අපේ ජන කියමන්වල තිබෙනවා, මැක්කාගේ කථාව. අද දවසේම පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ භූමිකාව තුළ තිබුණේත් මැක්කාගේ කථාව තමයි. විසි දෙක, විසි දෙක කියනවා හැර ඊට එහා වෙන කිසිවක් නැහැ. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ කාරණා ගැන විතරයි කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සම්මත කරන මේ මුදල් පනත යටතේ වන යෝජනා සම්මතයට අදාළ කාරණය ගත්තොත්, 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත ප්‍රකාරව මෙම අරමුදල ආරම්භ කළේ විශේෂයෙන්ම අපේ රටේ පෞද්ගලික අංශය නියෝජනය කරන තිස්හත්ලක්ෂයක් වෙච්ච වැඩ කරන ජනතාව, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් බවට පත් වෙච්ච ඒ සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාවට අදාළව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවීමට අදාළව අවශ්‍ය කරන පහසුකම් සැපයීම සඳහායි. එවැනි මුඛ්‍ය අරමුණු 6ක් තේමා කර ගනිමින් තමයි මේ ශ්‍රම වාසනා අරමුදල ගොඩනැඟුවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූලික අරමුණු 6ට අදාළව මේ රටේ වැඩ කරන පන්තියට, වැඩ කරන ජනතාවගේ සුබසාධන කටයුතුවලට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා තමයි මේ ලොතරැයිපත නිර්මාණය වුණේ. හැබැයි, මෙහි අරමුණ බොහොම හොඳයි. අරමුණ සද්භාවීයි. නමුත් ගෙවුණු කාල වකවානුව තුළ මේ අරමුදල පාවිච්චි වෙච්ච හැටි පිළිබඳව පසු විපරම් කරලා බලනකොට පෙනෙනවා, එකී මුඛ්‍ය අරමුණුවලට පරිබාහිරව, එකී උත්තුංග අරමුණුවලට පටහැනිව හුදු පටු දේශපාලනික බඩ ගෝස්තරවාදී වුවමනා සඳහා පමණක්ම තමයි ඒ ක්‍රියාවලිය භාවිතයේ යෙදිලා තිබෙන්නේ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ අරමුණ එක්ක ගත්තාම, අරමුණ සහ භාවිතාව දෙකක් බවට පත් වෙලා තිබෙනවා. ඒක නිකම් හරියට වර්තමානයේ අපේ මේ විපක්ෂයේ භූමිකාව වාගේම තමයි. කියන්නේ එකක්, කරන්නේ තව එකක්. ඒක වර්තමාන විපක්ෂයේ භූමිකාව වාගේම තමයි. ඒ නිසාම තමයි මේ සම්බන්ධයෙන් අධීක්ෂණය කරලා, විද්වත් කමිටුවක් හරහා පරීක්ෂා කළේ. ඌන උපයෝජිත ආයතන පිළිබඳව තීන්දු-තීරණ ගැනීමට අදාළ විද්වත් මණ්ඩලයක තීන්දුවක් මත තවදුරටත් ඒ අරමුදල වෙනම අරමුදලක් හැටියට පවත්වාගෙන යනවා වෙනුවට එය විසුරුවා හැරීමට කටයුතු කරනවා. මොකද, ඒ අරමුදල ගොඩනැඟීමෙන් බලාපොරොත්තු

වෙච්ච මුඛ්‍ය තේමා වන සේවා නියුක්තිකයන්ගේ වුවමනා, අභිලාෂ සැබෑ ලෙසම මල්ඵල ගැන්වීමට අවශ්‍ය ප්‍රායෝගික ක්‍රියාවලිය යථාර්ථයක් බවට පත් කර ගන්නට ඒ අරමුදල විසුරුවා හැර එය ඒකාබද්ධ අරමුදලට යොමු කරන්නත්, එය නිසි අධීක්ෂණය සහ පරීක්ෂාව යටතේ ජනතාවගේ අභිලාෂ සහ මේ රටේ වැඩ කරන ජනතාවගේ වුවමනා වෙනුවෙන් පාවිච්චි කරන්නත් අදාළ කරන අවකාශය - ඉඩකඩ - හදා ගැනීමේ අරමුණ සහිතව තමයි මේ අරමුදල අහෝසි කිරීමට - ඈවර කිරීමට - අදාළ කරන මෙම යෝජනා සම්මතය අද ඉදිරිපත් කරන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගෙවී ගිය කාල වකවානුව තුළ මේ අරමුදලේ තිබිච්ච මුදල් අවභාවිත කිරීම කොතරම්ද කිව්වොත්, 2024 අවුරුද්දේදී රටේ මැතිවරණයක් පවත්වන්න තිබෙද්දී, ජනාධිපතිවරණයක් පවත්වන්න තිබෙද්දී, මේ රටේ වැඩ කරන ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙන් මේ අරමුදල පාවිච්චි කරනවා වෙනුවට එවකට හිටපු අමාත්‍යවරයා මේ අරමුදලෙන් රුපියල් මිලියන 70ක් අරගෙන, මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල එක පියවරක් හැටියට රුපියල් මිලියන 66ක් වියදම් කරලා බෑග් බෙදුවා. එවැනි ක්‍රියාකාරිත්වයක් තමයි මේ අරමුදලේ තිබුණේ. ඒ නිසා ඒක වෙනස් කරලා, මේ රටේ වැඩ කරන ජනතාවගේ සැබෑ ජනතා වුවමනාවන්, අභිලාෂයන් මුදුන්පත් කිරීම වෙනුවෙන් මේ අරමුදල භාවිත කිරීමට අවශ්‍ය කරන පසුබිම, වැඩ පිළිවෙළ සකස් කිරීමට අවශ්‍ය කරන මේ යෝජනා සම්මතය අනුමත කිරීමට අදාළ මැදිහත් වීම කරමු කියන ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මුදල් පනත යටතේ යෝජනා සම්මතය යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න. ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ஸ்துதிய் මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, சபை ஒத்திவைப்பு வேளையில் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சர் அவர்களிடம் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்:

1. கௌரவ அமைச்சர் அவர்களே, தனிநபர்கள் தமது மத நம்பிக்கையையும் கலாசார அடையாளத்தையும் கடைப்பிடிப்பதற்கும் வெளிப்படுத்துவதற்குமான அடிப்படை உரிமைகளைக் கருத்திற்கொண்டு, பொது நிறுவனங்களில் இவ்வாறான உரிமைகள் மதிக்கப் படுவது உறுதிசெய்யப்பட வேண்டியதன் அவசியத்தைக் கருத்திற்கொண்டு, சுகாதாரம், பாதுகாப்பு, சுகாதாரத் தூய்மை, பாதுகாப்பு ஏற்பாடுகள், அடையாளங்காணுதல் மற்றும் உத்தியோகபூர்வ கடமைகளைத் திறம்பட நிறைவேற்றுதல் தொடர்பான நியாயமான தேவைகளைப் பேணிக்கொண்டு, ஒரு பொது நிறுவனத்தில் குறிப்பாக சுகாதார நிறுவனம் ஒன்றில் பணியாற்றும் ஒருவர், தனது மத நம்பிக்கையின் அல்லது கலாசார அடையாளத்தின் அடிப்படையில் ஆடை அணிவதை, அந்த ஆடை குறித்த சேவைக்காக நிர்ணயிக்கப்பட்ட சீருடையின் நியாயமான நோக்கம் அல்லது தேவைகளுக்கு முரண்படாத வரையில் அனுமதிக்கப்படலாம் என்பதை அரசாங்கம் ஏற்றுக்கொள்கின்றதா?

Sir, I am just repeating what is there in the English version of my Question; I am not adding anything

2. அவ்வாறாயின், 2026ஆம் ஆண்டு ஓகஸ்ட் மாதம் 8ஆம் மற்றும் 10ஆம் திகதிகளில் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் கடமைபுரியும் சில அதிகாரிகள், மத அல்லது கலாசார அடையாளத்தின் அடிப்படையில் அணிந்திருந்த ஆடை காரணமாக புதிதாக நியமிக்கப்பட்ட சில சுகாதார உதவிப் பணியாளர்களை கடமைக்குச் சமுகமளிப்பதைத் தடுக்கும் வகையில் செயற்பட்டுள்ளனர் என்பதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா?

3. மேலும், சுகாதாரத்துறையைச் சேர்ந்த பணியாளர்களுக்குப் பொருந்தக்கூடிய ஆடை மற்றும் சீருடை தொடர்பாக பொதுநிருவாக அமைச்சினால் 29.06.2019 அன்று வெளியிடப்பட்ட EST-7 UNIFO/06/V இலக்கமுடைய சுற்றறிக்கையின் விதிமுறைகளுக்கு இத்தகைய நடவடிக்கை முரணானது என்பதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா? அந்தச் சுற்றறிக்கை நடைமுறையில் இல்லாவிட்டாலும், சுகாதாரத்துறையில் அந்தச் சுற்றறிக்கையை உத்தியோகபூர்வமற்ற நிலையில் ஏற்றுக்கொண்டு இருக்கிறார்கள் என்பது எனக்குத் தெரியும்.

4. அவ்வாறாயின், மேற்படி சுற்றறிக்கைக்கு முரணாகச் செயற்பட்ட அல்லது இத்தகைய ஆடை காரணமாக சுகாதார உதவிப் பணியாளர்களைக் கடமைக்குச் சமுகமளிக்கவிடாமல் உரிமையைத் தன்னிச்சையாகக் கட்டுப்படுத்திய அதிகாரிக்கு எதிராக உரிய ஒழுக்காற்று நடவடிக்கை எடுப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுப்பாரா?

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

இது முக்கியம்! ஏனெனில் குறித்த சுற்றறிக்கை நடைமுறையில் இல்லாத சூழ்நிலையிலும், அன்று மற்றைய சகல வைத்தியசாலைகளிலும் இவ்வாறு ஆடை அணிந்து வந்த ஊழியர்களை வேலை செய்வ தற்கு அனுமதித்து இருக்கையில், கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் மாத்திரம் இப்படி நடவடிக்கை எடுத்திருக்கிறார்கள். இதற்குரிய காரணத்தை நான் அடுத்த கேள்வியைக் கேட்டுவிட்டுச் சொல்கின்றேன். I am just repeating what is written in the English version of my Question.

5. இவ்வாறான சம்பவங்கள் மீண்டும் இடம்பெறா திருப்பதை உறுதிசெய்ய, ஆடை தொடர்பான தீர்மானங்கள் அதாவது, மதம், இனம் அல்லது கலாசார அடையாளத்தின் அடிப்படையில் ஆடை அணிவதற்கு எவ்விதப் பாகுபாடுமின்றி ஒரேமாதிரி யாகவும் நியாயமாகவும் நடைமுறைப்படுத்தப் படுவதை உறுதி செய்வதற்காக அரசாங்கம் மேலும் என்ன நடவடிக்கைகளைத் தேசிய ரீதியாக மேற்கொள்ளும்?

This is a very important question.

இதோ பாருங்கள்! இதுதான் அந்தச் சுகாதாரப் பணியாளர்கள் அணிந்திருந்த ஆடை! இதனை நன்றாகப் பார்த்துக் கொள்ளுங்கள்! நான் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நேற்று நாங்கள் உங்களைச் சந்தித்தபோது - we met you yesterday - ஓரளவுக் குச் சாதகமான பதில்களைச் சொல்லியிருந்தீர்கள். You actually gave me a favourable reply. ஆனால், அரசாங்கம் இது சம்பந்தமாக எடுக்கின்ற திடமான தீர்மானம் அதாவது, 2022ஆம் ஆண்டு வெளியிடப்பட்ட சுற்றறிக்கையை இரத்துச் செய்து இருந்தாலும்கூட, ஏற்கனவே இருந்த சுற்றறிக்கையின் அடிப்படையில் அல்லது அந்தச் சுற்றறிக்கைக்கு மேலாக அரசியல் யாப்பில் இருக்கின்ற அடிப்படை உரிமையின் அடிப் படையில் இந்தச் சீருடையை ஏற்றுக்கொண்டு இருந்தார்கள். I have to specifically mention, notwithstanding the cancellation of the said Circular, that every hospital permit a reasonable and decent uniform. So, why did only the Kalmunai North Base Hospital take this action?

முக்கியமாக, நான் என்னுடைய கேள்வியில் 'முஸ்லிம்' என்ற பதத்தைப் பாவிக்கவில்லை. I have not used the word "Muslim". ஏனென்றால், தமிழ், முஸ்லிம் மக்களுக்கு இடையில் இருக்கின்ற பல கசப்பான அனுபவங்களுக்கு அப்பாற்சென்று, நாங்கள் ஒன்றாகப் பயணிக்க வேண்டும்; வாழ வேண்டும். எங்களுக்குள் ஒற்றுமையை ஏற்படுத்துவதற்காக ஒரு கூட்டமைப்பைக்கூட வைத்திருக்கின்ற இந்த நேரத்தில், அதைக் குழப்புவதற்குத்தான் ஒருசிலர் முயற்சிக்கிறார்கள். There is a sinister move by those who were very keen earlier to divide this community and disrupt harmony. You must take very serious note of it. இன்று அவர்களுடைய நோக்கங்கள் எல்லாம் தவிடுபொடியாகி விட்டன.

கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களும் கௌரவ மனோ கணேசன் அவர்களும் குறித்த முஸ்லிம் சுகாதாரப் பணியாளர்கள் மத அடிப்படையில் அணிந்திருக் கின்ற சீருடை சரியானது; அதை ஏற்றுக்கொள்ள வேண்டும் என்று பேசியிருப்பதைக் கேட்கும்போது மிகவும் சந்தோசமாக இருந்தது. எங்களுக்கு இடையிலான ஒற்றுமை இன்னும் கூடுதலாகப் பிரதிபலிக்கத் தொடங்கி விட்டது. கௌரவ மனோ கணேசன் அவர்கள் அழகாகச் சொல்லியிருந்தார், "குறித்த சுற்றறிக்கை பகவத் கீதையா, அல்-குர்ஆனா? தேவையென்றால் மாற்றிக்கொள்ளலாம்" என்று. கௌரவ அமைச்சர் அவர்களே, இது போன்ற விடயங்களுக்கு நிரந்தரத் தீர்வைக் கொடுக்க வேண்டும். அதை நான் உங்களுடைய பதிலில் எதிர்பார்க்கின்றேன். கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் கடமைபுரிந்த அந்த ஊழியர்களை Ashraff Memorial Hospitalக்கு மாற்றியது இப் பிரச்சினைக்குத் தீர்வல்ல; அதை நீங்களும் ஏற்றுக் கொண்டீர்கள். you were good enough to tell us yesterday that transferring them is not a permanent solution and that it is only a temporary measure taken in order to bring about harmony. Okay, fine. But, there should be a permanent solution to this. In order to bring about a permanent solution, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය කෙටියෙන් ඇහුවා නම් හොඳයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

I will be concluding in a minute, Sir.

Please inform this House and the public what you propose to do in order to bring about a permanent solution to this issue. Your Answer today must bring an end to this issue. Nobody should make use of this issue to gain political advantage. The people and we are expecting an Answer acceptable to all communities.

Thank you very much, Hon. Presiding Member.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, සභාව කල් තබන අවස්ථාවේදී මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.

මහජන නියෝජිතයන් හැටියට අප මේ සිදුවීම පිළිබඳව ඉතාම සංයමයෙන් සහ පරිණතව බැලිය යුතුයි කියලා මා හිතනවා. සමාජ මාධ්‍යවල හෝ එහෙම නැත්නම් එළියේ, ඡන්ද බලාගෙන කරන ප්‍රකාශ, හැසිරීම් අපි කිසි සේත් අනුමත කරන්නේ නැහැ. අපි කවුරුත් පිළිගන්නවා, මේ රට ජාතීන් කිහිපයක ජනතාව ජීවත් වන, ආගම් කිහිපයක් අදහන ජනතාව ජීවත් වන, ඒ අනුව භාෂා කිහිපයක් -විශේෂයෙන්ම සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්- කථා කරන ජනතාව ජීවත් වන, ඒ නිසාම ඒ මත පදනම් වූ සංස්කෘතීන් කිහිපයක් තිබෙන රටක්. ඒ සංස්කෘතීන්ට අදාළව ඇඳුම් පැලඳුම්, ආහාර පාන, විවිධ වත් පිළිවෙත් ආදිය තිබෙන රටක්. ඒ සියල්ලේම සංකලනයක්, සංහිඳියාවක්, එක්සත්කමක් ලෙසින් තමයි ශ්‍රී ලාංකීය රාජ්‍යය පවතින්නේ.

හැබැයි, අපට දේශපාලන ඉතිහාසයේදී තිබෙන්නේ ඉතාම බේදජනක සහ ශෝකජනක අත්දැකීම්. බලය ලබා ගැනීමට සහ බලය පවත්වාගෙන යාමට ජාතිවාදී ගංගාවේ පිහිනමින් තමයි බොහෝ අය ආණ්ඩු කළේ. නමුත් ජාතික ජන බලවේගය හැටියට අපට ඉතාම අමාරු, දුෂ්කර අවස්ථාවේදීවත් අපි ජාතිවාදය යොදා ගත්තේ නැහැ, බලයට එන්න. අපි බලයට ඇවිල්ලා මේ දක්වාමත්

-ජනාධිපතිවරයා පත්වෙලා, අවුරුද්දයි මාස එකොළහක් වෙනවා; ඒ කාලය තුළදීවත්- යළිත් වතාවක් මේ රටේ ජාතිවාදය සහ ආගම් අතර ගැටුම් ඇති වෙන්න කිසිසේත්ම අපි ඉඩ දුන්නේ නැහැ; ඉඩ දෙන්නේත් නැහැ. එවැනි කුඩා සිදුවීම් සම්බන්ධයෙන් වුණත් අවශ්‍ය නම් නීතියෙන්, අවශ්‍ය නම් අවබෝධයෙන්, අවශ්‍ය නම් සාකච්ඡාවෙන් අවශ්‍ය විසඳුම් ලබා දීලා තිබෙනවා.

මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ ප්‍රශ්නය පැන නැඟුණු මුල් මොහොතේදීම අපේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන, මුස්ලිම් ජනතාව බහුතරයක් ජීවත් වන ප්‍රදේශවල වාගේම මේ ප්‍රශ්නයට සංවේදී අපේ සියලු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව ඉතාම හොඳින් අවධානය යොමු කරලා, මෙය අනවශ්‍ය ගැටුම්කාරී තත්ත්වයක් දක්වා වර්ධනය වීම වළක්වා ගන්නටත්, කුඩා ජාතිවාදී කණ්ඩායම්වලට මෙය බෝල ගහන්න අවස්ථාවක්, ෆුට්බෝල් එකක් කර නොගන්නටත් කටයුතු කිරීම ගැන. ඒ වාගේම තමුන්නාන්සේලාගේ මැදිහත්වීම පිළිබඳවත් මා ස්තුතිවන්ත වෙනවා.

මෙතැනදී අප තේරුම් ගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මම දැන් ඔබතුමාගේ ප්‍රශ්නවලට එකින් එක උත්තර ලබා දෙන්නම්.

1. රාජ්‍ය සේවය තුළ නිල ඇඳුම් අඳින සේවක පිරිසක් සහ dress code එකක්, එහෙම නැත්නම් ඇඳුම් පැළඳුම් පිළිබඳ නියාමනයක් තිබෙන නිලධාරින් ඉන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේත් ඒක එහෙමමයි. සෞඛ්‍ය ක්ෂේත්‍රය සලකන කොට අප ඒ සේවකයන්ට නිල ඇඳුමක් ලබා දීලා තිබෙන්නේ, එක් පැත්තකින් පොදුවේ ඒ නිලධාරි කාණ්ඩ රෝගීන්ට සහ මහ ජනතාවට පහසුවෙන් වෙන් කරලා හඳුනා ගන්නයි; අනෙක් පැත්තෙන්, අපේ රෝහල්වලට සහ අපේ සෞඛ්‍ය ආයතනවලට පැමිණෙන ජනතාවගේ සනීපාරක්ෂාව තහවුරු කරන්නයි. නිල ඇඳුමක් කියන එක නිකම් ආවාට ගියාට සකස් කරන එකක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් දීර්ඝ කාලීන සාකච්ඡාවක් කරලා, නිල ඇඳුම් කමිටුවක් විසින් ඒ සියල්ල සලකා බලා තමයි ඒ කටයුත්ත කරන්නේ. ඒ අනුව, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිල ඇඳුම් සකස් කිරීමේදී, රෝගී සත්කාරක සේවාවන් පහසුවෙන් සිදු කිරීම වාගේම රෝගකාරක විෂබීජ පැතිරීම පාලන කිරීමත් සැලකිල්ලට ගෙන තිබෙනවා. ඒ වාගේම, නිල ඇඳුම් අඳින සේවක කණ්ඩායම්වලට, නිලධාරි කණ්ඩායම්වලට නිල ඇඳුම් දීමනාවකුත් හිමි වෙනවා.

   සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ නිල ඇඳුම් හිමි සේවාවන් පහත පරිදි වෙනවා. ඒ අනුව හෙද නිලධාරින්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්, මැලේරියා/බරවා මර්දන සහායකයන්, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරින්, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක කියන කණ්ඩායම්වලට සහ ඊට අමතරව සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ සහ සාමාන්‍ය), උපස්ථායක (කාන්තා/පිරිමි), රෝහල් ඕවසියර්, අරක්කැමි, කරණවැමි, කාර්යාල කාර්ය සහායක, පාපැදි පණිවුඩකරු, මුරකරු, රසායනාගාර සහායක සහ ඉසින යන්ත්‍ර ක්‍රියාකරු යන කනිෂ්ඨ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අයත් අයට තමයි නිල ඇඳුම කියන එක අදාළ වෙන්නේ. වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, දන්ත වෛද්‍යවරුන්, ඒ වාගේම රසායනාගාර සේවාවන්හි නිරත වන අය, පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් ආදි අයට නිල ඇඳුම් දීමනාව හෝ නිල ඇඳුම හිමි වන්නේ නැහැ.

   ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව 2025 ජනවාරි 01වැනි දා ඉඳලා හෙද නිලධාරින්ට රුපියල් 30,000කුත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්ට රුපියල් 28,000කුත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්ට රුපියල් 30,000කුත්, මැලේරියා/ බරවා මර්දන සහායකයන්, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරින්, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සකයන් යන අයට රුපියල් 20,600කුත්, කනිෂ්ඨ සෞඛ්‍ය කාර්ය සහායක මණ්ඩලයට රුපියල් 18,600කුත් ලෙස නිල ඇඳුම් දීමනාව ලබා දෙනවා. මම මේ කියන්නේ, නිල ඇඳුම් අඳින, නිල ඇඳුම් දීමනාව හිමි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරි කණ්ඩායමක් ඉන්නවා කියන එකයි.

2. නිල ඇඳුම වෙනස් කොට භාවිත කිරීමේ සිදුවීමක් පිළිබඳව අපේ අමාත්‍යාංශයට කරුණු වාර්තා වෙලා තිබෙනවා. සෞඛ්‍ය සේවාව අඛණ්ඩව හා ගුණාත්මකව පවත්වා ගෙන යැමට හැකි වන පරිදි එම සේවකයන් සම්බන්ධයෙන් යම් **පියවරක් ගෙන තිබෙනවා.** ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ අපට අවශ්‍ය වුණු එක දෙයක් තමයි, රෝගී සත්කාරක සේවා කමිටු පවත්වාගෙන යන එක. විශේෂයෙන්ම වෛද්‍යවරුන් සම්බන්ධ වෙලා අක්කරෙයිපත්තු රෝහලේ වැඩ වර්ජනයක් සිදු වුණාට පසුව රෝගී සත්කාරක සේවාවන් පවත්වාගෙන යැම සඳහා අපි තීන්දුවක් ගත්තා. ඒ ආකාරයටම නැඟෙනහිර පළාතේ ජනතාවගේ රෝගී සත්කාරක සේවාවන් දිගට පවත්වා ගෙන යන්නත්, අනෙක් පැත්තෙන් යම් යම් කණ්ඩායම්වලට වුවමනා ලෙසට ජාතිවාදී හැඟීම් ඇවිළවීම වැළැක්වීම සඳහාත් අපි ඒ අයට තාවකාලික පදනමින් ස්ථාන මාරුවක් සිදු කර තිබෙනවා.

3. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා චක්‍රලේඛයක් පිළිබඳව සඳහන් කළා. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක EST-7/UNIFO/06/V මඟින් රාජ්‍ය නිලධාරින්ගේ නිල ඇඳුම් භාවිතය පිළිබඳ විධිවිධාන දක්වා ඇති අතර, ඊට නිල ඇඳුම් දීමනා හිමි එම සෞඛ්‍ය සේවකයන් අදාළ වන්නේ නැහැ. ඇත්තටම ඒ චක්‍රලේඛය 2019දී යම් සංශෝධනයක් කරලා 2022දී යළිත් සංශෝධනයක් කරන්නේ නිල ඇඳුම් අඳින කාර්ය මණ්ඩලයට නොවෙයි. ඒක සංශෝධනය කරන්නේ, මා කලින් කිව්වා වාගේ dress code එකක් තිබෙන අයට යම් අනුමැතියක් ලබා දීම සඳහායි.

   නිල ඇඳුම යන්න, සම්මත කර ඇති ඇඳුමක් වන අතර, එමඟින් එම නිලයේ අනන්‍යතාව සුරැකෙනවා. එමෙන්ම, සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ නිල ඇඳුම් කමිටුවක් ක්‍රියාත්මක වන අතර, ඉන් එක් එක් නිලයට අදාළ නිල ඇඳුම සම්මත කර ගනු ලබනවා. එසේ සම්මත කර ගනු ලැබ ඇති නිල ඇඳුමේ යම් වෙනසක් සිදු කරනු ලබන්නේ නම් එම නිල ඇඳුම් කමිටුවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වෙනවා.

4. ගරු මන්ත්‍රීතුමනි, දැනට චක්‍රලේඛයක් පවතිනවා. ඒක අපේ ආණ්ඩුව ඇවිල්ලා ගහපු චක්‍රලේඛයක් නොවෙයි. ඒක ඔබතුමන්ලාගේ නායකයන්, ඔය ඉන්න කණ්ඩායම නියෝජනය කරපු ආණ්ඩු කාලයේදීම ගහපු චක්‍රලේඛයක්. ඒ චක්‍රලේඛය මත පදනම් වෙලා තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය දැන් කටයුතු කරන්නේ. එතකොට, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින යම්කිසි කෙනෙකුට වෙන්න පුළුවන්, බාහිර කෙනෙකුට වෙන්න පුළුවන්, නිල ඇඳුම වෙනස් කර ගන්න අවශ්‍යතාවක් පවතිනවා නම්, එම කමිටුවට යෝජනා ඉදිරිපත් කරලා, සැලකිය යුතු කාලයක් සාකච්ඡා කරලා, තිබෙන චක්‍රලේඛය වෙනස් කිරීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කරන්න අපට පුළුවන්. ඕනෑ නම් මේ පාර්ලිමේන්තුවේත් ඒක ආරම්භ කරන්න පුළුවන්. ඒ සඳහා නිදහසක් පවතිනවා. නමුත්, දැන් මේ නිලධාරින් කටයුතු කළ යුතු වන්නේ පවතින චක්‍රලේඛය පදනම් කර ගෙනයි.

5. එක පැත්තකින් මම සතුටු වෙනවා, පසුගිය කාලයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පත්වීම් විශාල ප්‍රමාණයක් අප ලබා දෙන කොට මුස්ලිම් ජාතික කාන්තාවන් -තරුණියන්- සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇතුළත් වීමේ නැඹුරුවක් පැවතීම ගැන. සාම්ප්‍රදායික ඇඳුමේ ප්‍රශ්නයක් නිසා කෙනෙකු රාජ්‍ය සේවයට ඇතුළත් වීම සීමා වෙනවා නම්, අපි ඒක අනුමත කරන්නේ නැහැ. ඒ අයට අවස්ථාවක් තිබෙන්නට ඕනෑ; අපි ඒ සඳහා නිදහස ලබා දෙන්නට ඕනෑ.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නමුත්, දැනට පවතින චක්‍රලේඛයක් අනුව තමයි නිලධාරින් කටයුතු කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, අප ලබා දුන් මේ තාවකාලික උත්තරය මේ වෙලාවේදී මේ ගැටුම පැතිරීම වැළැක්වීම සඳහා උදව් උපකාර වේවි කියලා අපි හිතනවා.

නමුත් පරිණත මහජන නියෝජිතයන් හැටියට අපි ලෝකය වෙනස් වන ආකාරය දිහා බලලා සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා අපේ රටේ ඕනෑම තරුණයෙකුට, තරුණියකට මේ ක්ෂේත්‍රයට ඇතුළත් වෙන්න අවස්ථාව සලසා දිය යුතුයි, අනෙක් පැත්තෙන් කෙනෙකුගේ ආගමික, සංස්කෘතික ඇදහීම් පවත්වාගෙන යන්නත් අවස්ථාව දිය යුතුයි. ඒ සියල්ල සාකච්ඡා කරන්න අවස්ථාවක් තිබෙනවා. එවැනි සාකච්ඡාවක් දැන් පවතින බව මම දන්නවා. අපට කරන්න තිබෙන්නේ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරු එකතු වෙලා ඒ අවස්ථාව සලසා ගන්නා එකයි.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනාට. ඔබතුමන්ලා හැමදෙනාම මේ දිහා ඉතාම සාධනීයව සහ පරිණත ආකාරයෙන් බැලුවා. සමහර කාලවල අපේ රටේ ජාතිවාදී ගිනි දලු ඇවිළෙන්න, ඒ ඔස්සේ ලේ වැගිරීම් ඇති වෙන්න, ආහාර පාන, ආහාර සකස් කරන විධි, නිල ඇඳුමක්, ටොපියක් පවා හේතු වුණා. එවැනි යුගයක් තමයි අපි පහු කරලා තිබෙන්නේ. මෙහිදී කටයුතු කර තිබෙන්නේ පවතින චක්‍රලේඛයක් මතයි. සමහර විට කෙනෙකුට ඒ ගැන අනවබෝධයක් තිබෙන්න පුළුවන්. අපේ dress code එක භාවිත කරන නිලධාරින් ඉන්නවා. ඔවුන් ඒ ඇඳුම භාවිත කරනවා. හැබැයි නිල ඇඳුම් තිබෙන කාණ්ඩ කිහිපයක් ඉන්නවා. ඒ නිල ඇඳුම් සම්බන්ධයෙන් මේ කියන චක්‍රලේඛය මත පදනම් වෙලා තමයි දැන් කටයුතු කරන්නේ.

ඔබතුමා අහපු ප්‍රශ්නයට උත්තරයක් මා දුන් පිළිතුර ඇතුළේ තිබෙනවා කියා මම හිතනවා, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි. අපි මේ ප්‍රශ්නය නිරාකරණය කර ගනිමු. අනාගතය වෙනුවෙන් ඉතාම සුහදායී ප්‍රතිසංස්කරණවලට අපි විවෘතයි. ඒ වෙනුවෙන් අපි සාකච්ඡා කරමු කියා මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. මට මිනිත්තුවක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට පැහැදිලි කර ගැනීමට අවස්ථාවක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
බොහොම ස්තුතියි, මේ අවස්ථාව ලබා දුන්නාට.

ගරු ඇමතිතුමනි, අපගේ එකම ඉල්ලීම මෙකයි. තාවකාලිකව නිල නොලත් විධියට, ඒ කියන්නේ ඔබතුමා කියන පරිදි චක්‍රලේඛයට ප්‍රතිවිරුද්ධව ඇඳගෙන හිටියත් වැඩ කරන්න දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. එක තැනක එහෙම නොදීමට මොනවා හරි හේතුවක් ඇති. ඒක ගැන ඔබතුමන්ලා බලා ගනීවි. මේකට විශාල සාකච්ඡාවක් අවශ්‍ය නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමාට පුළුවන් ලේකම්තුමා එක්ක කථා කරලා මේකට විසඳුමක් දෙන්න. චක්‍රලේඛ කියන ඒවා නීති නොවෙයි. ඉතා ඉක්මනින් ඒ සම්බන්ධයෙන් යහපත් අවසානාත්මක තීරණ ලබා ගන්න කියන ඉතාම ගෞරවනීය ආයාචනය මම ඔබතුමාට කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා ඒක අමාත්‍යවරයාගේ හෝ ලේකම්වරයාගේ හෝ තීරණයක් පමණක් නොවිය යුතුයි කියලා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනෙක් පාර්ශ්වයන්ගේ සහ මහජන නියෝජිතයන් හැටියට ඔබතුමන්ලාගේත් සහභාගිත්වයෙන් තමයි ඒ යෝජනා පිළිබඳව සාකච්ඡා විය යුත්තේ. ඒ නිසා තමයි නිල ඇඳුම් කමිටුවක් පත් කරලා තිබෙන්නේ. ඇත්තටම ලේකම්වරයාත් නොවෙයි චක්‍රලේඛය නිකුත් කරන්නේ. නිල ඇඳුම් කමිටුව තමයි තීන්දු කරන්නේ, නිල ඇඳුම කවර ආකාරයකට සකස් විය යුතුද කියන එක. ඒ සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරන්න පුළුවන්කම තිබෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.18ට, 2026 අගෝස්තු 20වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.18 மணிக்கு பாராளுமன்றம், 2026 ஓகஸ்ட் 20, வியாழக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 5.18 p.m. until 9.30 a.m. on Thursday, 20th August, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### දීමනා පත්‍ර/ඉඩම් බලපත්‍ර සහිත රජයේ ඉඩම්වල පදිංචිකරුවන්: කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රා.ලේ. කොට්ඨාසය
அளிப்புப் பத்திரங்கள்/காணி உரிமப் பத்திரங்களுடன் அரச காணிகளில் வசிப்போர்: கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவு
PEOPLE SETTLED IN STATE LANDS WITH DEEDS OF GRANT/ LAND PERMITS: KORALAIPATTU NORTH, VAKARAI DS DIVISION

890/2025

**1. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31

දක්වා කාලවකවානුව තුළ රජයේ දීමනා පත්‍ර හෝ ඉඩම් බලපත්‍ර ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.01.01ஆம் திகதி தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவில், அரசாங்கத்தினால் அளிப்புப் பத்திரங்கள் அல்லது காணி உரிமப் பத்திரங்கள் ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform the House -

(i) whether he is aware that people have settled in the State lands for which Deeds of Grant or Land Permits were given during the period from 01.01.2017 to 31.03.2025, out of the State lands situated in the Divisional Secretary's Division of Koralaipattu North, Vakarai in the Batticaloa District; and

(ii) if so, the total number of such people, their names and relevant details?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) විස්තර **ඇමුණුම*** මගින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම බලන්න.)

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) ***இணைப்பைப்** பார்க்கவும்.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) Details are given in Annex. (Please refer to theAnnex in Tamil.)

(b) Not applicable.

## කෝරළේපත්තු උතුර, වාකරේ ඉඩම් සඳහා අයදුම්කරුවන්: විස්තර
## கோரளைப்பற்று வடக்கு, வாகரைப் பிரதேச செயலகத்தில் காணிக்காக விண்ணப்பித்தோர்: விபரம்
## APPLICANTS FOR LAND IN KORALAIPATTU NORTH, VAKARAI: DETAILS

891/2025

**2. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3) :

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணியற்ற மக்கள் தங்களுக்குக் காணியொன்றைப் பெற்றுக்கொள்வதற்காக 2017.01.01 முதல் 2025.03.31 வரையான காலப்பகுதிக்குள் கோரளைப்பற்று வடக்கு, வாகரைப் பிரதேச செயலகத்தில் விண்ணப்பித்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு அளிப்புப் பத்திரம் அல்லது காணி உரிமம் வழங்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகளில் குடியிருப்பவர்களில் பலருக்கு இன்று வரை அளிப்புப் பத்திரம் அல்லது காணி உரிமம் வழங்கப்படாதுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு இதுவரை காணி உறுதி அல்லது காணி உரிமம் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that landless persons have applied to the Koralaipattu North, Vakarai Divisional Secretariat with the aim of acquiring land during the period from 01.01.2017 to 31.03.2025;

(ii) if so, the number of such persons, their names and relevant details;

(iii) whether such persons have been issued with Deeds of Grant or Land Permits; and

(iv) if so, the number of such persons along with their names and relevant details?

(b) Will he also inform this House -

(i) whether he is aware that the majority of the persons who have settled down in government lands in the Koralaipattu North, Vakarai Divisional Secretary's Division have not been issued with Deeds of Grant or Land Permits so far;

(ii) if so, of the number of such persons, their names and relevant details; and

(iii) the reasons for not issuing Deeds of Grant or Land Permits to the aforementioned persons so far?

(c) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) ඔව්.

(ii) පුද්ගලයින් සංඛ්‍යාව 2,205කි. විස්තර **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)

(iii) ඔව්. අවසන් නාම ලේඛනයෙන් තේරී පත්වූවන් අතුරින් පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ලත් පුද්ගලයින් සඳහා පමණක් ඉඩම් බලපත්‍ර ලබා දී ඇත.

(iv) පුද්ගලයින් සංඛ්‍යාව 1,512කි. විස්තර **ඇමුණුම 02*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 02 බලන්න.)

(ආ) (i) ඔව්.

(ii) ආරම්භක තේරීම් ලැයිස්තුවෙන් (ඇමුණුම 01) සහ අවසන් නාම ලේඛනයෙන් තේරී පත්වූවන් අතුරින් (ඇමුණුම 02) පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ලත් පුද්ගලයන් හැර අනෙකුත් පුද්ගලයන් සඳහා ඉඩම් බලපත්‍ර ලබා දී නොමැත.

(iii) අදාළ කාල සීමාව තුළ පැවැත්වූ ඉඩම් කච්චේරිවලට සහභාගි වී සුදුසු පුද්ගලයන් ලෙස තේරී පත්වුවද, ඇතැම් හේතු සාධක මත එම පුද්ගලයන් සුදුසු අය ලෙස සැලකිය නොහැකි වීම නිසා ඔවුන් ඉඩම් කච්චේරියේ අවසන් තේරීම් ලැයිස්තුවට ඇතුළත් කර නොමැත

(ඇ) අදාළ නොවේ.

(அ) (i) ஆம்.

(ii) ஆட்களின் எண்ணிக்கை 2,205 ஆகும். **(இணைப்பு 01*)**

(iii) ஆம். இறுதிப் பெயர்ப் பட்டியலில் தெரிவு செய்யப்பட்டவர்களில், மாகாண காணி ஆணையாளரின் அனுமதி பெற்ற ஆட்களுக்கு மட்டுமே காணி உரிமப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளன.

(iv) ஆட்களின் எண்ணிக்கை 1,512 ஆகும். **(இணைப்பு 02*)**

(ஆ) (i) ஆம்.

(ii) ஆரம்பத் தெரிவுப் பட்டியலில் (இணைப்பு 01) மற்றும் இறுதிப் பெயர்ப் பட்டியலில் (இணைப்பு 02) தெரிவு செய்யப்பட்டவர்களில், மாகாண காணி ஆணையாளரின் அனுமதிபெற்ற நபர்கள் தவிர்ந்த, ஏனைய நபர்களுக்கு காணி அனுமதிப்பத்திரங்கள் வழங்கப்படவில்லை.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) தொடர்புடைய காலப்பகுதியில் நடைபெற்ற காணிக் கச்சேரிகளில் கலந்துகொண்டு தகுதியானவர்களாகத் தெரிவுசெய்யப்பட்டு இருந்தபோதிலும், சில காரணங்களின் அடிப்படையில் அவர்கள் தகுதியற்றவர்களாகக் கருதப்பட்டதால், அவர்கள் காணிக் கச்சேரியின் இறுதித் தெரிவுப் பட்டியலில் சேர்க்கப்படவில்லை.

(இ) ஏற்புடையதாகாது.

(a) (i) Yes.

(ii) The number of individuals is 2,205. Details are given in Annex 01. (Please refer to Annex 01 in Tamil.)

(iii) Yes. Among those selected from the final list, land permits had been issued only to persons who had obtained the approval of the Provincial Land Commissioner.

(iv) The number of individuals is 1,512. Details are given in Annex 02. (Please refer to Annex 02 in Tamil)

(b) (i) Yes.

(ii) Among those selected from the initial selection list (Annex 01) and the final list of names (Annex 02), land permits had not been issued to persons other than to those who had obtained the approval of the Provincial Land Commissioner.

(iii) Although they participated in the Land Kachcheris held during the relevant period and were selected as eligible persons, they had not been included in the final selection list of the Land Kachcheri, as they could not be considered eligible due to certain reasons.

(c) Not applicable.

## "උරුමය" සින්නක්කර ඔප්පු සඳහා අයදුම්කරුවන්: කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රා.ලේ. කොට්ඨාසය

## 'உருமய' அறுதி உறுதிக்கு விண்ணப்பித்தோர்: கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவு

## APPLICANTS FOR "URUMAYA" FREEHOLD DEEDS: KORALAIPATTU NORTH, VAKARAI DS DIVISION

892/2025

**3. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා කෝරළේපත්තු උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උරුමය සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට උරුමය සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) උරුමය සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා උරුමය සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019.01.01 தொடக்கம் 2025.03.31 வரை கோரளைப்பற்று வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவில் 'உருமய' அறுதி உறுதியைப் பெற்றுக்கொள்வதற்கு விண்ணப் பித்தவர்களின் எண்ணிக்கை மற்றும் அவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) கடந்த அரசாங்கத்தின் விசேட வேலைத் திட்டத்தின்கீழ் மேற்படி காலப்பகுதியினுள் குறிப்பிட்ட நபர்களுக்கு 'உருமய' அறுதி உறுதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அந்த நபர்களின் எண்ணிக்கை மற்றும் பெயர்கள் யாவை என்பதையும்;

(iv) 'உருமய' அறுதி உறுதியைப் பெற்றுக்கொள்ள விண்ணப்பித்தவர்களில் சிலருக்கு அந்த உறுதிகள் வழங்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், அந்த நபர்களின் எண்ணிக்கை மற்றும் பெயர்கள் யாவை என்பதையும்;

(vi) அவர்களுக்கு இதுவரை 'உருமய' அறுதி உறுதி வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of people who applied for "Urumaya" freehold deeds in the Koralaipattu North, Vakarai Divisional Secretary's Division, Batticaloa from 01.01.2019 to 31.03.2025 and their names;

(ii) whether "Urumaya" freehold deeds have been granted to the persons referred to above under a special programme of the then Government;

(iii) if so, the number of such persons and their names;

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

(iv) whether he is aware that some of the persons who applied for "Urumaya" freehold deeds have not been granted the deeds concerned;

(v) if so, the number of such persons and their names; and

(vi) the reasons for not granting "Urumaya" freehold deeds to them, so far?

(b) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) පුද්ගලයින් සංඛ්‍යාව 290කි. විස්තර **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)

(ii) නැත. දැනට එය "හිමිකම" නමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

(iii) නැත.

(iv) ඔව්.

(v) පුද්ගලයින් සංඛ්‍යාව 208කි. විස්තර **ඇමුණුම 02*** මඟින් දක්වා ඇත. (දෙමළ භාෂාවෙන් ඇති ඇමුණුම 02 බලන්න.)

(vi) දැනට එය "හිමිකම" නමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

(அ) (i) ஆட்களின் எண்ணிக்கை 290 ஆகும். (**இணைப்பு 01***)

(ii) இல்லை. தற்போது அது 'ஹிமிகம' எனும் பெயரில் நடைமுறைப்படுத்தப்பட்டு வருகிறது.

(iii) இல்லை.

(iv) ஆம்.

(v) ஆட்களின் எண்ணிக்கை 208 ஆகும். (**இணைப்பு 02***)

(vi) தற்போது அது 'ஹிமிகம' எனும் பெயரில் நடைமுறைப்படுத்தப்பட்டு வருகிறது.

(ஆ) ஏற்புடையதாகாது.

(a) (i) The number of individuals is 290. Details are given in Annex 01. (Please refer to Annex 01 in Tamil.)

(ii) No. Currently, it is being implemented under the name "Himikama."

(iii) No.

(iv) Yes.

(v) The number of individuals is 208. Details are given in Annex 02. (Please refer to Annex 02 in Tamil.)

(vi) Currently, it is being implemented under the name "Himikama."

(b) Not applicable.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.